පොළොන්නරුව
නගර සංවර්ධන සැලැස්ම
2019 - 2030

පළමු වෙළුම



නාගරික සංවර්ධන අධිකාරිය
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය

පොළොන්නරුව
නගර සංවර්ධන සැලැස්ම
2019 - 2030

පළමු වෙළුම

නාගරික සංවර්ධන අධිකාරිය
දිස්ත්‍රික් කාර්යාලය
පොළොන්නරුව

පොළොන්නරුව නාගරික සංවර්ධන සැලැස්ම 2019-2030

(පොළොන්නරුව නාගරික බල ප්‍රදේශය සඳහා)

පළමු වෙළුම

© නාගරික සංවර්ධන අධිකාරිය - ශ්‍රී ලංකාව - 2019
නාගරික සංවර්ධන අධිකාරිය
6 වන 7 වන හා 9 වන මහල, "සෙත්සිරිපාය",
බත්තරමුල්ල, කොළඹ, ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය - www.uda.goc.lk
විද්‍යුත් තැපෑල - info@uda.gov.lk
දුරකථන අංකය - +94112873637

සියළුම හිමිකම් ඇවිරිණි,
මෙම ප්‍රකාශනය නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කෙරේ. මෙම ප්‍රකාශනය, සම්පූර්ණයෙන්ම හෝ කොටසක් මෙම අධිකාරියේ පූර්ව අනුමැතියකින් තොරව ප්‍රතිප්‍රකාශනය කිරීම, විකිණීම, බෙදා හැරීම, ලිඛිත අවසරයකින් තොරව පිටපත් කිරීම හෝ නවීන තාක්ෂණික ක්‍රම හරහා තැටිගත කිරීම, බෙදාහැරීම හෝ වෙළඳ අරමුණක් සඳහා යොදා ගැනීම සිදු නොකළ යුතුය.

ප්‍රකාශනය 2019 - ජූනි.
පොළොන්නරුව නගර සංවර්ධන සැලැස්ම 2019 – 2030 ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විත වන අතර එය පළමු වෙළුම හා දෙවැනි වෙළුම වශයෙන් ප්‍රකාශයට පත් කෙරේ. මෙහි පළමු වෙළුම අනු කොටස් දෙකකින් සමන්විත වන අතර එය පළමුවන කොටස සහ දෙවන කොටස වශයෙන් සඳහන් කර ඇත. මෙහි එන පළමු වෙළුමේ පළමුවන කොටස මඟින් සංවර්ධන සැලැස්ම හැඳින්වීම, මූලික අධ්‍යයනය සහ සංවර්ධනය සැලැස්මේ අවශ්‍යතාවය පිළිබඳ සඳහන් කරන අතර එහි දෙවන කොටස මඟින් සංවර්ධන සැලැස්මේ දැක්ම, අරමුණු සහ පරමාර්ථ, සංකල්පිත සැලැස්ම, සංවර්ධන උපාය මාර්ගික සැලසුම් යන ආදිය අන්තර්ගත කර ඇත. සංවර්ධන සැලැස්මේ දෙවනි වෙළුම වෙනම ප්‍රකාශනයක් ලෙස සකස්කර ඇති අතර එහි 2019 – 2030 කාල පරිච්ඡේදය සඳහා බල පවත්වන සැලැස්මට අනුව ගොඩනැගිලි සංවර්ධනය කිරීමේ රෙගුලාසි සහ කලාපීකරණ රෙගුලාසි අන්තර්ගත කර ඇත.

පොළොන්නරුව නගර සංවර්ධන සැලැස්ම 2019 - 2030 නාගරික සංවර්ධන අධිකාරියේ උතුරු මැද පළාත් අංශයේ පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය විසින් පොළොන්නරුව නාගරික බල ප්‍රදේශය සඳහා (2018.08.14 දරණ අංක 2084/4 අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත) සකස්කර ඇති අතර, ඒ සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ විවිධ අංශයන්ගේ හා සම්පත් දායකයන්ගේ උපදෙස් හා මහ පෙන්වීම් පෙරදැරි කරගෙන සිදුකර ඇත.

අධික්ෂණ කටයුතු ; නාගරික සංවර්ධන අධිකාරිය
ආචාර්යය ජගත් මුණසිංහ ;සභාපති , ඉංජිනේරු එස්.එස්.පී.රත්නායක;අධ්‍යක්ෂ ජනරාල්, නගර නිර්මාණ ශිල්පී කේ.ඒ.ඩී.චන්ද්‍රදාස; අතිරේකඅධ්‍යක්ෂ ජනරාල්, නගර නිර්මාණ ශිල්පී ඩී.එම්.බී. රණතුංග ; නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) , නගර නිර්මාණ ශිල්පී ජනක් රණවීර; අධ්‍යක්ෂ (බස්නාහිර පළාත් අංශය සහ පර්යේෂණ හා සංවර්ධන ඒකකය) , නගර නිර්මාණ ශිල්පී ලලිත් විජේරත්න; අධ්‍යක්ෂ (සංවර්ධන සැලැසුම් අංශය)

සැලසුම් කණ්ඩායම ; පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය
නගර නිර්මාණ ශිල්පී එල්.ජේ.ලියනගේ- අධ්‍යක්ෂක (උතුරු මැද පළාත), නගර නිර්මාණ ශිල්පී ඩී.බී.එස්.කේ.දිසානායක -නියෝජ්‍ය අධ්‍යක්ෂක (සැලසුම්), නගර නිර්මාණ ශිල්පී ඩබ්.ඒ.ආර්.රංජනී- නියෝජ්‍ය අධ්‍යක්ෂක (සැලසුම්), නගර නිර්මාණ ශිල්පී ටී.ජේ.කේ.ජයලත් මිය - උපාය මාර්ගික සැලසුම් ශිල්පී, එම්.එච්.අයි.එස්.ගුණරත්න මෙනවිය- සහකාර සැලසුම් නිලධාරී, ආර්.ඩී.එස්.සුමතිපාල මෙනවිය- බලාත්මක නිලධාරී, එච්.එම්.ජී.බණ්ඩාර මහතා - බලාත්මක නිලධාරී

පූර්විකාව

ශ්‍රී ලංකාවේ දෙවන රාජධානිය ලෙස ප්‍රෞඪ ඉතිහාසයක් හිමි පොළොන්නරුව නගරය, අතීත ශ්‍රී ලාංකික නගර නිර්මාණ ශිල්පයේ විශිෂ්ඨත්වය ලෝකයාට කියා පාන ජීවමාන සාධකයකි. මහා පරාක්‍රමබාහු රජ කල පාරිසරික සමබරතාවය රැක ගනිමින් ද ස්වභාවික සෞන්දර්යය ඉස්මතු කරමින් ද ආර්ථික, අධ්‍යාපන, සෞඛ්‍යය, සමාජයීය සහ ආරක්ෂාව ආදී සෑම අංශයකින්ම එකල නගරය සමබල විය. එය ශ්‍රී ලංකාවට "පෙරදිග ධාන්‍යාගාරය" යන විරුදාවලිය ගෙන දීමට මුල් වූ මධ්‍යස්ථානයයි.

වර්තමාන පොළොන්නරුව නගරය, දිස්ත්‍රික්කයේ ප්‍රධාන ආර්ථික සහ පරිපාලන මධ්‍යස්ථානය ලෙස ක්‍රියාත්මක වන අතර ක්‍රමයෙන් නාගරීකරණය හමුවේ ඇතිවන විවිධ ගැටළු වලට මුහුණ දෙමින් පවතී. නගරයේ සහ දිස්ත්‍රික්කයේ ආර්ථිකය අතීතයේ මෙන්ම සහල් කර්මාන්තය මත පදනම්ව පවතින නමුත් නාගරික ජනගහනය විකල්ප ආර්ථික අවස්ථා පිළිබඳව අවශ්‍යතාවය මතු කර සිටියි.

එබැවින් පොළොන්නරුව නාගරික බල ප්‍රදේශය තුල දැනට පවතින ගැටළු, භාවිතා නොකරන ශක්තීන් සහ විභවතාවයන් විද්‍යාත්මක විශ්ලේෂණයකට ලක් කිරීමෙන් පොළොන්නරුව නාගරික සැලැස්ම "සහල් රාජධානියේ මහිමාන්විත උරුමයේ හරිත නගරය" යන අනාගත දැක්ම මුදුන්පත් කරගැනීමේ අදිටනින් සකස් කර ඇත.

පොළොන්නරුව නාගරික බල ප්‍රදේශයේ ඉදිරි වසර 11 ක කාලය සඳහා පාරිසරික සමබරතාවය රැක ගන්නා අතර නව ආර්ථික අවස්ථා සලසමින් ඓතිහාසික සෞභාග්‍ය යලි ඉස්මතු කර ගැනීමට අවශ්‍ය භෞතික පරිසරය සැකසීම මෙම සැලැස්මෙහි ප්‍රධාන අරමුණ වේ. එයට අනුශාංගික අනෙකුත් සියලු පරමාර්ථ සහ උපායමාර්ගික සැලසුම් මෙහි අන්තර්ගත වන අතර 2030.12.31 දක්වා මෙම සංවර්ධන සැලැස්ම වලංගු වේ.

ගරු ඇමතිතුමාගේ පණිවුඩය



1978 හි අංක **41** දරණ නාගරික සංවර්ධන අධිකාරී පණත යටතේ නාගරික සංවර්ධන අධිකාරිය පිහිටුවනු ලැබූ අතර පසුගිය වසර **40** පුරාවටම නාගරික සංවර්ධන අධිකාරිය විසින් නාගරික ප්‍රදේශවල සැලසුම් සහගත නාගරික සංවර්ධනයක් සඳහා දායකත්වය සපයනු ලබයි. මෙම මොහොත වන විට නාගරික සංවර්ධන අධිකාරිය තම ගමන් මගෙහි තවත් එක් සන්ධිස්ථානයක් පසුකරමින් පුළුල් සංවර්ධන සැලසුම් නාගරික සංවර්ධන කලාප **44** ක් සඳහා සකස් කිරීමට කටයුතු කොට ඇත.

මෙම සංවර්ධන සැලැස්ම මගින් අපේක්ෂා කරනු ලබන්නේ පොළොන්නරුව නාගරික බල ප්‍රදේශය (පොළොන්නරුව මහනගර සභාව සහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක්) සඳහා ඒකාබද්ධ සංවර්ධනයක් ඇති කිරීමයි. පොළොන්නරුව නගරය දිස්ත්‍රික්කයේ වාණිජ හා පරිපාලන නගරය වන අතර, විශාල ජන සංඛ්‍යාවකට සේවය සපයනු ලබයි. එමෙන්ම, යුනෙස්කෝ ලෝක උරුම නගරයක් ලෙස නම් ලද පොළොන්නරුව සහල් කර්මාන්තය හා බැඳුණු ඓතිහාසික සංස්කෘතියකට උරුමකම් කියන අතර එම පසුබිම මත සංචාරක කර්මාන්තය සංවර්ධනය කර ගැනීම සඳහා ඇති විභවතාවය මෙම සංවර්ධන සැලැස්මට අනුගත කොට ගෙන ඇත.

මාගේ අවබෝධය අනුව සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා වෘත්තීයවේදීන්, විශේෂඥයන්, පාර්ශවකරුවන් හා ප්‍රජාවගේ පුළුල් උපදේශනය සමඟින් නවීන ක්‍රමෝපායන් යොදා ගනිමින් විශිෂ්ඨ තාක්ෂණික ක්‍රමවේදයන් හා නවෝත්පාදිත ප්‍රවේශයන්ද ලැබී ඇත. ඒ අනුව, සභාපතිතුමා, අධ්‍යක්ෂ ජනරාල්තුමා, සැලසුම් කණ්ඩායම හා මෙම කාර්ය සාර්ථක කර ගැනීමට නන් අයුරින් සහාය දුන් නාගරික සංවර්ධන අධිකාරියේ සියලුම නිලධාරීන්ගේ සේවය මම අගය කරමි. තවදුරටත් අදාළ පළාත් පාලන ආයතන, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන හා සාමාන්‍ය ජනතාවගේ සහයෝගය හා දායකත්වය එක සමාන අයුරින් මෙම කාර්ය උදෙසා යෙදවීම මගින් පොළොන්නරුව සංවර්ධන සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කර ගැනීමට මග සැලසෙනු ඇත.

පාඨලී චම්පික රණවක
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය

ගරු සභාපතිතුමාගේ පණිවුඩය



වර්තමානය වන විට නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකාවේ නාගරික සැලසුම් සකස් කිරීමට හා එම සැලසුම් ක්‍රියාත්මක කිරීමට ඇති ප්‍රධානතම ආයතනය වන අතර නාගරික පරිසරය ගුණාත්මක ලෙස කළමනාකරණය කිරීමේ වගකීමද එසේම පැවරී ඇත. 1978 වර්ෂයේදී මෙම ආයතනය ස්ථාපිත කිරීමේ පරමාර්ථය වී ඇත්තේ ඒකාබද්ධ සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම තුලින් නාගරික ප්‍රදේශවල හා එහි ජනතාවගේ පොදු යහපැවැත්ම ප්‍රවර්ධනය හා නියාමනය කිරීමයි.

1982 අංක 4 දරණ සංශෝධිත පනතෙහි (II කොටස 8 වන වගන්තිය 8 අ [I]) අනුව අමාත්‍යවරයා විසින් නාගරික සංවර්ධන ප්‍රදේශයන් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයන්හි සංවර්ධන සැලසුම් සකස් කිරීම අත්‍යාවශ්‍ය කරුණක්ව ඇත. පොළොන්නරුව කලාපය සඳහා සකස් කරනු ලැබූ සංවර්ධන සැලැස්ම සකස් කිරීම හා බලාත්මක කිරීම, එම විධිවිධාන යටතේ සිදු කර ඇත. පොළොන්නරුව ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස නාගරික සංවර්ධන අධිකාරිය පොළොන්නරුව නගරය හා ඒ අවට ප්‍රදේශයන්හි භෞතික, ආර්ථික, සාමාජීය හා පාරිසරික කරුණු සැලකිල්ලට ගෙන පොළොන්නරුව සංවර්ධන සැලැස්ම අවසන් කර ඇත.

මෙම සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී, අපගේ ගමන් මාර්ගය සුමට නොවන අතර, අභියෝග පිරුණු, අවිනිශ්චිතයන්ගෙන් සැදි විෂම බලාපොරොත්තුවලින් අපවිත්‍ර වූ කටුක ගමන් මාර්ගයක් බව අප අමතක කර නොමැත. නාගරික සංවර්ධන අධිකාරිය වර්තමානයේ අවශ්‍ය පද්ධති, මෙවලම්, හා ක්‍රමෝපායන් තුලින් සන්නද්ධව අභියෝගයන් සඳහා මුහුණ දීමටත්, අවිනිශ්චිතභාවයට ඔරොත්තු දීම මගින් පොළොන්නරුව නගරය “සහල් රාජධානියේ මහීමාන්විත උරුමයේ හරිත නගරය” බවට පත් කිරීමට අධිෂ්ඨාන කොට ගෙන සිටියි.

මෙම පුළුල් කාර්ය සාර්ථකව ඉටු කර ගැනීම සඳහා කැපවීමෙන් හා වෙහෙස මහන්සි වී වැඩකටයුතු කරන නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම හා නන් අයුරින් සහයෝගය දැක්වූ සැමට මාගේ හෘදයාංගම කෘතවේදීත්වය පිරිනැමීම සඳහා මෙය අවස්ථාවක් කර ගන්නා අතර මෙම සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා මේ හා සමාන සහයෝගය ඉදිරියටත් බලාපොරොත්තු වෙමි.

ජගත් මුණසිංහ
සභාපති
නාගරික සංවර්ධන අධිකාරිය

පොළොන්නරුව ගරු නගරාධිපතිතුමාගේ පණිවුඩය.



ශ්‍රී ලංකාවේ දෙවන රාජධානිය ලෙස ප්‍රෞඩ හා සශ්‍රීක ඉතිහාසයකට උරුමකම් කියන පොළොන්නරුව නගරය වර්තමානයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ "පිබිදෙමු පොළොන්නරුව" දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන යටතේ සීඝ්‍ර සංවර්ධනයක් ළඟා කර ගනිමින් පවතී. එමෙන්ම, "සුවපහසු දිවියකට තිරසර පුරවරයක්" යන දැක්ම පෙරදැරි කරගෙන පොළොන්නරුව මහනගර සභාවද විශේෂ ව්‍යාපෘති ගණනාවක් ආරම්භ කර ඇත.

එවන් වූ පසුබිමක ප්‍රදේශයේ ගැටළු හා සංවර්ධන විභවතා විශ්ලේෂණය කරමින් නාගරික සංවර්ධන අධිකාරිය විසින් "සහල් රාජධානියේ මහිමාන්විත උරුමයේ හරිත නගරය" යන දැක්මෙන් ඉදිරි වසර 11 ක කාලය සඳහා මෙම සැලැස්ම සකස් කර ඇත.

එම සැලැස්මෙන් පාරිසරික සංවේදී කලාප හා පාරිසරික සුන්දරත්වය රැක ගැනීමත්, පොළොන්නරුව අනන්‍යතාවය ඉස්මතු කර ගනිමින් නව ආර්ථික අවස්ථා සම්පාදනය කිරීමත් අරමුණු කොටගෙන ඇත. කාලෝචිත මෙන්ම ප්‍රායෝගික සැලැස්මක් සැකසීම පිළිබඳ නාගරික සංවර්ධන අධිකාරියට මාගේ ස්තුතිය පුදු කරන අතර, "සුවපහසු දිවියකට තිරසාර පුරවරයක්" දැක්ම ළඟා කර ගැනීමේදී මෙම සැලැස්ම මග පෙන්වනු ඇතැයි විශ්වාස කරමි.

චානක සිදත් රණසිංහ
නගරාධිපති
පොළොන්නරුව මහනගර සභාව

පොළොන්නරුව ප්‍රාදේශිය සභා ගරු සභාපතිතුමාගේ පණිවුඩය



පොළොන්නරුව යනු සුන්දරත්වයෙන් පරිපූර්ණ ඓතිහාසික නගරයකි. එහි ජීවත් වන සියලු ජනතාව තෘප්තිමත් ප්‍රජාවක් බවට පත් කිරීමේ දැක්ම පෙරදැරි කරගෙන පොළොන්නරුව ප්‍රාදේශීය සභාව කටයුතු කරමින් පවතී.

ප්‍රදේශයේ අනන්‍යතාව රැකගනිමින් ජනතාවගේ සුභසාධනය, සුඛවිහරණය වැඩිදියුණු කිරීම වස් "සහල් රාජධානියේ මහිමාන්විත උරුමයේ හරිත නගරය" යන දැක්මෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් පොළොන්නරුව නාගරික කලාපය වෙත සැලැස්මක් සකස් කොට කාලීන අවශ්‍යතාවයන් ඉටුකර ඇති බව දැකිය හැකිය.

නගරයේ පවතින ගැටළු හා ඒවා විසඳීම සඳහා ඇති ධනාත්මක විභවතාවන් සැලකිල්ලට ගනිමින් සකස් කර ඇති මෙම සැලැස්මෙන් නගරයේ ආර්ථිකය සංවර්ධනය කිරීම කෙරෙහි මූලිකත්වය දෙන අතර, පාරිසරික සමබරතාවය පවත්වාගැනීමද සැලකිල්ලට ගෙන තිබීම භාග්‍යයකි. පොළොන්නරුව නගර සංවර්ධන සැලැස්ම **2030** තුළින් ප්‍රදේශයේ ජනතාව සංවර්ධනයේ නිවැරදි මාවතකට යොමු කර ගැනීම සඳහා අවස්ථාව සැකසූ නාගරික සංවර්ධන අධිකාරියට අපගේ සුභාශිංසනය පිරිනමනු කැමැත්තෙමි.

එසේම, නව සංවර්ධන දැක්මක් හා කාලෝචිත සංවර්ධන අභිමතාර්ථයන් පෙරදැරි කර ගනිමින් අනාගත ලෝකයට පියනගන ගමනේදී පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ උපරිම සහයෝගය ලබා දීමට බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරනු කැමැත්තෙමි.

ප්‍රේමසිරි මුණසිංහ
සභාපති
පොළොන්නරුව ප්‍රාදේශීය සභාව

ස්තුතිය.!

පොළොන්නරුව නගරයේ ඓතිහාසික ප්‍රෞඩත්වය සහ සෞභාග්‍ය නැවත ඇති කිරීමේ රිසියෙන් වඩාත් ප්‍රයෝගික වූ නගර සංවර්ධන සැලැස්මක් සැකසීමේ අවශ්‍යතාවය පෙන්වා දුන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති, මෛත්‍රීපාල සිරිසේන මැතිඳුන්ට අපගේ ගෞරව පූර්වක ස්තුතිය මූලිකව පිරිනැමේ. මෙම සංවර්ධන සැලැස්ම විධිමත්ව හා සාර්ථකව සම්පාදනය කිරීම උදෙසා, විධිමත්ව සංවර්ධන සැලසුම් සකස්කිරීමේ අවශ්‍යතාවය නිවැරදිව අවබෝධ කරගනිමින්, ඒ සඳහා අවශ්‍ය මහපෙන්වීම හා නන් අයුරින් සහාය ලබාදුන් මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ ගරු අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමන්ට සැලසුම් කණ්ඩායමේ ගෞරවය පිරිනැමේ.

විශේෂයෙන්ම පොළොන්නරුව නගර සභාවේ කොමසාරිස්තුමා මෙන්ම නගරාධිපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා සහ ලේකම්තුමිය ඇතුළු කාර්යමණ්ඩලයටත්, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම් තුමා ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයටත් මෙම සැලැස්ම සාර්ථකව නිර්මාණය කිරීම උදෙසා නොමසුරුව ලබාදුන් සහාය වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරියේ විශේෂ ගෞරවය හා හෘදයාංගම ස්තුතිය පිරිනැමේ.

විශේෂයෙන්ම පොළොන්නරුව නගරයේ නගරවාසීන්, දෛනික සංක්‍රමණික ජනතාව, ව්‍යාපාරික ප්‍රජාව, සංචාරකයින් සහ පොළොන්නරුව අලංකාර සුවපහසු නගරයක් කර ගැනීමේ චේතනාවෙන් අපට සහාය දුන් නාගරික කලාපයේ ග්‍රාම නිලධාරීවරුන් හට අපගේ ගෞරව පූර්වක ස්තුතිය පිරිනැමේ. එමෙන්ම, මෙම සැලැස්ම සම්පාදනය කිරීමේදී ඒ සඳහා අවශ්‍ය දත්ත, උපදෙස් හා දැනුම ලබාදෙමින් දැක්වූ සහයෝගය වෙනුවෙන් රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනවලට නාගරික සංවර්ධන අධිකාරියේ විශේෂ ගෞරවය පිරිනැමේ.

විශේෂයෙන්ම නාගරික සංවර්ධන අධිකාරිය මගින් සකස්කරනු ලබන සංවර්ධන සැලසුම් නව මුහුණුවරකින් හා ගැඹුරු තාක්ෂණික හා ප්‍රයෝගික අධ්‍යනයන්ගේ ප්‍රතිඵල තුලින් නිර්මාණය විය යුතුය යන්න කෙරෙහි මූලික අවධානය යොමු කරමින් කටයුතු කළ නාගරික සංවර්ධන අධිකාරියේ ගරු සභාපති ආචාර්ය ජගත් මුණසිංහ මහතාට කෘතඥතාපූර්වක ස්තුතිය පිරිනැමේ. එමෙන්ම නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජෙනරාල්තුමන්ට සහ නාගරික සංවර්ධන අධිකාරියේ අතිරේක අධ්‍යක්ෂ ජෙනරාල්තුමාටද , නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල්තුමන්ටද, නාගරික සංවර්ධන අධිකාරියේ සංවර්ධන සැලසුම් අංශයේ අධ්‍යක්ෂතුමාටද මෙම සංවර්ධන සැලැස්ම සකස්කිරීමේදී ලබාදුන් අප්‍රතිහත ධෛර්ය, මගපෙන්වීම හා සුහදශීලි සහයෝගය දැක්වීම වෙනුවෙන් සැලසුම් කණ්ඩායමේ කෘතඥතාව පිරිනැමේ.

එමෙන්ම නාගරික සංවර්ධන අධිකාරියේ පරිසර හා භූ දර්ශන අංශයේ අධ්‍යක්ෂකතුමිය ඇතුළු කාර්ය මණ්ඩලයට, භූ ගෝලීය හා තොරතුරු පද්ධති අංශයේ අධ්‍යක්ෂකතුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටද, සහ නාගරික සංවර්ධන අධිකාරියේ අනෙකුත් සියලුම අංශවල ප්‍රධානීන් ප්‍රමුඛ නිලධාරී මණ්ඩලයට සැලසුම් කණ්ඩායමේ විශේෂ ගෞරවය හා ස්තුතිය පිරිනැමේ. තවද බස්නාහිර පළාත් අංශයේ සියලුම කාර්යමණ්ඩලයට මෙම සැලැස්ම සාර්ථක කරගැනීම සඳහා දැක්වූ සහයෝගය වෙනුවෙන් සැලසුම් කණ්ඩායමේ විශේෂ ස්තුතිය පිරිනැමේ.

පටුන

පෙරවදන III
ගරු ඇමතිතුමාගේ පණිවුඩය IV
ගරු සභාපතිතුමාගේ පණිවුඩය.....V
ගරු නගරාධිපතිතුමාගේ පණිවුඩය.....VI
ගරු ප්‍රාදේශීය සභා සභාපතිතුමාගේ පණිවුඩය VII
ස්තුතිය VIII
පටුන IX
සිතියම් ලැයිස්තුව.....XII
සංඛ්‍යාලේඛණ / පින්තූර ලැයිස්තු..... XIII
වගු ලැයිස්තුව.....XV
ඇමුණුම් ලැයිස්තුව XVI
කෙටි යෙදුම් XVIII

පළමු කොටස

1. හැඳින්වීම.....1
1.1 සංවර්ධන සැලැස්මේ පසුබිම.....2
1.2 සැලසුම් කණ්ඩායම.....3
1.3 සංවර්ධන සැලැස්මේ විෂය පථය.....5
1.4 සැලසුම් ක්‍රියාවලිය.....6

2. පූර්ව සමීක්ෂණ.....11
2.1 අධ්‍යයන ප්‍රදේශය.....9
2.2 ප්‍රදේශයේ සැලසුම්කරණ සන්දර්භය හා අවස්ථානුගත තත්වය 14
2.2.1 ජාතික වැදගත්කම 18
2.2.2 දැනට ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන් 19
2.2.3 දිස්ත්‍රික් වාණිජ පරිපාලන හා සේවා මධ්‍යස්ථානය ලෙස 19
2.2.4 ජන විකාශ තොරතුරු 19
2.2.5 නිවාස 20
2.2.6 නගරයේ ආර්ථිකය 20
2.2.7 ජල සම්පාදනය 20
2.2.8 විදුලි බල හා විදුලි සංදේශ 21
2.2.9 සෞඛ්‍යය 21
2.2.10 අධ්‍යාපනය 22
2.2.11 නගරයේ භූමි පරිහරණය 22

2.3 සැලසුම් සීමාව නිර්ණය කිරීම 23
2.3.1 නගරයේ ක්‍රියාකාරී කලාපය.....23
2.3.2 භූගෝලීය ලක්ෂණ.....23
2.3.3 පරිපාලන කොට්ඨාශ.....24

3. සංවර්ධන සැලසුමේ අවශ්‍යතාවය.....31

දෙවන කොටස

4. සංවර්ධන සැලැස්ම සැකසීම.....39

4.1 දැක්ම.....40
4.2 දැක්ම ප්‍රකාශනය.....40
4.3 ඉලක්ක 41
4.4 අරමුණු 41

5. "ශදුඅත" සහ විස්තරාත්මක විශ්ලේෂණය.....43

5.1 පළමු ඉලක්කය සඳහා "ශදුඅත" විශ්ලේෂණය 45
5.2 දෙවන ඉලක්කය හා "ශදුඅත" විශ්ලේෂණය.....69
5.3 තෙවන ඉලක්කය හා "ශදුඅත" විශ්ලේෂණය.....73

6. සංවර්ධන සැලැස්ම 85

6.1 හඳුන්වා දීම 86
6.2 සංකල්පිත සැලැස්ම.....87
6.3 යෝජිත භූමි පරිහරණ සැලැස්ම.....90
6.4 උපාය මාර්ග 94

6.4.1 ප්‍රධාන ආර්ථික ක්‍රියාවලිය හා අනාගත ප්‍රවණතා හඳුනා ගැනීම 94
6.4.1.2 යෝජිත ආර්ථික ක්‍රමෝපාය සැලැස්ම 95

6.4.2. සංස්කෘතික හා උරුම කළමනාකරණ උපායමාර්ගය 110
6.4.2.1. උරුම ප්‍රදේශ 110
6.4.2.2. සංස්කෘතික හා උරුම කළමණාකරණ උපාය මාර්ගයට අදාළ ඉලක්ක 111
6.4.2.3. යෝජිත සංස්කෘතික හා උරුම කළමනාකරණ උපාය මාර්ගික සැලැස්ම 111

6.4.3. සමාජ හා භෞතික යටිතල පහසුකම් සංවර්ධන උපාය මාර්ග 121
6.4.3.1. සේවා සැලැස්ම 121
6.4.3.2. උපාය මාර්ගික ප්‍රවාහන සැලැස්ම 128
6.4.3.3. ජල සැපයුම් උපාය මාර්ගික සැලැස්ම 134
6.4.3.4 විදුලි බල හා දත්ත රේඛා 137
6.4.3.5 ජලාපවහන හා මලාපවහන මාර්ග සඳහා උපායමාර්ගික සැලැස්ම 137
6.4.3.6. අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම 139

6.4.4. පාරිසරික තිරසාර උපායමාර්ග 142
6.4.4.1. සංරක්ෂණ සැලැස්ම 142
6.4.4.2. භූ දර්ශණ කළමණාකරණ සැලැස්ම 143
6.4.4.3. පොදු විවෘත අවකාශ සැලැස්ම 145
6.4.4.4. 2030 දී පොදු එළිමහන් විනෝදාත්මක අවකාශ (PORS) සැලැස්ම සකස් කිරීම 146
6.4.4.5. ආපදා අවධානම් කළමනාකරණ සැලැස්ම 153
6.4.4.6. කෘෂිකාර්මික සැලැස්ම 156

6.5. වෙනත් උපායමාර්ග අතර සම්බන්ධතා 159
6.6 ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගය..... 160
6.6.1. උපායමාර්ගික ක්‍රියාකාරී ව්‍යාපෘති 161
6.6.1.1. පළමු ප්‍රමුඛතා ව්‍යාපෘති 166
6.6.1.2. දෙවන ප්‍රමුඛථා ව්‍යාපෘති 169
6.6.1.3. තෙවන ප්‍රමුඛතා ව්‍යාපෘති 171
6.6.1.4. තෝරාගත් උපායමාර්ගික ව්‍යාපෘති කිහිපයක් 172

7. ඇමුණුම් 213

සිතියම් / රූප / වගු ලැයිස්තුව

සිතියම් ලැයිස්තුව

සිතියම 2.1	සැලසුම් කලාපයේ ස්ථානීය පිහිටීමේ සිතියම	13
සිතියම 2.2	දිස්ත්‍රික්කයේ නිවාස ව්‍යාප්තියේ රටාව සහ ඒවායේ සම්බන්ධතාවය	24
සිතියම 2.3.	ග්‍රාම නිලධාරී මායිම් හා සැලසුම් සීමාව	25
සිතියම 2.4.	මාර්ගජාල ප්‍රමුඛතාව අනුව ප්‍රදේශයේ ඒකාබද්ධතාව.	26
සිතියම 2.5.	පාරසරික සංවේදී ප්‍රදේශ	27
සිතියම 2.6.	විභවතාව විශ්ලේෂනය	28
සිතියම 2.7.	නේවාසික යෝග්‍යතා විශ්ලේෂණය	29
සිතියම 5.1	පොළොන්නරුව මහනගර සභාවේ ඝන අපද්‍රව්‍ය එකතු කිරීමේ මාර්ග	76
සිතියම 5.2	ජලාපවහන පද්ධතිය	79
සිතියම 6.1	සංකල්පිත සැලැස්ම	89
සිතියම 6.2	යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම 2030	93
සිතියම 6.3	සංචාරක කලාපයේ යෝජිත ව්‍යාපෘති - 2030	99
සිතියම 6.4	විනෝදය සඳහා වූ කුඹුරු ඉඩම හා නැරඹුම් පීඨිකාව	101
සිතියම 6.5	වාරිමාර්ග කෞතුකාගාරය, පැරණි වී ගම්මානය සහ වී කෞතුකාගාරය	103
සිතියම 6.6	නගරයේ විකල්ප සංචාරක මාර්ග	105
සිතියම 6.7	යෝජිත ආර්ථික ව්‍යාපෘති	109
සිතියම 6.8	සංස්කෘතික හා උරුම සැලැස්ම	120
සිතියම 6.9	පොළොන්නරුවේ සෞඛ්‍ය ආයතන	123
සිතියම 6.10	යෝජිත සේවා සැලැස්ම	125
සිතියම 6.11	ජනාවාස සැලැස්ම	127
සිතියම 6.12	උපායමාර්ගික සේවා සැලැස්ම	133
සිතියම 6.13	පොළොන්නරුව සැලසුම් ප්‍රදේශයේ වර්තමාන ජල සැපයුම	135
සිතියම 6.14	ජල සැපයුම් සැලැස්ම	136
සිතියම 6.15	ජලාපවහන උපායමාර්ගික සැලැස්ම	139
සිතියම 6.16	අපද්‍රව්‍ය පිරිපහදු මධ්‍යස්ථානය	141
සිතියම 6.17	2030 දී පොදු එළිමහන් විනෝදාත්මක අවකාශීය (PORS)සැලැස්ම	148
සිතියම 6.18	යෝජිත ආපදා අවදානම් අවම කිරීමේ කලාපකරණය	155
සිතියම 6.19	කෘෂිකාර්මික සැලැස්ම	158

රූප සටහන් ලැයිස්තුව

රූපය 1.1	සැලසුම් ක්‍රියාවලිය	06
රූපය 2.1	පැරණි නගරය සංකල්පීය සැලැස්ම (A.D.N.ප්‍රනාන්දු, 1978)	16
රූපය 5.1	ශ්‍රී ලංකාවේ යුනෙස්කෝ ලෝක උරුම	47
රූපය 5.2	ශ්‍රී ලංකාවේ එල්ලංගා වැව් ගම්මාන පද්ධතියේ සංරචක සහ ඒවායේ සාපේක්ෂ පිහිටීම්	48
රූපය 5.3	පොළොන්නරුව පූජනීය නගරයේ පුරාවිද්‍යා නටබුන් සිතියම	50
රූපය 5.4	පරාක්‍රමබාහු රජුගේ රාජකීය ශ්‍රවණාගාරය	52
රූපය 5.5	නිශ්ශංකලතා මණ්ඩපය	52
රූපය 5.6	පොළොන්නරුව සඳකඩ පහන	53
රූපය 5.7	පරාක්‍රමබාහු රජුගේ සත්මහල් මාළිගාව	53
රූපය 5.8	පරාක්‍රමබාහු රජුගේ යුගයේ අක්ෂර	53
රූපය 5.9	පරාක්‍රමබාහු රජුගේ කාසි	54
රූපය 5.10	පොළොන්නරුව චතුරස්‍රය	54
රූපය 5.11	නාගරික මධ්‍යස්ථානය සඳහා සංවර්ධන සංකල්පය	55
රූපය 5.12	ශ්‍රී ලංකාවේ විදේශීය සංචාරකයින් අතර සුප්‍රසිද්ධ ගමන් මාර්ග	56
රූපය 5.13	ශ්‍රී ලංකාවේ සංචාරක නවාතැන් පිහිටීම	56
රූපය 5.14	ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනය 2016 මහා කන්නය	57
රූපය 5.15	නගරයට ආසන්නයේ ඇති ජාතික වනෝද්‍යාන	58
රූපය 5.16	නාගරික ප්‍රදේශය තුළ සුන්දර ස්ථාන	59
රූපය 5.17	ශ්‍රී ලංකාවේ ජාතික උද්‍යාන නැරඹීමට පැමිණෙන සංචාරකයින්	59
රූපය 5.18	මාර්ගජාලා ප්‍රමුඛතාව අනුව ප්‍රදේශයේ ඒකාබද්ධතාව.	60
රූපය 5.19	2006 සිට 2016 තෙක් සංචාරකයින්ගේ පැමිණීම (අවශ්‍යතාවය අනුව) ලෝක උරුම නගර වලට සංචාරක පැමිණීම	63
රූපය 5.20	ප්‍රධාන පෞරාණික නගරවල නරඹන්නන් සංඛ්‍යාව	63
රූපය 5.21	*2015-2016* වනවිට ගැවසීමේ පළාත් අනුව පදිංචි වීමේ අනුපාතය	64
රූපය 5.22	වියට්නාමයේ කෘෂි සංචාරක ව්‍යාපාරයේ ක්‍රියාකාරකම්	67
රූපය 5.23	තිරසාර සංවර්ධන ඉලක්ක	72
රූපය 5.24	පොළොන්නරුව මහ නගර සභාව මගින් කසල එකතු කිරීමේ ක්‍රම	75
රූපය 5.25	පානීය ජල භාවිතය	77
රූපය 5.26	දැනට පවතින අපවහන පහසුකම් පිළිබඳ ඡායාරූප	78
රූපය 5.27	මැයි සිට අගෝස්තු දක්වා නගරයේ සුළං දිශාව(යල මෝසම)	80
රූපය 5.28	තාප දූපත් බලපෑමේ පැතිකඩ	81

රූපය 6.1	A සිට B දක්වා පැතිකඩ	90
රූපය 6.2	C සිට D දක්වා පැතිකඩ	91
රූපය 6.3	E සිට F දක්වා පැතිකඩ	92
රූපය 6.4	නගරයේ හරස්කඩ සඳහා මූලාශ්‍ර සිතියම	92
රූපය 6.5	සොබාදහම සමඟ මුසු වූ උගා හෝටලය, යාල, ශ්‍රී ලංකා	97
රූපය 6.6	පරාක්‍රම සමුද්‍රයේ මසුන් ඇල්ලීම	97
රූපය 6.7	නුවරඑළියෙහි ග්‍රෙගරි විලේ හංස බෝට්ටු සේවාව	97
රූපය 6.8	බයිසිකල් හුවමාරු කිරීමේ ස්ථාන	98
රූපය 6.9	විස්කොසන් (හේවුඩ්) මිරිදිය මත්ස්‍ය මධ්‍යස්ථානයේ ඡායාරූපය	100
රූපය 6.10	ළමයින් මිරිදිය මසුන් ඇල්ලීමේ කඳවුර	100
රූපය 6.11	වියට්නාමයේ කෘෂි සංචාරක විනෝදාත්මක කටයුතු	101
රූපය 6.12	සංචාරක විනෝදය සඳහා වූ නැරඹුම් පීඨිකාව	102
රූපය 6.13	ජපානයේ ඉනාකාඩේට් ගම්මානයේ වී කලාව	103
රූපය 6.14	මධ්‍යම සංස්කෘතික අරමුදල් පර්යේෂණ වාර්තාව 2010 මඟින්	112
රූපය 6.15	සංවර්ධනය කළ යුතු ප්‍රවේශ ස්ථාන සහ ප්‍රධාන මංසන්ධි	113
රූපය 6.16	පොළොන්නරුවේ මංසලකුණු ලෙස සංවර්ධනය කළ යුතු ප්‍රවේශ	114
රූපය 6.17	පාපැදි හිතකාමී යටිතල පහසුකම්	115
රූපය 6.18	පරාක්‍රම සමුද්‍ර බැම්මේ සූර්ය ආලෝකකරණ පහසුකම්	115
රූපය 6.19	උල්පොත ගම්මානය (දඹුල්ල)	117
රූපය 6.20	පොළොන්නරුව පූජනීය නගරයේ නටඹුන්	119
රූපය 6.21	පදිකයින්ට පහසුකම් සැලසීම	131
රූපය 6.22	යෝජිත කදුරුවෙල විකල්ප මාර්ගය සහ වාහන නැවැත්වීමේ ස්ථාන	132
රූපය 6.23	ගල්ලැල්ල පටු පාලම	132
රූපය 6.24	එළිමහන් අවකාශය සහ ගොඩනැඟිලි වෘක්ෂලතා මඟින් ආවරණය	144
රූපය 6.25	හරිත ආවරණ ගොඩනැගිලි ඇතුළත හා පිටත	144
රූපය 6.26	වහලයේ මුදුනේ වෘක්ෂලතා ආවරණය	144
රූපය 6.27	ගොඩනැඟිල්ලේ ඉදිරිපස වෘක්ෂලතා ආවරණය	144
රූපය 6.28	කුඹුරුවල සිට A 11 මාර්ගය දක්වා හරස් මාර්ග 04 ක්	144
රූපය 6.29	කදුරුවෙල නාගරික උද්‍යානයේ ස්ථානීය සිතියම	149
රූපය 6.30	නාගරික උද්‍යාන සඳහා උදාහරණ	150
රූපය 6.31	කදුරුවෙල නාගරික උද්‍යානයේ ස්ථානීය සිතියම	150
රූපය 6.32	ගල්ලැල්ල යෝජිත තෙත් බිම් උද්‍යානයේ ස්ථානීය සිතියම	151
රූපය 6.33	අභයභූමියේ වර්තමාන නාම පුවරුව	152
රූපය 6.34	යෝජිත තෙත් බිම් උද්‍යානයේ ඇවිදීමේ මාර්ගයට උදාහරණ	152

රූපය 6.35	මහවැලි ගඟේ බෝට්ටු ගමන් කිරීම	152
රූපය 6.36	දීප උයන ව්‍යාපෘතිය II අදියර - සංකල්පීය ප්‍රධාන සැලැස්ම	152
රූපය 6.37	දීප උයන ව්‍යාපෘතිය II අදියර - සංකල්පීය අංශ සැලැස්ම	153

වගු ලැයිස්තුව

වගුව 5.1	පළමු ඉලක්කය සඳහා "ශුද්ධත" විශ්ලේෂණය	45
වගුව 5.2	පොළොන්නරුව වෙත සංචාරකයින්ගේ පැමිණීම	56
වගුව 5.3	ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනය 2016	57
වගුව 5.4	හෙක්ටයාරයකට සාමාන්‍ය වී අස්වැන්න	58
වගුව 5.5	ජාත්‍යන්තරය සඳහා ඉල්ලුම	67
වගුව 5.6	දෙවන ඉලක්කය හා "ශුද්ධත" විශ්ලේෂණය	69
වගුව 5.7	තෙවන ඉලක්කය හා "ශුද්ධත" විශ්ලේෂණය	73
වගුව 5.8	පොළොන්නරුව මහ නගර සභාවේ ඝණ අපද්‍රව්‍ය එකතුකිරීමේ ගමන් මාර්ගය	76
	පොළොන්නරුව නාගරික ප්‍රදේශය තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිදු කරන ජල සැපයුම.	83
වගුව 6.1	ආර්ථිකයට අදාළ අනාවැකි	95
වගුව 6.2	පවතින එළිමහන් විනෝද කටයුතු අවකාශ 2018	145
වගුව 6.3	යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු අවකාශීය සැලැස්ම 2019 – 2030	146
වගුව 6.4	උපායමාර්ගික ක්‍රියාකාරී ව්‍යාපෘති	161-165
වගුව 6.5	පළමු ප්‍රමුඛතා ව්‍යාපෘති	166-168
වගුව 6.6	දෙවන ප්‍රමුඛතා ව්‍යාපෘති	169-170
වගුව 6.7	තෙවන ප්‍රමුඛතා ව්‍යාපෘති	171

ඇමුණුම් ලැයිස්තුව

ඇමුණුම 01:	අනුමත පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘති 2017	214
ඇමුණුම 02:	පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මාසික වර්ෂාපතනය 2009-2015	215
ඇමුණුම 03:	පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මාසික උෂ්ණත්වය 2010-2015	215
ඇමුණුම 04:	පොළොන්නරුව නාගරික කලාපයේ බෑවුම් සිතියම	216
ඇමුණුම 05:	උතුරුමැද පළාත් නාගරික ධූරාවලිය	217
ඇමුණුම 06:	පොළොන්නරුව නගරයේ පෝෂක ප්‍රදේශය	217
ඇමුණුම 07:	නාගරික කලාපයේ සෞඛ්‍ය ආයතන	218
ඇමුණුම 08:	ශ්‍රී ලංකාවේ ජනගහන ව්‍යාප්තිය 2012 (දිස්ත්‍රික්ක අනුව)	219
ඇමුණුම 09:	ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධනය 1981-2012	220
ඇමුණුම 10:	සැලසුම් කලාපයේ ආගමික සිද්ධස්ථාන ව්‍යාප්තිය 2018	221
ඇමුණුම 11:	ධරිද්‍රතා දර්ශකය අංශ, පළාත් හා දිස්ත්‍රික්කය අනුව	222
ඇමුණුම 12:	සැලසුම් කලාපයේ පවුලක මාසික ආදායම 2017	
ඇමුණුම 13:	විවිධ රැකියා අංශවලට අනුව සේවා නියුක්තිය	223
ඇමුණුම 14:	සැලසුම් කලාපයේ රැකියාවන් බෙදී යාම අංශ අනුව	223
ඇමුණුම 15:	ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අනුව විරැකියා මට්ටම 2011-2016	224
ඇමුණුම 16:	ආර්ථිකමය වශයෙන් ක්‍රියාකාරී ජනගහනය - දිස්ත්‍රික්ක අනුව 2016	225
ඇමුණුම 17:	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිදු කරන ජල සැපයුම 2018	226
ඇමුණුම 18:	සැලසුම් කලාපයේ ජලවහන රටාව 2018	227
ඇමුණුම 19:	සැලසුම් කලාපයේ විදුලි සැපයුම 2018	228
ඇමුණුම 20:	සැලසුම් ප්‍ර දේශය තුළ ඉඩම් වටිනාකම 2018	229
ඇමුණුම 21:	සැලසුම් කලාපයේ පාසල් සහ වෙනත් අධ්‍යාපනික ආයතන	230
ඇමුණුම 22:	සැලසුම් කලාපයේ භූමි පරිහරණය	231
ඇමුණුම 23:	පොළොන්නරුවට සංචාරක පැමිණීම 2017	232
ඇමුණුම 24:	පවතින මාර්ගජාලය හා වාහන තදබදය 2018	233
ඇමුණුම 25:	සැලසුම් කලාපයේ පවතින උද්‍යාන සහ ක්‍රීඩා පිටිටනි 2018	234
ඇමුණුම 26:	යෝජිත පොදු එළිමහන් විනෝදාත්මක අවකාශීය සැලැස්ම 2030	235
ඇමුණුම 27:	පූජා නගරයේ යෝජිත යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය	236-245
ඇමුණුම 28:	NVIVO විශ්ලේෂණ වාර්ථාව පාර්ශවකරුවන්ගේ පළමු රැස්වීම 2017.10.13	246-254

සංක්ෂිප්ත වචන

නා.සං. අ.	- නාගරික සංවර්ධන අධිකාරිය
ග්‍රා.නි.	- ග්‍රාම නිලධාරි අංශය
ජා. භෞ. සැ. දෙ.	- ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව
ප්‍රා.ලේ. කා.	- ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
ම. සං. අ.	- මධ්‍යම සංස්කෘතික අරමුදල
ජා.ජ.ජ.ම.	- ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
පො.ම.න.ස.	- පොළොන්නරුව මහ නගර සභාව
පො.ප්‍රා.ස.	- පොළොන්නරුව ප්‍රාදේශීය සභාව

පරිච්ඡේදය 01 : හැඳින්වීම



1. හැඳින්වීම

1.1. සංවර්ධන සැලැස්මේ පසුබිම

නාගරික සංවර්ධන අධිකාරිය යනු ශ්‍රී ලංකාවේ නාගරික සංවර්ධනයේ නියාමක යන්ත්‍රයයි. එලෙස 1978 අංක 47 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනත මඟින් එය රටේ නාගරික සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන ආයතනය ලෙසින් ක්‍රියා කිරීමට බලායනය කර ඇත. 1982 අංක 4 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනතේ 8 වෙනි වගන්තිය යටතේ අධිකාරිය සමඟ අත්පත් කර ගත් බලතල හා කාර්යයන්ට අනුව පොළොන්නරුව නාගරික සංවර්ධන සැලැස්ම ප්‍රකාශනය කර ඇත. අධිකාරියේ මෙහෙවර වනුයේ ප්‍රකාශිත නාගරික ප්‍රදේශවල ආර්ථික, සාමාජීය, පාරිසරික හා භෞතික සංවර්ධනය ක්‍රියාත්මක කිරීම, සමෝධානිත සැලසුම් කිරීම හා දියුණු කිරීමයි. ඉහත අපේක්ෂිතයන් මෙම සංවර්ධන සැලැස්ම සැකසීමේ ප්‍රධාන අභිප්‍රායන් රාමුගත කරයි.

මෙම සංවර්ධන සැලැස්මේ අධ්‍යයන ප්‍රදේශය ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පොළොන්නරුව මහ නගර සභාවෙහි සහ පොළොන්නරුව ප්‍රාදේශීය සභා සීමාවේ ඇති තෝරාගත් ග්‍රාම නිළධාරි කොට්ඨාශ 34 ක් තුළ පිහිටා ඇත. මුල් වරට 1979 ජූනි 10 දින ප්‍රකාශිත අංක 38/16 දරණ අතිවිශේෂ ගැසට් පත්‍ර ප්‍රකාශනයේ පොළොන්නරුව නගරසභා සීමාව (Town Council Area) නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇත.නැවතත් 2005.06.13 දින අංක 1397/1 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් තමන්කඩුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් වර්ග කිලෝමීටර 56.7 ක් එනම් ග්‍රාම නිලධාරී වසම් 22 ක් නාගරික කලාපය ලෙස සංශෝධනය කරන ලදි. එබැවින්, වසර 2008 සිට 2018 දක්වා කාලය සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් කෙටුම්පත් කරන ලද සංවර්ධන සැලැස්මක් මෙම ප්‍රදේශය තුළ ක්‍රියාවට නංවන ලදි.

මෑත කාලීනව 2016.12.19 දින ගැසට් ප්‍රකාශනය මඟින් තමන්කඩුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය, පොළොන්නරුව මහනගර සභාව හා පොළොන්නරුව ප්‍රාදේශීය සභාව ලෙස පලාත් පාලන ආයතන දෙකකට බෙදා වෙන් කෙරිණි. නගරයේ පරිපාලන සීමා වෙනස් වීමත්, සංවර්ධන නැඹුරුතාව හා සංවර්ධනයේ බලපෑම විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2018 වර්ෂයේ නාගරික සීමාව පුළුල් කිරීමට ලක් කරන ලදි.එනම්, මහනගර සභා බල ප්‍රදේශය සම්පූර්ණයෙන් හා (ග්‍රාම නිලධාරී වසම් 16) පොළොන්නරුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් (ග්‍රාම නිලධාරී වසම් 18) නාගරික කලාපය බවට නම් කරන ලදි. මෙම 2018 – 2030 සංවර්ධන සැලැස්මේ සැලසුම් සීමාව ලෙස තෝරාගෙන ඇත්තේ එම ප්‍රදේශයයි.

2018 – 2030 කාල පරිච්ඡේදය සඳහා පොළොන්නරුවේ නාගරික ප්‍රදේශය තුළ භෞතික සංවර්ධන සැලසුම් කිරීම සඳහා වූ සමස්ත රාමුව වාර්තාවේ අන්තර්ගතයි. එබැවින්, පොළොන්නරුව නාගරික ප්‍රදේශය තුළ ඉඩම් හා ගොඩනැගිලි වල භෞතික සංවර්ධන හා ඒකාබද්ධ සැලසුම්කරණය ප්‍රවර්ධනය කිරීමට හා බලාත්මක කිරීමටත් පොළොන්නරුවේ සංක්‍රමණික ජනතාවට හා පදිංචි කරුවන්ගේ සුභසෙත උදෙසා යටිතල පහසුකම් හා සම්බන්ධ සේවා සහ පහසුකම් ස්ථාපනය කිරීමට ත් **2030** පොළොන්නරුව සංවර්ධන සැලසුම තුළ විධිවිධාන සලසා ඇත.

මෙම සංවර්ධන සැලැස්ම ඉදිරි වසර දහයක් සඳහා බලාත්මක අතර, ඉන්පසු අවශ්‍ය යාවත්කාලීන කිරීම් හා සංශෝධනයන් වලට ලක් කළ යුතුව තිබේ.

1.2. සැලසුම් කණ්ඩායම

ප්‍රධාන පාර්ශවකරුවන්

- පොළොන්නරුව මහ නගර සභාව
- පොළොන්නරුව ප්‍රාදේශීය සභාව

ප්‍රධාන උපදේශක නියෝජිත ආයතන

- ජනලේඛණ හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
- මධ්‍යම සංස්කෘතික අරමුදල
- පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය
- වාරිමාර්ග දෙපාර්තමේන්තුව
- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
- ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව
- පිබිදෙමු පොළොන්නරුව සංවර්ධන වැඩ සටහන සඳහා වූ ජනාධිපති ලේකම් කාර්යාලය
- කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
- මධ්‍යම පරිසර අධිකාරිය
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
- ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
- වන රක්ෂණ දෙපාර්තමේන්තුව
- දුම්රිය දෙපාර්තමේන්තුව
- මාර්ග සංවර්ධන අධිකාරිය
- ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

- පොළොන්නරුව ආපදා කළමණාකරන මධ්‍යස්ථානය
- ලංකා විදුලිබල මණ්ඩලය
- හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
- ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
- ශ්‍රී ලංකා පොලීසිය
- මිනින්දෝරු දෙපාර්තමේන්තුව
- කාර්මික සංවර්ධන මණ්ඩලය

අනෙකුත් අදාළ පාර්ශවකරුවන්

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පොළොන්නරුව
- උතුරු මැද පළාත් සභාව
- ගෞරවනීය වෙඩරුවේ උපාලි මහානායක හිමි, ගල්විහාර පන්සල පොළොන්නරුව
- ගෞරවනීය උඩගම ධම්මානන්ද මහානායක හිමි, ඉසිපතන පන්සල පොළොන්නරුව
- ගෞරවනීය කඳුරුවෙල ධම්මපාල මහානායක හිමි, ජයන්ති පන්සල, කඳුරුවෙල, පොළොන්නරුව
- ප්‍රධාන මෞලවි ජුම්මා පල්ලිය කඳුරුවෙල
- අගරදගුරු නෝබට් මාෂල් අන්ද්‍රාදි පියතුමා, නිර්මලී පල්ලිය, නව නගරය, පොළොන්නරුව
- දිස්ත්‍රික් අධ්‍යක්ෂක, දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පොළොන්නරුව
- ලේකම්, වාණිජ මණ්ඩලය, පොළොන්නරුව කණ්ඩායම, නාලනී ස්ටුඩියෝව, ප්‍රධාන පාර, කඳුරුවෙල
- සභාපති, සණස සමිතිය, ජය සෙවන, කඳුරුවෙල, පොළොන්නරුව
- සභාපති, ප්‍රගති ත්‍රීරෝද රථ සමිතිය, රෝහල් හන්දිය, පොළොන්නරුව
- කළමණාකරු,ලංකා බැංකු කාර්යාලය, පළාත්බද කාර්යාලය,පොළොන්නරුව, නව නගරය
- කළමණාකරු, සම්පත් බැංකුව, කඳුරුවෙල, පොළොන්නරුව
- පොළොන්නරුව නාගරික ප්‍රදේශයේ පිහිටා ඇති කුඩා පරිමාණ සහ මහා පරිමාණ සහල් මෝල්වල හිමිකරුවන්

නාගරික සංවර්ධන අධිකාරියේ පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලයේ සැලසුම් කණ්ඩායම

- න.නි.ශි. එල්.ජේ.ලියනගේ - අධ්‍යක්ෂක,උතුරු මැද පළාත
- න.නි.ශි. ඩී.බී.එස්.කේ.දිසානායක - නියෝජ්‍ය අධ්‍යක්ෂක,සැලසුම්
- න.නි.ශි.ඩබ්.ඒ.ආර්.රංජනී - නියෝජ්‍ය අධ්‍යක්ෂක,සැලසුම්
- න.නි.ශි. ටී.ජේ.කේ.ජයලත් - උපාය මාර්ග සැලසුම්කරු
- එම්.එච්.අයි.එස්.ගුණරත්න මෙනවිය - සහකාර සැලසුම් නිලධාරී
- ආර්.ඩී.එස්.සුමතිපාල මෙනවිය - බලාත්මක නිලධාරී
- එච්.එම්.ජී.බණ්ඩාර - බලාත්මක නිලධාරී

1.3 සංවර්ධන සැලසුමේ විෂය පථය

නාගරික සංවර්ධන අධිකාරිය මඟින්, නාගරික සංවර්ධන ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීම හා නියාමනය කිරීම සිදු කරනු ලබන්නේ ආර්ථික වර්ධනය සඳහා පහසුකම් සැලසීමටත්, ස්වාභාවික සහ මිනිසා විසින් ඉදි කළ උරුමයන් ආරක්ෂා කිරීම හා එමඟින් සියළුම වැසියන්ගේ ජීවිතවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමත් සඳහාමය.

එමනිසා **2030** පොළොන්නරුව නාගරික සංවර්ධන සැලැස්ම ප්‍රධාන වශයෙන් අරමුණු කර ඇත්තේ සමස්ථ සැලසුම් ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට ප්‍රදේශයේ භෞතික සැලසුම් ක්‍රියාවලිය මෙහෙයවීමටයි. භෞතික සංවර්ධනය ලෙස අදහස් කරනුයේ භූමි පරිහරණයේ වෙනස්කම්, ජනාවාසයන්හි ස්ථාපනය හා ව්‍යාප්තිය, මිනිස් ක්‍රියාකාරකම් වල පිහිටීම සහ ස්ථාන මාරුවීම, භෞතික යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම හා ස්ථාපනය කිරීම, සම්පත් හෝ උරුමයන් මූලික කොටගත් ඕනෑම ඉඩමක් වැඩි දියුණු කිරීම හෝ සංරක්ෂණය කිරීම ආදිය වේ. ප්‍රදේශයේ භෞතික පරිසරය මත සෘජු සම්බන්ධතාවයක් නොමැති වෙනත් කිසිදු සංවර්ධන කටයුත්තක් මෙම සංවර්ධන සැලැස්මේ විෂය පථය ඇතුළත ආවරණය නොකෙරෙනු ඇත.

2030 නගර සංවර්ධන සැලැස්ම සකස්කරන විට මෙතෙක් භාවිතා කළ **2008 – 2018** කෙටුම්පත් කළ සංවර්ධන සැලැස්මද සලකාබලා ඇත. එම සැලසුමේ ප්‍රධාන සැලසුම් සංකල්පය හා බොහෝ ව්‍යාපෘති ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් මෙහෙයවන “ පිබිදෙමු පොළොන්නරුව” දිස්ත්‍රික් සංවර්ධන සැලැස්ම යටතේ ක්‍රියාත්මක කිරීමට තෝරාගෙන ඇත. “ පිබිදෙමු පොළොන්නරුව” වැඩසටහන මඟින් සමාජීය,ආර්ථික හා භෞතික යටිතල පහසුකම් ව්‍යාපෘති හරහා සමස්ත දිස්ත්‍රික් මට්ටමේ සංවර්ධනයන් සැලසුම් කරන ලදී. එහිදී පොළොන්නරුව නාගරික ප්‍රදේශය දිස්ත්‍රික්කයේ අගනගරය ලෙසින් ඉතා ඉහළ බලපෑමකට ලක් වෙමින් පවතී.

දැනටමත් ක්‍රියාත්මකවන මට්ටමේ පවතින පිබිදෙමු පොළොන්නරුව වැඩසටහන හා ව්‍යාපෘති මඟින් සෘජුවම අවධානය යොමුකළ නාගරික ගැටලු හා ඒවායේ අනාගත බලපෑම් නව නගර සංවර්ධන සැලසුම් සැකසීමේදී ඇතුළත් කරන ලද අතර නව ව්‍යාපෘති යෝජනා සමග පුනරාවර්තනය වීම වළක්වා ඇත.

1.4 සැළසුම් ක්‍රියාවලිය



රූපය 1.1: සැළසුම් ක්‍රියාවලිය

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය

1.4.1 පසුබිම් අධ්‍යයනය

පසුබිම් අධ්‍යයනය සඳහා පොළොන්නරුවේ සමාජීය භෞතික, පාරිසරික හා ආර්ථික යන ප්‍රධාන දෘෂ්ටීන් 4 ක් මත සමීක්ෂණ, කාර්යාලීය නිරීක්ෂණ, අන්තර්ජාලය, ඩ්‍රෝන් සමීක්ෂණ, ගූගල් සිතියම් හා චන්ද්‍රිකා තාක්ෂණය ආදිය තුලින් 2017 වර්ෂයේ මාර්තු මස තොරතුරු රැස්කර ඇත. එය ජනගහන තොරතුරු, භූමි පරිහරණය, ආර්ථිකය, කර්මාන්ත, කෘෂිකර්මය, නිවාස, සෞඛ්‍ය, අධ්‍යාපන, මාර්ග, ප්‍රවාහනය, යටිතල පහසුකම්, පුරාවිද්‍යා සහ උරුම, විශේෂ ව්‍යාපෘති, විවෘත අවකාශය යනාදියෙන් ගැඹිව පවතී.

2017 වර්ෂයේ ජූලි මස වන විට තෘප්තිමත් විය හැකි මට්ටමේ ප්‍රාථමික හා ද්විතීක තොරතුරු රැස්කිරීමෙන් පසුව නගරයේ වර්තමාන තත්වය දැන ගැනීම සඳහා එක්සෙල්, භූගෝලීය තොරතුරු පද්ධතිය, ඩ්‍රෝන් පදනම් වූ මෘදුකාංග, ගූගල් සිතියම්, SPSS යන පරිගණක තාක්ෂණය භාවිතා කර මූලික විශ්ලේෂණයන් සිදුකර ඇත.

1.4.1 සංවර්ධන සැලැස්මේ විෂය පථය නිර්ණය කර ගැනීම.

සංකල්පිත රාමුව

සංවර්ධන සැලැස්මේ විෂය පථය රාමුගත කිරීමේදී සැලකිය යුතු ප්‍රධාන අංශ කීපයක් තෝරාගෙන ඇත. ඒ අනුව, පොළොන්නරුව නගරයේ ඓතිහාසික පසුබිම, පෙර සැලසුම් ප්‍රවේශ හා ඒවායේ පරස්පරතා, පොළොන්නරුව නගරයට පවතින ප්‍රාදේශීය, පළාත්බද, ජාතික හා ජාත්‍යාන්තර මට්ටමේ වැදගත්කම හා සම්බන්ධතා සහ ශ්‍රී ලංකාවේ 2017 – 2050 ජාතික භෞතික සැලැස්ම හා ප්‍රතිපත්තිය යන තෝරාගත් ප්‍රධාන කරුණු 4 ක් සලකා බලා ඇත.

භෞතික රාමුව: සැළසුම් සීමාව නිර්ණය කිරීම

නාගරික සංවර්ධන නැඹුරුතාව හා සංවර්ධන පීඩනය හා නගරයේ භාවිත නොකළ විභවතා විශ්ලේෂණය කළ පසු අනාගත සංවර්ධන සැලැස්ම සඳහා සම්පූර්ණ ග්‍රාම නිලධාරී කොට්ඨාශ 34ක් නාගරික සංවර්ධන ප්‍රදේශ ලෙසින් ප්‍රකාශනය කිරීමට තෝරගෙන ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් 2018 වර්ෂයේ අගෝස්තු 14 දින ප්‍රකාශිත අංක 2084/4 දරණ අතිරේක ගැසට්පත් නිවේදනය මගින් නව නාගරික ප්‍රදේශය නිවේදනය කරන ලද අතර එම කලාපය මෙම සංවර්ධන සැලැස්මේ සැලසුම් සීමාවන් ලෙසින් තෝරා ගන්නා ලදී.

1.4.2 ප්‍රශ්න හා විභව්‍යතා හඳුනා ගැනීම

ප්‍රායෝගික හා සාර්ථක සංවර්ධන සැලැස්මක් හඳුන්වා දීමට ප්‍රදේශයේ ගැටලු හා විභවතා හඳුනාගත යුතුය. එය සිදුකර ඇත්තේ විශ්ලේෂිත තොරතුරු සහිතව සැලසුම්කරුවන්ගේ දෘෂ්ඨී කෝණයෙන් ඒවා හඳුනාගැනීමක් ලෙසින් හා ප්‍රශ්න පිළිබඳ පාර්ශවකරුවන්ගේ දැක්ම තවත් දෘෂ්ඨීකෝණයක් ලෙසින් හඳුනා ගැනීම යන ක්‍රම දෙක හරහාය. එම අරමුණ සඳහා NVIVO විශ්ලේෂණ පහසුකම් සහිතව රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමඟ 2017 සැප්තැම්බර් 28 දින පාර්ශවකරුවන්ගේ පළමු රැස්වීම පවත්වන ලදී

1.4.3 දැක්ම හා ඉලක්ක සම්පාදනය කිරීම

ප්‍රශ්න හා විභවතා හඳුනා ගැනීමේ ප්‍රවේශය

ප්‍රදේශයේ ප්‍රශ්න හා විභවතාවන් ඒවායේ සන්දර්භය, විශාලත්වය හා වැදගත්කම මත පදනම්ව රාමුගත කර ගැනීම සඳහා ක්‍රමවේදයක් අවශ්‍ය වූ අතර, ඒ සඳහා නගරයේ අවශ්‍යතා ඉටු කර ගන්නා අවම ජනගහනය කොටස් 4 කට බෙදා වෙන්කර ගන්නා ලදි. එනම්, පොළොන්නරුවේ පදිංචිකරුවන් හා ගොවීන්, දෛනිකව පැමිණෙන මඟීන්, විදේශීය සංචාරකයන් හා අනෙකුත් ශ්‍රී ලාංකිකයන් හා දේශීය සංචාරකයන්ය.

තෝරාගත් එකිනෙක කණ්ඩායම්වලට එක් එක් ගැටළුව මඟින් වූ බලපෑම විශාල මධ්‍යස්ථ හා අඩු ලෙස බර තැබීම කරන ලදි. ඒ අනුව, මූලිකව විසඳිය යුතු ගැටළු හා භාවිතා කළ හැකි ප්‍රධාන විභවතා ලැයිස්තුවක් සකස්කර ගැනීමට හැකිවිය. මෙම ලැයිස්තුව විශ්ලේෂණය කිරීමේදී ගැටළු විසඳීමට භාවිතා කළ හැකි විභවතා පැහැදිළි කර ගත් බැවින්, නගර සංවර්ධන සැලැස්මේ දිශානතිය ඒ අනුව තීරණය කර ගත හැකි විය.

සංවර්ධන නැඹුරුතා ප්‍රවේශය

නූතන ලෝකයේ සංවර්ධන ප්‍රවණතා සමඟ නගර සංවර්ධන සැලැස්ම ගලපා ගැනීමේදී 2030 ජාතික භෞතික සැලැස්මත්, පිබිදෙමු පොළොන්නරුව දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහනත්, එක්සත් ජාතීන්ගේ 2030 තිරසාර සංවර්ධන න්‍යායපත්‍රයත් (2015 සැප්තැම්බර් 25 දින පැවැත්වූ එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන සම්මේලනය) යනාදිය පිළිබඳ සලකා බලමින් ගැටළු විසඳීමේදී අත්‍යාවශ්‍ය අවධානය යොමු කළ යුතු කරුණු තොරාගෙන අධ්‍යයනය කරන ලදි.

පොදු පාර්ශවකරුවන් දැක්මෙහි ප්‍රවේශය

නගරයේ පහසුකම් භුක්ති විඳින සියළු පාර්ශවකරුවන්ගෙන් වසර 2030 වන විට ඔවුන් අත්දැකීමට කැමති වන්නා වූ නගරයේ පෙනුම, දැක්ම, ප්‍රතිරූපය පිළිබඳ විමසන ලදි.

ඉහත තෙවැදෑරුම් ප්‍රවේශයන්ගේ 2030 පොලොන්නරුව සංවර්ධන සැලැස්මේ දැක්ම සමන්විත වේ. ඒ අනුව, එකී දැක්ම සාක්ෂාත් කරගැනීම සඳහා ප්‍රධාන ඉලක්ක 3 කට වෙන් කර ඇත.

1.4.4 විස්තරාත්මක විශ්ලේෂණය (දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා ඉලක්ක හා පරමාර්ථ මත පදනම් වූ)

සෑම ඉලක්කයක් සඳහාම වෙන් වෙන්ව ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන පිළිබඳ තොරතුරු අධ්‍යයනය කරන ලදි. ඉන්පසු ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන තොරතුරු මත පදනම්ව විස්තරාත්මක විශ්ලේෂණයක් සිදු කරන ලදි. ජීවත්වීමේ යෝග්‍යතා විශ්ලේෂණය, විභවතා විශ්ලේෂණය, සංවේදිතා විශ්ලේෂණය ආදියද එම විස්තරාත්මක විශ්ලේෂණයන්ට අයත් විය. පසුව එක් එක් ඉලක්කයන්ගේ විස්තර මත පදනම් වී අවසන් වශයෙන් ළඟා කර ගන්නා වූ පරමාර්ථ තිරණය කරන ලදි.

1.4.5 සැලැස්ම - උපාය මාර්ග සම්පාදනය කිරීම

2030 දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා ආර්ථික, සමාජීය, භෞතික හා පාරිසරික සාධකයන්හි විස්තරාත්මක විශ්ලේෂණයන් නාගරික සංවර්ධනයේ ප්‍රායෝගික ක්‍රියාවලිය බවට පරිණාමයට පත් වන්නේ “සැලසුම් උපාය මාර්ගයන් “ මඟිනි.

1.4.6 සැලසුම් රෙගුලාසි

2018 ජූනි මස ඉහත සැලැස්ම සම්බන්ධයෙන් අදාල නාගරික සංවර්ධන ප්‍රදේශ ඇතුළත සීමාවන්, සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි, පොදු රෙගුලාසි, සුවිශේෂ රෙගුලාසි මහපෙන්වීමේ සැලසුම් රෙගුලාසි සහ කලාප රෙගුලාසි සකස් කරන ලදි. මෙහිදී නගරයේ ඉලක්කගත සංවර්ධන ප්‍රවනතා සහ භූමි පාරිභෝජනයේ උපරිම කාර්යක්ෂමතාවය මත පදනම්ව කලාපීකරණය සඳහා නව ක්‍රමවේදයක් අනුගමනය කරන ලදි.

1.4.7 අනුමැතිය විමසීම හා සම්මුතිගත වීම.

නාගරික සංවර්ධන අධිකාරී පනතට අනුව, කෙටුම්පත් නගර සංවර්ධන සැලැස්ම නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන සැලසුම් කමිටුවට සහ අදාළ පළාත් පාලන ආයතන වෙත ඉදිරිපත් කොට අනුමැතිය ලබා ගත යුතුය. ඒ අනුව, 2019 පෙබරවාරි මස 14 වන දින

පොළොන්නරුව මහනගර සභාව සහ පොළොන්නරුව ප්‍රාදේශිය සභාවේ නියෝජිතයන් වෙත කෙටුම්පත් කරන ලද නගර සංවර්ධන සැලැස්ම ඉදිරිපත් කොට අවසාන අර්ථකථන සහ අදහස් ලබා ගන්නා ලදි. ඉන් පසු කෙටුම්පත් සංවර්ධන සැලැස්ම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම හා ඔවුන්ගේ අදහස් ලබා ගැනීමට **2019** පෙබරවාරි **28** දින සිට අප්‍රේල් **28** දක්වා දක්වා (දින **60**ක්) පළාත්පාලන ආයතන වල තැබීමටත් පළාත් පාලන ආයතනවල අනුමැතිය ලබා ගැනීමටත් කටයුතු කරන ලදි.

එමෙන්ම, **2019** මැයි මස **02** වන දින නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන සැලසුම් කමිටුවට ඉදිරිපත් කොට අදහස් සහ යෝජනා ලබා ගෙන කෙටුම්පත් සංවර්ධන සැලැස්ම සංශෝධනය කරන ලදි.

1.4.8 භාර දීම

පළාත් පාලන ආයතන දෙකෙහි හා නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන සැලසුම් කමිටුව මඟින් සංශෝධනය කර අනුමත කළ සැලැස්ම **2019** වර්ෂයේ ජූනි මස නාගරික සංවර්ධන අධිකාරියේ සංවර්ධන සැලසුම් අංශයට භාරදෙන ලදී.

1.4.9 අනුමැතිය හා ප්‍රකාශයට පත් කිරීම

2019 වර්ෂයේ අග භාගයේදී විෂයභාර අමාත්‍යවරයා මෙම සැලැස්ම අනුමත කරන ලද අතර, භාෂා තුනෙන්ම ගැසට්පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත්කරනු ලැබීය.

පරිච්ඡේදය 02 : ප්‍රාරම්භක සමීක්ෂණ



ප්‍රාරම්භක සමීක්ෂණ

2.1. අධ්‍යයන ප්‍රදේශය

සංචාරකයින් අතර, එක් නිර්මල හා වඩාත් සුන්දර නගරයක් ලෙසින් හඳුන්වන පොළොන්නරුව නාගරික ප්‍රදේශය, ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පිහිටා ඇත. හරිත වර්ණ පරිසරය, ස්වයංපෝෂිත කුඹුරු, විශ්මයජනක භෞතික ඉදිකිරීම් , පරාක්‍රම සමුද්‍ර ය වැනි විශාල වැව්, අනන්‍ය වූත්, අනුස්මරණීය වූත්, අත්දැකීමක් නිර්මාණය කරයි. ලාංකිකයන් හට නම් සිහියට නැගෙන්නේ පෞරාණික නටඹුන්, පුලස්ති පිළිමය, වන අලින් , වැව් හා විශාල ඇළවල් සමඟ වූ හරිත කුඹුරු යායද, පවතින අධික උෂ්ණත්වය ද වේ.

සම්පූර්ණ ග්‍රාම නිළධාරී කොට්ඨාශ 34 කින් සමන්විත පොළොන්නරුව **නාගරික** සැලසුම් ප්‍රදේශය ග්‍රාම නිළධාරී කොට්ඨාශ 18 කින් යුතු පොළොන්නරු මහ නගර සභාව හා පොළොන්නරුව ප්‍රාදේශීය සභාවෙන් කොටසක් (ග්‍රාම නිළධාරී කොට්ඨාශ 16) ලෙසින් පළාත් පාලන ආයතන දෙකකට අයත් වේ.

කොළඹ සිට 216 k m ක් හා කුරුණෑගල සිට 122 k m ක් ඔබ්බට වන්න පොළොන්නරුව නගරය පිහිටා ඇත. පොළොන්නරුව නගරයට පැමිණීමට ජනප්‍රියම මාර්ගය වන්නේහබරණට පැමිණ පසු A11 මාර්ගයට හැරී මින්නේරිය ජාතික වනඋද්‍යානයත් පසුකර 45 km ක් පමණ නැගෙනහිරට ගමන් කිරීමයි. දුම්රිය මාර්ගය හරහා පැමිණෙන්නේ නම් කොළඹ - මඩකලපුව දුම්රිය මා ර්ග ය පිහිටා ඇත්තේ පොළොන්නරුව නගරය හරහා වන අතර එය ප්‍රතිඵල ලෙස 1928 සිට කදුරුවෙල ප්‍රධාන වාණිජ නගරය ලෙස විකාශනය වීම ආරම්භ විය. (කොළඹ, මා ඔය හංදිය, පොළොන්නරුව හා මඩකලපුව)

නගරයට ඇතුළු වීමට දඹුල්ල, අනුරාධපුරය, මඩකලපුව, මහියංගනය, අම්පාර යනාදි වූ දිස්ත්‍රික්ක හරහා A පන්තියේ මාර්ග හා දුම්රිය මාර්ග අතර මනා සම්බන්ධතාවයක් පැවතුන ද වනාන්තර, ගංගා වැනි ස්වභාවික බාධක පසු කර යාමේ අවශ්‍යතාවය නිසා ඉතිහාසය පුරාවටම පොළොන්නරුව සැඟවුණු රාජධානිය ක් බවට පත්ව තිබේ.

පොළොන්නරුව දිස්ත්‍රික්කය නිවතර්න දේශගුණික ලක්ෂණවලින් පවතින අතර මිලිමීටර්1678 වාර්ෂික වර්ෂාපතනයකින් යුතු ශ්‍රී ලංකාවේ වියළි කලාපය යටතට ගැනේ. (ඇමුණුම 02) සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය 27 – 30C° වන අතර 36 C° සාමාන්‍ය උෂ්ණත්වයකින් යුතු මැයි උෂ්ණාධික මාසය ලෙසින් සැලැකේ. වර්ෂයේ අඩුම උෂ්ණත්වය ලෙස 25.1C ° ජනවාරි මස පවතී. (ඇමුණුම 03) දිස්ත්‍රික් භූ ලක්ෂණ මධ්‍ය ම මුහුදු මට්ටමේ සිට සාමාන්‍ය උසකට අඩි 5 සිට අඩි 500 දක්වා විචලනය වන අතර, සාපේක්ෂව මද බෑවුමක් සහිත තැනිතලා භූමි භාගයකි. (ඇමුණුම 04)

පොළොන්නරුව නාගරික සංවර්ධන ප්‍රදේශය



සිතියම 2.1 : සැලසුම් සීමාවේ පිහිටීමේ සිතියම

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය

2.2 සැලසුම් හා තත්ත්ව සන්දර්භය

දැනට උතුරු මැද පළාත් නාගරික ධුරාවලිය අනුව අනුරාධපුර නගරය පළමු පෙළ නගරය වන අතරතුර, පොළොන්නරුව දෙවන පෙළ නගරය වේ. (ඇමුණුම 05) 1779 සිට ගම් සභාවක් ලෙස (Town Council) පොළොන්නරුව නගරය ප්‍රකාශයට පත්ව ඇති අතර, එතැන්සිට අවුරුදු ගණනක් පුරාවට නාගරික ප්‍රදේශ සීමාවන් වෙනස් විය

වර්තමානයේදී 2018 –2030 / 2050 ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තියට අනුව නගරයේ කාර්ය භාරය මදකින් වෙනස් විය. ජාතික භෞතික ප්‍රතිපත්තිය 2006 වර්ෂයේදි සම්පාදනය කර ඇති අතර ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් 2018-2050 කාල සීමාව දක්වා ප්‍රතිශෝධනය කරන ලදි. ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය හා සැලැස්ම අනුව, රටේ භෞතික සංවර්ධනය භෞතික සංවර්ධන තීර හතරකටත්, අග්‍ර කලාප දෙකකටත් සහ ප්‍රධාන නගර නවයකටත් වශයෙන් යොමු කිරීමට අපේක්ෂා කර ඇත. **පොළොන්නරුව යනු එම ප්‍රධාන නගර නවයෙන් එකකි.** භෞතික සැලැස්ම මගින් ප්‍රධාන නගරයක් යනු පහත පරිදි විස්තර කරනු ලබයි.

ප්‍රධාන නගරයක් යනු සැලකිය යුතු මට්ටමේ විශාල ප්‍රමාණයේ සෑම ප්‍රදේශයකට ඉතා ඉහළ මට්ටමේ සේවා සපයන්නෙකි. ආර්ථික ක්‍රියාකාරකම්, නාගරික පහසුකම් සහා නේවාසික ජනගහනය කෙරෙහි සාපේක්ෂව විශාල අවධානයක් යොමු කරන්නකි. මෙකී ප්‍රතිපත්තිය ඇතුළත ප්‍රධාන නගරයක් ලක්ෂයක් (100000) වූ අවම ජනගහනයක් සහිත ප්‍රදේශයක් ලෙසින් හා වර්ග කිලෝමීටරයකට මිනිසුන් 5000 කට නොවැඩි දළ නේවාසික ජනගහනයක් ලෙස නිර්වචනය විය යුතුය. (2.3.1 වගන්තිය / 2017-2050 ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව / ප්‍රතිසංශෝධන සැලැස්ම / ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව)

විශ්ලේෂණයන්ට අනුව ස්වාභාවික වර්ධනය සමඟ 2030 වර්ෂයේ දී පොළොන්නරුව නාගරික කලාපය 77000 වූ ජනගහණයකට පමණක් ළඟාවන අතර, ජාතික භෞතික සැලැස්මේ ඉලක්ක වලින් ප්‍රධාන නගරයක් ලෙසින් ජනගහනය හැර පොළොන්නරුව අනෙකුත් නිර්ණායක සමඟ ගැලපෙනු ඇත.

වර්තමානයේ පොළොන්නරුව නගරයේ නාගරික අවකාශය හැඩ ගැසී ඇත්තේ ඉහත පැවසූ ඓතිහාසික ක්‍රියාකාරකම් වල ප්‍රථිඵලයක් ලෙසය, මේ වන විට නගරය එකිනෙකට වෙනස් අංග ලක්ෂණයන්ගෙන් යුතු ප්‍රධාන මංසන්ධි 3ක් ලෙස සංවර්ධනය වී ඇත.

නගරයේ ක්‍රියාකාරීත්වය සලකා බලන විට සම්පූර්ණ නාගරික ප්‍රදේශය වැඩි වශයෙන් දවසේ උදෑසන 7 සිට සවස 7 දක්වා ක්‍රියාශීලී වේ. නගරය දිස්ත්‍රික්කයේ අගනුවර හා සියළුම මාර්ග සඳහා ප්‍රධාන මධ්‍යස්ථානයක් ලෙස සැලකුනද රාත්‍රී කාල ක්‍රියාකාරකම් හා ජනගහනය ඉතා අඩුය.

ඓතිහාසික පරිණාමය

සියළුම නටඹුන් කෙරෙහි අවධානයක් යොමු කරන විට ශ්‍රී ලංකාව ඇතුළත පැහැදිලිව දැකිය හැකි ජනප්‍රියම පෞරාණික රාජධානියක් ලෙසින් පොළොන්නරුව හැඳින්විය හැකිය. පයින් ගවේෂණය කළ හැකි, යතුරු පැදියකින් හෝ ත්‍රී රෝද රථයකින් ගමන් කරමින් ගවේශනය කළ හැකි ඓතිහාසික ප්‍රදේශ රාශියකින් මෙම සම්පූර්ණ ප්‍රදේශය සමන්විත වේ. පොළොන්නරු නගරය රටේ ඓතිහාසික ගමන්මගේ සුවිශේෂී මහ සලකුණක් වන අතර ඓතිහාසික ක්‍රියාවන්හි ප්‍රතිඵලයක් ලෙසින් වර්තමාන නගරය ස්ථාපනය වී ඇති නිසා නගර සංවර්ධන සැලැස්ම සැකසීමේදී විචක්ෂණ අවබෝධයක් තිබීම අත්‍යවශ්‍ය දෙයකි.

ලක්දිවට ආර්යයන්ගේ පැමිණීම හා ජනාවාස පිහිටුවා ගැනීමට පෙරම (වසර **1300** කට පෙර) මෙම නගරයේ කතාව ආරම්භ වේ. රාවණා රජුගේ කාලයේ මහවැලි ගඟ දෙපස වී ගොවිතැන් කළ ජනතාවකගේ ශිෂ්ඨාචාරයක් පිළිබඳව සාක්ෂි පවතී. පොතුගල් විහාරයේ ඇති ජනප්‍රිය පිළිමය මහවැලි වැව් ඉවුරේ පිහිටා තිබූ පොතුගල් විහාර ආශ්‍රමයේ ප්‍රධානියා වූ රාවණ රජුගේ මුත්තණුවන්වන පුලතිසි ඍෂිගේ වන්නට ඇතැයි විශ්වාස කෙරේ. (***ජේ.බාලසූරිය, 2007 පළමු මුද්‍රණය, මහවැලි හා ඓතිහාසික පොළොන්නරුව ISBN - 955-96585-8-1)***

නගරයේ මනාව ලේඛණගත කළ ඉතිහාසය ආර්යයන්ගේ පැමිණීම හා ජනාවාස සමඟ ආරම්භ විය. අනුරාධපුර රාජධානි කාලයේ බද්දකච්චායනා කුමරියගේ සහෝදරයකු මහවැලි ගං ඉවුරේ ජනාවාස පිහිටුවා ගන්නා ලද අතර, විජිතගාම නමින් ගමක් නිර්මාණය කරන ලදී. (වර්තමානයේ එය කඳුරුවෙල නගරය සමීපයේ පිහිටා ඇත) එමෙන්ම, ක්‍රි.ව. **161** දී එළාර රජුට අයිතිව තිබූ විජිතපුර නමින් හැඳින්වෙන තිරසාර හා ඉතා හොඳින් සැලසුම් කළ බලකොටුවක් තිබුණි. දුටුගැමුණු රජු විජිතපුර සමඟ සටන් වැදීමට කඳවුරු බඳිමින් පදිංචි වුණ කුඹුරු යාය වර්තමානයේදී කඳුරුවෙල වාණිජ නගරය ලෙසින් හඳුන්වයි. “කඳුරුවෙල” නගරයේ නම කඳවුරු බැදිවෙල, කඳවුරු වෙල, කඳුරුවෙල ලෙස විකාශනය වීම එහි ප්‍රතිඵලයක් වේ.

(මූලාශ්‍රය : මහවැලිය හා ඓතිහාසික පොලොන්නරුව ISBN - 955 -96585 -8-1, 2007 පළමු මුද්‍රණය, සේ බාලසූරිය)

සිව්වන අග්බෝ රජුගේ ආරම්භයත් සමඟ ක්‍රි.ව. 658 දී පොළොන්නරුව ශ්‍රී ලංකාවේ දෙවන රාජධානිය බවට පත්විය. ක්‍රි.ව. 1153 -1186 කාලයේ මහා පරාක්‍රමබාහු රජු සමඟ පොළොන්නරුවේ ස්වර්ණමය යුගය ආරම්භ විය.



රූපය 2.1: A. D. N ප්‍රනාන්දු මහතා විසින් අඳින ලද පුරාණ නගරයේ සංකල්පිත සිතුවම
මූලාශ්‍රය : මහවැලිය හා ඓතිහාසික පොලොන්නරුවISBN 955 -96585 -8-1, 2007
පළමු මුද්‍රණය, ජේ .බාලසූරිය

__මහා පරාක්‍රමබාහු රජුගේ__ කාලයේ පොළොන්නරුව නගරය නන්දන උයන, ලක්ෂ උයන හා දීප උයන නමින් හැඳින්වෙන උද්‍යාන තුනක් සහිතව මනාව සැලසුම් කළ, තිරසාර සෞඛ්‍ය සම්පන්න නගරයක් විය. ආලාහන පිරිවෙන, ලංකාතිලක, ථූපාරාමය, කිරිවෙහෙර, ජේතවනාරාමය වැනි නව බෞද්ධ විහාර ඉදිකිරීමෙන් සංස්කෘතික හා අධ්‍යාපනික සමෘද්ධියද සම්පූර්ණ කරන ලදී. 2000 කට අධික වැව්, ඇළ මාර්ග, වාරිමාර්ග පද්ධතිය, ශ්‍රී ලංකාවට පෙරදිග ධාන්‍යාගාරය නම් වූ ප්‍රකට නාමය නිර්මාණය කරන ලදී. ඉහත කතා පුවතට පොළොන්නරුව පෞරාණික නගරය තවදුරටත් සාක්ෂි සපයයි.

ක්‍රි.පූ. 1187-1196 කාලයේ නිශ්ශංකමල්ල රජු විසින් නගරයට ආවේණික අනන්‍යතාවය පිළිබිඹු වූ අලංකාර ගොඩනැගිලි රාශියක් ගොඩ නගන ලදී. **ක්‍රි.පූ. 1214** කාලයේ අවුරුදු හතළිහක කාලිංග මාඝ ගේ ක්‍රියාකාරකම් සමඟ පොළොන්නරුව රාජධානිය අත් හරින ලදී. පසුව පොළොන්නරුව අනෙකුත් රාජධානි කාලයන්හි උප නගරයක් වශයෙන් ක්‍රියා කරන ලද අතර, රාජධානීන්වල වෙනස්කම් සඳහා අවශ්‍ය වූ විට සටන් බිමක් ලෙසින් ඉතා වටිනා භූමිකාවක් රඟදක්වන ලදී. **1815**දී ද කන්ද උඩරට ගිවිසුම අත්සන් කළ තමන්කඩුව දිසාවේ එකල පොළොන්නරුවේ නායකයා විය. ඒ ආකාරයට පොළොන්නරුව ඉතිහාසිය පුරාවටම සම්පූර්ණයෙන් අකර්මන්‍ය නොවී පැවති බවට ඕනෑ තරම් සාක්ෂි තිබේ.

පසුකාලීනව බ්‍රිතාන්‍ය යටත් විජිත සමයෙන් පසුව කාලයේ නගරය පරිණාමයේ සුවිශාල බලපෑමකට ලක්විය. නගරයේ සමස්ත සැලැස්ම පුරාවට ම කිසිදු ලිඛිත ලියවිල්ලක් සොයා ගත නොහැකිය. නමුත් සමීපතව බැලූ කල්හි ඉතා වැදගත් මධ්‍යස්ථාන කිහිපයක් ස්ථාපිත වීමත් සමඟ වර්තමාන තත්තවය දක්වා නගරය විකාශනය වී ඇති ආකාරය සිතෙහි මවාගත හැකිය.

1870 දී බ්‍රිතාන්‍ය රජය විසින් එම රජයේ ඒ ජන්තවරුන් සඳහා **(GA)** පරාක්‍රම සමුද්‍රයෙහි බැම්මෙහි සංචාරක ගිමන්හලක් ඉදිකරන ලද අතර, අද එය ලේක් හවුස් හෝටලය බවට පරිවර්තනය වී ඇත. එය පොළොන්නරුව හෝටල් වර්ගීකරණයේ තරු පන්තියේ හෝටල් අතරින් එකකි.

1927 දුම්රිය නැවතුම්පල හා තැපැල් කාර්යාලය ආරම්භ කළ අතර, ඒ සමඟ ක්‍රම ක්‍රමයෙන් කඳුරුවෙල වාණිජ නගරයක් බවට පත්වීම ආරම්භ විය. ලංකා ගමනාගමන මණ්ඩලයද **1969** බස් **5** කින් තම සේවාව කඳුරුවෙලදී ආරම්භ කරන ලදි. නගරයේ විකාශයත් සමඟ වර්තමානයේ මාර්ග **16** ක් සහ දෛනික ගමන්වාර **869** ක් මේ වන විට පවත්වාගෙන යනු ලබන අතර, පොදු ප්‍රවාහන බස් රථ **148** කුත් පෞද්ගලික රථ **178** කුත් සේවය ලබා දෙනු ලබයි.

1958 වන විට පොළොන්නරුව රෝහල ග්‍රාමීය රෝහලක් ලෙස ආරම්භ වූ අතර, මාතලේ සෞඛ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය යටතේ පාලනය විය. එම ආරම්භයත් සමඟ රෝහල හංදිය ප්‍රදේශයේ භූමි පරිහරණ රටාව රෝහල හා බැඳි ක්‍රියාකාරකම් වලට වෙනස් විය.

පරිපාලන මධ්‍යස්ථානයක් ලෙස නවනගරය දෙසට නාගරීකරණය ගලා යාම ආරම්භ වූයේ **1961** තමන්කඩුව පත්තුව හා සිංහල පත්තුව ප්‍රදේශවල පරිපාලන කටයුතු සඳහා තමන්කඩුව කච්චේරිය ආරම්භ කිරීමත් සමඟය. නවනගරය ප්‍රදේශය වඩාත් තියුණු බලපෑකට ලක්වූයේ **1959** රාජකීය විද්‍යාලය ඉදිකිරීම ආරම්භයත්, **1965** විවෘත කිරීමත් සමඟය. එම වසරේම නවනගරයේ ජල සම්පාදන මණ්ඩලයද ආරම්භ විය.

වර්තමානය වන විට පොළොන්නරුව නගරයේ අවකාශීය භාවිතය පෙර පැවසූ ඓතිහාසික ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස වෙන් වෙන් ලක්ෂණ සහිතව ප්‍රධාන මධ්‍යස්ථාන තුනක් ලෙසට ගොඩනැඟී ඇත.

2.2.1 ජාතික වැදගත්කම

දෙආකාර වූ ජාතික වැදගත්කමක් පොළොන්නරුව නගරය සතුව පවතී

(i) 1982 වර්ෂයේ සිට එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් යුනෙස්කෝ ලෝක උරුම නගරයක් ලෙසින් ප්‍රකාශයට පත් කිරීමෙන් පසු එය ශ්‍රී ලංකාවේ ප්‍රවලිත පෞරාණික සංචාරක ගමනාන්තයක් බවට පත් විය. මධ්‍යම සංස්කෘතික අරමුදලේ සංඛ්‍යාත වලට අනුව **2016** වර්ෂයේ විදේශීය සංචාරකයින් පමණක් **180,000** පැමිණ ඇත.

(ii) සියවස් ගණනාවක් පුරා රටේ ප්‍රමුඛතම වී සහ සහල් නිෂ්පාදකයා වන්නේ පොළොන්න රුවය. මෙවර විශාලතම වී වගාව වාර්තා වී ඇත්තේ ද පොළොන්නරු දිස්ත්‍රික්කයේ වන අතර එය රටේ මුළු වී වගාවෙන් 16% කි (හෙක්ටයාර 61,559). එමෙන්ම රටේ වී නිෂ්පාදනයෙන් 18% ක්ම පොළොන්නරුව දිස්ත්‍රික්කයේ නිෂ්පාදනය කර ඇති අතර එය මෙවර රටේ වැඩිම වී නිෂ්පාදනය ද වේ (වී මෙට්රික් ටොන් 268,472). (සංඛ්‍යාලේඛන -2018 යල; ශ්‍රී ලංකා සංඛ්‍යාන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව).
එමෙන්ම රටේ සම්පූර්ණ වී නිෂ්පාදනයෙන් 55% කට වඩා සහල් බවට හැරවෙන්නේ මෙම නගරය තුළය. වී ගොවිතැන සමඟ ඉතා වටිනා බැඳීමක් ඇති ඓතිහාසික වාරිමාර්ග පද්ධතිය නගරයේ අනන්‍යතාවය ලෙසින් මෙන්ම දිස්ත්‍රික්කයේ ආර්ථික තුළ ද ඉතා වටිනා භූමිකාවක් නිර්මාණය කර ඇත.

වී ගොවිතැන, වාරිමාර්ග තාක්ෂණය සහ පෞරාණික නගරය හැරුණු විට ජල ගැලුම් නිමින ජාතික වනෝද්‍යානය නාගරික කලාපය තුළ දැකිය හැකි ප්‍රධාන භූමි භාවිතයකි.**1984** අගෝස්තු **07** ඇති කළ මෙම වනෝද්‍යානය වන අලි සඳහා

ස්වභාවික රක්ෂිතයක් වන අතර ඔවුන් වස්ගමුව හා සෝමාවතිය වන රක්ෂිත අතර ගමන් ගන්නා මාර්ගය වැටී ඇත්තේ මෙම නිම්නය හරහායි.

2.2.2 දැනට ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති

අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ සංකල්පයකට අනුව නාගරික සංවර්ධන අධිකාරිය යටතේ "පිබිදෙමු පොළොන්නරුව" නමින් හැඳින්වෙන දිස්ත්‍රික් සංවර්ධන වැඩ සටහන වර්තමානයේ ක්‍රියාත්මක වේ. පුළුල්ව සංවර්ධන වන මාර්ග, විදුලිය, කෘෂිකර්මය, අධ්‍යාපන, සෞඛ්‍යය හා පරිසරය යනාදි පොළොන්නරුවේ සෑම අංශයකම සංවර්ධනය වීම එමඟින් අපේක්ෂා කරයි.

2.2.3 දිස්ත්‍රික්කයේ වාණිජ, පරිපාලන හා සේවා මධ්‍යස්ථානය ලෙස

ප්‍රකාශිත නාගරික කලාපය දිස්ත්‍රික්කයේ ප්‍රධාන පරිපාලන, වාණිජ හා සේවා මධ්‍යස්ථානය ලෙස ක්‍රියාත්මක වන අතර, දිස්ත්‍රික්කයේ ජනගහනය හා අවට කලාපයේ ජනගහනය 600,000 කට පමණ සේවා සපයනු ලබයි. (ඇමුණුම 05 නගර පෝෂිත කලාපය)

දිස්ත්‍රික් මට්ටමේ අධ්‍යාපන, සෞඛ්‍ය හා පරිපාලන කාර්යාල මෙහි පිහිටා ඇත. (ඇමුණුම 06 පින්තූර) වාණිජ මධ්‍යස්ථානය ලෙස ප්‍රාථමික (පාරිභෝගික භාණ්ඩ හා සේවා) හා ද්විතියික මට්ටමේ වාණිජ පහසුකම් (කෘෂිකාර්මික, රසායනික, රථවාහන පහසුකම්, ඉදිකිරීම් කර්මාන්තය, විදුලි බල ක්ෂේත්‍රය) ලබා දෙනු ලබයි.

2.2.4 ජනාධිකාශන තොරතුරු

නගරයේ නේවාසික ජනගහනය 65329 (2016)ක් වන අතර, වාර්ෂික වර්ධන වේගය අනුව2030 දී 76905 ක් දක්වා වර්ධනය වේ. 2012 වර්ෂයේ දිස්ත්‍රික්කයේ ජනගහනය 419000 ක් වූ අතර, 1.16 ක් වූ ජනගහන වර්ධන වේගය ජාතික මට්ටමට වඩා වැඩි බව පෙනෙන්නට තිබේ. (ඇමුණුම 07, පින්තූරය) නමුත්, ස්වාභාවික වර්ධනය පමණක් සැලකුවිට 2030 වන විට පොළොන්නරු දිස්ත්‍රික්කයේ නේවාසික ජනගහනය 516200 විය හැකි අතර, එය දිස්ත්‍රික්කයේ සේවා පැවැත්මට අවශ්‍ය අවම ජනගහනය ලෙස සැලකිය හැක.

කඳුරුවෙල දකුණ, පැරකුම් පෙදෙස, කුරුප්පු හන්දිය, උඩවෙල, නිශ්ශංකමල්ල පෙදෙස, වර්ග කිලෝමීටරයකට 1600 නොවැඩි ලෙස ඉතා ඉහළ ජනගහණ ගණත්වයක් නිරූපනය කරයි. 2001 හා 2012 සංඛ්‍යා ලේඛණ සංසන්දනය කරන විට A11 මාර්ගය දිගේ

කඳුරුවෙල සිට පොළොන්නරුව හන්දිය දක්වා නව නගර ප්‍රදේශය වෙත ජනගහණ ඝනත්වයේ වර්ධනයක් දැක්විය හැකිය. අවම ජනගහන ඝණත්වය වාර්තා වී ඇත්තේ වර්ග කිලෝමීටරයකට මිනිසුන් 200 කට වඩා අඩු වන ලෙස ඇති කොටලීය හා අලුත්වැව බටහිර ප්‍රදේශයයි.

සමස්ත ජනගහනයෙන් 76% ක් බහුතරය සිංහල අය වේ. 22% වූ ඉස්ලාම් ජාතිකයෙන් 1% වූ දමිල සහ 1% කතෝලික හා අනෙකුත් ආගම් අදහන පිරිස් සහිතව විවිධ සංස්කෘතීන්ට අයත් සමාජයක් මෙම නගරයේ ජීවත් වේ.

2.2.5 නිවාස

දැනට නිවාස 16684 ක් තිබේ. සමස්ත ජනගහනයෙන් 93% ක්ම තමාටම කියා නිවසක හිමිකම පවතින පවුල් වේ. නිවාස 92% ක්ම ස්ථිර ඒවා වන අතර, 7% ක් අර්ධ ස්ථිර හා 1% පමණ තාවකාලික ඒවා වේ. මුළු නිවාස ගණනින් නිවාස 12% ක් මහල් නිවාස ගනයට අයත්වේ. වර්තමානයේ නගරයේ නිවාස 497 ක ඌනතාවයක් දක්නට ලැබෙන අතර, එය සම්පූර්ණ පවුල්වලින් 3% ක් වේ. ඉහළම නිවාස ඝනත්වයක් මහවැලි පෙදෙසින් හා කඳුරුවෙල දකුණ ග්‍රාම නිලධාරී වසමින් වාර්තා විය.

2.2.6 නගරයේ ආර්ථිකය

ආර්ථික වශයෙන් ක්‍රියාකාරී කම්කරු පිරිස (අවුරුදු 15 ට වැඩි ජනගහනය) පිළිබඳ සලකන කල්හි එය ජාතික සාමාන්‍යයට (52%) වඩා අඩු වූ සමස්ත ජනගහණයෙන් 46% කි. 76% ක් පවුල්වල මාසික ආදායම රුපියල් 25,000/- ට අඩුවේ. නමුත් අවුරුදු ගණනාවක්ම පොළොන්නරුව ජාතික මට්ටමේ දරිද්‍රතා දර්ශකයට වඩා ඉහළ අගයක පැවතුණි. (ඇමුණුම 08 රූපසටහන 10) සේවක නියුක්ති අංශය කෘෂිකර්මාන්තය කර්මාන්ත හා සේවාවන් ලෙසට බෙදා දැක්වුවහොත් ඒවායේ ප්‍රතිශතය අනුපිළිවෙලන් 40%, 20% සහ 40% ලෙසින් ගැනේ. ජාතික මට්ටම සමඟ සංසන්දනය කරන විට මාතලේ, මාතර හා මුලතිව් යන දිස්ත්‍රික්කවලට සමාන වේ. මෙම තත්වය නව ආර්ථික අවස්ථාවන් සඳහා නගරයේ පදිංචිකරුවන්ට ඇති අවශ්‍යතාවය පෙන්වා දෙයි.

2.2.7 ජල සැපයුම

නල ජලය මෙම ප්‍රදේශයේ ප්‍රධාන ජල මූලාශ්‍රය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් එය සපයනු ලබයි. (ඔවුන් විසින් භාවිතා කරනු ලබන ප්‍රධාන ජල මූලාශ්‍ර දෙක වනුයේ මහවැලි ගඟ හා පරාක්‍රම සමුද්‍රයයි) වර්තමානයේදී 83% ක පිරිසක් ජාතික ජල සම්පාදන මණ්ඩලයේ ජලය ලබාගන්නා අතර, 13%ක පිරිසක් භූගත ජල ලිං

වලින් ජලය ලබා ගනී. සපයන ලද ජලය ප්‍රමිතිගත මට්ටමේ පැවතියද වකුගඩු රෝග සඳහා තර්ජන හේතුවෙන් දැනට පානීය ජල අවශ්‍යතා සඳහා පිරිපහදු ජලය භාවිතා කිරීමේ ප්‍රවණතාවයක් පවතී. එක් ජල ලීටරයක වියදම රු. 2.00 කි.

ගිනි ආරක්ෂණය පිළිබඳ අධ්‍යයනය කරන විට සම්පූර්ණ ප්‍රදේශය ගිනි නිවීමේ ජල සැපයුම් ඒකක 6 කින් සුදානම් කොට ඇත. (කඳුරුවෙල 3, රෝහල් හන්දිය 1 , පොල හන්දිය 1, නව නගරය 1)

2.2.8 විදුලිය හා විදුලි සංදේශ

විදුලි සැපයුම පිළිබඳ සලකා බලන කල්හි, ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයේ වාර්තාවන්ට අනුව පොළොන්නරුව නාගරික ප්‍රදේශයේ සිටින මිනිසුන්ට ප්‍රමාණවත් විදුලි සම්බන්ධතාවයන් පවතින අතර, ප්‍රදේශයේ 99% ක් විදුලිබල මණ්ඩලයෙන් විදුලිය ලබා ගනී. විදුලි සංදේශ අංශය තුල ශ්‍රී ලංකා ටෙලිකොම් (SLT) මුළු නගරයටම ඔවුන්ගේ සේවාව සපයා ඇති අතර, CDMA හා ADSL දැනට පවතී. පෞද්ගලික අංශයේ විදුලි සංදේශ කුළුණු 18ක් නාගරික ප්‍රදේශය ඇතුලත පිහිටා තිබෙන අතර, 4G ආවරණය ද පවතී.

2.2.9 සෞඛ්‍ය

සමාජ යටිතල පහසුකම් අංශය ගත් කල, සෞඛ්‍ය හා අධ්‍යාපන අංශයේ දිස්ත්‍රික් මධ්‍යස්ථානය ලෙස වැදගත් ස්ථානයක් ගනී. දිස්ත්‍රික් මූලික රෝහල නාගරික ප්‍රදේශය තුල පිහිටා තිබෙන අතර, සියල්ලම එකට ගත් කළ ඇඳන් 885 කින්, වෛද්‍යවරු 210 කින්, වාට්ටු 22 කින් හා ඒකක 46 කින් සමන්විත වේ. මූලික විශේෂ්‍යතාවයන්ට අමතරව, විකලාංග චිකිත්සාව, ඇස්, ENT, හෘද රෝග චිකිත්සාව, සම පිළිබඳ විද්‍යාව, වාත රෝග විද්‍යාව, Nephrology සහ මානසික සෞඛ්‍ය, විකිරණවේදය, රුධිර විද්‍යාව, අෂුද්‍ර ජීව විද්‍යාව හා පටක විද්‍යාව යනාදී සුවිශේෂී සේවාවන් ද එමඟින් සැලසේ. බාහිර රෝගී අංශය වෛද්‍ය සත්කාර අවශ්‍ය හදිසි අනතුරුවලට ලක්වූවන්ටද අවශ්‍යතා සපුරාලයි. 2012 වර්ෂයේ සංඛ්‍යාලේඛණ වලට අනුව දිස්ත්‍රික්කයෙන් අර්ධයක් වූ ජනගහනය රෝහලෙන් පහසුකම් ලබා ගෙන ඇති බව පිළිබිඹු කරන අතර, (292063 ක් වූ බාහිර රෝගීන්) ඇතුළත් කිරීමේ ඒකකය හරහා ඇතුළත් කිරීම් 223849 ක් ද වාර්තා වී ඇත.

ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාතේ ප්‍රධාන වශයෙන් වී ගොවීන්හට වැළදෙන සහ හඳුනා ගත නොහැකි වකුගඩු රෝග සහිත රෝගීන්ට ප්‍රතිකාර කිරීමට (A11 මාර්ගයේ නාගරික ප්‍රදේශයේ 28 සැතැපුම් කණුව අසල) වකුගඩු බද්ධ කිරීමේ පහසුකම් සහිත ජාතික මට්ටමේ රෝහලක් දැනට ඉදි වෙමින් පවතී. ව්‍යාපෘතිය චීන රජයේ පරිත්‍යාගයක් වන අතර, එම

වකුගඩු රෝහල ඇඳන් 200 කින්ද, රුධිර පවිත්‍ර කරන යන්ත්‍ර 100 කින්ද නූතන ශල්‍යකර්ම මධ්‍යස්ථානයකින්ද සමන්විතය. මෙම රෝහලේ ඉදිකිරීම් අවසන් කිරීමේදී රු. බිලියන 12 ක පමණ මුදලක් වැය වේ.

ජාතික රෝහල්වලට අමතරව රජයේ බෙහෙත් ශාලා 4 ක්ද, පෞද්ගලික ආයුර්වේද රෝහල් 4 ක්ද ප්‍ර දේශයේ පවතින අතර පෞද්ගලික රෝහල් 1 ක් සහ විශේශඥ වෛද්‍යාධාර සඳහා යොමු කිරීම මධ්‍යස්ථාන 3 ක්ද පවතී.

2.2.10 අධ්‍යාපන

පොළොන්නරුව නාගරික ප්‍රදේශය, පොළොන්නරුව අධ්‍යාපන කලාපයට හා තමන්කඩුව අධ්‍යාපන කොට්ඨාශයට අයිති වේ. නාගරික ප්‍රදේශය ඇතුලත සම්පූර්ණ පාසල් 30 ක් ව්‍යාප්තව පවතී. රාජකීය මධ්‍ය විද්‍යාලය ප්‍රදේශයේ පවතින එකම ජාතික මට්ටමේ පාසල වන අතර, එය සියළුම පහසුකම්වලින් සමන්විත වේ. උසස් අධ්‍යාපන අරමුණ සඳහා පුලතිසි අධ්‍යාපන විද්‍යාපීඨය, කාර්මික විද්‍යාලය, බැදිවැව විවෘත විශ්ව විද්‍යාලය, ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) ජාතික වෘතීය පුහුණු කිරීමේ මධ්‍යස්ථානය ප්‍රදේශය ඇතුලත පවතී. මෙම ආයතන අනුපිළිවෙලින් අවුරුද්දකට සිසුන් 200,500,470,100 ලියාපදිංචි කරනු ලබයි.

2.2.11 නගරයේ භූමි පරිහරණය

නාගරික ප්‍රදේශයේ සම්පූර්ණ භූමි ප්‍රමාණයෙන් වර්ග කිලෝමීටර 103 කි. එයින් 62% ක් වූ භූමිය අයත් වන්නේ නාගරික සංවේදී ලක්ෂණ සහිත භූමි භාවිතයන්ටය. එනම් 30% කුඹුරු ඉඩම් වන අතර ඉතිරි 32% පුරාවිද්‍යා සංරක්ෂණ භූමි, වැව්, ජලාශ සහ තෙත් බිම් ලෙසය. මුළු සැලසුම් කලාපයෙන් 23% ප්‍රදේශයක් සේවාධික කලාපය ලෙස ගතහැකි අතර එම ඉඩම් මූලික වශයෙන් ප්‍රධාන මාර්ග දෙපස පිහිටා ඇත. (ඇමුණුම 11)

නගරයේ ප්‍රධාන මධ්‍යස්ථාන තුනක් ලෙස සංවර්ධනය වී ඇති අතර පෙර ඒවා නම් කඳුරුවෙල, නවනගරය හා පූජා නගරයයි.වර්ෂ 2005 පෙර මෙම ප්‍රධාන මධස්ථාන 03 කුඹුරු වගාවන් හා පහත් බිම් මඟින් ස්වාභාවිකවම හඳුනාගත හැකි ලෙස වෙන් වෙන්ව පැවතිනි. පසුගිය දශක කිහිපයේ නවනගර ඉතා අඩු සංවර්ධන ප්‍රවණතාවක් පෙන්නුම් කරන ලදි. නමුත් වසර 2015 පසු නව යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය සමඟ මෙම මධ්‍යස්ථාන තුනෙහිම භූමි පරිහරණ රටාවේ සීඝ්‍ර වෙනසක් දක්නට ලැබුණි.මේ ආකාරයට තත්වය තවදුරටත් වර්ධනය වුවහොත් මෙම මධ්‍යස්ථාන 03 එකිනෙක හාවීමෙන් පූජා නගරයේ අනන්‍යතාවයට හානි සිදුවීම ඉහළ ඉඩකඩක් පවතී.

2.3 සැලසුම් සීමාවන් නිර්ණය කිරීම.

පහත දැක්වෙන තෙවැදෑරුම් අංශයන්ගෙන් සලකා බලා සැලසුම් සීමාවන් නිර්ණය කරන ලදි. මෙම අංශ තුනෙන්ම ලැබුණා වූ ප්‍රදේශ "අතිච්ඡාදනය" කිරීමෙන් පසුව ලැබුණු පොදු ප්‍රදේශය 2030 නගර සංවර්ධන සැලැස්මේ නගර සීමාව ලෙස තෝරා ගන්නා ලදි.

2.3.1 නගරයේ ක්‍රියාකාරී සීමාව

ඉහත සඳහන් කළ ආකාරයට පොළොන්නරුව නාගරික කලාපය ප්‍රධාන මධ්‍යස්ථාන තුනකට ඒකරාශී වී ඇති අතර, රෝහල හංදිය, ගල්ලැල්ල, බැඳිවැව හා සේවාගම නමින් ඇති කුඩා මංසන්ධි ද සිසුයෙන් නාගරීකරණය වෙමින් පවතී. මේවා සමඟ සලකා බලමින් නගරයේ ක්‍රියාකාරී කලාපය නිර්ණය කර ගැනීමට විවිධ අධ්‍යයන සිදු කරන ලදි. එනම්, මාර්ග සම්බන්ධතාව හා ජනාවාස රටාව, ප්‍රාදේශය අනුකලනය හා ජාල මධ්‍ය තක්සේරු ඇඟයීම සහ සංවර්ධන සම්පීඩතා විශ්ලේෂණය ඒ අතර වේ. එම අධ්‍යයනයන් මඟින් පවතින නාගරික කලාපය තවදුරටත් පුළුල් කළ යුතු බව හඳුනාගත හැකි වේ.

සංවර්ධන සම්පිඩනය පවතින 2005 අනුමත කළ නාගරික කලාපයෙන් පිටත ග්‍රාම නිලධාරී වසම් 12 ක් කරා පැතිර ඇති බව දක්නට ලැබුණු අතර, ඉන් ඇතැම් ග්‍රාම නිලධාරී වසමක භූමි ප්‍රමාණය 1/3 ක් පමණක් ඉහළ අගයක් දැක්වෙන අවස්ථාද දක්නට ලැබුණි.

2.3.2 භූගෝලීය ලක්ෂණ

සැලසුම් සීමාව තෝරා ගැනීමේදී පොකුරු ලෙස හඳුනාගත හැකි මානව ජනාවාස ඒ්වායේ හඳුනාගත හැකි ස්වාභාවික සීමාවන්, වෘක්ෂලතා රටාව, ජල පෝෂක ප්‍රදේශය ආදිය පිළිබඳව සලකා බලන ලදි. නැගෙනහිරින් මහවැලි ගඟ හා ජාතික ජල ගැලුම් නිම්නයත් දකුණින් අඹන්ගඟ හා බටහිරින් පරාක්‍රම සමුද්‍රයත් පවතින ජනාවාස වල ස්වාභාවිකව නිර්මාණය වූ සීමාවන් ලෙස හඳුනාගන්නා ලදි. එබැවින්, අවසන් සැලසුම් සීමාවන් නිර්ණයේදී නැගෙනහිර, බටහිර හා දකුණු දිශාවන් තීරණය කෙරුණේ ඉහත පැවසූ භූගෝලීය ලක්ෂණ මත පදනම්වය.

2.3.3 පරිපාලන සීමා

පෙර පැවති නාගරික කලාපයට අයත් ග්‍රාම නිලධාරී වසම 22 අයත් වූයේ තමන්කඩුව ප්‍රාදේශීය සභාවටය. නමුත්, 2016 දී එම ප්‍රාදේශීය සභාව පොළොන්නරුව මහනගර සභාව ලෙස ග්‍රාම නිලධාරී වසම 16කුත් පොළොන්නරුව ප්‍රාදේශීය සභාව ලෙස ග්‍රාම නිලධාරී වසම 37 කටත් බෙදා වෙන් කරන ලදි.

ඇතැම් ග්‍රාම නිලධාරී වසම වලින් නාගරික ලක්ෂණ පවතින්නේ 1/3ක ප්‍රදේශයක පමණි. එම නිසා සැලසුම් කලාපය තීරණය කිරීමේදී ඇති වන පරිපාලනමය සංකූලතා මඟහරවා ගැනීමට සම්පූර්ණ ග්‍රාම නිලධාරී වසම ම නාගරික කලාපයට ඇතුළත් කර ගන්නා ලදි.

අවසාන සැලසුම් කලාපය ග්‍රාම නිලධාරී වසම් 34 කිනුත් (18 ක් මහනගර සභාවට සහ 16 ක් ප්‍රාදේශීය සභාවට අයත්ය.) 65329 ක් වූ ජනගහනයක් හා පවුල් 16684 කින් සමන්විතය. භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර් 103.2 ක් වේ.



සිතියම 2.2: දිස්ත්‍රික්කයේ නිවාස ව්‍යාප්තියේ රටාව සහ ඒවායේ සම්බන්ධතාවය
මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය



සිතියම 2.3 : ග්‍රාම නිලධාරී වසම් අනුව සැළසුම් සීමාව නිර්ණය කිරීම
මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය



රූපය 2.3: සංවර්ධන තෙරපුම් විශ්ලේෂණය
මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය



සිතියම 2.4 : මාර්ග ජාල ප්‍රමුඛතා ඇගයීම අනුව ප්‍රදේශයේ ඒකාබද්ධතාවය (සමීප බව)
මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය



සිතියම 2.5. පාරසරික සංවේදී ප්‍රදේශ

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය



සිතියම 2.6. විභවතාව විශ්ලේෂනය

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය



සිතියම 2.7. නේවාසික යෝග්‍යතා විශ්ලේෂණය

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය

පරිච්ඡේදය 03 : සංවර්ධන සැලැස්මේ අවශ්‍යතාවය



3. සංවර්ධන සැලැස්මේ අවශ්‍යතාවය

නාගරික කලාපයක් ලෙස ගැසට් කරන ලද නාගරික ප්‍රදේශයක සංවර්ධන සැලැස්මක් සකස් කිරීම 1982 අංක 4 දරණ නාගරික සංවර්ධන අධිකාරියේ (සංශෝධිත) පනතේ 8 වන වගන්තිය යටතේ සඳහන් නෛතික අවශ්‍යතාවයකි. තවද, එම සැලැස්ම වසර 2050 සඳහා වූ ජාතික භෞතික සැලැස්මෙහි අදාළ නගරය වෙත පවරා ඇති කාර්යභාරයද ආවරණය කළ යුතුය.

මේ ආකාරයේ නාගරික සංවර්ධන සැලසුමක් සැකසීමේ මූලික අරමුණ නගරයේ ජනතාවට වඩා හොඳ ජීවන පරිසරයක් ලබා දීමයි. එනම්, ආර්ථික වර්ධනයට පහසුකම් සැලසීම, ස්වභාවික හා ගොඩනගන ලද උරුමයන් ආරක්ෂා කිරීම සහ සියළු වැසියන්ගේ ජීවන තත්වය වැඩිදියුණු කිරීම මඟින් වඩා හොඳ ජීවන පරිසරයක් අත්පත් කර ගැනීමයි.

සාමාන්‍යයෙන් සැලසුම් නොකළ සංවර්ධනය පාරිසරික හා වෙනත් අංශවල ගැටළු කිහිපයකට තුඩු දෙන අතර ක්‍රමයෙන් අසාර්ථක අබලන් වූ ජනාවාස ඇති කරයි. ඇතැම්විට සැලසුම් සහගත සංවර්ධනයන්ද නගර වැසියන්ගේ පවතින සමාජ, ආර්ථික, භෞතික හා පාරිසරික තත්ත්වයන් හා විශේෂ අවශ්‍යතා පිළිබඳ අවබෝධයක් නොමැතිකම හේතුවෙන් අනවශ්‍ය ප්‍රතිඵලයන්ට මගපෙන්වයි.

ඉහත පැවසූ අක්‍රමිකතාවයන් මගහරවා ගැනීම සඳහා මෙම නාගරික සංවර්ධන සැලැස්ම සැකසීමේදී නාගරික සංවර්ධන අධිකාරිය විසින් විද්‍යාත්මක ක්‍රමවේදයක් අනුගමනය කරන ලදි.

පොළොන්නරුව නාගරික ප්‍රදේශය සම්පූර්ණ නේවාසික ජනගහනය 64299 කින් යුත් අතර (2017 සම්පත් පැතිකඩ) වර්ග කිලෝමීටර 103ක භූමි ප්‍රදේශයක් සතුය . නගරයේ එක් එක් අංශයන්හි පාර්ශවකරුවන්ගේ උපදෙස් සාකච්ඡා වලින් ලබාගත් ප්‍රාථමික හා ද්විතික තොරතුරු විශ්ලේෂණය කිරීමෙන් පසුව 2030 සැලැස්මෙන් අවධානය යොමු විය යුතු ප්‍රශ්න ලැයිස්තුවක් ලබා ගන්නා ලදී. ප්‍රශ්න,විභවතා සහ පාර්ශවකරුවන්ගේ දැක්ම විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව පොළොන්නරුව සංවර්ධන සැලැස්මෙහි මූලික අවශ්‍යතාවයන් නිර්ණය කිරීමට හැකිවිය.ඒ අනුව පොළොන්නරුව නගරයේ තිරසාර හා ජීවත්වීමට යෝග්‍ය ඉලක්ක ළඟා කරගැනීම සඳහා මෙම සංවර්ධන සැලැස්ම ප්‍රධාන වශයෙන් අංශ හතරක් කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

පළමුවැන්න වඩා වැඩි වෙළඳ හා ආර්ථික අවස්ථා සඳහා ප්‍රදේශයට පවතින අවශ්‍යතාවයයි. සංඛ්‍යාලේඛන අනුව ප්‍රදේශයේ කම්කරුවන්ගෙන් (අවු:15ට වැඩි) ආර්ථිකමය වශයෙන් ක්‍රියාකාරී 46% පමණි.(ජාතික සාමාන්‍ය 52%). එසේම පවුල් 76% කම සාමාන්‍ය මාසික ආදායම රු.25,000.00 ට පහළ මට්ටමක පවතී. (ඇමුණුම 11 සිට ඇමුණුම 16 දක්වා) සංචාරක කර්මාන්තය ආශ්‍රිත මෙතෙක් භාවිත නොකළ විභවතාවයන් ප්‍රදේශයේ ගෘහස්ථ ආදායම වැඩි කිරීම සඳහා යොදාගත හැකිය. මේ වන විට කෘෂි සංචාරක කර්මාන්තය හා සංස්කෘතික අත්දැකීම් හා බැඳුනු උරුමයන් පිළිබඳ පෞරාණික සංචාරක කර්මාන්තය සඳහා ලෝකයේ ප්‍රවණතාවයක් පවතී. දැනට පවතින භෞතික යටිතල පහසුකම් භාවිත කරමින් විධිමත් ක්‍රමෝපයන්හි උපයෝගීත්වයෙන්, පරිසරයට හානි නොකර ආදායම් ඉපයීම සඳහා සංචාරක කර්මාන්තයේ විභවතාවයන් භාවිත කළ හැකිය.

දෙවනුව නගරයේ **අනන්‍යතාවය ආරක්ෂා කරමින් වැඩිදියුණු කිරීම** නගරයට අත්‍යවශ්‍යය. පොළොන්නරුව නගරය සතුව දෙවැදෑරුම් අනන්‍යතාවයක් පවතී. ඉන් එකක් නම් පොළොන්නරුව ලෝක උරුම නගරයක් වන අතර, එතිහාසික සාක්ෂි සලකා බැලූ විට එය අනුරාධපුර යුගය හා ආර්යයන්ගේ පැමිණීමටත් එහා ගිය දියුණු ජනාවාස ලක්ෂණ පෙන්වන සුවිශේෂී නගරයක් වීම හා අනෙක් කාරණාව නම් ශතවර්ෂ 100කට අධික කාලයක් ගොඩනැඟුණු වී ගොවිතැන, වාරි කර්මාන්තය සහ ඒ හා සම්බන්ධ සංස්කෘතියයි. පරාක්‍රමබාහු රජුගේ කාලයේදී *පෙරදිග ධාන්‍යාගාරය* යන විරුදාවලියෙන් හැඳින්වුන අතර තවමත් ජාතික සහල් නිෂ්පාදනයෙන් 55% කට වඩා වැඩි සහල් ප්‍රමාණයක් නගරයේදී නිෂ්පාදනය සිදු වේ. නමුත්, නගරයේ භෞතික ආකෘතිය මෙම දෙවැදෑරුම් අනන්‍යතාවයන් පිළිබිඹු නොකරන අතර, එය සුවිශාල සංවර්ධන විභවතාවයක් අපතේ හැරීමක් බවට පත්ව තිබේ. එනම්, දැනටද ලෝක උරුමයක් ලෙස පොළොන්නරුව නගරයට පවතින සංචාරක පදනම තවදුරටත් අනන්‍යතාවය සමඟ බැඳී විවිධ දිශානතීන්ට යොමු කරමින් නව ආර්ථික අවස්ථා නිර්මාණය කර ගැනීමේ හැකියාව ප්‍රයෝජනයට නොගෙන ඇති බවයි.

උදාහරණයක් ලෙස පොළොන්නරුව නගරය A 11 මාර්ගය හරහා නැගෙනහිර පළාතට සම්බන්ධවීමේදී පසුකර යන ප්‍රධාන නගරය ලෙස එහි වාසිය මේ වන තුරුත් හරියාකාරව භාවිතා කර නොමැතිය. විනෝදය අරමුණු කර ගත් නගරය පසු කර නැගෙනහිර මුහුදුබඩ ප්‍රදේශය වෙත යන සංචාරකයින් පවා සාර්ථක වූ උපාය මාර්ගික සැලැස්මක් මඟින් නවතා ගත හැකිය. ඒ සඳහා නගරයේ අනන්‍යතාවය විශේෂයෙන් මාර්ගයේ දෙපසින් හොඳින් පිළිබිඹු විය යුතුය.

නගර සංවර්ධන සැලැස්මේ අවශ්‍යතාවය ගත් කල තෙවනුව නගරයේ අනන්‍යතාවය හා තිරසරභාවය ස්ථාපනය කිරීම සඳහා **ඓතිහාසික අංගයන් හා පාරිසරික සංවේදී ප්‍රදේශයන් ආරක්ෂා කිරීම හා සංරක්ෂණය** හඳුනා ගන්නා ලදි. ප්‍රධාන නිර්ණායකයන් තුනක් හේතුකොටගෙන **1985** වර්ෂයේදී පොළොන්නරුව ලෝක උරුමයක් බවට පත්විය. ඉන් පළමුවැන්න පරාක්‍රමබාහු රජුගේ නගරයේ අසාමාන්‍ය මානයන් සහ එහි පදනම ස්වභාවික පරිසරය සමඟ ඇති ඉතා විශේෂ සම්බන්ධතාවය නිසාය. චෝළ, බ්‍රහ්මණවාදී මූලධර්ම සහිත ශිෂ්ඨාචාර කිහිපයක් සහ ඒවායේ විශේෂිත ශෛලීන්ද,**12** හා **13** ශතවර්ෂ අතරතුර සිංහලයන්ගේ ස්වෛරී පාලනය පිළිබඳවද පොළොන්නරුව සාක්ෂි දැරීම දෙවැන්නයි. තෙවැන්න මෙම ප්‍රදේශය බෞද්ධයන්ගේ හා සිංහලයන්ගේ ඉතිහාසය තුළ මුදුන්මල්කඩක් බදු සිද්ධස්ථානයක් වීමයි. ඉහත සඳහන් ප්‍රධාන ලක්ෂණයන්ට සිදුවන හානි ලෝක උරුම නගරයට තර්ජනයක් වන අතර එසේ වන්නේ නම් ලෝක උරුම ලැයිස්තුවෙන් පොළොන්නරුව පෞරාණික නගරය ඉවත්වීමේ හැකියාවක්ද පවතී. මෙය නගරයට පමණක් නොව සංචාරක අංශයන්ගෙන් ප්‍රතිලාභ ලබන මුළු රටටම බලපානු ඇත.

වර්තමානයේ නාගරික ප්‍රදේශයේ ප්‍රධාන මධ්‍යස්ථාන තුනෙහි ඇති ඉඩම් සඳහා ඇති ඉල්ලුම වැඩි වීමත්, දැනට ක්‍රියාත්මක වෙමින් පවතින බොහෝමයක් සංවර්ධන ව්‍යාපෘති නිසාත් ක්‍රමයෙන් නගරයේ අනන්‍යතාවයටත් ස්වභාවික පරිසරයටත් තර්ජනාත්මක වෙමින් පවතී. නගරයේ ජීවත්වීමේ හැකියාව සහ තිරසරභාවය ආරක්ෂා කිරීම සඳහා පරිසර සංවේදී ප්‍රදේශවල ආරක්ෂාව හා සංරක්ෂණය ඉතා වැදගත් වේ.

නගර සැලැස්මේ **සිවුවැන්න අලංකරණය, සම්බන්ධීකරණය හා ජීවත්වීමේ යෝග්‍යතාවය වැඩිදියුණු කිරීමයි.** හදිසි අධික වර්ෂාව, අධික උෂ්ණත්වය වැනි නිවර්තන දේශගුණික තත්වයන් නගරයේ සුවපහසු මට්ටම අවම කරයි. දහවල් කාලයේදී කඳුරුවෙල වාණිජ මධ්‍යස්ථානය ඉතාමත් අයහපත් පාරිසරික තත්වයක් පෙන්නුම් කරන අතර, මීටර් **500** ක දුර පවා ගමන් කිරීම ඉතා පීඩාකාරී වේ. එසේම, එය අනපේක්ෂිත වාහන තදබදයද වැඩි කරයි. ගිමන් හැරීම සඳහා නගර මධ්‍යයේ සංවිධානය කළ විවෘත හෝ විනෝදය සඳහා වූ අවකාශයක් නොමැති අතර දහවල් කාලයේ හරිත සෙවන ස්ථානයක් සොයා ගැනීමද අභියෝගයකි.

නගර සැලැස්මේ සිව් වන අවශ්‍යතාවය ලෙස ඉහත අංශය තෝරා ගැනීමේදී සලකන ලද තවත් එක්තරා ප්‍රධාන ප්‍රශ්නයක් වනුයේ රෝහල් හන්දියේ හා වාණිජ නගරයේ ඇති විශාල වාහන තදබදයයි. එයට හේතු ලෙස විශලේෂණයේදී සොයා ගන්නා ලද්දේ විකල්ප මාර්ගයන් පිළිබඳව ඇති අවම දැනුවත්කම, සන්ධිස්ථාන තුනෙහි විධිමත් පොදු ප්‍රවාහන චක්‍රයක් නොමැති වීම, පදිකයන්ට අහිතකර පරිසරය, රථගාල්වල අවිධිමත් පරිහරණය,

වාහන හැරවීමට වටරවුම් නොමැති වීම වැනි බොහෝමයක් හේතූන්වල ප්‍රතිඵලයක් බවය. එමෙන්ම, හොඳින් සැලසුම් කළ ජලාපවහනයක් නොමැතිවීම, නගර මධ්‍යයේ අපජල පිරියම් කිරීමේ ක්‍රමයක් නොමැතිවීම නිසා සම්පූර්ණ වාරි මාර්ග පද්ධතියම දූෂණය වීම සිදු වී ඇත. පිරියම් නොකළ අපජලය සමග වූ ඝණ අපද්‍රව්‍ය ඇළ මාර්ග අවහිර කරන අතර නිරපේක්ෂිත අධික වර්ෂාව සහ අවම බෑවුමක් සහිත තැනිතලා භූමිය ගැටළුව තීව්‍ර කරයි. සංඛ්‍යාත්මකව ගත් කල අපජල කාණු නිසා නිවාස 3/5 කටම ඒ ආශ්‍රිත ගැටළුවකට මුහුණ දීමට සිදු වේ. ජලාපවහනයේ, වාරිමාර්ග පද්ධතියේ හා ප්‍රවාහනයේ වඩාත් හොඳ සම්බන්ධතාවයක් නගරයේ අනාගතයේ ජීවත් වීමේ යෝග්‍යතාවය වැඩිදියුණු කරනු ඇත.

ඉහත සඳහන් කළ ප්‍රධාන අංශයන්හි ගැටළු මගහරවා ගැනීමට ඇති එකම විසඳුම වන්නේ ඒකාබද්ධ හා සවිස්තරාත්මක භෞතික සංවර්ධන සැලැස්මක් වන අතර, එවන් සැලැස්මක් මඟින් පොළොන්නරුව සෞඛ්‍ය සම්පන්න , ධනවත් , පෞරාණික හරිත නගරයක් බවට පත් වනු ඇත.

ගරු ඇමතිතුමාගේ පණිවුඩය

ගැසට් පත්‍රිකාව

පරිච්ඡේදය 04 : සංවර්ධන සැලසුම් රාමුව



4. සංවර්ධන සැලසුම් රාමුව

4.1 දැක්ම

පොළොන්නරුව නාගරික ප්‍රදේශය **2030** සඳහා වූ දැක්ම ;

"සහල් රාජධානියේ මහිමාන්විත උරුමයේ හරිත නගරය"

සහල් රාජධානියේ යනුවෙන් අදහස් වන්නේ දිස්ත්‍රික්කයේද නගරයේද ශත වර්ෂ ගණනක අනන්‍යතාවය හා ආර්ථික පදනමයි.

මහිමාන්විත යනුවෙන් අදහස් වනුයේ තේජාන්විත, ධනවත්, සෞඛ්‍ය සම්පන්න සියළු දෙයින් ආඪ්‍ය වූ නගරයක් බවයි.

උරුමය යනුවෙන් අදහස් කළේ නගරය හා බැඳුනු විශිෂ්ට ඉතිහාසය, පුරාවස්තූන් පිළිබඳ ආරක්ෂාව, නගරයේ අනන්‍යතාවය හා ඒ මඟින් සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනයයි.

හරිත වචනයෙන් අදහස් කෙරෙනුයේ නිර්තන දේශගුණික ලක්ෂණ වලට සාර්ථකව මුහුණ දෙන සන්සුන් ප්‍රසන්න හරිත පරිසරය හා අනාගතයේදී හරිත පරිසර ප්‍රමිතීන් අනුගමනය කිරීමට ඇති නැඹුරුතාවය යන්නයි.

නගරය ලෙස අදහස් කරනුයේ පොළොන්නරුව නාගරික කලාපයයි.

4.2 දැක්ම ප්‍රකාශණය

"නිවර්තන දේශගුණය තුළ සුවපහසු ජීවිතයක් ලබා දෙන අතර, නගරයේ සුවිශේෂීත්වය සහ ස්වභාවය නැති කර නොගෙන උරුම නගරයක් සහ රටේ ප්‍රමුඛතම වී නිෂ්පාදකයා ලෙස හොඳම වාසි අත්කර ගැනීම."

4.3 ඉලක්ක

1. වසර 2030 වන විට පොළොන්නරුව නගරය ශ්‍රී ලංකාවේ හොඳම පෞරාණික සංචාරක ගමනාන්තය බවට පත් කිරීම මගින් නගරයට වැඩි ආර්ථික අවස්ථා නිර්මාණය කිරීම.
(පවතින නටඹුන් හා කුඹුරු පදනම් වූ කෘෂිකාර්මික සංචාරක කටයුතු සමඟ).

2. ඓතිහාසික හා හරිත සංවේදි ප්‍රදේශ ආරක්ෂා කිරීම.

3. නගර වැසියන් හා නගරයට පැමිණෙන්නන් සඳහා නිවර්තන දේශගුණය තුළ සුවපහසු හා ප්‍රසන්න වූ ජීවත්වීමට හැකි පරිසරයක් නිර්මාණය කිරීම.

4.4 අරමුණු

පළමු ඉලක්කය සඳහා අරමුණු

"වසර 2030 වන විට පොළොන්නරුව නගරය ශ්‍රී ලංකාවේ හොඳම පෞරාණික සංචාරක ගමනාන්තය බවට පත් කිරීම මගින් නගරයට වැඩි ආර්ථික අවස්ථා නිර්මාණය කිරීම (පවතින නටඹුන් හා කුඹුරු පදනම් වූ කෘෂිකාර්මික සංචාරක කටයුතු සමඟ)."

1) වසර 2025 වනවිට හතමුණ මන්සන්දියේ සිට කදුරුවෙල නගරය දක්වා පවතින
සෑම අංගයක්ම පෞරාණික උරුමයේ ලක්ෂණ පෙන්නුම් කරන පරිදි ප්‍රතිසංවිධානය කිරීම.

2) 2020 වන විට සංචාරක කටයුතුවල යෙදී සිටින පාර්ශවකරුවන්ගේ ලැයිස්තුවක් සකස් කිරීම සහ අන්තර්ජාලය ඔස්සේ ඒ සඳහා පිවිසීමට අවශ්‍ය පහසුකම් සැලසීම.

3) වසර 2025 වන විට සංචාරක කර්මාන්තයේ යෙදෙන සියලු පාර්ශවකරුවන්, වාසස්ථාන, නැවතුම්පලවල් සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කිරීම.

4) වසර 2025 වන විට සහල් කෞතුකාගාරයක් හා විශේෂිත වී වෙළඳ මධ්‍යස්ථානයක් ඉදිකිරීම.

5) වසර 2025 වන විට නගරය වෙත පැමිණෙන සංචාරකයින් හට පෞරාණික නටඹුන් හැර වෙනත් ආකර්ෂණීය ස්ථාන නැරඹීම සඳහා විකල්ප සංචාරක

6) වසර 2030 වන විට නගර මධ්‍යයේ තෝරා ගත් කුඹුරු ඉඩමක සාම්ප්‍රදායික කෘෂිකර්ම ක්‍රම භාවිත කරමින් ගොවි ගම්මානයක් ඉදි කිරීම.

7) වසර 2030 වන විට සහල් ආශ්‍රිත අගය වැඩිකළ නිෂ්පාදන සැකසීමට එක් කර්මාන්ත ශාලාවක් හෝ ස්ථාපිත කිරීම.

දෙවන ඉලක්කය සඳහා අරමුණු

"ඓතිහාසික හා හරිත සංවේදී ප්‍රදේශ ආරක්ෂා කිරීම"

1) වසර **2025** වන විට සැලසුම් ප්‍රදේශය තුල පවතින **100%** සියළු වැව්, වනාන්තර හා ඓතිහාසික උරුමයන්හි රක්ෂිතවල මායිම් භෞතිකව සලකුණු කිරීම

තෙවන ඉලක්කය සඳහා අරමුණු

"නගර වැසියන් හා නගරයට පැමිණෙන්නන් සඳහා නිවර්තන දේශගුණය තුළ සුවපහසු හා ප්‍රසන්න වූ ජීවත්වීමට හැකි පරිසරයක් නිර්මාණය කිරීම"

1) වසර **2030** වන විට ප්‍රධාන නගර මධ්‍යස්ථාන තුන එකිනෙක සම්බන්ධ කරමින් නීල හරිත (වාරිමාර්ග හා කුඹුරු ඉඩම්) අවකාශ පද්ධතියක් නිර්මාණය කිරීම.

2) **2025** වන විට මීටර් **500** ක් ඇවිද යා හැකි දුරක් ඇතුළත සංවිධානය කළ විවෘත භූමි ප්‍රදේශයක් හෝ හරිත සෙවනක් ලබා දීම.

3) වසර **2030** වන විට කඳුරුවෙල නගර මධ්‍යයේ පවතින වැඩි උෂ්ණත්වය සාමාන්‍ය පරිසර උෂ්ණත්වය තෙක් අවම කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.

4) වසර **2030** වන විට ක්‍රමවත් නොබිඳුනු වාරිමාර්ග ජාලය වැඩිදියුණු කිරීම.

5) **2030** වන විට සැලසුම් ප්‍රදේශය සඳහා ප්‍රධාන ජලාපවහන සැලැස්මක් සැකසීම හා ක්‍රියාත්මක කිරීම.

6) අපජල පිරිපහදු කිරීමේ සැලැස්මක් සැලසීම හා **2025** වන විට ක්‍රියාත්මක කිරීම.

පරිච්ඡේදය 05 : ශක්තීන්, දුර්වලතා, අවස්ථා,තර්ජන,විශ්ලේෂණය සහ විස්තරාත්මක විශ්ලේෂණය





5. ශක්තීන්,දුර්වලතා,අවස්ථා,තර්ජන විශ්ලේෂණය සහ විස්තරාත්මක විශ්ලේෂණය

"සහල් රාජධානියේ මහිමාන්විත උරුමයේ හරිත නගරය" යන දැක්ම ළඟා කර ගැනීමේදී ප්‍රධාන ඉලක්ක 03 ක් සපුරා ගත යුතුව ඇත. නමුත්, එම ඉලක්ක ළඟා කර ගැනීමේදී අප නගරය සතුව ඇති ශක්‍යතාවය, ධාරිතාවය කොපමණදැයි හඳුනාගත යුතුය. ඒ අනුව, එම ඉලක්ක තුළ ඇති ප්‍රායෝගික භාවය සනාථකර ගත හැකිය.මේ සඳහා සුදුසුම විශ්ලේෂණය ලෙස "ශදුඅත" විශ්ලේෂණය හඳුනා ගන්නා ලදි. එනම්, එක් එක් ඉලක්ක ළඟා කර ගැනීම සඳහා නගරය සතුව ඇති ශක්තීන්, දුර්වලතා සහ අපගේ පරිපාලනයන්ගෙන් බැහැරව පවතින අවස්ථා හා තර්ජන හඳුනාගත යුතුය. එවිට උපායමාර්ගික සැලැස්මක් මඟින් දුර්වලතා ජය ගැනීමට ඇති ශක්තිය සහ අවස්ථාද තර්ජන සඳහා සූදානම් වීමට ඇති අවස්ථා සහ ශක්තීන්ද කළමනාකරණය කර ගැනීමට මගපාදා ගත හැකිය.



5.1 ඉලක්ක 01

වසර 2030 වන විට පොළොන්නරුව නගරය ශ්‍රී ලංකාවේ හොඳම පෞරාණික සංචාරක ගමනාන්තය බවට පත් කිරීම මගින් නගරයට වැඩි ආර්ථික අවස්ථා නිර්මාණය කිරීම (පවතින නටඹුන් හා කුඹුරු පදනම් වූ කෘෂිකාර්මික සංචාරක කටයුතු සමඟ).

ශක්තීන්	1. යුනෙස්කෝ මගින් ලෝක උරුම නගරයක් ලෙස ප්‍රකාශයට පත් කර තිබීම 2. අනෙකුත් යුනෙස්කෝ ලෝක උරුම නගර හා ස්ථාන පොළොන්නරුවට ආසන්නයේ තිබීම. 3. ලංකාවේ එල්ලංගාව වැව් ගම්මාන පද්ධති ලෝකයේ කෘෂිකාර්මික උරුමයක් ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානය මඟින් 2018.04.19 හඳුනා ගැනීම. 4. පුරාණ නටඹුන් සමඟ පෞඪ ඉතිහාසයක් පැවතීම 5. පිබිදෙමු පොළොන්නරුව වැඩ සටහන (අපරව්‍යුහ පහසුකම් ජාලය, සංචාරක පහසුකම් මධ්‍යස්ථාන, ත්‍රීමාන කෞතුකාගාරය යනාදිය) 6. පවතින සංචාරක පදනම හා හෝටල් 7. පවතින වී නිෂ්පාදන සහ සැකසුම් ඒකක (සහල් නිෂ්පාදන කර්මාන්ත) 8. පාරිසරික වශයෙන් වටිනා වැදගත් ස්ථාන නගරය ආසන්නව පිහිටා තිබීම 9. පවතින මාර්ග පද්ධතිය
දුර්වලතා	1. පූජා නගරය හා සම්බන්ධ වන විකල්ප සංචාරක සැලසුම් නොමැති වීම (වෙනත් සුවිශේෂී නැරඹුම් ස්ථාන ඇතුළත් කළ) 2. අවිධිමත් සංචාරක තොරතුරු මධ්‍යස්ථානය. 3. සංචාරක කර්මාන්තය සඳහා පවතින නවාතැන්වලින් 80% ක් පමණ අනවසර ඒවා වීම 4. සම්ප්‍රදායික වී වගා ක්‍රම බහුලව භාවිතා නොවීම
අවස්ථා	1. දේශපාලන සහයෝගය 2. ලංකාවට විදේශිකයින්ගේ පැමිණීම 3. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සහ ක්‍රිස්තියානි කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් සකසනු ලැබූ ශ්‍රී ලංකා සංචාරක උපාය මාර්ගික සැලසුම 2017 – 2020 4. ප්‍රාදේශීයව හා විදේශිකව සහල්වලට පවතින ඉල්ලුම 5. කෘෂි සංචාරක සංකල්පය විශේෂයෙන් වී නිෂ්පාදනය හා බැඳුනු සංස්කෘතිය 6. ස්වාභාවික විපත් ඇති වීමේ අඩු ප්‍රවනතාවය
තර්ජන	1. උරුම නගර / සංස්කෘතික අත්දැකීම් ලැබීමට ලංකාවට පැමිණෙන සංචාරකයින් අඩු වීමේ ප්‍රවණතාවය.

වගුව 5.1 පළමු ඉලක්කය හා "ශදුඅත" විශ්ලේෂණය
මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය

ඉලක්ක 1 - ශක්තීන්

1. යුනෙස්කෝ මගින් ලෝක උරුම නගරයක් ලෙස ප්‍රකාශයට පත් කර තිබීම

ලෝක උරුම ස්ථානයක් යනු එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය - (යුනෙස්කෝ) විසින් සංස්කෘතික, ඓතිහාසික, විද්‍යාත්මක හෝ වෙනත් වැදගත් ආකාරයකින් තෝරා ගනු ලබන සන්ධිස්ථානයක් හෝ ප්‍රදේශයක් වන අතර ඒවා ජාත්‍යාන්තර ගිවිසුම් මඟින් නිත්‍යානුකූලව ආරක්ෂා කර ඇත. මෙම ස්ථාන මානව වර්ගයට ඇති සාමූහික අවශ්‍යතාවන්හි වැදගත්කම අනුව තීරණය කර ඇත.

සන්නද්ධ ගැටුම් හා යුධ තත්වයන්, ස්වාභාවික විපත්, දූෂණය, මුහුදු කැණීම් හෝ නාගරීකරණය හෝ මානව සංවර්ධනය හේතුවෙන් මෙම ලෝක උරුමයන් ලේඛණගත ලැයිස්තුවෙන් ඉවත් කල හැක.යුනෙස්කෝ ICOMOSපැරිස්, මාස් 1982, ලෝක උරුම ලේඛන අංක 201 අනුව පහත නිර්නායකයන් පොළොන්නරුව නගරය ලෝක උරුමයක් ලෙස ප්‍රකාශයට පත්කිරීම සඳහා යොදාගෙන ඇත.

- 12 වෙනි ශත වර්ෂයේදී පළමුවන පරාක්‍රමබාහු රජු විසින් නිර්මාණය කරන ලද ස්වෛරී අගනගරය ඉතිහාසයේ ඉතාමත් විශ්මිත නගර නිර්මාණවලින් එකක් වීම හා එය ස්වාභාවික පරිසරය හා මනා සම්බන්ධතාවයක් පැවතීම.

- පොළොන්නරුව නගරය ශිෂ්ටාචාර කිහිපයකටම සුවිශේෂී වූ වස්තුවකි. ඒ අතරින් 12 හා 13 ශත වර්ෂයන්හිදී චෝල හා බ්‍රහ්මණවාදීන්ගේ සංස්කෘතික ලක්ෂණයන්ද ස්වෛරී සිංහල නගරයක් ලෙසද භෞතික පරිසරය තුළ හමුවන සාධකයන් එයට සාක්ෂි සපයයි.

- සිංහල හා බුදුදහම පිළිබඳ පූජනීය සිද්ධස්ථානයක් වීම, විජයබාහු රජු විසින් සිංහලයින්ගේ මුදුන්මල්කඩ ලෙස සැලකූ දන්ත ධාතුව තැන්පත් කර අටදාගේ කරවීම හා දෙවන බුවනෙකබාහු රජු විසින් එය ඉවත් කිරීම මඟින් පොළොන්නරුව පරිහානියට පත්වීම.

සැලැස්මේ ඉලක්ක 1 සඳහා "උරුමයන් පිළිබඳ වූ සංචරණය" පිළිබඳ අර්ථකථනයම ශක්තියක් ලෙස ගත හැක. ඇමරිකා එක්සත් ජනපදය "උරුමයන් පිළිබඳ වූ සංචරණය" අර්ථදක්වන්නේ "අතීතයේ මිනිසුන් හා කතාන්දර පිළිබඳ නියෝජනයන් කරන්නා වූ ස්ථාන, ක්‍රියාකාරකම්, කෞතුක වස්තු පිළිබඳ අත්දැකීම් ලැබීමට සංචාරය කිරීම" ; සංස්කෘතික, ස්වභාවික සම්පත් හා ඓතිහාසික ස්ථානද එයට ඇතුළත් කළ හැකිය. කෙසේ වුවද, මෙහි සමස්ත අරමුණ නම් අතීතය අගය කිරීමයි.

2. අනෙකුත් යුනෙස්කෝ ලෝක උරුම නගර හා ස්ථාන පොළොන්නරුවට ආසන්නයේ තිබීම.

ශ්‍රී ලංකාව තුල යුනෙස්කෝ මඟින් ලෝක උරුමයන් ලෙස ප්‍රකාශයට පත් කොට ඇති ස්ථාන අටකි. එනම්,

I. පොළොන්නරුව උරුම නගරය (1982)
II. සීගිරිය උරුම නගරය (1982)
III. දඹුලු රජ මහා විහාරය (1991)
IV. පැරණි ගාලු නගරය හා එහි බලකොටුව (1988)
V. අනුරාධපුර පූජා නගරය (1982)
VI. මහනුවර පූජා නගරය (1988)
VII. ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරය (2010)
VIII. සිංහරාජ වනාන්තරය (1988)



රූප සටහන 5.1: ශ්‍රී ලංකාවේ යුනෙස්කෝ උරුම නගර
මූලාශ්‍රය : නිවාස, ඉඩකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ වෙබ් පිටුව 2019

මෙම උරුමයන් අතරින් සීගිරිය, දඹුල්ල, අනුරාධපුරය හා මහනුවරට පොළොන්නරුව නගරයේ සිට ඇත්තේ පැය 4 ක පමණ ගමන් වේලාවක් ඇති දුරකි. මීට අමතරව සේරුවිල මංගල රජ මහා විහාරය, මහවැලි ගඟ ඔස්සේ සේරුවිල සිට ශ්‍රී පාදයට යන වන්දනාකරුවන්ගේ ගමන් මාර්ගයද යුනෙස්කෝ ලෝක උරුම තාවකාලික ලැයිස්තුවට ඇතුලත් කර ඇත. ඒ අනුව පොළොන්නරුව ශ්‍රී ලංකාවේ ලෝක උරුම නගරයන්හි කේන්ද්‍ර ස්ථානයක් ලෙස දැක්විය හැකිය.

3. ලංකාවේ එල්ලංගාව වැව් ගම්මාන පද්ධති ලෝකයේ කෘෂිකාර්මික උරුමයක් ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානය මඟින් 2018.04.19 හඳුනා ගැනීම.

එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් ශ්‍රී ලංකා කෘෂිකාර්මික පද්ධතියක් වන වියළි කලාපයේ "එල්ලංගා ගම්මාන" ක්‍රමය ගෝලීය වශයෙන් වැදගත් කෘෂිකාර්මික උරුම පද්ධතියක් (GIAHS) ලෙස නම් කරන ලදී. ඉතාලියේ රෝමයේ පැවති නව GIAHS අඩවි සඳහා වූ ජාත්‍යන්තර සංසදය සහ සම්මාන ප්‍රදානෝත්සවයේදී ශ්‍රී ලංකාවේ එල්ලංගා ගම්මාන පද්ධතිය පිළිගැනීමට ලක්විය.

FAO විසින් මෙහෙයවනු ලබන මෙම වැඩසටහන මගින් වටිනා කෘෂිකාර්මික උරුමයන් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම, ජෛව විවිධත්වය හා සාම්ප්‍රදායික දැනුම ආරක්ෂා කිරීම මෙන්ම ප්‍රතිරෝධී පරිසර පද්ධති නිර්මාණය කිරීම අරමුණු කර ඇත.

රටේ කෘෂිකාර්මික නිෂ්පාදනයේ විශාලතම කොටස සඳහා අඩිතාලම වන එල්ලංගා ගම්මාන කෘෂි ජෛව විවිධත්වයේ සහ වනජීවී විවිධත්වයේ විශිෂ්ට උරුමයක් සපයන අතර ස්වාභාවික විපත් හා දේශගුණික විපර්යාසයන්ට එරෙහිව අද්විතීය ආවරණයක් වේ. මෙම පද්ධතියේ ගෝලීය වැදගත්කම ඉහළ මට්ටමක පවතින්නේ ජලය ගබඩා කිරීමෙන් පාලනය කළ හැකි ගංවතුර වැනි ස්වාභාවික විපත් වල කම්පන අවශෝෂණය කර ගැනීමට සහ අවට පරිසර පද්ධතියේ පැවැත්මට දායකවීම නිසාය. නියඟය



රූප සටහන **5.2 :** ශ්‍රී ලංකාවේ එල්ලංගා වැව් ගම්මාන පද්ධතියේ සංරචක සහ ඒවායේ සාපේක්ෂ පිහිටීම

මූලාශ්‍රය: ආචාර්ය පී.බී. ධර්මසේන 2010: "ග්‍රාමීය තිරසාරභාවය සඳහා එල්ලංගා වැව් ගම්මාන පද්ධති"

හේතුවෙන් වැව් වලින් සිදුවන ජල හානිය අවම කිරීමෙන් වැව් හා ඇළ දොළ ජාලයක් හරහා එක් වැවක සිට තවත් වැවකට ගලා යන කාර්යක්ෂම ජල කළමනාකරණයට ද එල්ලංගා ගම්මාන පද්ධතිය දායක වේ.

කෙසේ වෙතත්, එල්ලංගා වැව් ගම්මාන පද්ධතිය අඛණ්ඩව පවත්වාගෙන යාම ගොවීන්ගේ දුර්වල ආදායම, තරුණ තරුණියන්ගේ ග්‍රාමීය-නාගරික සංක්‍රමණය, වන විනාශය සහ වැව් පරිසර පද්ධතියේ පිරිහීම යන හේතුනිසා තර්ජනයට ලක්ව ඇත. රටේ ආහාර හා ජීවනෝපාය සුරක්ෂිතතාවයේ අඛණ්ඩතාව සහ වැඩිදියුණු කිරීම මෙන්ම තිරසාර ග්‍රාමීය සංවර්ධනය සහතික කිරීම සඳහා එල්ලංගා වැව් ගම්මාන පද්ධතියහි ආරක්ෂාව අත්‍යවශ්‍ය වේ. මෙම ක්‍රමය ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා රජය ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇති අතර පද්ධතිය සංරක්ෂණය හා සංවර්ධනය සඳහා ප්‍රධාන සැලැස්මක් සකස් කරමින් සිටී. (මූලාශ්‍රය: http://www.fao.org/srilanka/news/detail-events/en/c/1118377)

එල්ලංගා සංකල්පයට අනුව ක්‍රියාත්මක වන මධ්‍යම ප්‍රමාණයේ වැව් තුනක් සහ කුඩා පරිමාණ විල් 45 ක් පමණ සැලසුම් කලාපයට අයත්ය. පරාක්‍රම සමුද්‍රය සැලසුම් කලාපයට බටහිර මායිමේ පිහිටා ඇති අතර එය සැලසුම් ප්‍රදේශයට අයත් නොවන නමුත් සමුද්‍රය වැව් බැම්මෙන් ආරම්භ වන ප්‍රධාන වාරි ඇලමාර්ග දෙක සහ වාරිමාර්ග ජාලය සැලසුම් ප්‍රදේශයට අයත් ය. පොලොන්නරුව නගරයේ සිට වාරිමාර්ග කටයුතු පිළිබඳ පුරාණ තාක්ෂණය තථ්‍ය ස්ථානවල පෙන්විය හැකි අතර කෘෂි සංචාරක කටයුතු සඳහා ද විශාල විභවයක් ලෙස භාවිතා කිරීමේ හැකියාව ඇත.

4. පෞඪ ඉතිහාසයක් සහිත පුරාණ නටඹුන් ඇති නගරයක් වීම

පෙලොන්නරුවේ පූජා නගරය හා කෞතුකාගාරය, නගරයට පෞඪ ඉතිහාසයක් ඇති බවට වූ සාක්ෂි වේ. මෙහි ගොඩනැගිලි ඉදිකිරීම් තාක්ෂණය, වාරිමාර්ග පද්ධතිය, සංස්කෘතික සම්බන්ධතාව, පාරිසරික සමතුලිතතාව, ආර්ථික කටයුතු, සෞඛ්‍ය අංශය, අධ්‍යාපන පහසුකම් සහ තවත් කරුණු කිහිපයක් සඳහා සාධක තවමත් දැකිය හැක. මෙම නගරය යුනෙස්කෝ ලෝක උරුම නගරයක් වීම, වසර 2030 වන විට ලංකාවේ විශිෂ්ඨතම උරුම සංචාරක මධ්‍යස්ථානයක් බවට පත් කිරීමට ඇති විශාලම ශක්තියයි.



රූපය 5.3: පොලොන්නරුව පූජා නගරයේ නටඹුන් වල පිහිටීම.
මූලාශ්‍රය: පුරාවිද්‍යා දෙපාර්තුමේන්තුව

ක්‍රි.පූ.කාලයේ පටන් පොලොන්නරුව ජනාවාස වීමත් සංවර්ධනය වීමත් සිදුවී ඇත. දුටුගැමුණු - එළාර සටන සිදුවූ විජිතපුර පිහිටා ඇත්තේද පොලොන්නරුව නගරයේය.

පොලොන්නරුවේ පිහිටි ගෝපාල පබ්බත නම් ස්ථානයෙන් එහි පුරාණ පුරාවිද්‍යාත්මක සාක්ෂි හමුවී ඇති අතර (දැන් එය ගල් විහාරය ලෙස හඳුන්වයි) ඒවා පළමු ශත වර්ෂයට

අයත් වේ. පොලොන්නරු යුගයේ රජ කළ උපතිස්ස රජුගේ කාලයේ (ක්‍රි.ව.365-406) "ඉතිහාසය" පිළිබඳව ග්‍රන්ථවල (වංශ කතා) සටහන් කිරීම ආරම්භ කරන ලද අතර තෝපා වැව ඔහු විසින් කරවන ලද්දකි. තුන්වෙන අග්ගබෝධි රජු විසින් පොලොන්නරුවේ මහ ප්‍රානදීප විහාරය කරවන ලදී.

7 වන සියවසේ සිට අවස්ථා කිහිපයකදී මෙරටෙහි විදේශ ආක්‍රමණ හා අභ්‍යන්තර අරගල සිදුවී ඇති අතර තාවකාලික පාලන මධ්‍යස්ථානයක් ලෙස රාජධානිය අනුරාධපුරයේ සිට පොලොන්නරුව දක්වා ගෙන යාමට මෙය හේතු වී ඇත. හතරවන අග්ගබෝධි රජු තාවකාලික පාලන මධ්‍යස්ථානයක් ලෙස අගනගරය පොලොන්නරුවට මාරු කරන ලද අතර එහිදී ඔහු මිය යන ලදී. දෙවන මහින්ද රජු (ක්‍රි.ව.777 – 797) විසින් දාම විහාර පිරිවෙන හා තම්බිලිතොට පිරිවෙන කරවන ලද අතර උදය රජු විසින් (ක්‍රි.ව.797 – 801) පොලොන්නරුවේ රෝහල ඉදිකරවන ලදී.

ක්‍රි.ව. 1017 දී සොළී ජනයා විසින් සාස්වන මිහිඳු රජු පරාජයට පත්කල අතර රාජධානිය ජනනාථපුරම් නමින් පොලොන්නරුවට ගෙන යන ලදී. චූලවංශයට අනුව පොලොන්නරු යුගය ආරම්භයේ සිට විජයබාහු රජුගේ කාලය තෙක් නිදහස් රාජ්‍යයක් ලෙස පැවතුන අතර සොළීන් සංස්කෘතිය විනාශ කරමින් රට අරාජික බවට පත්කරන ලදී. මෙම කාලය තුල හින්දු පාලන කටයුතු හා ආගමික කටයුතු සඳහා විශාල ගොඩනැගිලි ප්‍රමාණයක් ඉදිකර ඇති අතර වර්තමානයේ එහි පවතින ශිව දේවාලයද එම කාලය තුල ඉදිකරන ලද්දකි.

විජයබාහු රජු විසින් (ක්‍රි.ව.1055 – 1110) විදේශ ආක්‍රමණයන්ගෙන් රට නිදහස් කර ගන්නා ලදී. ඔහු අනුරාධපුරයේ අලුතින් ඉදිකරන ලද මාලිගයේ රාජාභිෂේකය සිදුකල නමුදු, පොලොන්නරුව සිය රාජධානියේ අගනුවර ලෙස තෝරා ගන්නා ලදී. මෙතැන් සිට පහලොවකට අධික සාර්ථක හා අසාර්ථක රජවරු හා රැජිනන් විසින් පොළොන්නරුවේ සිට මෙරට පාලනය කරන ලද අතර, කාලිංග - මාඝ ආක්‍රමණයෙන් පසු පොලොන්නරු රාජධානියේ බිඳ වැටීම සිදුවිය.

මහා පරාක්‍රමබාහු රජු විසින් (ක්‍රි.ව.1153 – 1186) පුරාණ පොලොන්නරුව නගරය තුල ගොඩනැගිලි ගණනාවක් ඉදිකරන ලදී. ඒවා අතුරින් රජ මාළිගාව, ශ්‍රවණාගාරය (පරිපාලන ගොඩනැගිල්ල), ආගමික ගොඩනැගිලි ප්‍රධාන වශයෙන් අලාහණ පිරිවෙන, මහා පරාක්‍රම සමුද්‍රය, අන්ගම්මැඩිල්ල ආදියේ (වාරිමාර්ග තාක්ෂණය) එකතුවෙන් පරිපූර්ණ නගරයක් පිහිටුවා ඇත. රජු යටතේ යුධ සමයේ කැඩී බිඳී ගිය වැව් හා වාරි මාර්ග ප්‍රතිසංස්කරණ කරන ලදී. මෙම සමයේ වී වගාව සමෘධිමත් කිරීම තුලින් ශ්‍රී ලංකාව "පෙරදිග ධාන්‍යාගාරය" ලෙසද ප්‍රසිද්ධියට පත්වී ඇත. අලාහණ පිරිවෙන තුල

ඉදිකරනු ලැබූ රෝහල, එම කාලය තුල වෛද්‍ය විද්‍යාවේ දියුණුව නිරූපනය කරන අතර එම රෝහල අදට සාපේක්ෂව වඩාත් දියුණු තත්වයක පැවති බව සොයා ගන්නා ලද ශල්‍යාගාර උපකරණ මඟින් පැහැදිලි වේ.

මහා පරාක්‍රමබාහු රජු පොලොන්නරුව නගරය, අලංකාරවත් හා පරිපූර්ණ නගරයක් බිහි කිරීමේ මහත් ගෞරවාදරයට පාත්‍ර වූ රජෙකි. දෙවන ස්ථානය නිශ්ශංකමල්ල රජුට **(1187 – 1196 CE)** හිමිවිය. ඔහු බිඳ වැටුණු දේ යථා තත්වයට පත්කරමින් නගරයට නව ගොඩනැගිලි එකතු කර ඇත.

පනස් වසරක චෝල පාලනය හේතුවෙන් පොළොන්නරුවේ ශ්‍රී ලංකාව හා දකුණු ඉන්දියානු කලාවන්හි සමානකම් දැක ගත හැකිය. දකුණු ඉන්දීය ගෘහ නිර්මාණ ශිල්පය ආධාරයෙන් පොලොන්නරුව නගරයේ දේවාල ඉදිකරන ලදී. චෝල හා සිංහල පාලනයෙන් පසුව වුවද හින්දු හා සිංහල සංස්කෘතීන් අතර මනා සම්බන්ධතාවයක් ඇති බව දැක ගත හැකි අතර වර්තමානයේ පවතින ගොඩනැගිලිවලින් එය මනාව පිළිඹිමු වේ. තවද, ගවයා ශිව දෙවියන්ගේ වාහනය බැවින් සඳකඩ පහනේ කැටයම්වලින්ද එය ඉවත් කරන ලදී. දකුණු ඉන්දියාවේ ගෘහ නිර්මාණශිල්පි සම්ප්‍රදායක් වන “ ගෙඩිගේ” නේවාසික ගොඩනැගිලිවල පෙනුම සඳහා යොදා ගෙන ඇත.



රූපය 5.4 : පරාක්‍රමබාහු රජතුමාගේ රාජකීය ශ්‍රවණාගාරය
මූලාශ්‍රය: https://nerdnomads.com



රූපය 5.5: නිශ්ශංක ලතා මණ්ඩලය
මූලාශ්‍රය: https://nerdnomads.com



රූපය 5.6 : පොළොන්නරුව යුගයේ
මූලාශ්‍රය: https://nerdnomads.com



රූපය 5.7: පරාක්‍රමබාහු රජතුමාගේ සත්මහල් ප්‍රාසාදය

වර්තමානය හා සැලකීමේදී පොලොන්නරුව යුගයේ භාවිතා කරන ලද අක්ෂර ද ඉතා දියුණු තත්වයක පැවති බව පැහැදිලි වේ. ගල් විහාරයෙහි දක්නට ලැබෙන පොලොන්නරුව "කතිකාවත" මහා පරාක්‍රමබාහු රජු විසින් ලියන ලද්දකි. ගල්පොත ලිපිය (ගලෙහි කෙටු අකුරු), පුවරු ලිපි, (ලෑල්ල මත ලියූ අකුරු), ආඥා ලිපි නිශ්ශංකමල්ල රජු විසින් ලියන ලද ඒවා වේ. පනා කඩුව තඹ සන්නස, වැල්ලක්කාර දෙමළ ශිලා ලේඛණ මහා විජයබාහු රජු සමයේ කරන ලද ඒවා අතර මේ සියල්ලක්ම පොලොන්නරු යුගයට අයත් ඒවා වේ.



රූපය 5.8 : පරාක්‍රමබාහු රජ සමයේ භාවිතා කළ අක්ෂර
මූලාශ්‍රය : https://nerdnomads.com

මහා විජයබාහු රජු, තම නාමය කාසියක් මත යෙදූ ප්‍රථම ශ්‍රී ලාංකික රජුය. මෙම කාලයෙන් පසු රජවරු නිර්නාමික රන් කාසි නිකුත් කර ඇති අතර පසුව ක්‍රමයෙන් රන් කාසිවල ගුණාත්මකභාවය අඩුකර රිදී කාසිද තඹ කාසිද නිකුත් කර ඇත.

සියවස් ගණනාවක් රන්කාසි නිකුත් කිරීමකින් තොරව ගත විය. විජයබාහු රජුට පසුව ආ රජවරුන් ඔහුව අනුගමනය කරමින් ඔවුන්ගේ නම සහිතව ලෝහ කාසි නිකුත් කරන ලදී.



රූපය 5.9: පරාක්‍රමබාහු රජ සමයේ භාවිතා කළ කාසි

මූලාශ්‍රය: පැරණි ශ්‍රී ලංකාව - මුද්‍රා රටාව /පොළොන්නරුව සමය/2009.06.23/කැපැල් දෙපාර්තුමේන්තුවේ මුද්දර කාර්යාංශය, කැපැල කන්තෝරු ප්‍රධාන කාර්යාලය, D. R.විජේවර්ධන මාවත, කොළඹ 00100, ශ්‍රී ලංකාව



රූපය 5.10: පොළොන්නරුව චතුරශ්‍රය

මූලාශ්‍රය: පැරණි ශ්‍රී ලංකාව - මුද්‍රා රටාව /පොළොන්නරුව සමය/2009.06.23/කැපැල දෙපාර්තුමේන්තුවේ මුද්දර කාර්යාංශය,

5. පිබිදෙමු පොලොන්නරුව වැඩ සටහන (අපරව්‍යුහ පහසුකම් ජාලය, සංචාරක පහසුකම් මධ්‍යස්ථාන සහ ත්‍රිමාන කෞතුකාගාරය)

පිබිදෙමු පොලොන්නරුව වැඩ සටහනේ මූලික සංකල්පය වනුයේ ඓතිහාසික උරුමයන්හි අනන්‍යතාව රැකගනිමින් නගර කේන්ද්‍රස්ථාන තුනක් සංවර්ධනය කිරීමත්, කඳුරුවෙල නගරය තුල වාණිජ හා නව පරිපාලන පහසුකම් සැපයීමත්ය. ඒ සඳහා මේ වනවිට ව්‍යාපෘති බොහොමයක් හඳුනාගෙන ඇති අතර, එම ඉලක්කයන් සපුරාගැනීම සඳහා ව්‍යාපෘති කිහිපයක ඉදිකිරීම් මේ වනවිට නිමකර ඇත. මෙම වැඩ සටහන යටතේ හඳුනා ගන්නා ලද ව්‍යාපෘති 11 ක්ම මෙම සැලැස්මේ පළමු ඉලක්කය සපුරා ගැනීම සඳහා ඍජුවම සහාය වෙයි.



රූපය **5.11:** නාගරික මධ්‍යස්ථාන සඳහා වන සංවර්ධන සංකල්පිතය
මූලාශ්‍රය: පිබිදෙමු පොළොන්නරුව වැඩසටහන

6. පවතින සංචාරක පදනම සහ හෝටල්

වසර **2016** සඳහා වූ සංචාරක සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාවට අනුව පොලොන්නරුව නගරය ප්‍රධාන සංචාරක ගමන්මාර්ග තුනකටම අයත් වේ.ඒනම්, ප්‍රධාන සංචාරක ගමනාන්ත, බෞද්ධ නගර සහ වෙරළ ගමනාන්ත යන වර්ග තුනය. ඉන් ඇඟවෙන ප්‍රධාන කරුණ වන්නේ පොළොන්නරුව නගරය හරහා විදේශීය සංචාරකයෙකු ගමන් කිරීමට ඇති විය හැකියාව ඉහළ බවයි.

පොළොන්නරුව නගරයට පැමිණෙන සංචාරකයින්ගෙන් වැඩි ප්‍රමාණයක් විදේශිකයින් වන අතර එය දේශීය සංචාරකයින් මෙන් ආසන්න වශයෙන් දෙගුණයක් පමණ වේ. එය අනුරාධපුර නගරයට පැමිණෙන සංචාරකයින්ට වඩා වැඩි ප්‍රමාණයකි. වැඩිම සංචාරකයින් ප්‍රමාණයක් දැකිය හැක්කේ පෙබරවාරි හා අගෝස්තු මාසවලය.

නගරය තුල තරු පන්තියේ හෝටල් 5 ක්ද මධ්‍යම ප්‍රමාණයේ හෝටල් හා ආගන්තුක නිවාස 50 කට අධික ප්‍රමාණයක්ද, ලැගුම්හල් 100 කට වැඩි ගණනක්ද අන්තර්ජාලය ඔස්සේ දැන්වීම් පල කරමින් ඇත. (ඇමුණුම් 2)

මාසය	විදේශීය	දේශීය
ජනවාරි	17386	3531
පෙබරවාරි	23661	7773
මාර්තු	17899	13570
අප්‍රේල්	9740	7417
මැයි	6301	3667
ජුනි	5910	6060
ජූලි	16885	11004
අගෝස්තු	24489	11061
සැප්තැම්බර්	11992	6689
ඔක්තෝම්බර්	9921	3609
නොවැම්බර්	12948	2158
දෙසැම්බර්	17035	7877
එකතුව	**174167**	**84416**

වගුව 5.2: පොළොන්නරුව වාර්ෂික සංචාරක පැමිණීම 2016
මූලාශ්‍රය:වාර්ෂික සංඛ්‍යාන වාර්තාව 2017 ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය



රූපය 5.12: විදේශික සංචාරකයින් විසින් භාවිතා කරන ප්‍රසිද්ධ සංචාරක මාර්ග
මූලාශ්‍රය:වාර්ෂික සංඛ්‍යාන වාර්තාව 2017 ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය



රූපසටහන5.13: ශ්‍රී ලංකාව වටා සංචාරක නැවතීමේ පහසුකම්වල පැතිරීම
මූලාශ්‍රය:වාර්ෂික සංඛ්‍යාන වාර්තාව 2017 ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

7. පවතින වී නිෂ්පාදනය සහ සැකසුම් ඒකක (සහල් කර්මාන්තය)

ශ්‍රී ලංකාවේ වී වගාවේ ආරම්භය ක්‍රි.පූ.161 දක්වා දිව යන අතර ඒ සඳහා පෞඪ ඉතිහාසයක් ඇත. වී වගාව, ශ්‍රී ලංකාවේ මුළු වගා බිම් ප්‍රමාණයෙන් 34% ක්ම වගා කරනු ලබන ප්‍රධාන බෝගය වන අතර, ඒ සඳහා යොදවා ඇති මුළු බිම් ප්‍රමාණය හෙක්. 725000 ක් පමණ වේ. වාර්ෂිකව යල මහ දෙකන්නයේම වගා කරනු ලබන බිම් ප්‍රමාණයේ සාමාන්‍ය, හෙක්ටයාර් 870000 ක් පමණ වේ.

ශ්‍රී ලංකාවේ සෑම දිස්ත්‍රික්කයකම පාහේ වී වගාව තෙත් බිම් බෝගයක් ලෙස වගා කරන අතර ශ්‍රී ලංකාවේ මුළු වී නිෂ්පාදනයෙන් 15% ක් නිපදවනුයේ පොලොන්නරුව දිස්ත්‍රික්කයෙනි. පොලොන්නරුව දිස්ත්‍රික්කයේ හෙක්ටයාරයකට ලැබෙන ශුද්ධ අස්වැන්නේ සාමාන්‍ය ජාතික අස්වැන්නේ සාමාන්‍ය අගයට වඩා වැඩිවේ.

ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනයෙන් 55% කට වැඩි ප්‍රමාණයක් සකසනුයේ පොලොන්නරුවේ සහල් කර්මාන්තවලින් වන අතර නගරය තුල මහා පරිමාණ කර්මාන්තශාලා 6 ක්ද මධ්‍යම හා කුඩා පරිමාණ කර්මාන්තශාලා 129 ක්ද පිහිටා ඇත. රජයේ සැකසුම් ගොවිපල පිහිටා ඇත්තේද මෙම නගරය තුල වන අතර එහි බිම් ප්‍රමාණය අක්කර 200 ක් පමණ වේ. එමෙන්ම රජයේ ප්‍රධාන වී ගබඩා සංකීර්ණය පිහිටා ඇත්තේද පොලොන්නරුව නගරයේ වන අතර එහි ධාරිතාවය මෙට්‍රික් ටොන් 12500 ක් වේ.



රූපය 5.14: මහ කන්නයේදී ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදිතය (2016)

මූලාශ්‍රය: දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන වාර්තාව - පොලොන්නරුව

	සකසන ලද බිම් ප්‍රමාණය	%	අස්වනු නෙලූ මුළු ප්‍රමාණය (අක්කර)	අක්කරයකට අස්වැන්න	මුළු අස්වැන්න	මුළු නිෂ්පාදනය ('000 බුසල්)	%
මඩකලපුව	155273	12	91095	48.81	80400	3624	5
අම්පාර	201285	15	167382	92.8	159967	14844	21
පොළොන්නරුව	122615	9	118072	98.53	104446	10291	15
වෙනත් දිස්ත්‍රික්ක	861510	64	569499	-	501993	41532	59
ශ්‍රී ලංකාව	1340683	100	946048	83.41	846806	70291	100

වගුව 5.3: ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනය 2016

මූලාශ්‍රය: පොලොන්නරුව දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන වාර්තාව 2016

හෙක්ටෙයාරයකට සාමාන්‍ය අස්වැන්න (කිලෝග්‍රෑම්)			
	දිස්ත්‍රික්කය	ශ්‍රී ලංකාව	නිෂ්පාදනය මෙට්රික් ටොන්
2015 යල	5131	4527	280476
2014/20150 මහ	5306	4364	349625

වගුව 5.4 : සාමාන්‍ය අස්වැන්න (හෙක්ටයාරයකට)
මූලාශ්‍රය: පොළොන්නරුව දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන වාර්තාව 2016

8. පාරිසරික වශයෙන් වටිනා වැදගත් ස්ථාන නගරය ආසන්නයේ පිහිටා තිබීම

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ජාතික උද්‍යාන 6 ක් මෙම සැලසුම් බල ප්‍රදේශය ආසන්නයේ පිහිටා ඇත. මින්නේරිය සහ කවුඩුල්ල අලි නැරඹීම සඳහා ඉතා ප්‍රසිද්ධ වනෝද්‍යාන 02 කි. එමෙන්ම, වස්ගමුව, සෝමාවතිය, මාදුරුඔය, ගල්ඔය ජාතික වනෝද්‍යානද සංචාරක ආකර්ශනය දිනූ ස්ථාන වේ.



රූප 5.15: ආසන්නයේ ඇති ජාතික උද්‍යාන
මූලාශ්‍රය: වන රක්ෂණ දෙපාර්තුමේන්තුව

මෙම වනෝද්‍යාන වෙත මේ වන විටත් දෛනිකව පැමිණෙන සංචාරකයින් පොළොන්නරුව නගරයට සංචාරක කර්මාන්තය කෙරෙහි ඇති විශාල විභවතාවයක් පෙන්වයි. පූජා නගරය හැරුණු විට මෙම නාගරික ප්‍රදේශය, පෙව විවිධත්වයෙන් හෙබි සුන්දර ස්ථානවලින් යුක්ත වන අතර, පරාක්‍රම සමුද්‍රය, වනඅලි 20 ක් පමණ වෙසෙන මහවැලි ජල ගැලුම් නිම්නය, කුඹුරු හා තෙත් බිම් සහ එහි වෙසෙන නොයෙකුත් කුරුල්ලන්, සමනලුන් සහ වෙනත් ශාක විශේෂ මේ අතර ප්‍රධාන වේ. සංචාරකයින්ට ප්‍රදේශයේ පවතින නටඹුන් මෙන්ම මෙම ස්වභාවික පරිසරයෙන් ද ප්‍රතිලාභ ලබා ගත හැක.



රූපය 5.16 : නාගරික ප්‍රදේශය ඇතුළත සුන්දර ස්ථාන

මූලාශ්‍රය: අන්තර්ජාලය



රූපය 5.17 : ශ්‍රී ලංකාවේ ජාතික උද්‍යාන නැරඹීමට පැමිණෙන සංචාරකයින් සංඛ්‍යාව

මූලාශ්‍රය: වනජීවී සංරක්ෂණ දෙපාර්තුමේන්තුව

9. පවතින මාර්ග රටාව

ප්‍රදේශයක ඉහළ ප්‍රවේශකත්වයක් පැවතීම එහි සංවර්ධනය සඳහා ඉතා ප්‍රබල විභවතාවකි. පොළොන්නරුව නගරයද එහි උප නගර හා මනා සම්බන්ධතාවයක් පවතින නගරයක් වන අතර නගර මධ්‍ය තුලද ඉහළ සම්බන්ධතාවයක් පවතී



රූපය 5.18 : මාර්ගජාල ප්‍රමුඛතාව අනුව ප්‍රදේශයේ ඒකාබද්ධතාව.
මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය

ඉලක්ක 1 - දුර්වලතා

1. පූජා නගරය හා සම්බන්ධ කළ විකල්ප සංචාරක සැලසුම් නොමැති වීම.

   පූජා නගරය තුල හැර, විදේශ සංචාරකයින් සඳහා කිසිදු වෙනත් සංවිධානාත්මක සංචාරක මාර්ග ප්‍රදේශය තුල දක්නට නොමැත. විදේශ සංචාරකයින් සමඟ කරන ලද සම්මුඛ සාකච්ඡාවලින් තහවුරු වූයේ සංචාරකයින්ගෙන් 90% කට වැඩි ප්‍රමාණයක් ප්‍රදේශයේ සාම්ප්‍රදායික වී ගොවිතැන හා ඒ හා බැඳුණු සංස්කෘතික කටයුතු පිළිබඳ කිසිදු දැනුවත් වීමක් නොමැති බවයි.

   පූජා නගරයෙන් පිටත පාපැදිවලින් ගමන් කරමින් අත්දැකීම් ලබා ගන්නා පිරිස 40% ක් පමණ වන අතර ප්‍රදේශයේ පවතින විභවතාවන් පිළිබඳව දැනුවත් කරන කිසිදු දැන්වීම් පුවරුවක් ප්‍රදේශයේ ස්ථාපිත කර නොමැත.

2. අවිධිමත් සංචාරක තොරතුරු මධ්‍යස්ථානය

   මධ්‍යම සංස්කෘතික අරමුදල හා කෞතුකාගාරය හැරුණු විට සංචාරකයින් සඳහා තොරතුරු ලබා ගැනීමට වෙනත් කිසිදු වගකිව යුතු ආයතනයක් නගරය තුල නොමැති අතර, එම ආයතනවලින් ලබා ගත හැක්කේද ප්‍රදේශයේ පවතින නටඹුන් හා උරුමයන් පිළිබඳ තොරතුරු පමණි. පිබිදෙමු පොලොන්නරුව වැඩ සටහන යටතේ සංචාරකයින් සඳහා වූ තොරතුරු මධ්‍යස්ථානයක් ඉදිකර ඇති අතර, එයද ක්‍රමවත්ව තොරතුරු හා උපාංග සමඟ සංවිධානය වී නොමැත.

3. සංචාරක ව්‍යාපාරය ආශ්‍රිතව නවාතැන් මධ්‍යස්ථානවලින් 80% ක ප්‍රමාණයක් ශ්‍රී ලංකා සංචාරක අධිකාරියේ ලියාපදිංචි වී නොමැති වීම

   සැලසුම් බල ප්‍රදේශයේ පවතින සංචාරක හෝටල් හා නවාතැන් මධ්‍යස්ථානවලින් සංචාරක සංවර්ධන අධිකාරිය යටතේ ලියාපදිංචි වී ඇත්තේ හෝටල් හා නවාතැන්පලවල් 12 ක් පමණි. නමුදු මෙවන් ආයතන 100 ක් පමණ සංචාරක ප්‍රවර්ධන වෙබ් අඩවි තුල දැන්වීම් ප්‍රචාරණය කරනු ලබයි. මෙම ලියාපදිංචි නොකළ නවාතැන්පලවල් මඟින් හා නුපුහුණු සේවක කණ්ඩායම් මඟින් අනාගතයේ ලංකාවේ සංචාරක කර්මාන්තයට හානිකර තත්වයක් උදාවිය හැක.

4. සම්ප්‍රදායික වී වගා ක්‍රම බහුල ලෙස භාවිතා නොවීම

වී වගා කිරීම සම්බන්ධයෙන් අපේ රටට වසර 5000 කට වැඩි දීර්ඝ ඉතිහාසයක් ඇති අතර, මෙම සාම්ප්‍රදායික ක්‍රමය තුල සාම්ප්‍රදායික උපකරණ, බීජ, රසායනික නොවන පලිබෝධ නාශක පාලන ක්‍රම ආදිය ඇතුලත්ය. නමුදු ප්‍රදේශය තුල වී වගාවන්හිදී මෙම කිසිදු සාම්ප්‍රදායික උපක්‍රමයක් භාවිතා නොකරයි. මෙම නගරය ඓතිහාසික උරුමයන්ගෙන් හෙබි සංචාරක පාරාදීසයක් බවට පත්කිරීමේ ඉලක්කයේදී මෙය දුර්වලතාවයක් ලෙස සැලකිය හැකිය.

ඉලක්ක 1 - අවස්ථාවන්

1. දේශපාලන සහයෝගය / අභිප්‍රේරණය

රටේ වර්තමාන ජනාධිපතිවරයා වන ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මෙම ප්‍රදේශයෙන් බිහිවූ අග්‍රඝනයේ නායකයෙකි. ඔහුගේ අභිමතාර්ථයන්ද 2030 වසර දක්වා වූ මෙම සැලැස්මේ දර්ශනයට, පරමාර්ථ හා අරමුණුවලට සමාන වේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස පිබිදෙමු පොලොන්නරුව වැඩ සටහන ආරම්භ කරන ලද අතර ඒ තුලින් අමාත්‍යාංශ ගණනාවක් හරහා ව්‍යාපෘතින් ගණනාවක් ක්‍රියාවට නංවා ඇත.

2. ශ්‍රී ලංකාවට සංචාරකයින්ගේ පැමිණීම

සංචාරක කර්මාන්තය ශ්‍රී ලංකා ආර්ථිකයේ තුන්වෙනි ආදායම් උපයන්නා වන අතර ඇඟලුම්වලට පසු මුදල් රට තුලට ගෙන එන්නා ද වේ. ගෙවී ගිය පස් වසර තුල සංචාරකයින්ගේ පෙර නොවූ විරූ වර්ධනයක් දැකිය හැකි අතර, එය සාමාන්‍යයෙන් වසරකට 22% කි. නිවාඩු කාලය තුල ලංකාවට පැමිණෙන සංචාරකයින් ප්‍රමාණය, මුළු සංචාරකයින්ගෙන් 80% - 90% අතර වේ. 2015 වසර තුල පමණක් විදේශීය සංචාරකයින් මිලියන 1.8 ක ප්‍රමාණයක් ලංකාවට පැමිණ ඇති අතර ඔවුන් ලංකාවේ නැවතී සිටි කාලය සාමාන්‍යයෙන් දින 10.1 කි. එය ඇමෙරිකානු ඩොලර් මිලියන 2.98 ක ආදායමකි. 2016 වසර තුල සංචාරකයින්ගේ පැමිණීම මිලියන 2 දක්වා ඉහළ ගොස් ඇති අතර ඇමෙරිකානු ඩොලර් මිලියන 3.5 ක ආදායමක් උපයා ඇත. මෙම සංචාරකයින්ගේ පැමිණීම හා එහි ආකර්ශනය මෙම සැලැස්මේ ඉලක්ක 1සඳහා මහඟු අවස්ථාවක් වේ. (ඇමුණුම 3)



රූපසටහන **5.19: 2006-2016** නරඹන්නන්ගේ අරමුණින් සංචාරකයින්ගේ පැතිරීම
මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

FIGURE 12: Visitor numbers at Central Cultural Fund–managed sites of Sigiriya, Anuradhapura, Polonnaruwa and Galle



රූපසටහන *5.20:* ප්‍රධාන පෞරාණික නගරවල නරඹන්නන් සංඛ්‍යාව
මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය



Resort Region	Occupancy Rate 2015	2016
Colombo City	76.4%	76.75%
Greater Colombo	74.4%	75.18%
South Coast	74.3%	74.24%
East Coast	74.1%	74.92%
High Country	74.8%	75.24%
Ancient Cities	75.2%	75.46%
Northern Region	72.0%	69.58%

*රූපසටහන **5.21 2015-2016** වනවිට ගැවසීමේ පළාත් අනුව පදිංචි වීමේ අනුපාතය*
මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

3. සංචාරක සංවර්ධන අධිකාරිය හා ක්‍රිස්තියානි කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් 2017- 2020 සඳහා සකස් කරන ලද ශ්‍රී ලංකා සංචාරක උපාය මාර්ගික සැලැස්ම

එක්සත් ජාතින්ගේ තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වසර 2025 සඳහා වූ දීර්ඝකාලීන දැක්මක් සහිත සංචාරක දර්ශනය ක්‍රියාවට නැංවීමේ අරමුණ ඇතිව මෙම උපායමාර්ගික සංචාරක සැලැස්ම පිළියෙල කොට ඇති අතර, ගෝලීය සංචාරක වෙළඳපොල තුල ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය තරඟකාරී තත්වයකට ගෙන ඒම මෙහි ඉලක්කය වී ඇත. මූලික වශයෙන් මෙම සංචාරක උපායමාර්ගික සැලැස්මෙහි අරමුණු වනුයේ රටෙහි සමස්ත ආදායම වර්ධනය කිරීම, ප්‍රාදේශීය ප්‍රජාවට සහයදීම, තිරසර දැක්මක් මත සංචාරක ව්‍යාපාරය වැඩි දියුණු කිරීමයි.

ඒ අනුව මෙම සැලැස්ම තුලින් සංචාරකයින් හට

- වෙබ් අඩවිය හරහා සංචාරක කටයුතු සඳහා වැඩි අගයක් ලබා දීම, දිගු කාලයක් මෙහි රැඳී සිටීම සඳහාත්, අද්විතීය අත්දැකීම් ලබා ගැනීම සඳහාත් වැඩි අවස්ථාවක් ලබාදීම.
- අත්දැකීම් බෙදා ගැනීම සඳහා ප්‍රජාව ක්‍රියාකාරීව වැඩ සටහන්වලට සහභාගි කරවා ගැනීම.
- ආයෝජකයින් සඳහා අපහසුතාවයකින් තොරව කටයුතු කර ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීම.
- ඉහල වටිනාකමින් යුත් සංචාරක සේවාවන්හි නිරතවීමට අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීම හා සේවාවන් වැඩි දියුණු කිරීම.
- තිරසාර පැවැත්මට මුල්තැන දෙමින් තිරණ ගැනීම හා විශ්වාස කටයුතු දත්ත භාවිතය සඳහා රජයේ මැදිහත් වීම හා සම්බන්ධීකරණය කිරීම

මෙම උපායමාර්ගික සැලැස්ම අපගේ සංවර්ධන සැලැස්මේ පළමු ඉලක්කය සාක්ෂාත් කර ගැනීම සඳහා වූ අනඟි අවස්ථාවකි. එමෙන්ම එය වසර 2025 වන විට ශ්‍රී ලංකාවට සංචාරක කර්මාන්තයෙහි අද්විතීය ස්ථානයක් හිමිකර ගැනීමට උපයෝගී වනු ඇති අතර එය පොලොන්නරුව නාගරික සැලැස්මේ ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට ද අනඟි අවස්ථාවක් වේ.

4. සහල් සඳහා වූ දේශීය හා ජාත්‍යන්තර ඉල්ලුම

ශ්‍රී ලංකාව තුල සහල් සඳහා ඉල්ලුම වාර්ෂිකව 1.1% කින් වැඩිවෙන අතර ඒ අනුව සහල් නිෂ්පාදනය වසරකට 2.9% කින් වැඩි කල යුතුය. වර්තමානය වනවිට ලංකාවේ වාර්ෂික සහල් නිෂ්පාදනය මිලියන 2.7 ක් වන අතර එය දේශීය අවශ්‍යතාවයෙන් 95% කි. සාමාන්‍යයෙන් සහල් මඟින් මුළු ප්‍රෝටීන් අවශ්‍යතාවයෙන් 45% ක් ලබා දෙන අතර, මුළු කැලරි ප්‍රමාණයෙන් 40% ක් සපයයි. උක්ත සංඛ්‍යාලේඛනවලට අනුව දේශීය සහල් අවශ්‍යතාවයෙන් 5% ක භිඟයක් පවතින අතර දිස්ත්‍රික්කය තුල ආදායම් මූලාශ්‍රයක් ලෙස වී නිෂ්පාදනයට ඉහල විභවතාවක් පවතී.

ලංකාව තුල බඩඉරිගු හා තිරිගු මෙන් නොව සහල් නිෂ්පාදනයෙන් බොහෝමයක් ආහාර සඳහා යොදා ගැනීමේ ප්‍රවනතාවය හේතුවෙන් ඒවා ජාත්‍යාන්තර වෙළඳපලට ඇතුළු නොවේ. එහෙත් ජාත්‍යන්තර සහල් වෙළඳාම 1960 වසර තුල වාර්ෂිකව ටොන් මිලියන 7.5 සිට 2000 – 2009 කාලය දක්වා ටොන් මිලියන 28.5 දක්වා ඉහළ ගොස් තිබේ.

ජාත්‍යන්තර සහල් වෙළඳාමේදී සුළු ප්‍රමාණයක් වන සහල් අපනයනය කරන රටවල් සාපේක්ෂ වශයෙන් ආනයනය කරන විශාල රටවල් සංඛ්‍යාවක් සමඟ කටයුතු කළ යුතුය. 2000 සහශ්‍රකයේ මුල් දශකය තුල හොඳම සහල් අපනයනයකරුවන් පස් දෙනෙක් ලෝක වෙළඳපලින් 81% ක් ග්‍රහනය කරගෙන තිබිණි. (1960 දශකයේ 69% සිට) වියට්නාමය හා ඉන්දියාව අනුගමනය කරමින් 1980 දශකයේ තායිලන්තය ලෝකයේ විශාලම සහල් අපනයනයකරුවෙකු බවට පත්ව ඇත.

ආහාර හා කෘෂිකාර්මික ප්‍රතිපත්තිමය පර්යේෂණ මඟින් සිදුකරන ලද ප්‍රරෝකථනයන් මත, ගෝලීය සහල් ඉල්ලුම 2020දී ටොන් මිලියන 496 වනු ඇතැයි අපේක්ෂා කරනු ලබන අතර එය 2035 වන විට ටොන් මිලියන 555 දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. විශේෂයෙන් චීනය හා ඉන්දියාවේ සහල් පරිභෝජනය අඩු වුවද, ආසියානු රටවල සහල් වෙළඳපොල මුළු සහල් ඉල්ලුමෙන් 60% ක් වෙනු ඇතැයි ගණන් බලා ඇත. එසේම අප්‍රිකානු රටවල 2010ට සාපේක්ෂව 100% කට වඩා සහල් සඳහා වැඩිවන ඉල්ලුම සපුරාලීම සඳහා සහල් ටොන් මිලියන 30 ක් අවශ්‍ය වන බව ගණන් බලා ඇත. මීට

අමතරව මීළඟ දශකවලදී ඇමෙරිකාවේ මුළු සහල් පරිභෝජනය 30% කට වඩා ඉහල යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ඉහත සඳහන් සියලු කරුණු මගින් පැහැදිලිවනුයේ ජාත්‍යාන්තර වශයෙන් සහල් සඳහා අඛණ්ඩ ඉල්ලුමක් පවතින බවත්, ඉහළ නිෂ්පාදනයක් කරන්නේ නම් ඒ සඳහා දිවයින තුල මෙන්ම ජාත්‍යාන්තර වශයෙන් විශාල වෙළඳපලක් පවතින බවත්ය.

රට	වර්ෂය	විචල්‍ය	මූලාශ්‍රය	වටිනාකම	ඒකකය
ශ්‍රී ලංකාව	2017	අපනයන ප්‍රමාණය	USDA	5,000.00	ටොන්
ශ්‍රී ලංකාව	2017	ආනයන ප්‍රමාණය	USDA	400,000.00	ටොන්

වගුව 5.5: *ජාත්‍යන්තරය සඳහා ඉල්ලුම*
මූලාශ්‍රය: http://ricestat.irri.org:8080/wrsv3/entrypoint.htm

5. කෘෂි සංචාරක සංකල්පය (විශේෂයෙන් වී වගාව සඳහා)

කෘෂි සංචාරක කර්මාන්තය යනු සංචාරකයින්ගේ විනෝදය හා දැනුම සඳහා ප්‍රායෝගිකව ක්‍රියා කරනු ලබන ගොවිපලක් තුල අයිතිකරු හෝ ක්‍රියාකරු අතිරේක ආදායමක් උපයමින් කරගෙන යනු ලබන වාණිජමය ව්‍යාපාරයකි.

වර්තමාන ලෝකයේ සංචාරක කර්මාන්තයේදී මෙම සංචාරක කටයුතු සඳහා විශාල ප්‍රවනතාවයක් පවතින අතර පවතින යටිතල පහසුකම් සමගින් කරගෙන යා හැක. අවශ්‍ය වන්නේ නිසි මඟ පෙන්වීමක් පමණි.



රූපසටහන 5.22: වියට්නාමයේ කෘෂි සංචාරක ව්‍යාපාරයේ ක්‍රියාකාරකම්
මූලාශ්‍රය: අන්තර්ජාලය

ඉලක්ක 1 - තර්ජන

1. ශ්‍රී ලංකාව තුල උරුම නගර / සංස්කෘතික අත්දැකීම් නැරඹීමට පැමිණෙන සංචාරකයන් අඩු වීමේ ප්‍රවණතාවය.

   ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින් වර්ග දහයකට බෙදා දැක්විය හැකිය. ඉන් වැඩි ප්‍රතිශතයක් ගනුයේ විනෝදය හා නිවාඩුවක් සඳහා පැමිණෙන සංචාරකයින්ය. වසර 2006 සිට පවතින සංඛ්‍යාලේඛන අධ්‍යයන කිරීමේදී පැහැදිලි වනුයේ ආගමික හා සංස්කෘතික කටයුතු වශයෙන් පැමිණෙන සංචාරකයින් 2016 වන විට 9% ක පමණ අඩුවීමේ ප්‍රවනතාවක් ඇති බවයි. මෙය සැලැස්මේ ඉලක්ක 1 සඳහා තර්ජනයක් වේ. (පින්තූර 6 සංචාරයේ අරමුණු අනුව ව්‍යාප්ති ප්‍රතිශතය 2006 – 2016)

5.2 : ඉලක්ක 2

ඓතිහාසික හා පාරිසරික සංවේදී ප්‍රදේශ ආරක්ෂා කිරීම

ශක්තීන්	1. යුනෙස්කෝ මඟින් පොලොන්නරුව ලෝක උරුම නගරයක් ලෙස ප්‍රකාශයට පත්කර තිබීම. 2. නටඹුන් සමග පෞඪ ඉතිහාසයක් පැවතීම 3. දැනටමත් පරිසර සංවේදී ප්‍රදේශ සංරක්ෂණ කර තිබීම 4. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් මෙහෙයවනු ලබන වැඩ සටහන්
දුර්වලතා	1. පාරිසරික සංවේදී ප්‍රදේශවල ක්‍රියාත්මක කරනු ලබන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති 2. රක්ෂිතයන්හි නිශ්චිත භෞතික මායිම් නොමැති වීම
අවස්ථාවන්	1. පරිසරය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් රජයේ අවධානය යොමු වීමේ ප්‍රවනතාවය 2. දේශපාලන සහයෝගය / අභිප්‍රේරණය 3. සංචාරකයින්ගේ පැමිණීම 4. උරුම නගර ලැයිස්තුවට ඇතුලත් වී තිබීම 5. කෘෂි සංචාරක සංකල්පය - විශේෂයෙන් වී වගාව සඳහා 6. ස්වාභාවික ව්‍යවසනයන් සිදුවීමේ සම්භාවිතාව අවම වීම
තර්ජන	1. පවතින නියං තත්වය / වියළි කාලගුණය

වගුව 5.6: දෙවන ඉලක්කය හා "ශදුඅත" විශ්ලේෂණය
මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය

ඉලක්ක 2 ශක්තීන්

1. යුනෙස්කෝ මඟින් ලෝක උරුම නගරයක් ලෙස ප්‍රකාශයට පත්කර තිබීම

ලෝක උරුම නගරයක් ලෙස ප්‍රකාශයට පත්කිරීමෙන් මෙම ප්‍රදේශය ආරක්ෂා වී ඇති අතර තෝරා ගත් නිර්නායකයන්හි අඩුවීම හෝ වෙනස්වීම මත ලෝක උරුම නගර ලැයිස්තුවෙන් ඉවත් කල හැකි බැවින් මෙම ප්‍රදේශය දැඩි ලෙස ආරක්ෂා කිරීමට පෙළඹෙනු ඇත.

2. දැනටමත් පාරිසරික සංවේදී ප්‍රදේශ ආරක්ෂා කර තිබීම

මුළු නාගරික ප්‍රදේශයෙන් 31% ක් පමණ බිම් ප්‍රමාණයක් කුඹුරු ඉඩම්වලින් සමන්විත වන අතර එම ඉඩම් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ආරක්ෂා වීම හා පාලනය වීම සිදු වේ. මුළු බිමෙන් 15% ක ප්‍රමාණයක් වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ ජල ගැලීම් නිමින ජාතික වනෝද්‍යානයට අයත් වේ.

3. පුරා විද්‍යා දෙපාර්තමේන්තුව හා මධ්‍යම සංස්කෘතික අරමුදල යටතේ නටඹුන් ආරක්ෂා කිරීම සඳහා වූ වැඩ සටහන්

1931 මාර්තු 9 දිනැති අංක 7831 දරණ ගැසට් නිවේදනය හා 1951 මාර්තු 9 දිනැති අංක 10222 දරණ ගැසට් නිවේදන මඟින් පොළොන්නරුව පූජා නගරය ප්‍රකාශයට පත්කර ඇත. මෙහි මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර් 446 ක් වන අතර ඉන් හෙක්ටයාර් 23ක් ප්‍රදර්ශන මට්ටම දක්වා සංවර්ධනය කොට ඇත. මෙම ප්‍රදේශය නීති මඟින් ආරක්ෂා කර ඇත. මෙම ඉඩම් තුල පවතින නටඹුන් මධ්‍යම සංස්කෘතික අරමුදලින් සංරක්ෂණය කර පවත්වාගෙන යනු ලැබේ. ඇතුලත නගරය, උතුරු පෙදෙසේ තාප්ප සංරක්ෂණය, ඇතුලත නගරයේ නැගෙනහිර තාප්පය සංරක්ෂණය පරාක්‍රමබාහු මාලිගය, ලංකාතිලක ප්‍රතිමා ගෘහය, ජයමහ විහාරයේ සිතුවම් සහ වෙනත් නටඹුන් රාශියක් ද මෙම මධ්‍යම සංස්කෘතික අරමුදලේ සංරක්ෂිත ලැයිස්තුවට ඇතුලත් වේ.

ඉලක්ක 2 - දුර්වලතා

1. පාරිසරික සංවේදී ප්‍රදේශයන්හි අපරව්‍යුහ පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

   කඳුරුවෙල වාණිජ නගරය හා උරුම නගරයන්හි සංවර්ධන පීඩනය / බලපෑම ඉතා ඉහළය. යාබඳව ඇති ඉඩම් බොහෝමයක් පහත් බිම් හා කුඹුරු ඉඩම් වේ. පසුගිය වසර පහ සලකා බැලීමේදී මෙම කුඹුරු ඉඩම්වලින් 2% ක පමණ ප්‍රමාණයක් අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය වෙනුවෙන් යොදා ගෙන ඇත. (ඉඩම් ගොඩ කර ඇත.)

   උදා : අඩි 100 අතුරු මාර්ගය සිට A11 මාර්ගය දක්වා (කඳුරුවෙල වකුගඩු රෝහල)

2. රක්ෂිතයන්හි පැහැදිලි සීමා මායිම් නොමැති වීම

   නගරය තුල වැව් රක්ෂිත, පුරාවිද්‍යාත්මක රක්ෂිත, වනජීවී දෙපාර්තමේන්තුවේ රක්ෂිත නම් කොට ඇති අතර මින් පැහැදිලි භෞතික මායිම් ඇත්තේ පුරා විද්‍යා දෙපාර්තමේන්තුවට අයත් කොටස්හි පමණි.

   මෙම රක්ෂිතයන් සම්බන්ධයෙන් දැනුවත් කිරීමක් හෝ වීමක් නොමැතිවීම හේතුවෙන් රක්ෂිතයන්හි ඉඩම් පහසුවෙන් අනවසරයෙන් අත්පත් කර ගැනීමට හැකිය. සිරිසහබෝ පෙදෙස, නිශ්ශංකමල්ලපුර සහ ඇතුල්පිටිය ප්‍රදේශයේ පවතින ඓතිහාසික උරුමයන් සහිත ඉඩම්හි සිදුවී ඇති අනවසර අල්ලා ගැනීම් හේතුවෙන් මේ වනවිටත් ගැටළු මතු වී ඇත.

ඉලක්ක 2 - අවස්ථාවන්

1. **පරිසර ආරක්ෂණය සඳහා රජයේ මැදිහත්වීමේ ප්‍රවනතාවය (තිරසාර සංවර්ධනය සඳහා වූ නියාමක 2030)**

එක්සත් ජාතින්ගේ 2030 සඳහා වූ න්‍යාය පත්‍රයට අනුව තිරසාර සංවර්ධනය සඳහා ලෝකයම නව ගිවිසුමක් අත්සන් කර ඇත. එය ඉලක්ක 17 කින් හා ඉලක්කගත ඉලක්ක 169 කින් සමන්විත වන අතර ඉලක්ක 17 න් ඉලක්ක 11, 12, 13, 14 හා 15 සෘජුම පරිසර ආරක්ෂාව පිළිබඳ වූ ඉලක්ක වේ.



රූපසටහන 5.23: තිරසාර සංවර්ධන ඉලක්ක

මූලාශ්‍රය: 2030 තිරසර සංවර්ධන ඉලක්ක, එක්සත් ජාතීන්ගේ ජනාවාස වැඩසටහන

5.3 ඉලක්ක 3

නිවර්තන පරිසරයක් තුල ප්‍රදේශවාසීන් හා මගී ජනයා සඳහා ප්‍රසන්න, සැපපහසු ජීවිතයක් ගත කිරීමට හැකි පරිසරයක් නිර්මාණය කිරීම

ශක්තීන්	1. පිබිදෙමු පොලොන්නරුව වැඩ සටහන 2. පරිසර සංවේදී ප්‍රදේශ දැනටමත් ආරක්ෂා කර තිබීම 3. පවත්නා හරිත පරිසරය 4. පවත්නා වාරිමාර්ග හා අපරවාහ පහසුකම් ජාලය 5. පවත්නා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය
දුර්වලතා	1. නිසි කාණු පද්ධතියක් නොමැති වීම 2. නගර මධ්‍යයේ පවතින දැරිය නොහැකි උෂ්ණත්වය 3. ජල මාර්ග පද්ධතියේ අත්‍යාවශ්‍ය කොටස් ගොඩකිරීම 4. විකල්ප මාර්ග ජාලය පිළිබඳ දැනුම අවම කිරීම
අවස්ථාවන්	1. දේශපාලන කැමැත්ත / එකඟතාවය 2. ස්වභාවික විපත් සිදුවීමේ අඩු සම්භාවිතාව 3. පොලොන්නරුව නැගෙනහිර ජල සම්පාදන ව්‍යාපෘතිය
තර්ජන	1. නියං තත්වය / වියළි කාලගුණය

වගුව 5.7 තෙවන ඉලක්කය හා "ශදුඅත" විශ්ලේෂණය
මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය

ඉලක්ක 3 - ශක්තීන්

1. පිබිදෙමු පොලොන්නරුව වැඩ සටහන

පිබිදෙමු පොලොන්නරුව වැඩ සටහනේ ප්‍රධාන අරමුණ වන්නේ නගරවාසීන්ගේ ජීවන තත්වය නඟා සිටුවීම සහ අනෙකුත් කේෂ්ත්‍රයන් සංවර්ධනය කිරීමත්ය. මෙම සම්පූර්ණ වැඩ සටහනෙන් ඉහත ඉලක්ක සපුරා ගැනීම සඳහා සමාජ හා භෞතික අපරව්‍යුහ පහසුකම් සැපයීමට ව්‍යාපෘති 27 ක් සැලසුම් කර ඇති අතර, ඒවා වගු අංක 01 මඟින් දැක්වේ.

2. පරිසර සංවේදී ප්‍රදේශ ආරක්ෂා කර තිබීම

කෝපන් දේශගුණික වර්ගීකරණයට අනුව සර්ම කලාපිය රටවල සෑම මාස 12 කම අවම උෂ්ණත්වය සෙලිසියස් අංශක 18 පමණ වේ. නිවර්තන දේශගුණික තත්වයන් තුල නිරන්තරයෙන් කාල දෙකක් පවතී. එනම් වියළි කාලය, වැසි කාලයයි. නිවර්තන දේශගුණය හිමෙන් තොර වන අතර සුර්ය කෝණයෙහි සිදුවන වෙනස්කම් ඉතා අල්ප වේ. නිවර්තන දේශගුණයක් තුල වසර පුරාම උෂ්ණත්වය සාපේක්ෂව ස්ථාවරම (උණුසුම්ව) පවතී. නිවර්තන දේශගුණයක් තුල සුවපහසුව ජීවත්වීම සඳහා බොහෝමයක් හරිත ප්‍රදේශ අවශ්‍ය වේ. එමෙන්ම හදිසියේ පතිත වන අධික වර්ෂාව අවශෝෂණය සඳහාත් මතුපිට ජලාපවහනයන්ට ඔරොත්තු දීම සඳහාත් පහත් බිම් අවශ්‍ය වේ. නාගරික ප්‍රදේශය ආවරණය කරමින් පරාක්‍රම සමුද්‍රය හා කුඩා වැව් 4 ක්, මුළු බිම් ප්‍රමාණයෙන් 15% ක පමණ වූ වනාන්තර ප්‍රදේශ, හරිත ශාකවලින් හෙබි හෙක්ටයාර් 400 ක් පමණ වූ උරුම නගරය, 31% ක් පමණ වූ කුඹුරු ඉඩම් විසිර පවතී.

3. නිවාසවලින් 90% ක් ගෙවතුවලින් යුක්ත වීම

වාණිජ නගර මධ්‍යය හා පොලොන්නරුව හන්දිය හැරුණු විට අනෙකුත් ප්‍රදේශයන්හි නිවාස, ගෙවතුවලින් යුක්ත වන අතර අවම වශයෙන් එක් ගෙවත්තක විශාල ගස් දෙකක්වත් දක්නට ඇත. මෙය ඉලක්ක 3 සඳහා විශාල ශක්තියකි.

4. පවත්නා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය

මනා ලෙස සැලසුම් කරන ලද ඝන අපද්‍රව්‍ය එකතු කිරීමේ ක්‍රමවේදයක් නගරය තුල දක්නට ඇති අතර, දිනකට නගරයෙන් එකතුවන කැලි කසල ප්‍රමාණය මෙට්‍රික් ටොන් 12 – 13 අතර ප්‍රමාණයක් වේ. පූජා නගරය තුල දිනකට එකතුවන කසල ප්‍රමාණය මෙට්‍රික් ටොන් 1 ක් පමණ වේ. ට්‍රැක්ටර් යොදා ගනිමින් පලාත් පාලන ආයතනය විසින් කසල එකතු කරනු ලබන අතර දිරන හා නොදිරන වශයෙන් බෙදා වෙන්කොට ඇත්තේ නම් පමණක් කසල එකතු කරනු ලැබේ. ග්‍රාමීය ප්‍රදේශවල මේ තත්වය 100% ක් ක්‍රියාත්මක වුවද නගරබදව තිබෙන්නේ එක කසල භාජනයක් පමණි. ඒ අනුව නගරය තුල එකතුවන කසලවලින් 50% ක් පමණක් බෙදා වෙන්කල කසල වේ.



වගුව 5.8: පොළොන්නරුව මහ නගර සභාව මගින් කසල එකතු කිරීමේ ක්‍රම
මූලාශ්‍රය: පොළොන්නරුව මහ නගර සභාව



රූප 5.24: පොළොන්නරුව මහ නගර සභාව මගින් කසල එකතු කිරීමේ ක්‍රම
මූලාශ්‍රය: පොළොන්නරුව මහ නගර සභාව



සිතියම *5.1:* පොළොන්නරුව මහ නගර සභාවේ ඝණ අපද්‍රව්‍ය එකතුකිරීමේ ගමන් මාර්ගය
මූලාශ්‍රය: තමන්කඩුව මහ නගර සභාව හා ප්‍රාදේශීය සභාව

ගමන් මාර්ගය	ගම
ගමන් මාර්ගය 01	බැඳිවැව,23 කණුව, ඩෝබිගම, කවාකාර මාර්ගය,සේවාගම
ගමන් මාර්ගය 02	පත්තිනි පෙදෙස, රජයේ නිල නිවාස, අක්කර 500, නව නගර පාර, හතරවන ඇළ පාර
ගමන් මාර්ගය 03	සංචාරක හෝටල්, බෙට 03 පාර, හිජ්රා ම.වි,බැංකු පෙදෙස, පැරකුම් පෙදෙස
ගමන් මාර්ගය 04	28 කණුව, කොතලාවල මාර්ගය, පයිප්ප පාර, මැණික් පෙදෙස, මුස්ලිම් කොලනිය, මානික්කම්පිටිය
ගමන් මාර්ගය 05 (රාත්‍රී)	පොළොන්නරුව කදුරුවෙල ප්‍රධාන මාර්ගය

වගුව 5.9: පොළොන්නරුව මහ නගර සභාවේ ඝණ අපද්‍රව්‍ය එකතුකිරීමේ ගමන් මාර්ගය
මූලාශ්‍රය: තමන්කඩුව මහ නගර සභාව හා ප්‍රාදේශීය සභාව

5. පවත්නා වාරිමාර්ග හා අපරවාහ පහසුකම් ජාලය

නගරයක සුවපහසු ජීවන රටාවක් සඳහා වූ පදනම වනුයේ එහි පවතින අපරවාහ පහසුකම් හා අනෙකුත් පහසුකම්ය. ඒ අනුව මෙම නාගරික ප්‍රදේශයේ පවතින මූලික පහසුකම් ඉලක්ක 3 සඳහා වූ ශක්තින් වේ. මනා සම්බන්ධතාවයකින් යුක්ත මාර්ග ජාලයක් නගරය තුල පවතින අතර, පවුල්වලින් 86% කට නලජල පහසුකම් ඇත.

සෑම නිවසකටම පාහේ විදුලි සැපයුම ලබා දී ඇති අතර මුළු ප්‍රදේශයෙන් 98% ක්ම, විදුලි සැපයුම ආවරණය වී ඇත. සමස්ත දිස්ත්‍රික්කය තුල ඇති හොඳම සේවාවන් (අධ්‍යාපනය, සෞඛ්‍ය හා වෙනත් සේවාවන්) නගරය තුලින්ම ලබාගත හැකිය. වාරිමාර්ග පද්ධතිය ද ප්‍රදේශය ආවරණය වන පරිදි විසිර පවතින අතර වියළි කාලවලදී ජලය බෙදා හැරීම පරාක්‍රම සමුද්‍රය මඟින් සිදුකරන ලබයි. එය භූගත ජල මට්ටමට ද බලපෑමක් සිදු කරනු ලබයි.

පානීය ජල මූලාශ්‍රය	ප්‍රතිශතය
නළ ජලය	86%
ළිං ජලය	12%
බෝතල් කළ ජලය	1%
ගඟ/වැව/දිය පහර	1%
නළ ළිං	0



රූපසටහන 5.25 පානීය ජල භාවිතය
මූලාශ්‍රය: ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

ඉලක්ක 3 - දුර්වලතා

1. නිසි කාණු පද්ධතියක් නොමැති වීම

නාගරික සංවර්ධන අධිකාරියේ පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය විසින් කරන ලද ක්ෂේත්‍ර සමීක්ෂණ වාර්තාවලට අනුව පවතින නිවාසවලින් 2/5 කට පමණ කාණු / ස්වාභාවික වැසි ජලය බැසයාම පිළිබඳ ගැටළු ඇති බවට හඳුනාගෙන ඇති අතර, ප්‍රධාන මාර්ගයන් ඔස්සේ පමණක් කොන්ක්‍රීට් යොදා කාණු ඉදිකර ඇත. අනෙකුත් ප්‍රදේශ ආවරණය කරමින් පස් කාණු පැවතිය ද ඒවා නිසිලෙස නඩත්තු කිරීමක් සිදු නොවන අතර සමහර කොටස්හි අනවසරයෙන් පස් පිරවීම් ද සිදු කොට ඇත.

එමෙන්ම, වර්තමානයේ ක්‍රියාත්මක කරමින් පවතින මාර්ග වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති මඟින් මාර්ගයේ බිම් මට්ටම උස් වන අතර එමඟින් දෙපස මාර්ගය සාපේක්ෂව පවතින ඉඩම් පහළ මට්ටමේ පවතී.

එමෙන්ම, නගරය තුල අපජලවහන පද්ධතියක් නොමැති අතර, වාණිජ නගරය තුලින් උත්පාදනය වන අපජලය, වැසි ජලය සමඟ මිශ්‍රවී ගෙවතු තුලට පිටාර ගැලීමක් සිදුවේ.



රූපසටහන 5.26: දැනට පවතින අපවහන පහසුකම් පිළිබඳ ඡායාරූප
මූලාශ්‍රය: ක්ෂේත්‍ර පිරික්සුම



සිතියම 5.2: අපවහන පද්ධතිය
මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය

2. නගරය තුල උෂ්ණත්වය ඉහළ යාම / දරාගත නොහැකි වීම

පොළොන්නරුව ශ්‍රී ලංකාවේ වියළි කලාපයට අයත්වන අතර එහි සාමාන්‍ය උෂ්ණත්වය **28˚C – 32˚C** ත් අතර වේ. නමුත් විශේෂයෙන් කඳුරුවල නගරය තුල මෙම උෂ්ණත්වය **5˚C** කින් පමණ ඉහළ යන අතර, ඒ සඳහා විවිධ හේතු බලපා ඇත. මෙය නගරයේ ස්ථානීය උෂ්ණත්වය ඉහළ යාමක් ලෙස දැක්විය හැකිය. මේ සඳහා බලපානු ලබන ප්‍රධාන හේතු ලෙස ගොඩනැගිලි මඟින් සුළං මාර්ග අවහිර වීම, ගොඩනැගිලි ද්‍රව්‍ය ,හරිත ආවරණ නොමැති වීම ගත හැකිය.

- *ගොඩනැගිලි මඟින් සුළං මාර්ග අවහිර වීම*

නගරයේ පවතින වීථි රටාව හා එහි පවතින ඉදිකිරීම් මඟින් වසර පුරාවට නගරය තුල සුළං දිශාව අවහිර කර ඇත. නිරිත දිග මෝසම් සුළං පවතින මැයි සිට අගෝස්තු දක්වා කාලය තුල ප්‍රදේශයේ පවතිනුයේ වියළි කාලගුණික තත්වයක් වන අතර ඊසාන දිග මෝසම් කාලයේදී ද තත්වය එසේම පවතී. පවතින ගොඩනැගිලි මඟින් ස්වාභාවික සුළං දිශාව අවහිර කරනු ලබන අතර එම ගොඩනැගිලි අතර කිසිදු අවශ්‍යතාවයක් සඳහා ඉඩකඩක් තබා නොමැත.

උදාහරණයක් වශයෙන් **A11** මාර්ගයේ වම්පැත්ත, පළමු හරස් මාර්ගය, කඳුරුවෙල වාණිජ නගරයෙන් පටන්ගෙන පොළොන්නරුව රෝහල් මංසන්ධිය දක්වා වූ ප්‍රදේශය දැක්විය හැකිය. ගොඩනැගිලි මඟින් සුළං මාර්ග අවහිර කිරීමෙන් සංවහනය මඟින් වන සිසිල් වීම වළකාවනු ලබයි. එමෙන්ම මෝටර් රථ, වායු සමීකරණ, කර්මාන්ත හා වෙනත් මූලාශ්‍ර මඟින් පිටකරනු ලබන අපද්‍රව්‍ය ද නගරයේ උණුසුම් තත්වයක් ඇතිවීමට බලපායි.



රූපසටහන 5.27 : මැයි සිට අගෝස්තු දක්වා නගරයේ සුළං දිශාව(යල මෝසම)
මූලාශ්‍රය: අන්තර්ජාලය

- *ගොඩනැගිලි ද්‍රව්‍ය*

නාගරික උෂ්ණත්වය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපානුයේ ඉඩම් සඳහා කරනු ලබන වෙනස් කිරීමය. අඳුරු පෘෂ්ඨයන් සැලකිය යුතු තරම් සූර්ය විකිරණ අවශේෂණය කර ගන්නා බැවින් උප නාගරික ප්‍රදේශවලට හා ග්‍රාමීය ප්‍රදේශවලට සාපේක්ෂව දිවා කාලයන්හි නාගරික ප්‍රදේශයන්හි උෂ්ණත්වය

ඉහළ අගයක් ගනී. කඳුරුවෙල නගරය තුල වහලවල්, පදික වේදිකා හා මාර්ග සඳහා යොදා ගෙන ඇති ගොඩනැගිලි අමුද්‍රව්‍ය වන කොන්ක්‍රීට්, ඇස්බැස්ටස් සෙවිලි තහඩු, ඇස්ෆෝල්ට් මඟින් අවට ප්‍රදේශයන්ට සාපේක්ෂව සැලකිය යුතු උෂ්ණත්වයක් පවතී.

එමෙන්ම බලශක්ති භාවිතය මඟින් ජනනය වන අපද්‍රව්‍ය නගරයේ උෂ්ණත්වය ඉහලයාම සඳහා ද්විතීයක දායකත්වයක් සපයයි.

- හරිත ආවරණ නොමැති වීම

කඳුරුවෙල නගරය තුල ගස් කොලන් නොමැති වීමෙන් ශාක මඟින් ලැබෙන සිසිලස, සෙවන, කාබක්ඩයොක්සයිඩ් උරා ගැනීම (වාතයෙන් ඉවත් කිරීම) ආදිය නගරයට අහිමිවී ඇත.

නගරයක උෂ්ණත්වය අවම කිරීම සඳහා ශාක අත්‍යවශ්‍ය සාධකයක් වන අතර එමඟින් පාරිසරික උෂ්ණත්වය $10^{\circ}F$ හෝ $5.5^{\circ}C$ සිට $10^{\circ}F$ හෝ 20.45° හෝ $11.25^{\circ}C$ දක්වා අඩු කිරීමක් සිදුකරනු ලබයි. නේවාසික ගොඩනැගිලි, වහලවල්, පදික වේදිකා, මාර්ග ආදිය සඳහා සුදු හෝ පරාවර්තක ද්‍රව්‍ය භාවිතයෙන් හා හරිත ආවරණ හා සුළං මාර්ග විවෘත කිරීමෙන් තාප දූපත් බලපෑම අවම කර ගත හැකිය.

රූපසටහන 5.28: තාප දූපත් බලපෑමේ පැතිකඩ



මූලාශ්‍රය:
https://www.accuweather.com/en/weather-glossary

- *Sachindra, D. A., Ng, A. W. M., Muthukumaran, S., & Perera, B. J. C. (July 2015). Impact of Climate Change on Urban Heat Island Effect and Extreme Temperatures: A Case Study. Quarterly Journal of the Royal Meteorological*

3. ජලවහන පද්ධතියේ අත්‍යාවශ්‍ය කොටස් ගොඩ කිරීම

පොලොන්නරුව නාගරික ප්‍රදේශය සාපේක්ෂ වශයෙන් සමතලා භූමියක පිහිටා ඇති අතර අඩු ආනතියකින් ජලය ගලා යයි. ඒ නිසා සුළු අවහිරවීමකින් වුවද මුළු ජලවහන පද්ධතියම අවහිර විය හැකිය. මෙම ජලවහන පද්ධතියේ ප්‍රධාන කොටස් ලෙස පරාක්‍රම සමුද්‍රය, වාරි ඇළ මාර්ග, වැසි ජල අපවහන කාණු, කුඹුරු හා පහත් බිම් දැක්විය හැකිය. කුඹුරු ඉඩම් මඟින් ජලය අවශෝෂණය කර ගන්නා අතර අමතර ජලය කුඩා ඇල මාර්ග ඔස්සේ ගොස් කුඩා වැව්වලට එකතු වේ. නගරය තුල පතිතවන වැසි ජලයද මෙම කුඹුරු ඉඩම්වලට එකතු වේ. දැනට ක්‍රියාත්මක වන අපරව්‍යුහ පහසුකම් සංවර්ධන ව්‍යාපෘති වන අඩි **100 A11** පාර හා නගර පුළුල් කිරීමේ ව්‍යාපෘති මඟින් කුඹුරු ඉඩම් අක්කර **32** ක පමණ ප්‍රමාණයක් පුරවා ඇති අතර එමඟින් වන බලපෑම තවමත් ගණන් බලා නොමැත.

4. විකල්ප මාර්ග ජාලය පිළිබඳ දැනුවත් කිරීම් අවම වීම

A11 මාර්ගයේ දිනපතා අධික වාහන තදබදයක් පවතින අතර නගරය පසුකර යන වාහන හා දිනපතා නගරයට පැමිණෙන මගී ජනතාව මෙම මාර්ගය භාවිතා කරනු ලබයි. කරන ලද සමීක්ෂණ අනුව ප්‍රධාන නගර මධ්‍යස්ථාන තුනෙන් භාණ්ඩ හා සේවා ලබා ගැනීමට පැමිණෙන ජනතාවගෙන් **95%** ක්ම මෙම ප්‍රධාන මාර්ගය භාවිතා කරනු දැක ගත හැකිය. පවතින මාර්ග පද්ධතිය පිළිබඳව හොඳින් නිරීක්ෂණය කිරීමේදී ප්‍රධාන නගර තුන සම්බන්ධ කරමින් එම නගර මධ්‍යයන් පසු කර යා හැකි විකල්ප මාර්ග ජාලයක් පවතින අතර ගැටළුව වී ඇත්තේ එම විකල්ප මාර්ගයන් පිළිබඳව දැනුවත් වී නොතිබීමයි. උදාහරණයක් ලෙස රෝහල් හන්දිය මග හරිමින් වාණිජ නගරය වෙත පිවිසීම සඳහා උප මාර්ග තුනක් ඇත. නමුත් එම මාර්ගයන් භාවිතා කරනුයේ මුළු වාහන ප්‍රමාණයෙන් **5%** කටත් අඩු ප්‍රමාණයකි.

ඉලක්ක 3 - අවස්ථාවන්

1. ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන පොලොන්නරුව නැගෙනහිර ජල ව්‍යාපෘතිය

වර්තමානයේ ජලය සඳහා වන ඉල්ලුම සලකා බලන විට තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල ජල අවශ්‍යතාවය දිනකට ඝන මීටර 16100 කි. පොලොන්නරුව තුල මුළු ජල අවශ්‍යතාවය දිනකට ජලය ඝන මීටර් 80,000 කි. මෙය ගණනය කරන ලද්දේ ඒක පුද්ගල ජල පාරිභෝජනය දිනකට ලීටර 120 ක් හා මුළු ගෘහස්ථ පරිභෝජනයෙන් 8% ක් කර්මාන්ත සඳහා ද, 10% වාණිජ සඳහා ද ඉල්ලුමක් ඇතිවේ යයි යන උපකල්පය පදනම් කරගෙනය. ජනගහන වර්ධනය සලකන්නේ නම් ජනගහන වර්ධන වේගය 1.5% යයි පදනම්ව තමන්කඩුව ප්‍රාදේශීය සභා ප්‍රදේශයටම ජල අවශ්‍යතාව දිනකට ඝන මීටර් 19500 වේ. මෙම නැගෙනහිර ජල ව්‍යාපෘතිය මඟින් පොලොන්නරුව දිස්ත්‍රික්කයේ තමන්කඩුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ජල අවශ්‍යතාවයෙන් 65% ක් පමණ ආවරණය කරනු ලබන අතර ගල්ලැල්ලේ පවතින ජල පොම්පාගාරයේ ධාරිතාවයද ඝන මීටර්13500 දක්වා වැඩි කරනු ලබයි. පවතින ජල ව්‍යාපෘති මඟින් හා නැගෙනහිර නගර ජල ව්‍යාපෘති මඟින් නගරයේ ජල අවශ්‍යතාව සම්පූර්ණ කිරීමට හැකියාව ලැබෙනු ඇත. එමෙන්ම ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය මඟින් පිරිසිදු කර බෙදා හරිනු ලබන ජලය වකුගඩු ලෙඩ රෝග සඳහා බල නොපාන බවට තහවුරු කර ඇත.

ස්ථානය	වර්තමාන ඉල්ලුම (m^3/දිනකට)	සැපයුම (m^3/දිනකට)	අනාගතයේ සැලසුම් කළ ධාරිතාව (m^3/දිනකට)	ජල මූලාශ්‍රය
ගල්ලැල්ල	10100	8800	13500	මහවැලි ගඟ
පොළොන්නරුව	5000	3800	6500	පරාක්‍රම සමුද්‍රය

වගුව 5.8 පොළොන්නරුව නාගරික ප්‍රදේශය තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ජල පිරිපහදු කිරීමේ හා බෙදා හැරීමේ මධ්‍යස්ථාන
මූලාශ්‍රය: ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

2. ස්වභාවික විපත් සිදුවීමේ සම්භාවිතාව අවම වීම

පොළොන්නරුව නාගරික ප්‍රදේශය දිවයිනේ අනෙකුත් නගරවලට සාපේක්ෂව ඉතා සුළු ස්වාභාවික ව්‍යවසන කිහිපයක් වාර්තා කර ඇත. නියඟය, ගංවතුර, අධික සුළං සහ අකුණු ගැසීම් ආදිය ප්‍රදේශයේ ස්වාභාවික ව්‍යවසන වශයෙන් වාර්තා වී ඇති අතර, (ඇමුණුම 11) මේ හේතුවෙන් කිසිදු මරණයක් මෙතෙක් වාර්තා වී නොමැත. සෑම වසරකම දෙසැම්බර් මාසයේ සිදුවන මහවැලි ගඟේ ගංවතුරෙන් නගර ක්‍රියාකාරිත්වයට ඉහළ බලපෑමක් එල්ල වී ඇත. නමුත්, මොරගහකන්ද ව්‍යාපෘතිය හේතුවෙන් මෙම ගංවතුර බලපෑම අනාගතයේ අවම වනු ඇතැයි උපකල්පනය කර තිබේ.

නමුත් පොළොන්නරුව ප්‍රධාන පානීය ජල මූලාශ්‍රය මහවැලි ගඟ වන බැවින්, ප්‍රදේශයේ ජල සැපයුම නොවෙනස්ව පවත්වා ගත හැක. වියළි කාල වලදී සමස්ථ දිස්ත්‍රික්කයේ වී වගාව සඳහා නියඟය යම්තාක් දුරට බලපා ඇතත් මොරගහකන්ද ජලාශයේ ඉදිකිරීමත් සමඟ පරාක්‍රම සමුද්‍රය ඔස්සේ අදාල වාරිමාර්ග ඇලවලට අවශ්‍ය ජලය සැපයිය හැකිය. එමගින් භූගත ජල මට්ටමේ වැඩිවීමක් දැකිය හැකි අතර අනාගතයේ සමස්ථ දිස්ත්‍රික්කයටම නියඟයෙන් වන බලපෑම්ද අවම වනු ඇත.

ඉලක්ක 3 - තර්ජන

1. නියඟය සහ අධික සුළං තත්වය

නාගරික ප්‍රදේශයෙහි සැප පහසු ජීවිතයක් ගත කිරීම සඳහා ලෝකය තුල ඇතිවන දේශගුණික වෙනස්කම් තර්ජනයක් විය හැකිය. නිවර්තන දේශගුණික කලාපයක් තුල පිහිටා ඇති මෙම නාගරික ප්‍රදේශයේ උෂ්ණත්වය අඩු කිරීම සඳහා කුමන වෙනස්කමක් කළද ඊට වඩා වැඩි වේගයකින් ලෝකයේ ගෝලීය උෂ්ණත්වය වැඩිවේ නම් ඉන් සිදුවන බලපෑම අඩුවිය හැකිය. අධික සුළං වසර 30 කට වරක් වාර්තා වී ඇති අතර, වසර 1996 න් පසුව නැවත එය සිදුවීමේ ප්‍රවනතාවයක් ඇත්තේ වසර 2026 දීය. මෙවැනි ව්‍යවසන මඟින් සාමාජීය, භෞතික හා විශේෂයෙන්ම ආර්ථික බලපෑම් ඇතිවිය හැකි අතර එය වඩාත් ප්‍රබල ලෙස දැනෙනුයේ ප්‍රධාන සේවා මධ්‍යස්ථානය වන පොළොන්නරුව නාගරික ප්‍රදේශයටය.

පරිච්ඡේදය 06 : සැලැස්ම



6. සැලැස්ම

6.1 හැදින්වීම

පොළොන්නරුව නගරය ***"සහල් රාජධානියේ මහිමාන්විත උරුමයේ හරිත නගරය"*** බවට පත් කිරීමෙහි ලා හොඳින් සැලසුම් කළ උපායමාර්ගික සංවර්ධනයක් අවශ්‍ය වේ. ඒ අනුව, නව ආර්ථික අවස්ථා සපයා දෙමින් නිවර්තන දේශගුණයක් තුළ සුවපහසු දිවිපෙවෙතක් ළඟාකර ගැනීමටත්, ස්වාභාවික පරිසරය ආරක්ෂා කරන අතරතුරම වී ගොවිතැන හා සම්බන්ධ සංස්කෘතිය හා පෞරාණික උරුමය පෙන්වන පරිදි නගරයේ අනන්‍යතා ලක්ෂණ ඉස්මතු කිරීමත් අත්‍යාවශ්‍ය කරුණකි. ජීවත්වීමේ යෝග්‍යතාවය වැඩිදියුණු කිරීම, ප්‍රධාන මධ්‍යස්ථාන අතර සම්බන්ධීකරණය හා අලංකාරය යන කාරණා නගරය එහි නේවාසිකයන්ට සුඛිතවත් කරන අතරම දේශීය හා විදේශීය සංචාරකයන් ආකර්ශනය කිරීමට සහාය වනු ඇත. එමෙන්ම, දැනට පවතින යටිතල පහසුකම් පද්ධතියේ උපරිම භාවිතය අනාගත දැක්ම ළඟාකර ගැනීමේදී සුවිශේෂී පහසුවක් අත්කර දෙනු ඇතැයි අපේක්ෂිතය.

නගරයේ අනාගත දැක්ම භෞතික අවකාශයේදී මුදුන්පත්කර ගැනීමට "සංකල්පිත සැලැස්ම" සංවර්ධනයකර ඇත. 2030 අනාගත දැක්මකරා යෑමේදී එය ඉලක්ක තුනකට බෙදීමෙන් නගර සැලසුම්කරණයේ සෑම දෘෂ්ටිකෝණයක්ම ආවරණය වන පරිදි උපායමාර්ග 7 ක් හඳුනාගෙන ඇත. ආර්ථික සංවර්ධන උපාය මාර්ගය වනාහි ප්‍රධානතම උපාය මාර්ගය වන අතර, අනෙකුත් ඒවා සංවර්ධනය කර ඇත්තේ ඊට සහාය දීම සඳහාය. සංස්කෘතික හා කළමනාකරණ උපායමාර්ගය නගරයේ අනන්‍යතාවය වැඩිදියුණු කරනු ඇති අතර, සමාජයීය හා භෞතික යටිතල පහසුකම් සංවර්ධන උපාය මාර්ගය මඟින් දැක්ම මුදුන්පත් කර ගැනීම සඳහා සේවා පහසුකම් සපයනු ඇත. පරිසර හිතකර උපායමාර්ගය සංවේදී ප්‍රදේශවල ආරක්ෂාව තර කරනු ඇති අතරම නිවර්තන දේශගුණය තුළ ජීවත්වීමේ අපහසුතාවද අවම කරනු ඇත.

සමස්ථය සලකා බැලූ විට පොළොන්නරුව නගරය වසර 2030 දී හොඳම පෞරාණික සංචාරක ගමනාන්තය බවට පත් කිරීම උදෙසා භෞතික සැලසුම්කරණයේ එන මෙවලම් හා තාක්ෂණික ක්‍රමෝපායන් ප්‍රශස්තව භාවිතා කර ඇත.

එනම්, යුනෙස්කෝ පූජා නගරයක් වීම හැර පොළොන්නරුවේ වසර 5000 කට එහා ගිය වී වගාව පිළිබඳ සංස්කෘතික උරුමයද ආර්ථික සංවර්ධනය සඳහා භාවිතා කිරීමට උපක්‍රම යෝජනාකර ඇත. එහිදී වර්තමාන ලෝක සංචරණ නැඹුරුතාවක් වන "කෘෂි සංචරණය" යන විභවතාවය ඉහළින්ම භාවිතා කළ හැක. වී ගොවිතැන, පැරණි

තාක්ෂණික ක්‍රම, මෙවලම්, පැරණි වාරිමාර්ග තාක්ෂණය, සමාජ වටිනාකම්, පුරුදු, සදාචාර සම්මතයන් හා අත්දැකීම් ලැබීමට දේශීය හා විදේශීය සංචාරකයින්ට **2030** පොළොන්නරුව නගරය තුළ දී අවස්ථාව ලැබෙනු ඇත. විවිධ වර්ගයේ පැරණි සහ නූතන සහල් වර්ග සහ ඒවායින් නිෂ්පාදිත ආහාර වර්ග රස විඳීමටත් මිලදී ගැනීමටත් නගරය තුළ සුවිශේෂී අවස්ථාවක් හිමි වනු ඇත. නගර වැසියන්ගේ ජීවන රටාව දැනටමත් වී ගොවිතැන හා සම්බන්ධ සංස්කෘතියකට උරුමකම් කියන නිසාවෙන් අවම ආයෝජනයකින් නිවාස, නැවතුම්පලවල් තුළින් ආදායම් උත්පාදනයකර ගැනීමට ඔවුනට හැකිවනු ඇත. ඒ අනුව, **2030** වන විට නගරය ධනවත්, සෞඛ්‍යමත් සහ විනෝදකාමී පෞරාණික නගරයක් බවට පත් වනු ඇතැයි අපේක්ෂිතය.

6.2 සංකල්පිත සැලැස්ම

"2030 වන විට සහල් රාජධානියේ මහිමාන්විත උරුමයේ හරිත නගරය" යන්නා වූ දැක්ම මුදුන්පත් කරගනු වස් නගරය සඳහා සංකල්පිත සැලැස්ම සංවර්ධනය කර ඇත. සංකල්ප සැලැස්ම යනු නගරයේ අපේක්ෂිත අනාගත භෞතික අවකාශීය භාවිතය (දැක්ම) ළඟා කර ගැනීම සඳහා නිර්මාණය කළ සංකල්පමය ආකෘතියයි. මෙය නිර්මාණයකර ගැනීමේදී නගරයේ පාරිසරික සංවේදීතාවය, ජීවත්වීමේ යෝග්‍යතාවය හා විභවතාවයන් පිළිබඳව විශ්ලේෂණයක් සහ අතීතයේ සිට වර්තමානය තෙක් නගරයේ අවකාශීය භාවිතයේ විකාශනය අධ්‍යයනයකර ඇත.

සංකල්පිත සැලසුම් කිහිපයක් සකස්කර ඒවායේ වාසි අවාසි විශ්ලේෂණයෙන් පසු හොඳම ආකෘතිය තෝරා ගන්නා ලදි. එනම්, පවතින ප්‍රධාන මධ්‍යස්ථාන තුනෙන් සමන්විත අවකාශීය භාවිතය වැඩිදියුණු කරමින් පවත්වා ගන්නා අතරම නව උපනගර පහක් වැඩිදියුණු කිරීමයි.

යෝජිත සංකල්පිත සැලැස්ම විසින් කුඹුරු ඉඩම් සහ පරිසර සංවේදී කලාප ආරක්ෂා කරමින් දෛනික සංක්‍රමණික ජනතාවට අවශ්‍ය පහසුකම් සැලසීම අපේක්ෂිතය. එමෙන්ම, නව සංකල්පිත සැලැස්ම හරහා පවත්නා අපරවාහ පහසුකම්වලින් උපරිම ප්‍රයෝජන ගන්නා අතරම නව ආර්ථික අවස්ථා උත්පාදනය හා **2030** ට සුවඟසු නේවාසික පරිසරයක් නිර්මාණය කිරීම අරමුණු කොට ඇත. ප්‍රධාන මධ්‍යස්ථාන හා පර්ෂද නගර පහත පරිදි වේ. **(සිතියම 6.1)**

❖ ප්‍රධාන මධ්‍යස්ථාන

1. පොළොන්නරුව උරුම නගරය
2. කඳුරුවෙල වාණිජ නගරය
3. නවනගරය පරිපාලන නගරය

❖ උප පර්ෂද

1. පොළොන්නරුව සෞඛ්‍ය පර්ෂදය (Cluster)
2. ලක්ෂ උයන කාර්මික පර්ෂදය (Cluster)
3. සේවාගම නේවාසික පර්ෂදය (Cluster)
4. නව නගර නේවාසික පර්ෂදය (Cluster)
5. ගල්ලැල්ල කිරි ගොවිපළ පර්ෂදය (Cluster)



සිතියම 6.1 : සංකල්පිත සැලැස්ම

මූලාශ්‍රය : පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය - නා.සං.අ.

6.3 යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම

වසර 2030 සඳහා යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම සකසා ඇත්තේ "සහල් රාජධානියේ මහිමාන්විත උරුමයේ හරිත නගරය" යන දැක්ම සාක්ෂාත් කර ගැනීම සහතික කරගනිමින් ය. එමෙන් ම, ඒ හරහා නගරයට නාගරික සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය ලෙස හඳුනා ගැනෙන අංශ පහම ආවරණය කර ඇත.

පොළොන්නරුව පරිපාලන නගරය, පොළොන්නරුව උරුම නගරය සහ කදුරුවෙල වාණිජ නගරය ඒවායේ අනන්‍යතා ලක්ෂණ ආවරණය කර ගනිමින් ප්‍රධාන මධ්‍යස්ථාන ලෙස සංවර්ධනය වනු ඇත. සංචාරක ආකර්ශනය වැඩිකර ගනු වස්, සමස්ථ නගරයේම යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට සැලසුම් කර ඇති අතර, ස්වභාවික පරිසරය ආරක්ෂා කර ගැනීම සඳහා කුඹුරු ඉඩම්, පූජා නගරය සහ ජල ගැලුම් නිම්න ජාතික වනෝද්‍යානය භෞතික සංවර්ධන ක්‍රියාකාරකම්වලින් බැහැරකර ඇත.

යෝජිත කලාප සැලැස්ම වනාහි ප්‍රදේශයේ පූර්වාපේක්ෂිත භූමි පරිහරණය ලඟා කර ගැනීම සඳහා භාවිත වන ප්‍රධාන සැලසුම් මෙවලමකි. සැලසුම් ප්‍රදේශය ඇතුළත වෙනස් වූ පැතිකඩ තුනක් (AB,CD,EF)යොදා ගනිමින් භූමි පරිහරණ සැලැස්ම නිරූපණය කර ඇත. (රූපසටහන 6.4) මෙම පැතිකඩ මඟින් භූමි පරිහරණ රටාව පහසුවෙන් තේරුම්ගත හැකි වන අතර සැලසුම් ප්‍රදේශයේ අදාල කලාප යටතේ එහි භාවිතය විවිධ වේ. (රූප සටහන 6.1, රූපසටහන 6.2, රූපසටහන 6.3)

රූපය 6.1 A සිට B දක්වා පැතිකඩ



කොළඹ හබරණ A11 මාර්ගයේ සිට පොළොන්නරුවට ඇතුළු වන විට අඩු ගණත්ව නේවාසික කලාපය හා හරිතවත් බව නරඹන්නන්ට දැනෙනු ඇත. එසේම පරාක්‍රම සමුද්‍රයෙහි හා දීප උයනෙහි සෞන්දර්යාත්මක පෙනුම නිසා පූජනීය නගරයේ අලංකාර බව ඔවුනට අත්විඳිය හැකිය. පා පැදි සවාරි යන විදේශිය සංචාරකයින්ට මෙන්ම පොළොන්නරුව හංදියේ පදිකයින්ට පෞරාණික ස්වාභාවයෙන් යුත් නමුත්, වඩා වැඩි වශයෙන් නාගරීකරණය වූ ලක්ෂණ අත්විඳිය හැක. රෝහල් හංදිය දක්වා ඉදිරියට ගමන්කරන විට පෞරාණික බව පිළිබඳ වූ හැඟීම සෞඛ්‍ය පර්ෂදය (Cluster) සමඟ

වඩාත් ක්‍රියාකාරී නාගරික අවකාශයක් බවට පරිවර්තනය වනු ඇත. ඉන් පසු හරිත කුඹුරු යායන් සහ අඩු ගණත්ව නේවාසික කලාපය පසුකරමින් කඳුරුවෙල වාණිජ නගරය දක්වා ගමන් කළ හැකිය. මෙම ප්‍රදේශය අනෙකුත් කලාප වලට වඩා උස ගොඩනැගිලි වලින් හා ඉහළ ජන ගණත්වයකින් යුතු ගොඩනැගිලි සහිත ප්‍රදේශයකි. නමුත්, හරස් මාර්ග හරහා කුඹුරු යායවල් සමඟින් සම්බන්ධ ප්‍රධාන මාර්ගයේ වායු සංසරණය වැඩිදියුණු වනු ඇති අතර, මඟීන් සඳහා ඇවිදීමට පහසුකම් සලසන පදික සුහඳ නගරයක් වනු ඇත. නැවතත් මඩකලපුව දෙසට වාණිජ නගරය පසු කරන විට උස ගොඩනැගිලි ඉදිවීම අවම වනු ලබන අතර, අතර, ගල්ලැල්ල ප්‍රදේශයේ වූ ආයතනික කලාපය ප්‍රධාන වශයෙන් ආයතනික අරමුණ සඳහා වූ මධ්‍ය ගණත්වයකින් යුතු ගොඩනැගිලි වලින් සමන් විත වනු ඇත. අවසානයේදි ජලගැලුම් නිම්න අභයභූමිය සහ මහවැලි හ හමුවී නාගරික කලාපය අවසන් වනු ඇත.

රූපය 6.2 : C සිටD දක්වා පැතිකඩ



CD පැතිකඩ (රූප සටහන **6.2**) සංචාරක කලාපයේ, පරිපාලන කලාපයේ, මධ්‍ය නේවාසික කලාපයේ, වාණිජ කලාපයේ, මිශ්‍ර සංවර්ධන කලාපයේ හා පහළ නේවාසික

කලාපයේ භූමි පරිහරණය ආවරණය කරයි. සුළං කපොලු මාර්ග විවෘත කිරීම තුළින් නගර මධ්‍යයේ උෂ්ණත්වය පාලනය කිරීමට වාණිජ නගරය අසළ ඇති කුඹුරු ඉඩම් සහිත පහළ නේවාසික කලාපය සහය වනු ඇත. පරාක්‍රම සමුද්‍රය අවට ඇති සංචාරක කලාපය ප්‍රදේශයේ ස්වාභාවික සුන්දරත්වය හා අනන්‍යතාවය ඉස්මතු කෙරෙන අතර එය නගරයට බොහෝ සංචාරකයන් ආකර්ෂණය කරගනී. චක්‍රාකාරව එය නගරයට සුළඟ ඇතුළු වීම සඳහා සහය වන අතර පූජනීය නගරයේ උණුසුම අඩු කරයි. වාර්ෂික ගංවතුර අවධානය නිසා **D** කෙළවරදී පහළ නේවාසික කලාපය හඳුන්වා දී ඇත.

රූපය 6.3 : Eසිට F දක්වා පැතිකඩ



EFපැතිකඩ (රූපසටහන 6.3) කර්මාන්ත කලාපයේ, පුරාවිද්‍යාත්මක කලාපයේ සහ සංචාරක කලාපයේ සුවිශේෂිත වූ සැකැස්ම ආවරණය කරයි. පුරාවිද්‍යාත්මක කලාපය හා ඒකාබද්ධ වූ සංචාරක කලාපය එම කලාපවල ස්වාභාවික පරිසරය හා පෞරාණික වටිනාකම සංරක්ෂණය කිරීමට උපාය මාර්ගයක් ලෙසින් භාවිත කරන ලද සංචාරක කර්මාන්තය මඟින් ප්‍රතිලාභ ලබා ගනු ඇත. කුඹුරු ඉඩම් වලින් වටවූ කර්මාන්ත කලාපය පරිසර දූෂණය අවම සමබර හරිත කලාපයක් වීම අපේක්ෂිතය.

වසර 2030 දැක්ම ළඟා කර ගැනීමට කලාපීයකරණ සැලසුමක් හා සැලසුම් රෙගුලාසි වෙළුම ii හි හඳුන්වා දී ඇති අතර, එක් එක් කලාපයේ අපේක්ෂිත භෞතික අවකාශයේ හැඩය ළඟා කර ගැනීමට එම කලාපයන් හට වෙන් කළ කලාප සංගුණකයක් පවතී. ඉහත සඳහන් කළ භූමි පරිහරණය වසර 2030 දී ලඟා කර ගැනීම සඳහා ප්‍රමුඛතම උපාය මාර්ගය වන්නේ එම කලාපීකරණ සැලස්ම හා සැලසුම් රෙගුලාසි වේ.



රූපය 6.4 : නගරයේ හරස්කඩ සඳහා මූලාශ්‍ර සිතියම

මූලාශ්‍රය : පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය නා.සං.අ.



සිතියම 6.2 : යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම 2030

මූලාශ්‍රය : පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය නා.සං.අ.

6:4 උපාය මාර්ග

සම්පූර්ණ පොළොන්නරුව සංවර්ධන සැලැස්ම යනු පහත සඳහන් කර ඇති පරිදි පුළුල් වූ උපාය මාර්ග හතක සංකලනයකි.

6.4.1 ආර්ථික සංවර්ධන උපාය මාර්ගය

6.4.1.1 ප්‍රධාන ආර්ථික ක්‍රියාවලිය හා අනාගත ප්‍රවණතා හඳුනා ගැනීම

ආර්ථික සංවර්ධන උපාය මාර්ගය නගරයේ ආර්ථිකය සඳහා මූලික අඩිතාලම ලෙසින් ක්‍රියා කරයි. එය තිරසර ආර්ථික ප්‍රතිසාධනය හා නගරයෙහි මූල්‍ය ස්ථාවරත්වය සඳහා මූලික පියවර ගනු ඇත. එසේම රැකියාව, ආයෝජනය හා දිවි පැවැත්මේ ගුණාත්මකභාවය ඒ මත තීරණය කළ හැකි වනු ඇත. ආර්ථික උපාය මාර්ගික සැලැස්මක් පිළියෙල කිරීමේ අරමුණ වනුයේ ආර්ථික ක්‍රියාවලියට භාවිත නොකළ විභවතාවයන් ලබා ගන්නා අතරම නගර වැසියන් සඳහා වඩාත් හොඳ, ජීවත් වීමට සුදුසු පරිසරයක් ලබා දීමයි. ආර්ථික වර්ධනය සඳහා පහසුකම් සැලසීම හා ස්වාභාවික හා ගොඩනැගිලි සහිත උරුමයන් ආරක්ෂා කිරීම මඟින් සියළුම වැසියන් සඳහා ගුණාත්මක ජීවන තත්වයක් ළඟා කර ගත හැකිය.

උතුරු මැද පළාත් ජාතික දළ දේශීය නිෂ්පාදනයට 5.12% ක දායකත්වයක් සපයයි.එම පළාතින් එක්එක් අංශ සඳහා දළ දේශීය නිෂ්පාදනය සඳහා වූ දායකත්වය වෙන් වෙන් වශයෙන් කෘෂිකාර්මික 8.73% කර්මාන්ත 3.67%, සේවා 5.34% (ඇමුණුම 11) වශයෙන් දැක්වේ.එක් එක් අංශයෙන් වූ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ශ්‍රම බලකායේ පැනිරීම වනුයේ කෘෂිකාර්මික අංශය 45%, සේව 45% සහ කර්මාන්ත සඳහා 10% පමණි.2016 වර්ෂයේ දී පොළොන්නරුව දිස්ත්‍රික්කයේ විරැකියා අනුපාතය 2.5 කි. (ඇමුණුම 13) එම වසරෙහිම ජාතික විරැකියා අනුපාතය 4.4 විය. එම නිසා සාලේක්ෂව පොළොන්නරුව දිස්ත්‍රික්කය සතුව ඉතා පහළ විරැකියා අනුපාතයක් පවති. පොළොන්නරුව සැලසුම් සීමාව ඇතුළත රැකියා ප්‍රතිශතය සම්පූර්ණ ජනගහනයෙන් 55% කි. එම නිසා විරුකියා අනුපාතය මුළු ජනගහනයෙන් 45% කි. සම්පූර්ණ පවුල් සංඛ්‍යාවෙන් 49% පමණක් රු. 5000- 25000 අතර ආදායමක් ලබයි. (ඇමුණුම 14)

පොළොන්නරුව නගරයේ හඳුනාගත් ප්‍රධාන ආර්ථික යාන්ත්‍රණයන් පහත දැක්වේ.

01. සංචාරක කර්මාන්තය වැඩිදියුණු කරන ශ්‍රේෂ්ඨ ඉතිහාසයක් සහිත පැරණි නටබුන්
02. ප්‍රධාන සංචාරක ගමන් මාර්ගය හා පවතින මාර්ග පද්ධතිය අතර පිහිටා ඇති නගරය.

03. සහල් නිෂ්පාදන හා සැකසීමේ ඒකක (සහල් කර්මාන්තය)

04. නගරයට ඉතා ආසන්නයේ පිහිටා ඇති වැදගත් වටිනා පාරිසරික ස්ථාන වැදගත් වටිනාක ස්ථාන (වනාන්තර හා ජල පද්ධතිය)

05. ශ්‍රම බලකාය (සංචාරක කර්මාන්තය හා බැදුණු)

ඉහත සඳහන් කළ ආරථික යාන්ත්‍රණයන් හි සවිස්තරාත්මක තොරතුරු පස්වන පරිච්ඡේදයේ ශක්තීන්, දුබලතා, අවස්ථා හා තර්ජන යන්නෙහි විස්තරාත්මක විශ්ලේෂණය සාකච්ඡා කර ඇත. පොලොන්නරුව ආර්ථිකයට අනාවැකි **6:1** වගුව මඟින් පෙන්වා දෙයි.

වගුව **6:1** : ආර්ථිකයට සම්බන්ධ අනාවැකි.

ක්‍රියාකාරකම	පවතින	යෝජිත
සංචාරක පැමිණීම	දිනකට පුද්ගලයන් 697	දිනකට පුද්ගලයන් 2154
කුඹුරු ඉඩම්	කි.මී.31.71	පුරන් වූ කුඹුරු අස්වැද්දීම 32.02 km²

6.4.1.2 යෝජිත ආර්ථික උපාය මාර්ගික සැලැස්ම

2019 – 2030 පොලොන්නරුව සංවර්ධන සැලැස්මේ දැක්ම වනුයේ සහල් රාජධානියේ මහිමාන්විත උරුමයේ හරිත නගරයයි. පෞරාණික නගරය හා සහල් රාජධානිය වනාහි නගරයේ ආර්ථිකය වැඩිදියුණු කිරීමට යොදාගත හැකි දෙවැදෑරුම් අනන්‍යතාවයන් හා නගරයේ ප්‍රධාන විභවතාවයන්ය. නමුත් පවතින සංවර්ධන පීඩනය නිසාවෙන් පෞරාණික නගරයක් ලෙස එහි අනන්‍යතා ලක්ෂණයන් පරිහානියට පත්වීම නිසාවෙන් එක්සත් ජාතීන්ගේ ලෝක උරුම ලැයිස්තුවෙන් ඉවත්වීමේ හැකියාවක් පවති.

ඒකාබද්ධ කළ හා සංකීර්ණ භෞතික සැලැස්මකට ඉහත කී තර්ජනයන් මැඩපැවැත්විය හැකි අතර සෞඛ්‍යමත් ධනවත් සහ පූජනීය පෞරාණික නගරයක් ලෙසින් පොලොන්නරුව නගරය නිර්මාණය කළ හැකිය. යෝජිත ආර්ථික උපායමාර්ගය සකස් කර ඇත්තේ වී ගොවිතැන හා සංචාරක කර්මාන්තය සංවර්ධනය සඳහා වඩා වැඩි අවකාශයක් දෙමින් පවතින යටිතල පහසුකම් පද්ධතියේ උපරිම භාවිතයන් සහිතව නගර වැසියන්ගේ ආර්ථිකය නගා සිටුවිමටය.

වෙනත් කර්මාන්ත හා සංචාරක කර්මාන්තය සඳහා වෙනස් කලාප නිර්ණය කිරීම මඟින් එම කලාපවල පවතින සහල් සැකසීමේ කර්මාන්තය හා සංචාරක කර්මාන්ත ආශ්‍රිත

ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීමට දිරිමත් කිරීමක් ලබා දෙනු ඇත. නමුත්, සමස්ත නගර වැසියන් සඳහාද වඩා වැඩි ආර්ථික අවස්ථා නිර්මාණය කිරීමට ඉහත කලාපවලින් පිටත ඇතැම් උපායමාර්ගික ව්‍යාපෘති පිහිටවනු ඇත. වී ගොවිතැන හා සම්බන්ධ සංස්කෘතිය පිළිබඳ වූ කෞතුකාගාරය, වාරිමාර්ග කෞතුකාගාරය, ඓතිහාසික වී ගොවිතැන හා සම්බන්ධ සංස්කෘතිය ප්‍රායෝගිකව ක්‍රියාවට නංවන පරිසර ගම්මානය (උදා: උල්පොත පරිසර ගම්මානය, දඹුල්ල) එහි පදිංචිකරුවන් සඳහා නව ආදායම් උත්පාදන ක්‍රම සඳහා උදාහරණ සපයා දෙනු ඇත.

6.4.1.2.1 සංචාරක කටයුතු සඳහා සුවිශේෂී කලාපයක් හා එහි විශේෂ ව්‍යාපෘති හඳුන්වා දීම.

සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම වනාහි නගරයේ ආර්ථිකය දියුණු කිරීම සඳහා ඇති එක්තරා සැලකිය යුතු උපකාරයකි. පොළොන්නරුව ලෝක උරුම නගරයක් ලෙස වඩා වැඩි සංචාරක ආකර්ෂණයක් ලබා ගැනීමට එහි අනන්‍යතාවය ඉස්මතු කර දැක්වීම අත්‍යාවශ්‍ය දෙයකි. සංචාරක අවශ්‍යතා හා කැමැත්ත සලකා බලමින් නගරයේ ආර්ථිකය සුපෝෂිත කිරීමට පහත උපාය මාර්ගික ව්‍යාපෘති හඳුනාගෙන ඇත.

(A) නව තරු පංතියේ හෝටල් හඳුන්වාදීම හා දැනට පවතින හෝටල් නීතිගත කිරීම.

පූජනීය නගරය අවට **100** කට අධික හෝටල් (කුඩා පරිමාණයේ සිට මහා පරිමාණය දක්වා) පැවතුනද ඒවායින් බොහෝමයක් සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි වී නොමැත. පළාත්පාලන ආයතන සමඟ සංචාරක කර්මාන්තයේ පාර්ශවකරුවන්ගේ තොරතුරු සියල්ල ලේඛණගත කිරීම සහ ඒවා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කිරීම හරහා සංචාරකයින් සඳහා වැඩිදියුණු කළ ආරක්ෂිත නවාතැන් පහසුකම් සලසන බවට සහතික වනු ඇත. අනාගතයේදී සංචාරකයින්ගේ පැමිණීම හා ඉල්ලුම සලකා බලමින් මෙම සංචාරක සැලැස්ම තුළ පරාක්‍රම සමුද්‍රය ආසන්නයේ මහාපරිමාණ තරු පන්තියේ හෝටල් **4** ක් යෝජනා කර ඇත. එම හෝටල් ඔවුන්ගේ පරිසර දූෂණය **(Carbon Footprint)** ඉතා පහත මට්ටමේ තබා ගත යුතු අතර, ආකෘතිය ස්වභාවික පරිසරය සමඟ සම්මිශ්‍රණය වීම අත්‍යාවශ්‍යය. **(රූපසටහන 6.5)**



රූපය 6.5 : සොබාදහම සමඟ මුසු වූ උගා හෝටලය, යාල, ශ්‍රී ලංකා
මූලාශ්‍රය : **https://www.ugaescapes.com/destinations/yala.html**

සුරතල් මත්ස්‍ය කර්මාන්තය හා වාණිජ අරමුණු සඳහා වූ ධීවර කර්මාන්තය හා බෝට්ටු සේවා

මිරිදිය මත්ස්‍ය කර්මාන්තය වනාහි පොළොන්නරුවේ ඇති එක්තරා ජනප්‍රිය කර්මාන්තයකි. ඒ අනුව, සංචාරකයන් සඳහා සුරතල් මත්ස්‍ය කර්මාන්තයත්, නේවාසික ප්‍රජාව සඳහා වාණිජමය ධීවර කර්මාන්තයත් සඳහා ස්ථාන හඳුන්වා දීමෙන් මෙම උපාය මාර්ගය ප්‍රවර්ධනය කෙරෙනු ඇති අතර, පරාක්‍රම සමුද්‍රය අසල මේ සඳහා පහසුකම් සලසනු ඇත. (රූප සටහන 6.6)එමෙන්ම, පරාක්‍රම සමුද්‍රයේ වක් වූ ප්‍රදේශ (Bay areas) සඳහා හංස බෝට්ටු පහසුකම් හඳුන්වා දීමට යෝජනා කර ඇත.



රූපය 6.6 : පරාක්‍රම සමුද්‍රයේ මසුන් ඇල්ලීම
මූලාශ්‍රය:https://manishamishra.files.wordpress.com/2012/04/img_3561.jpg



රූපය 6.7 : නුවරඑළියෙහි ග්‍රෙගරි විලේ හංස බෝට්ටු සේවාව
මූලාශ්‍රය : https://www.dhanushamarinelanka.Com /img/about/paddle-500-swan-07.jpg

(C)පාපැදි කුලියට ගැනීමේ වැඩසටහනක් හඳුන්වා දීම.

මෙම පාපැදි ක්‍රමය වනාහි පූජනීය නගරය ඇතුළත වාහන තදබදය අවම කිරීමට ඇති ක්‍රමයක් වන අතර, මිනිසුන් පූජනීය නගරයේ සුන්දරත්වය විඳින අතරතුර ඔවුන්ගේ සෞඛ්‍ය තත්ත්වයද නගා සිටුවයි. එම අදාළ පාපැදි අයදුම්පත් මඟින් ආසන්නතම බයිසිකල් සේවාව සොයා ගත හැකි අතර, ඒවායේ අඟුළු ඉවත් කිරීමට QR කේතය යොදා ගත හැක. පුද්ගලයෙකු ගමන ආරම්භ කළ පසු පැයකට ආදීවශයෙන් අය කිරීම් සිදු කරනු ඇත. මෙම ක්‍රමය ගැණුම්කරුවන් හා විකුණුම්කරුවන් යන දෙපිරිසෙහිම සුරක්ෂිතභාවය හා විනිවිදභාවය තහවුරු කරනු ඇත. එසේම, මෙය විදේශීය සංචාරකයින්ව ඔවුන්ගේ වාහන පූජනීය නගරයෙන් පිටත නවතා තැබීමට පොළඹවනු ලැබෙනු ඇති අතර, පාපැදි පදින අතරතුර පැරණි නටඹුන් පිළිබඳවද නව අත්දැකීමක් ලබා දෙනු ඇත.



රූපය 6.8 : බයිසිකල් හුවමාරු කිරීමේ ස්ථාන
මූලාශ්‍රය:: https://altaplanning.com/dockless-bike-share/:

(D) ස්වාභාවික මින්මැදුර හා මිරිදිය මත්ස්‍ය ගම්මානය

මෙම ස්වාභාවික මින්මැදුර පරාක්‍රම සමුද්‍රය සමඟ සම්බන්ධවෙමින් ප්‍රදේශය තුළම ජලජ ජීවිතය පිළිබඳව අත්දැකීමක් ලබා දීම සඳහා යෝජනා කර ඇත. මෙම යෝජනාව පොළොන්නරුවේ මිරිදිය ධීවර කර්මාන්තයේ අනන්‍යතාවය මතුකර දැක්වීම උදෙසා සැකසූවකි. බැඳිවැව ධීවර ගම්මානය තුළ මෙම සැකැස්ම ස්ථාපනය කරනු ඇත. මෙම ස්වභාවික මින්මැදුර තුළ මසුන් හා සම්බන්ධ අධ්‍යාපනය හා විනෝද ක්‍රියාකාරකම්ද සැපයීමට යෝජිතය.



සිතියම 6.3 : සංචාරක කලාපයේ යෝජිත ව්‍යාපෘති - 2030

මූලාශ්‍රය : පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය - නා.සං.අ.



රූපය 6.9: විස්කොසන් (හේවුඩ්) මිරිදිය

මූලාශ්‍රය:: https://media-cdn. tripadvisor. com/ media/ photo-s/01/3a/77/13/the-big-muskie-at-the.jpg



රූපය 6.10 ළමයින් මිරිදිය මසුන් ඇල්ලීමේ කඳවුර

මූලාශ්‍රය : https://www.gannettcdn.com/-/mm-/local/media/2018/04/08/Guam/Guam/636587486250118451/IMG-2669.JPG

6.4.1.2.2. කෘෂි-සංචාරක වැඩසටහන

කැලිෆෝනියා විශ්ව විද්‍යාලයේ කුඩා ගොවිපල වැඩසටහනෙහි විස්තර වලට අනුව "කෘෂි සංචාරක කර්මාන්තය යනු අයිතිකරුට හා ක්‍රියාකරුට අතිරේක ආදායමක් උපදවන නරඹන්නන්ගේ විනෝදය හෝ අධ්‍යාපනය සඳහා වැඩකරන ගොවි හෝ විශාල පරිමාණයෙන් ක්‍රියාත්මක කරන වාණිජ ව්‍යාවසායකි." සංචාරක ලෝකය තුළ මෙම මාතෘකාව සම්බන්ධයෙන් ඉතා ඉහළ ප්‍රවණතාවයක් පවතින අතර, පවතින යටිතල පහසුකම් සමඟින් පොළොන්නරුව තුළද එය සිදු කළ හැක. ප්‍රාදේශීය මට්ටමින් අවශ්‍ය වන්නේ විධිමත් මඟ පෙන්වීමක් පමණි. පහත උපායමාර්ගික වැඩසටහන් නගර වැසියන්ට තම ඉඩම තුළ අනුගමනය කළ හැකි ආකෘතීන් ලෙසින් හඳුන්වා දෙනු ඇත.

A. නැරඹුම් මැදිරි සහ කෘෂි කාර්මික සංචාරක කර්මාන්තයේ විනෝද ක්‍රියාකාරකම් (සිතියම 6.4)

පොළොන්නරුව නගරයට පවතින ආකර්ෂණය කුඹුරු ඉඩම් මඟින් තීව්‍ර කරන අතර, එය පොළොන්නරුව නගරයේ ප්‍රධානතම භූමි පරිහරණයකි. නමුත් ප්‍රදේශයේ කුඹුරු ඉඩම් වල පවතින සුන්දරත්ව පිළිබඳ අත්දැකීම විඳගැනීමට සංචාරකයින්ට අවකාශයක් නොමැත. විශේෂයෙන් A11 මාර්ගයට යාබදව අළංකාර කුඹුරු ඉඩම් ඇති අතර ප්‍රධාන මාර්ගයේ යන අතරතුරම ඒවායේ සුන්දරත්වය නැරඹීම සඳහා නැරඹුම් මැදිරි / වේදිකා සැකසීමට යෝජිතය.(රූප

සටහන 6.11, 6.12).එමෙන්ම සංචාරක විනෝදය සහ අත්දැකීම් සඳහා වී ගොවිතැන ආශ්‍රිත ක්‍රියාකාරකම් ද ඒවායේ සංවිධානය කළ හැක. සංචාරක කර්මාන්තය අමතර ආදායමක් ලබා ගැනීමට ගොවීන්ගේ කුඹුරු ඉඩම් තුළ මෙවැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන අයට ආදර්ශයක් ලෙස "රන්කෙත උයන" කුඹුරු ඉඩම තෝරාගෙන ඇත.



රූපය 6.11: වියට්නාමයේ කෘෂි සංචාරක විනෝදාත්මක කටයුතු
මූලාශ්‍රය: අන්තර්ජාලය



සිතියම 6.4: විනෝදය සඳහා වූ නැරඹුම් පීඨිකාව හා කුඹුරු ඉඩම
මූලාශ්‍රය: පොලොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය- නා.සං.අ.

B කදුරුවෙල කුඹුරු ඉඩම් තුළ ජපන් වී ගොවිතැන් කලාව පුහුණු කිරීම



රූපය 6.12 නැරඹීමේ තට්ටුව
මූලාශ්‍රය: https://www.thewilddeckcompany.co.uk/product-portfolio/viewing-platforms/

ඉනාකාඩේට් ජපන් ගම්මානය මෙම කලාව සඳහා සුප්‍රසිද්ධය. කලාව කෘෂිකර්මාන්තයේ තේමාව බවට පත් වන විට එය සුවිශේෂී එමෙන්ම විශිෂ්ඨ ආකෘතියක් වනු ඇත. ඉනාකාඩේට් ජපන් ගම්මානයේ සෑම ගොවිපලක්ම කලා කෘතියකි. මෙම ගම්මානයේ ගොවීන් කලා නිමැවුමක් නිර්මාණය කරනු වස් විවිධ වර්ගයේ වී වගා කිරීමෙන් විස්තරාත්මක රටාවක් නිර්මාණය කරයි. මෙම ගම්මානයේ එක් එක් කුඹුරු ඉඩමක් සතුව කලාත්මක ස්පර්ශයක් පවතින අතර, සෑම පැතිකඩකින්ම එය මිත්‍යා කථාවල චරිතයන්ගේ සිට හොලිවුඩ් කීර්තිය පෙන්වන ආකෘතීන් දක්වා පරාසයක පවතී.

මෙම කලා නිමැවුම සුපරීක්ෂාකාරී ලෙස නිර්මාණය කර ඇත්තේ පරිගණකයේ සැලසුම් කිරීමෙනි.ජානමය වශයෙන් නිර්මාණය කරන ලද සහල් ගොවීන් විසින් ප්‍රවේශමෙන් රෝපණය කරනු ලැබේ. දේශිය "හරිත පත්‍ර" ප්‍රභේදය සහ තද රතු, කහ සහ සුදු (ජානමය වශයෙන් නිර්මාණය කරන ලද) ප්‍රභේද සමඟ ප්‍රවේශමෙන් එක් කිරීමෙන් කලා නිර්මාණය සිදුකරනු ලැබේ.

A 11 මාර්ගය දෙපස බොහෝ කුඹුරු ඉඩම් තිබේ. කදුරුවෙල පිහිටා ඇති රාමධා හෝටලයට අයත් එක්තරා වී ගොවිපල මෙම වී ගොවිතැන් කලාව ස්ථාපිත කිරීමට තෝරාගෙන ඇත. එයට ලැබෙන අවධානය හා ආකර්ෂණය අනෙකුත් කුඹුරු ඉඩම් වලටද ප්‍රවණතාවයක් නිර්මාණය කරනු ඇතැයි අපේක්ෂිතය.



රූපය 6.13 : ජපානයේ ඉනාකාඩේට් ගම්මානයේ වී කලාව
මූලාශ්‍රය: *https://krishijagran.com/news/japans-paddy-art-a-new-way-of-agritourism/*

C. ප්‍රායෝගික උදාහරණ සහිත වාරිමාර්ග කෞතුකාගාරය
(සංස්කෘතික හා පෞරාණික කළමනාකරණ උපායමාර්ගය තුල විස්තරාත්මකව දක්වා ඇත. (සිතියම 6.5))

D. වී ගොවිතැන් කෞතුකාගාරය හා ආකෘතික ගම්මානය (සංස්කෘතික හා පෞරාණික කළමනාකරණ උපායමාර්ගය තුල විස්තරාත්මකව දක්වා ඇත. (සිතියම 6.5)



සිතියම 6.5: වාරිමාර්ග කෞතුකාගාරය, පැරණි වී ගම්මානය සහ වී කෞතුකාගාරය
මූලාශ්‍රය : පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය - නා. සං. අ.

6.4.1.2.3. නව සංචාරක ප්‍රදේශ ආවරණය කිරීමට විකල්ප සංචාරක මාර්ගයක් හඳුන්වා දීම.

මෙම විකල්ප සංචාරක මාර්ගය මගින් මෙතෙක් පොළොන්නරුවේ පැවති ප්‍රමුඛතම සංචාරක සංධිස්ථානය වන පෞරාණික නටඹුන් සහිත ප්‍රදේශය සමඟ, පරාක්‍රම සමුද්‍රය, පොත්ගුල් විහාරය, ත්‍රිමාන කෞතුකාගාරය, වී ගොවිතැන් සම්බන්ධ කෞතුකාගාරය හා කෘෂි ගම්මානය, වාරිමාර්ග කෞතුකාගාරය සහ ජල ගැලුම් නිමින අභය භූමිය වැනි ප්‍රධාන සංචාරක ස්ථාන ආවරණය කිරීමට අපේක්ෂිතය.

නාගරික සංවර්ධන අධිකාරියේ 2015 කෙටුම්පත් සංවර්ධන සැලැස්ම් යෝජනාවක්ව තිබි "පිබිදෙමු පොළොන්නරුව" වැඩසටහන යටතේ ඉදිකළ සංචාරක තොරතුරු මධ්‍යස්ථානය හරහා මෙම නව සංචාරක ආකර්ශනීය ස්ථාන පිළිබඳ දැණුවත් කිරීම හා මඟ පෙන්වීම ලබා දීමට අපේක්ෂා කෙරේ. සංචාරක තොරතුරු මධ්‍යස්ථානය ඒ සඳහා ප්‍රතිසංවිධානය කල යුතුව ඇත.

6.4.1.2.4. කාර්මික සැලැස්ම (නිෂ්පාදන)

සහල් කර්මාන්තය ශත වර්ෂ ගණනාවකට පෙර සිට පොළොන්නරුව නගරයේ වඩාත් සුවිශේෂී හා ප්‍රධාන කර්මාන්තයකි. නාගරික ආර්ථිකය පොහොසත් කිරීම සඳහා විවිධ ආකාරවලින් වී අස්වැන්න ආරක්ෂා කිරීම හා සම්බන්ධ වීම මෙම උපායමාර්ගය සකස් කිරීමේ ප්‍රධාන ඉලක්කය වේ. පහත උපාය මාර්ග මේ සඳහා තෝරාගෙන ඇත.

A. හරිත කර්මාන්ත සඳහා (ලක්ෂ උයන) තුළ වෙනත් කලාපයක් හඳුන්වා දීම.

එම කලාපයේ පහත දැක්වෙන කර්මාන්තයන් ප්‍රවර්ධනය කෙරනු ඇත.

- සහල් නිෂ්පාදන කර්මාන්ත
- සහල් වලට අගය එකතු කළ කර්මාන්ත
- පොලිසැක් කවර නිෂ්පාදන කර්මාන්ත

A 11 මාර්ගය හරහා ලංකාවේ නැගෙනහිරට ගමන් කිරීමේදී හමුවන ප්‍රධානම නගරය වීමේ වාසිය තවම පොළොන්නරුව විසින් සංවර්ධන අවස්ථාවක් ලෙස භාවිතයට ගෙන නොමැත. නගරය පසුකරමින් නැගෙනහිර වෙරළබඩ කලාපයට විනෝද කටයුතු අරමුණු කරගෙන ගමන් ගන්නා සංචාරකයින්ව හා ඇතැම්විට දේශීය පුද්ගලයින් පවා උපායමාර්ගික සැලැස්මක් මඟින් නතර කරගත හැක.



සිතියම 6.6 : නගරයේ විකල්ප සංචාරක මාර්ග

මූලාශ්‍රය : පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය - නා.සං.අ.

ආර්ථිකමය අතින් අක්‍රිය ජනගහනය වන 54% කට රැකියා අවස්ථාවන් ලබා ගැනීමට සංචාරකයින් ආකර්ෂණය කළ හැකි දේශීය නිෂ්පාදන කර්මාන්ත ප්‍රවර්ධනය කරන කාර්මික ආයෝජනයන් සංචාරක කලාපය හා පුරාවිද්‍යාත්මක කලාපය ඇතුළත මෙම උපාය මාර්ගය හරහා ඉදිවනු ඇත. (සංචාරක කර්මාන්තය ඉලක්කගත කරනගෙන)

එසේම, යටිතල පහසුකම් කළමනාකරණ උපාය මාර්ගය ආර්ථික ප්‍රවර්ධන උපායමාර්ගය සමඟ සම්බන්ධ වෙයි. යම්තාක් දුරක සිට වාහන නැවතීමේ පහසුකම් හඳුන්වා දීමෙන් සංචාරකයින්ට පයින් ඇවිද යාමට මඟ පෙන්වනු ලබන අතර, එය වක්‍රාකාරව නගරයේ ආර්ථික අවස්ථාවන් වැඩිදියුණු කරනු ඇත. එසේම, අපවහන හා වාරිමාර්ග පද්ධතිය හා ප්‍රවාහන පද්ධතිය තුළ පවතින මනා සම්බන්ධතාවය නගරයේ ජීවත්වීමේ යෝග්‍යතාවය වැඩිදියුණු කරනු ඇත.

පොළොන්නරුව නගර සංවර්ධන සැලැස්මේ අවශ්‍යතාවය ලෙස හඳුනාගත් අංශ මේ හරහා සම්පූර්ණ වනු ඇත. වී නිෂ්පාදනය ඉහළ නැංවීම, වී ගොවිතැන් කර්මාන්තයේ අනන්‍යතාවය ආරක්ෂා කර ගැනීම, සහ දැනට පවතින කුඹුරු ඉඩම් සංරක්ෂණය කිරීමට මෙහිදී කටයුතු කරනු ලබන අතර, එමඟින් ආර්ථිකය ඉහළ නංවනු ඇත. එසේම, ගොවීන් සඳහා අවම ඝනත්වයකින් යුතු නිවාස කාෂිකාර්මික කලාපවල ප්‍රවර්ධනය කර ඇත.

6.4.2.5. කඳුරුවෙල නගරය සඳහා ආර්ථික සැලැස්ම

(වෙළඳ/වාණිජ/මූල්‍ය/සේවා)

කඳුරුවෙල යනු දිස්ත්‍රික්කයේ හා අවට ප්‍රදේශවල 600000 කට අධික ජනගහනයක් සේවා ලබා ගන්නා වාණිජ අග නගරයයි. මේ මොහොත වන විට කුඹුරු සහිත ප්‍රදේශවලින් බැහැරව සංවර්ධනය කළ හැකි සම්පූර්ණ ඉඩ අවකාශයන් දැනටමත් සංවර්ධනය වී අවසන්ව ඇත. නමුත්, අනාගතයේ ඉල්ලුම් හේතු කොටගෙන පවතින නගර මධ්‍යයේ ප්‍රතිසංවිධානයක් අවශ්‍ය කර තිබේ. පහත ව්‍යාපෘති එම අවශ්‍යතා සම්පූර්ණ කිරීමට හඳුනාගෙන ඇත. (සිතියම 6.7)

A. ගොවීන් සඳහා ඔවුන්ගේ නිෂ්පාදන ජාතික මට්ටමට ඉදිරිපත් කිරීමට වෙළඳපල පුළුල් කරමින් කඳුරුවෙල නගරයේ සහල් සිල්ලර සහ මහා පරිමාන තොග වෙළඳපල හඳුන්වා දීම.

B. කෘෂිකාර්මික නිෂ්පාදන සහ අනෙකුත් අතුරු නිෂ්පාදන සේවා පොළොන්නරුවේ වටිනාකම් එකතුවන නිෂ්පාදන අලෙවිකිරීමට වෙළඳ හා වාණිජ මධ්‍යස්ථානයක් ඉදිකිරීම.

C. ප්‍රධන බස්නැවතුම්පල මහල් දෙකකින් යුතුව ප්‍රතිසංවිධානය කිරීම. බිම් මහළ (බස් ඩිපෝ ඉඩමෙහි) විශේෂයෙන්ම බස්වල ගමන් ගන්නා මඟීන්ට පහසුකම් සැලසීම සඳහා පොදු වෙළඳපොලක් සඳහා වෙන් කෙරෙනු ඇත. උඩු මහළ වාහන නවතා තැබීමේ ප්‍රදේශයක් ලෙසින් ක්‍රියාත්මක වනු ඇත.

D. මඟී මංතීරු (පදික වේදිකා) පුළුල් කිරීම, වාණිජ කටයුතු සිදු වන ප්‍රදේශය තුළ පවතින වෙළඳසැල් ප්‍රතිසංවර්ධනය කිරීම හා නගරය ඇතුළත සාප්පුවල අනුකූලතාවය වැඩිදියුණු කිරීම.

E. කඳුරුවෙල සියළුම මූල්‍ය ආයතන සඳහා මූල්‍ය ආයතන සංකීර්ණය සංවර්ධනය.

F. ශ්‍රී ලංකා ගමනාගමන බස් ඩිපෝව හා දුර ගමන් සේවා මධ්‍යස්ථානය මෛත්‍රීපාල සිරිසේන මාවතෙහි ප්‍රවේශයට ආසන්නයේ ප්‍රති ස්ථානගත කිරීම.

6.4.2.6. නවනගරය සඳහා ආර්ථික සැලැස්ම

A. කුඩා බස්නැවතුම්පල හා සාප්පු සංකීර්ණය

නවනගරය ප්‍රදේශයේ දිස්ත්‍රික්කයේ ප්‍රධාන පරිපාලන මධ්‍යස්ථානය, කාර්යාල, දිස්ත්‍රික් උසාවිය හා නගර මධ්‍යයේ වූ එකම ජාතික පාසල ක්‍රියාත්මක වන නිසාවෙන් කුඩා බස්නැවතුම්පලක් සඳහා ඉහළ ඉල්ලුමක් පවතී.

එමෙන්ම, නීතීඥයින්ටද ඔවුන්ගේ කාර්යාල සඳහා වඩා වැඩි ඉඩ අවකාශයක් අවශ්‍යය. ඉල්ලුම සලකා බලමින් රාජකීය විද්‍යාලය ප්‍රවේශය ඉදිරිපස කුඩා බස් නැවතුම්පලක් හා එහි උඩු මහලේ කාමර නීතිය හා සම්බන්ධ කාර්යාල සඳහා යෝජනා කර ඇත. පහළ මහල සුපිරි වෙළඳපල, කොමියුනිකේෂන්, අවන්හල් හා ඒ හා සම්බන්ධ අධ්‍යාපනික සේවා සපයන වෙළඳසැල්වලින් සමන්විත වනු ඇත.

6.4.2.7.පොළොන්නරුව පොල හංදිය / පූජනීය නගරය සඳහා ආර්ථික සැලැස්ම

පොළොන්නරුව පොල හංදිය පැරණි නගරය ඇතුළත පිහිටා ඇති අතර, රෙගුලාසි මඟින් සංවර්ධනය සීමා කරන ලදි. නමුත්, සංචාරකයින් හා දෛනික සංචාරක ජනගහනයට වඩාත් හොඳම සේවාවක් සැපයීමට පහත ව්‍යාපෘතීන් හඳුනාගෙන ඇත. **(සිතියම 6.7)**

A. සුහුරු බැංකු ඒකක ඇතුළුව සංචාරක පහසුකම් මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම් ප්‍රතිසංවිධානය කිරීම.

B. සංචාරක කර්මාන්තය හා සම්බන්ධ ක්‍රියාකාරකම් සඳහා මධ්‍යම සංස්කෘතික භාරකාර අරමුදල සහිත ඉඩමේ සාප්පු සංකීර්ණයක් ඉදිකිරීම.

C. තැපැල් කන්තෝරුව හා නගර සභාව ඇති භූමිය තුළ පොදු නාගරික චතුරස්‍රයක් හා අවන්හල් සහිත විවෘත, විනෝද අවකාශයක් ස්ථාපිත කිරීම.

D. පොදු චතුරස්‍රය ඉදිරිපිට සුහුරු බස් නැවතුම්පලක් හා සාප්පු සංකීර්ණයක් ඉදිකිරීම/ වැඩි දියුණු කිරීම.



සිතියම 6.7 : යෝජිත ආර්ථික ව්‍යාපෘති

මූලාශ්‍රය : පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය - නා.සං.අ.

6.4.2. සංස්කෘතික හා උරුම කළමනාකරණ උපායමාර්ගය

6.4.2.1. පෞරාණික උරුම ඇති ප්‍රදේශ

පොළොන්නරුව නගරය රටේ දෙවන රාජධානිය වන අතර, ප්‍රධාන වශයෙන් දෙයාකාර වූ සුවිශේෂී අනන්‍යතාවයකට හිමිකම් කියයි. පළමුවැන්න නම් පොළොන්නරුව එක්සත් ජාතීන්ගේ සංවිධානය මඟින් ලෝක උරුමයක් ලෙසින් ප්‍රකාශිත ස්ථාන වලින් එකකි. අනෙක වි වගාව හා බැඳුනු සංස්කෘතික වටිනාකම්ය.

පොළොන්නරුවේ සංස්කෘතික හා පෞරාණික උරුමයන්ගේ වර්ගීකරණය පහත සඳහන් පරිදි වූ දෘශ්‍ය හා අදෘශ්‍ය ඛාණ්ඩ යටතේ හඳුනා ගත හැකිය.

a) දෘශ්‍ය
   - I. පැරණි නටබුන් (පුරා විද්‍යාත්මක කලාපය)
   - II. වාරිමාර්ග පද්ධතිය
   - III. වී ගොවිතැන හා ඒ හා සම්බන්ධ තාක්ෂණය

b) අදෘශ්‍ය
   - I. වී ගොවිතැන හා සම්බන්ධ සංස්කෘතිය, සම්මතයන් විශ්වාසයන්
   - II. දළදා පෙරහැර (පූජා භූමියේ පොසොන් පෙරහැර)
   - III. වෙසක් පෙරහැර (කඳුරුවෙල)

උරුම කළමනාකරණයේදී පෞරාණික ස්ථාන, වාරිමාර්ග හා නගරයේ කුඹුරු ඉඩම් සහිත ප්‍රදේශ වැනි සංවේදී ප්‍රදේශ ආරක්ෂා කර ගැනීමට ඒවා සංරක්ෂණය අවශ්‍ය වන අතර, නිෂ්පාදන හා සංචාරක අංශය වැඩිදියුණු කිරීමෙන් නගරයේ ආර්ථිකය වැඩිදුයුණු කර ගැනීමට මෙම උරුමයන් මැදිහත්ව යොදා ගත යුතුය.

නගරයේ වර්තමාන සැකැස්ම ඓතිහාසික ක්‍රියාවන්හි ප්‍රතිඵලයක් වන අතර, නගර සංවර්ධන සැලැස්ම සැකසීමේදී විවක්ෂණ අවබෝධයක් පැවතීම අත්‍යාවශ්‍යය. පුරා විද්‍යාත්මක ප්‍රදේශ සඳහා වෙන්කළ කලාපයකින් යුතුව **2030** යෝජිත පොළොන්නරුව කලාප සැලැස්ම සංවර්ධනය කර ඇත්තේ එබැවිනි. නගරයේ අනන්‍යතාවය ආරක්ෂා කිරීමට සංරක්ෂණය කිරීමට අවශ්‍ය වන කුඹුරු ඉඩම් හා ජල පද්ධතිය සංවේදී ප්‍රදේශ ලෙසින් එහි හඳුනාගෙන ඇත.

6.4.2.2. සංස්කෘතිය හා උරුම කළමනාකරණ උපායමාර්ගයට අදාළ ඉලක්ක

2030 දැක්ම හා බැඳුණු ඉලක්ක එක හා දෙක සංස්කෘතික හා පෞරාණික උරුම කළමනාකරණය සෘජුවම ඉලක්ක කරගෙන ඇත. රටේ හොඳම පෞරාණික සංචාරක ගමනාන්තය බවට පත් වීමට නගරයේ උරුමයන් සමඟින් එහි අනන්‍යතාවය වැඩි දියුණු කිරීම අත්‍යාවශ්‍යය. පෞරාණික උරුම කළමනාකරණ උපාය මාර්ගය යටතේ **2030** දැක්ම මුදුන්පත් කර ගැනීමට නම් ආරක්ෂා කිරීමට හා ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂිත ප්‍රධාන ලක්ෂණයක් වනුයේ නීල හරිත පද්ධතිය හා බැඳුණු උරුමයන්ය. (කුඹුරු හා වාරිමාර්ග පද්ධතිය) ඉලක්ක එකෙහි අභිමතාර්ථයන් මේ සඳහා සෘජුවම සම්බන්ධ වී ඇත. ඉලක්ක දෙක වනාහි සීමා ලකුණු කිරීමෙන් පෞරාණික උරුම හා පාරිසරික සංවේදී ප්‍රදේශ ආරක්ෂා කිරීම සඳහාය.

සංවර්ධන සැලැස්මේ දැක්ම තුළින් පෞරාණික නගරය හා සහල් කර්මාන්තය ඉස්මතු කර දක්වන්නේ එය පොළොන්නරුවේ අනන්‍යතාවය නිසාවෙනි. ඒ අනුව, ක්‍රමයෙන් පහත උපායමාර්ග අනුගමනය කිරීමෙන් පොළොන්නරුවේ අනන්‍යතාවය ආරක්ෂා කර ගැනිමින් ආර්ථිකය වර්ධනය කිරීමට මෙම ඉලක්ක මඟ පෙන්වනු ඇත.

6.4.2.3. යෝජිත සංස්කෘතික හා උරුම කළමනාකරණ උපාය මාර්ගික සැලැස්ම

6.4.2.3.1. උරුම නගරය සඳහා වෙනම කලාපයක් නම් කිරීම

වර්තමානයේ පූජා නගරය පවත්නා ඉඩම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ "ආලාහන පිරිවෙන" වැඩසටහනට අයත් වේ. මෙම කලාපය තුල පවත්නා පුරාවිද්‍යා නටඹුන් **27** න් නටඹුන් **18** ක්ම පුරාවිද්‍යාත්මක වටිනාකම ආරක්ෂා කරමින් සංවර්ධනය කිරීම සඳහා හඳුනාගෙන ඇත. රෙගුලාසි මඟින් යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට හැර වෙනත් කිසිදු සංවර්ධන කටයුත්තක් සඳහා අවසර දෙනු නොලැබේ.

6.4.2.3.2. මායිම් භෞතිකව දැක්වීම මඟින් උරුම ස්ථාන ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම.

අ) අනවසර අත් කර ගැනීම හේතුවෙන් උරුම ස්ථාන තර්ජනයන්ට ලක්ව ඇත. මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මඟ පෙන්වීම මත මායිම භෞතිකව වෙන් කළ යුතුය.

ආ) මධ්‍යම ප්‍රමාණයෙන් වැව් තුනක් හා කුඩා පරිමාණයේ වැව් **45** ක් මෙම සැලසුම් ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වේ. "ජෛව වැට" **(Bio Fence)** සංකල්පයට අනුව මායිම් සලකුණු කිරීම කළ හැක.

ඇ) ප්‍රධාන මාර්ගය අවට පවතින කුඹුරු ඉඩම් සංරක්ෂණය කළ යුතුය. කලාපීකරණ සැලැස්මේ අඩු නේවාසික කලාපය සඳහා තෝරා ගත් මුළු ප්‍රදේශය තුළ කුඹුරු ඉඩම් වෙනත් භාවිතයක් සඳහා පරිවර්තනය වීම අවම කිරීම සඳහා අවශ්‍ය රෙගුලාසි සකස් කර ඇත.

(ඉ) විජිතපුර බලකොටුව / කඳුරුවෙල බලකොටුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් උරුමයක් ලෙස නම් කරන තුරු සංරක්ෂණය කිරීම සඳහා කලාපීකරණ සැලැස්මේ ලකුණු කොට ඒ සඳහා විශේෂ රෙගුලාසි සකස් කිරීම. එය වාණිජ නගරයට ආසන්නයෙන් වීර පෙදෙස ග්‍රාම නිලධාරී වසමේ පිහිටා ඇත. (රූපසටහන 6.13)



රූපය 6.14 : මධ්‍යම සංස්කෘතික අරමුදල් පර්යේෂණ වාර්තාව 2010 මඟින් ගූගල් සැටලයිට් රූපය භාවිතා කරමින් කඳුරුවෙල බලකොටුව කෙටුම්පත් කරන ලදි.

මූලාශ්‍රය : https://www.archaeology.lk/sinhala/%E0%B6%B4%E0%B7%9C%E

6.4.2.3.3. නගර පිවිසුම් සහ මංසන්ධි සංවර්ධන

අ) සංස්කෘතික හා සංස්කෘතික උරුමයන් පිළිබිඹු වන පරිදි අතීත ආකෘති සමඟ නගරයේ ප්‍රධාන පිවිසුම් ස්ථාන සංවර්ධනය කිරීම.

පොළොන්නරුව නගරය සඳහා ප්‍රධාන පිවිසුම් ස්ථාන 04 ක් හඳුනාගෙන ඇත.

- කොළඹ දෙසින්
- සෝමාවතිය දෙසින්
- නවනගරයෙන්
- කදුරුවෙල දෙසින්

නගරයේ උරුමයේ සුවිශේෂීතාවය පිළිබිඹු වන අයුරින් පිවිසුම් දොරටු ඉදිකිරීමට යෝජනා කෙරේ. පොළොන්නරුව උරුම නගරයේ දැක්ම සැලකිල්ලට ගනිමින් මෙම පිවිසුම් දොරටු සඳහා ආකෘති ලෙස යොදා ගත හැකි ඓතිහාසික නටඹුන් කිහිපයක් මෙම 2030 දක්වා වූ සංවර්ධන සැලැස්ම තුළින් හඳුනාගෙන ඇත.



රූපය 6.15 : පොළොන්නරුවේ මංසලකුණු ලෙස සංවර්ධනය කළ යුතු ප්‍රවේශ ස්ථාන සහ ප්‍රධාන මංසන්ධි

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය -2018 අගෝස්තු - නාගරික සංවර්ධන අධිකාරිය

ආ. සංස්කෘතික හා සංස්කෘතික උරුමයන්ගේ අනන්‍යතාවය පිළිබිඹු වන අයුරින් ප්‍රධාන මංසන්ධි සහ මාර්ග ජාලය සංවර්ධනය කිරීම.

මහා පරාක්‍රමබාහු රජ සමය පොළොන්නරුවේ ස්වර්ණමය යුගය ලෙස සැලකේ. වසර 2030 දක්වා වූ දැක්ම සමඟ එම මහිමාන්විත නගරය අපි නැවත ප්‍රති සංවර්ධනය කරන්නෙමු. ඒ අනුව, මෙම ප්‍රධාන මංසන්ධි පැරණි අංග විස්තර කෙරෙන මංසලකුණු ලෙස ක්‍රියා කරනු ඇත. නිදසුනක් ලෙස මෙම ප්‍රධාන මංසන්ධි පහත මංසලකුණු සමඟ

සංවර්ධනය කිරීමට හැකි වනු ඇත. (රූපය 6.16) සමස්ත ව්‍යූහය ගත් කල එය ඓතිහාසික වටිනාකම් සහ මුල් අයිතමයන් විස්තර කෙරෙන හා දැක ගත හැකි ස්ථානයන් වේ. මෙම ව්‍යූහයන්හි ප්‍රමාණය සංචාරකයින්ට ඡායා රූප ගැනීමේදී පසුබිමක් ලෙස භාවිතා කළ හැකි පරිදි විශාල ස්මාරක විය යුතුය.

- මෛත්‍රීපාල සිරිසේන මාවතේ ආරම්භක ස්ථානය, කදුරුවෙල පිවිසුම; පරාක්‍රමබාහු රජුගේ කාලයෙහි වූ රන් කාසිය සමඟ සංවර්ධනය කිරීම.
- රෝහල හංදිය සුංගාවිල මාර්ගයේ පිවිසුම; ආලහන පිරිවෙන කැණීම් වලින් සොයා ගත් උපකරණ මඟින් දැක්වීම.
- පොළොන්නරුව පොළ හංදිය වට රවුම මංසන්ධිය මීටර් 80 කට හෝ ඊට වැඩි උස සහිත කුළුණක් ලෙස සංවර්ධනය කිරීම.
- නවනගර පිවිසුම පොත් ලිවීම සඳහා යොදා ගත් පැරණි අකුරු සහිත ආකෘතියක් ලෙසින් නිර්මාණය කිරීම.



රූපය 6.16 :පොළොන්නරුවේ මංසලකුණු ලෙස සංවර්ධනය කළ යුතු ප්‍රවේශ ස්ථාන සහ ප්‍රධාන මංසන්ධි

මූලාශ්‍රය:https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_images/notes_coins/Early%20Massa%20-%20Polonnaruwa.png

6.4.2.3.4උරුම නගරයේ ගති ලක්ෂණ පවත්වා ගනිමින් ඒ වටා වන ඉදිකිරීම් නියාමනය කිරීම.

පුරාවිද්‍යා සංරක්ෂණ කලාපය තුළ සංවර්ධන කටයුතු නියාමනය කිරීමෙන් සංවර්ධනයන් සීමා කිරීම.

6.4.2.3.5 උරුම නගරයේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම

පුරා විද්‍යා දෙපාර්තමේන්තුව විසින් උරුම නගරයේ යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා ව්‍යාපෘති කිහිපයක් හඳුනාගෙන ඇත. මෙම ව්‍යාපෘති ලැයිස්තුවට තෝරා ගත් උරුම ස්ථාන සංරක්ෂණය කිරීමද ඇතුළත් වේ. මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් හඳුනා ගන්නා ලද ව්‍යාපෘති මඟින් සංචාරක කර්මාන්තය සඳහා පහසුකම් සලසමින් පොළොන්නරුව උරුමය පවත්වා ගත යුතුය. (ඇමුණුම 18 සහ පින්තූර 6.17 සහ 6.18)

පොළොන්නරුව නගරයේ පවත්නා උණුසුම් කාලගුණික තත්ත්වය හේතුවෙන් හා ප්‍රදේශයට පතිත වන සෘජු හිරු එළියත් හේතුවෙන් මෙම ඓතිහාසික ස්ථාන නිසි ආලෝකකරණ ක්‍රමවේදයක් සහිතව සවස් කාලයේ පවතින සුවපහසු පරිසරය සමඟ දේශීය හා විදේශීය සංචාරකයින් සඳහා ප.ව.10.00 වන තෙක් විවෘතව තැබීම වඩාත් යෝග්‍ය වේ. ඒ අනුව, නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම සැලැස්ම තුළින් පුරාවිද්‍යාත්මක ස්ථාන සඳහා යටිතල පහසුකම් සැපයීමට අවශ්‍ය මාර්ගෝපදේශ සපයනු ලබන අතර, එම ස්ථානයන් රාත්‍රී කාලය තුළ භාවිතයට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය විය යුතුය.



රූපය 6.17 : පාපැදි හිතකාමී යටිතල පහසුකම් අවශ්‍ය වේ.

මූලාශ්‍රය:https://www.atlasandboots.com/wp-content/uploads/2017/04/cycling-in-anuradhapura-sri-lanka-8.jpg



රූපය 6.18 :පරාක්‍රම සමුද්‍ර බැම්මේ සූර්ය ආලෝකකරණ පහසුකම්

මූලාශ්‍රය: http://www.leadsunglobal.com/wp-content/uploads/2018/09/ParakramaSamuddraya.jpg

6.4.2.3.6 සපුෂ්ප ගස්වලින් උරුම නගරයේ භූමි අලංකරණය කිරීම.

පූජා නගරය වර්ග කිලෝමීටර් 4.2 ක් පමණ ප්‍රදේශයක පැතිර පවතී. පූජා නගරයෙහි අලංකරණය සඳහා ඉදිකිරීම් සිදු කිරිමද අනුචිත බැවින්, වාර්ෂිකව සහ දෛනිකව මල් පිපෙන ශාක සිටුවීම එහි භූමි අලංකරණය සම්බන්ධව වඩාත් උචිත උපක්‍රමයයි.

විදේශීය සංචාරක පැමිණිම ඉහළ යන්නේ ජූනි සිට අගෝස්තු කාලය තුළය. එම කාලයට මල් පිපෙන්නාවූ ඇසල, මැයි මාර ශාක සඳහා මෙහිදී ප්‍රමුකත්වය ලබා දිය හැකිය. වසර 5 ක් පමණ වන විට පූජා නගරය කහ, රතු, තැඹිලි සහ විවිධ පැහැ මල්වලින් පිරී යමින් සංචාරකයින් සඳහා අමරණීය මතකයක් දායාද කරනු ඇතැයි අපේක්ෂිතය. මෙම භූමි අලංකරණ වැඩසටහන සඳහා පහත ප්‍රදේශ හඳුනාගෙන ඇත.

(අ) පූජා නගරය ඇතුළත පාරවල් දෙපස
(ආ) පරාක්‍රම සමුද්‍රය දෙපස
(ඇ) පූජා නගරය වටා භෞතික මායිම දිගේ

6.4.2.3.7. පූජා නගරය අසල හෙළ බොජුන් හල

පූජා නගරය අසල හෙළ බොජුන් හල මඟින් පූජා නගරය තුළට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින්ට සේවා සපයනු ඇත. සාම්ප්‍රදායික උපකරණ මඟින් පිසින ලද සාම්ප්‍රදායික ශ්‍රී ලාංකික කෑම වර්ග මඟින් පූජා නගරයේ සංස්කෘතික පරිසරය පිළිබඳ වූ හැඟීම වැඩිදියුණු වේ. පූජා නගරය ආසන්නයේ ආහාර ගැනීමට ඇති ස්ථාන අවම නිසා මෙය උචිත විසඳුමක්ද වනු ඇත.

6.4.2.3.8. වී කෞතුකාගාරය හා ආදර්ශ ගම්මානය

වී ආශ්‍රිත සංස්කෘතිය වසර 5000 ක් පුරාවට ගොඩ නැඟී ඇත. එය නව පරම්පරාවට ඇති උරුමයකි.වී ගොවිතැන් තාක්ෂණය පමණක් නොව ජනයා හා බැඳුණු සාම්ප්‍රදායන් හා සංස්කෘතිකමය බැඳීම්ද පවතී. ගමක සාමාන්‍ය අංග පමණක් නොව ආහාරපිළියෙල කිරීම, පිසින උපකරණ, නිවාස ඉදිකිරීම්, වී ගබඩා කිරීමේ ක්‍රම, වී සකස් කිරීමේ ක්‍රම හා තවත් ඒවා මේ අතර වේ. මෙහිදි එක් පුරාණ ගමක් පැරණි ලක්ෂණ සහිතව ගොඩනඟනු ලබන අතර, එය රජයේ බීජ ගොවිපලට ආසන්නයෙන් ගොවිතැන ආශ්‍රයෙන් සංස්කෘතික ආදර්ශ ගම්මානයක් ලෙස ගොඩනැඟීමට අපේක්ෂිතය. සංචාරකයින්ට ගමේ

නැවතී සිටීමට හැකියාව ඇති අතර, සංස්කෘතික අත්දැකීම්ද මෙහිදී අත්විඳිය හැක. (රූපසටහන 6.19 උල්පොතගම, දඹුල්ල) මෙහි කළමනාකාරිත්වය ගම්වැසියන්ගේ කණ්ඩායමක් විසින් මෙහෙයවනු ලැබීම අපේක්ෂිත අතර, පැරණි තාක්ෂණික ක්‍රම වී ප්‍රභේධ ඇතුළුව සෑම අංගයක්ම මෙම කෞතුකාගාරය මඟින් ප්‍රදර්ශනය කිරීමට සැලසුම් කර ඇත.



රූපය 6.19 : උල්පොත ගම්මානය (දඹුල්ල)
මූලාශ්‍රය: https://www.ulpotha.com/ වෙබ් පිටුව

6.4.2.3.9.වාරිමාර්ග කෞතුකාගාරය

ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ඇළ මාර්ග පද්ධතිය හා වාරිමාර්ග තාක්ෂණය සියවස් ගණනාවක් පුරා මුළු මහත් ලෝකය තුල ප්‍රසිද්ධියට පත්ව ඇත. නමුත්, ශ්‍රී ලංකාව තුළ එක් ස්ථානයකදී මේ සම්බන්ධයෙන් අවශ්‍ය දැණුම හා තොරතුරු ලබා ගැනීම සඳහා සුදුසු ආයතනයක් නොමැත. වී වගාව සඳහා උපරිම ආකාරයෙන් භාවිත කළ හැකි පැරණි තාක්ෂණය ප්‍රදර්ශනය කිරීම සඳහා පොළොන්නරුවට ඓතිහාසිකවම හිමි වූ අධිකාරියක් ඇත.

මේ අනුව, කදුරුවෙල අලුත්වැව ප්‍රදේශයේ වාරිමාර්ග කෞතුකාගාරයක් ඉදි කිරීමට යෝජිත අතර, අලුත්වැව වැවෙහි ඇළ මාර්ග පද්ධතිය ප්‍රායෝගික ආදර්ශ ඇළ පද්ධතියක් ලෙසින් සංවර්ධනය කිරීමට අපේක්ෂිතය. ප්‍රායෝගිකව දැකිය හැකි එල්ලංගාව වැව් පද්ධතියක් සහිතව මෙම වාරිමාර්ග කෞතුකාගාරය ඉදිකිරීමට

අපේක්ෂිත අතර, වී වගාව හා බැදුණු පුරාණ ගම්මානයද මේ අසලින්ම ස්ථාපිතකර ඇත්තේ ඒවායේ ඇති අන්‍යෝන්‍ය බැඳීම නිසාය. (සිතියම 6.5)

6.4.2.3.10. ත්‍රිමාණ කෞතුකාගාරය සහිත ඓතිහාසික පුස්තකාලය (රජවරුන්ගේ පිළිම, වර්තමාන නායකයින්, ත්‍රිමාණ තාක්ෂණය)

නවනගරයේ පොත්ගුල් විහාරයට ආසන්නව "පිබිදෙමු පොළොන්නරුව" වැඩසටහන යටතේ ත්‍රිමාණ කෞතුකාගාරයක් සහ පුස්තකාලයක් ඉදිකර ඇත. පැරණි රජවරුන්ගේ පිළිම සහ ඓතිහාසික ඉදිකිරීම් එහි ප්‍රති නිර්මාණය කෙරෙනු ඇත. නවීන තාක්ෂණයෙන් හා උපකරණ භාවිතා කරමින් ඉදිකරන ලද මෙම කෞතුකාගාරය දේශීය විදේශිය සංචාරකයින්ට අති විශිෂ්ඨ අත්දැකීමක් ලබා දෙනු ඇති අතර, පුස්තකාලය මඟින් විදේශිකයින්ට ඓතිහාසික තොරතුරු සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමට හැකියාව ලැබෙනු ඇත.

අවසාන වශයෙන් සංස්කෘතික හා උරුමයන් පිළිබඳ වූ උපායමාර්ග නගරයේ සංස්කෘතික බැදියාව වැඩි දියුණු කිරීමටත්, එමඟින් සංචාරක නගරයක් ලෙස මෙහි අනන්‍යතාවය ප්‍රවර්ධනය කිරීමටත් අපේක්ෂිතය. (වැඩි විස්තර සඳහා කෘෂි සංචාරක සැලැස්ම බලන්න)



රූපය 6.20 : පොළොන්නරුව පූජනීය නගරයේ නටඹුන්

මූලාශ්‍රය: දිස්ත්‍රික් කාර්යාලය, පොළොන්නරුව - නා.සං.අ.



සිතියම 6.8 :සංස්කෘතික හා උරුම සැලැස්ම

මූලාශ්‍රය: දිස්ත්‍රික් කාර්යාලය, පොළොන්නරුව - නා.සං.අ.

6.4.3. සාමාජීය හා භෞතික අපරව්‍යුහ පහසුකම් සංවර්ධන උපාය මාර්ග

"සහල් රාජධානියේ මහිමාන්විත උරුමයේ හරිත නගරය" පිළිබඳ වූ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා සමාජ හා භෞතික අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය යටතේ ගත යුතු ක්‍රියා මාර්ග මෙමගින් විශ්ලේෂණය කෙරේ. ඒ අනුව, යෝජිත සේවා සැලැස්ම, යෝජිත ප්‍රවාහන සැලැස්ම, යෝජිත ජල සම්පාදන සැලැස්ම, යෝජිත විදුලිය සහ දත්ත රැහැන් සැලැස්ම, යෝජිත ජලාපවහන සහ මලාපවහන සැලැස්ම, අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම, මෙම සාමාජීය හා භෞතික අපරව්‍යුහ උපාය මාර්ග යටතේ හඳුනා ගන්නා ලදි.

6.4.3.1 සේවා සැලැස්ම

සැලසුම් ප්‍රදේශයේ ජීවත් වන ජනතාවට අවශ්‍ය සෞඛ්‍ය, අධ්‍යාපනය හා නේවාසික පහසුකම් සැපයීම සඳහා මෙම සැලැස්ම සකස් කර ඇත. සැලසුම් කලාපයේ මුළු භූමි ප්‍රමාණය වර්ග කිලෝ මීටර් **103** කි. වර්තමාන නේවාසික ජනගහනය **65329** කි. **(මූලාශ්‍රය සම්පත් පැතිකඩ 2016)** සහ වසර **2030** වන විට වාර්ෂික වර්ධන වේගය අනුව එය **76905** වන බවට පුරෝකථනය කර ඇත. මෙම ස්වාභාවික ජනගහන වර්ධන වේගයට අමතරව ජාතික මට්ටමින් ක්‍රියාත්මක වන වකුගඩු රෝහල, සංචාරක අංශයේ සංවර්ධනය සහ අනෙකුත් අපරව්‍යුහ පහසුකම් හේතුවෙන් ආකර්ශනය වන ජනගහනයන් සමඟ සමස්ථ නේවාසික ජනගහනය වසර **2030** දී **100000** ක් පමණ වෙතැයි අපේක්ෂා කෙරේ.

6.4.3.1.1 සෞඛ්‍ය අංශයේ සේවා සැලැස්ම

පොළොන්නරුව මහරෝහලේ භූමි ප්‍රමාණය අක්කර **22** ක් පමණ වන අතර, භූමි ප්‍රමාණයෙන් **85%**ක් පමණ ප්‍රදේශයක් තුළ එහි ගොඩනැඟිලි ව්‍යාප්තව ඇත. රෝහල් භූමිය තුළ නිසි වාහන නැවතුම් සඳහා ඉඩකඩ නොමැති වීම හේතුවෙන් පොළොන්නරුව රෝහල හංදිය ආශ්‍රිත ප්‍රදේශය තුළ අධික වාහන තදබදයක් නිර්මාණය කෙරේ. වඩාත් සංවිධානාත්මකව සෞඛ්‍ය ක්ෂේත්‍රය ආශ්‍රිත පහසුකම් සැපයීම සඳහා පහත උපාය මාර්ග යෝජනා කෙරේ. **(පවත්නා සෞඛ්‍ය ආශ්‍රිත පහසුකම් සිතියම 6.9)**

- සෞඛ්‍ය කලාපයක් ලෙස නව කලාපයක් යෝජනා කිරීම හා එම කලාපය තුළ සෞඛ්‍ය ආශ්‍රිත පහසුකම් දිරිමත් කිරීම සඳහා රෙගුලාසි සම්පාදනය කිරීම.
- දිස්ත්‍රික් මහරෝහලේ පවතින සීමිත ඉඩකඩින් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා කලාපීකරණ සංගුණකය අධි උස ගොඩනැඟිලි ඉදිකිරීම සඳහා සහාය වන ලෙස යෙදීම.

- රෝහල හංදියේ පවතින මාර්ග තදබදය **50%**කින් අඩු කිරීමට රෝහලේ ප්‍රධාන වාහන පිවිසුම සුංගාවිල මාර්ගයට විතැන් කිරීම.
- රෝහල වෙත පැමිණෙන ජනතාව සඳහා පුද්ගලික අංශයේ දායකත්වයෙන් වාහන නැවතුම් පහසුකම් ඇති කිරීම.
- පොල හංදිය වෙත යෑමට විකල්ප මාර්ගයක් ලෙසින් රෝහල හංදියේ පවතින වාහන තදබදය අවම කිරීම සඳහා බණ්ඩාරනායක මාවත සහ නිශ්ශංකමල්ල මාර්ගය මංතීරු **2** ක් ලෙසින් සංවර්ධනය කිරීම.



සිතියම 6.9 : පොළොන්නරුවේ සෞඛ්‍ය ආයතන

මූලාශ්‍රය: දිස්ත්‍රික් කාර්යාලය, පොළොන්නරුව - නා.සං.අ.

6.4.3.1.2 අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා උපායමාර්ගික සැලැස්ම

සැලසුම් ප්‍රදේශයේ ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනික පහසුකම් සංඛ්‍යාව සැලකිල්ලට ගත් කල වර්තමානයේ මෙන්ම අනාගතයේදීද සේවාලාභීන් සඳහා පහසුකම් සැලසීම සඳහා ප්‍රමාණවත් ය. නමුත්, රාජකීය විද්‍යාලය යනු විශාල ප්‍රදේශයක සිටින සිසුන් සඳහා පහසුකම් සහිත එකම ජාතික මට්ටමේ පාසල වේ. එබැවින්, බොහෝ පාසල්වල තත්වය සැලකිල්ලට ගනිමින් නාගරික ප්‍රදේශයෙන් ඔබ්බට ඇති පාසල්වල පුරප්පාඩු සංඛ්‍යාව සඳහා ගුරුවරුන් බඳවා ගැනීම සිදු කළ යුතුය.

අනාගත අධ්‍යාපන අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් ඉඩකඩ සැපයීමේ අරමුණින් කලාපීයකරණ සැලැස්මේ ගල්ලැල්ල ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය පිහිටි ප්‍රදේශයේ අධ්‍යාපනික ආයතන සඳහා විශේෂ කලාපයක් හඳුන්වා දී ඇත. එහි පහත ව්‍යාෘතීන් දෙක දැනට යෝජනා කර ඇති අතර, අනාගතයේ පැමිණෙන පෞද්ගලික අධ්‍යාපන ආයතන සඳහාද එහි ප්‍රමාණවත් ඉඩ පහසුකම් පවතී.

පොළොන්නරුවේ ජනවාර්ගික සංයුතිය සැලකිල්ලට ගෙන තෙභාෂා පාසල හඳුනාගෙන ඇත. පොළොන්නරුව තුළ පවතින මුස්ලිම් හා දමිල පාසල්හි ප්‍රමාණවත් පහසුකම් සපයා නොමැත. එම නිසා, මෙම තෙභාෂා පාසල මඟින් සෑම ජන වර්ගයකටම අධ්‍යාපනය ලැබීම සඳහා අවශ්‍ය පහසුකම් සපයනු ඇත. වක්‍රාකාරයෙන් එය විවිධ ජන කොටස් අතර සුහදතාවය වර්ධනය කිරීමටද හේතු වේ යැයි අපේක්ෂිතය.

පොළොන්නරුව හෝටල් කර්මාන්තයේ අනාගත අවශයතාවයන් සැලකිල්ලට ගනිමින් එය ජාත්‍යන්තර මට්ටමට වැඩිදියුණු කළ යුතු වේ. රැකියා විරහිත තරුණ පරපුර මෙම හෝටල් කර්මාන්තයට එක් කර ගැනීමේ අරමුණින් "හෝටල් කළමනාකරණ පාසල"ක් ගල්ලැල්ලේ යෝජනා කර ඇත.

සිතියම 6.10 මඟින් සැලසුම් ප්‍රදේශයේ පාසල්වල පහසුකම් සලසා ඇති ආකාරය පෙන්නුම් කරනු ලබයි. රතු පැහැයෙන් පෙන්වා ඇති ස්ථානයන්හි පාසල් සඳහා ප්‍රමාණවත් පහසුකම් සපයා ඇති අතර, කහ පැහැයෙන් දක්වන ස්ථානයන්හි ඇති පාසල් සඳහා පහසුකම් සැලසීමේ අවශ්‍යතාවයක් පවතී.

6.4.3.1.3 වැලි කැනීම් ක්ෂේත්‍රය සඳහා සේවා ව්‍යාපෘතිය

මනම්පිටිය හා ඒ අවට ප්‍රදේශයේ සිදු කරනු ලබන මහා පරිමාණයේ වැලි කැණීම් කර්මාන්තයේ ක්‍රියාකාරිත්වය සැලකිල්ලට ගනිමින් එහි නියැලෙන කම්කරුවන් සඳහා විවේක පහසුකම් සඳහා ස්ථානයක් හඳුනාගෙන ඇත. රියදුරන් හා කම්කරුවන් සඳහා විවේකීව සිටීමට හෝ ආහාර ලබා ගැනීමට සුදුසු ස්ථානයක් නොමැති අතර, 2030 දක්වා

සකස් කරනු ලබන මෙම සැලැස්ම තුළින් ගල්ලැල්ල ප්‍රදේශයේ කම්කරුවන් සඳහා ප්‍රමාණවත් පහසුකම් සලසා දීමට ඉඩමක් හඳුනාගෙන ඇත.



සිතියම 6.10 : යෝජිත සේවා සැලැස්ම

මූලාශ්‍රය: දිස්ත්‍රික් කාර්යාලය, පොළොන්නරුව - නා.සං.අ.

6.4.3.1.4 නිවාස අංශයේ සේවා සැලැස්ම

පොළොන්නරුව නාගරික ප්‍රදේශය තුළ මුළු නිවාස ඒකක ගණන **16684** ක් වන අතර, ඉන් **92%**ක් ස්ථිර නිවාසද, **8%** ක් අර්ධ ස්ථිර හා තාවකාලික නිවාස ද වේ. මුළු නිවාස ප්‍රමාණයෙන් **12%** ක් බහු තට්ටු නිවාස වන අතර, මුළු ජනගහනයෙන් **93%** කටම තම නිවස සඳහා සින්නක්කර අයිතිය ඇත. මෙම සැලැස්මේ පුරෝකථනය කළ ජනගහනයට අනුව වසර **2030** වන විට නිවාස අවශ්‍යතාව නිවාස ඒකක **17090** කි.

මෙම සැලසුම් බල ප්‍රදේශය තුළ පවතින කුඹුරු ඉඩම් හේතුවෙන් සංවර්ධනය සඳහා යෙදවිය හැකි ඉඩම් සීමා සහිත වේ. අනාගතයේදී පවතින ඉල්ලුමට සරිලන පරිදි නිවාස සැපයීම සඳහාත්, දැනට පවතින නිවාස හිඟය පියවීම සඳහාත්, නිවාස සම්බන්ධයෙන් දැනට පවතින ගැටළු විසඳීම සඳහාත් පහත පරිදි සංවර්ධන උපාය මාර්ග හඳුනාගෙන ඇත. අනාගත සංවර්ධන තීව්‍රතාව සැලකිල්ලට ගනිමින් වෙන් වූ කලාප දෙකක් නේවාසික කටයුතු සඳහා හඳුනා ගැනීම හා කලාපීය සංගුණකයක් හඳුන්වා දීමද සිදුකර ඇත.

- කලාප **1** හි ජන ඝනත්වය වැඩි කිරීම සඳහා අපරවාහ පහසුකම් සංවර්ධනය කිරීම.
- ඉඩමෙහි හිමිකාරිත්වය නිරවුල් කිරීම.
- සේවාගම මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම.
- පොල හංදියේ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම.



සිතියම 6.11: ජනාවාස සැලැස්ම
මූලාශ්‍රය: දිස්ත්‍රික් කාර්යාලය, පොළොන්නරුව - නා.සං.අ.

6.4.3.2. උපාය මාගරීක ප්‍රවාහන සැලැස්ම

පොලොන්නරුව සැලසුම් ප්‍රදේශයේ ප්‍රවාහන පද්ධතියේ වර්ථමාන තත්වයට අනුව දිනකට නගරය නැරඹීමට පැමිණෙන සංචාරක ජනගහනය **100,000**ක් පමණ සිටින අතර දිනකට නගරය හරහා වාහන **15000**ක් පමණ ගමන් කරයි.පොලොන්නරුව සැලසුම් ප්‍රදේශයේ ගමනාගමන රටාව සලකා බලන විට ප්‍රධාන මාර්ගය දිගට දැඩි වාහන තදබදයක් පවති. වැඩි වශයෙන්ම පෙ.ව. **8.00**- පෙ.ව. **9.00**, ප.ව.**12.00**-ප.ව.**2.00** සහ ප.ව. **4.00**- ප.ව.**6.00** වැනි කාර්ය බහුල පැය වලදී ප්‍රධාන මාර්ගය වැඩි වශයෙන් තදබදයට ලක් වේ. අනෙක් අතට අවිධිමත් බස් නැවතුම්පළ දෛනික සංචාරක ජනගහනයට වඩාත් ගැලපෙන පරිදි විධිමත් කිරීම අත්‍යාවශ්‍යය. (ඇමුණුම් මඟින් කාර්ය බහුල පැය වලදී පවතින වාහන තදබදය පෙන්වා දෙයි.)

යෝජිත උපාය මාගරීක ප්‍රවාහන සැලැස්ම

ප්‍රධාන මංසන්ධි තුනෙහි සම්බන්ධතාවය වැඩි දියුණු කිරිමටත්, නිවර්ථන දේශගුණයක් පහිත ප්‍රදේශයක් තුළ සුවපහසු දිවිපෙවෙතක් ළභාකර ගැනීමටත් සංචාරක ඉලක්ක, යටිතල පහසුකම් සංවර්ධනය මුදුන්පත් කර ගැනීමටත්, පවතින යටිතල පහසුකම් පද්ධතියේ උපරිම ප්‍රයෝජන ගැනීමටත් පහත උපායමාර්ග හඳුන්වා දී ඇත. (සිතියම **6:12**)

6.4.3.2.1 පරිපාලන නගරය හා වානිජ නගරය අතර සෘජු බස් ගමන්වාර හඳුන්වා දීම (සිතියම 6.12)

ප්‍ර දේශයේ මාර්ග පද්ධතිය “පිබිදෙමු පොලොන්නරුව” වැඩසටහන මඟින් සංවර්ධනය කර ඇත. නමුත් තවමත් කඳුරුවෙල හා නව නගර බස් ගමන් වාරය මිනිත්තු **45** කට වඩා වැඩි කාලයක් ගන්නා අතර පොල හංදිය හරහා ගමන් කරයි. ස්වර්ණ ජයන්ති මාවත හරහා කඳුරුවෙල සිට නව නගරයට ඇති සෘජු බස් ගමන් මාර්ගය කාලය මිනිත්තු **15** කට අවම කරයි.

6.4.3.2.2 දෛනික මඟීන්ට පහසුකම් සැලසීමට කඳුරුවෙල බස් නැවතුම්පළ සංවධර්නය කිරීම.

කඳුරුවෙල බස් නැවතුම්පල වර්තමානයේ තරමක් අබලන්ව පවතී. නගරයට පැමිණෙන දෛනික සංචාරක ජන සංඛ්‍යාව සලකා බලන කල්හි පවතින බස් නැවතුම්පළ ඔවුනට පහසුකම් සැලැස්වීමට පිළිසකර කිරීම, නවීකරණය කිරීම සහ සංවර්ධනය කිරීම අත්‍යාවශ්‍යය.

6.4.3.2.3 ප්‍රධාන මංසන්ධි හා උපමංසන්ධිවල විකල්ප මාගර් සහ මහ පෙන්වීම් පුවරු සවි කිරීම.

පොලොන්නරුව සංචාරක ගමනාන්තයක් ලෙසින්, නගරය තුළ සංචරණය පිළිබඳ පැහැදිලි අදහසක් නිර්මාණය කිරීම ඉතා වැදගත්ය. ඒ අනුව මෙම මහපෙන්වීමේ පුවරු එල්ලීමේ වැදගත්කම 2030 නගර සංවර්ධන සැලැස්ම යටතේ යෝජනා කරන ලදි.

නගරයේ මාර්ග සහ සංචාරක ආකර්ශනය සහිත ස්ථානවලට ඒ ඒ තැන්වල සිට ඇති දුර දක්වමින් මාර්ග සිතියමක් සහිතව මහ පෙන්වීමේ පුවරු සවි කිරීම මඟින් එම අවශ්‍යතාවය සම්පූර්ණ කළ හැක.

6.4.3.2.4 කඳුරුවෙල බස්නැවතුම් පල හා දුම්රිය නැවතුම්පල අතර සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම.

2050 ජාතික භෞතික සැලැස්ම අනුව, දුම්රිය ගමනාගමන ක්ෂේත්‍රය තුළද සැලකියයුතු සංවර්ධනයක් සිදුවනු ඇත. ප්‍රධාන දුම්රිය නැවතුම්පල බස්නැවතුම්පළට ඉතා ආසන්නයේ පිහිටා තිබෙන නමුත් එය සම්පූර්ණයෙන්ම වෙන් වී පවති. මෙම නැවතුම්පළවල් දෙක අතර පවතින අන්තර් සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම සංචාරක ජනතාවගේ හා නාගරිකයින්ගේ ජීවිතය සුවපහසු කරනු ඇත.

එමෙන්ම, දුම්රියපලෙහි පොළොන්නරුව නගරයේ නැඹිය හැකි සංචාරක ස්ථාන පිළිබඳව ආකර්ශනීය පුවරු පළ කිරීම සාර්ථක උපායමාර්ගයකි.

6.4.3.2.5 පදිකයේදිකා / මඟී මංතීරු වැඩිදියුණු කිරීම

දේශිය, විදේශීය සංචාරකයින් පොළොන්නරුව නගරය වෙත ආකර්ශනය වන්නේ එහි ඇති නටඹුන් මෙන්ම ඒවා බැඳී ඇති ස්වභාවික පරිසරයද හේතු කරගෙනය. එමෙන්ම, ඒ නිසා ඔවුන් අපේක්ෂා කරන භෞතික වට පිටාව හා සුවපහසු මට්ටම පොදු ප්‍රවාහන පද්ධතියකින් හා ප්‍රසන්න පදික වේදිකා වලින් යුතුව නැවත සැකසිය යුතුය.

එසේ නොවුනහොත් පූජනීය නගරය පිළිබඳ හැඟීම සහ මතකය අප්‍රසන්න එකක් වීමට ඇති ඉඩකඩ බොහෝය. පදික මංතීරු ආකර්ශනීය නොවන විට වැඩි වශයෙන් වාහන භාවිතයට සංචාරකයින් උත්සාහ කරන අතර, එමඟින් අනවශ්‍ය වාහන තදබදයක් පවා නිර්මාණය වීමේ ඉඩකඩ පවතී.

සංචාරකයින්ට පමණක් නොව, වෙළඳ, වාණිජ හා වෙනත් අරමුණු සඳහා පැමිණෙන සංචාරක ජනතාවටත් ඔවුන්ගේ එදිනෙදා වැඩකටයුතු ඉටුකරගැනීමට කඳුරුවෙල නගරය අවට ඇවිදීම අත්‍යාවශ්‍යය. 2030 වන විට නගරයට පැමිණීමට ඉඩ ඇති සංචාරක

ජන සංඛ්‍යාව සලකා බලන විට පදිකයින් සඳහා ප්‍රමාණවත් ඉඩ ප්‍රස්ථාවක් පැවතිය යුතු අතර නගරය ඇතුළත ඇවිදීම ප්‍රවර්ධනය කරන පහසුකම් නිර්මාණය කළ යුතුය. මෙම පහසුකම් වැඩිදියුණු කිරීම හරහා කඳුරුවෙල නගරය පසු කර A11 මාර්ගය හරහා ගමන්ගන්නා අනෙකුත් සංචාරකයින්ගේ ආකර්ෂණය නගරය වෙත ලැබීමට ඉඩ ඇත. භෞතික වටපිටාව (භූමි අලංකරණය + පැළ සිටුවීම) සහ සුවපහසු ජීවන මට්ටම වැඩිදියුණු කිරීම මඟින් වාහන භාවිත කිරීම වෙනුවට මිනිසුන්ට ඇවිදීමට මගපෙන්වනු ඇති අතර, එය පූජනීය නගරයෙහි වාතය පිරිසිදුව තබා ගැනීමටත් සෙවණ ඇති පරිසරයක් තුළ අඩු වාහන තදබදයක් තබා ගැනීමටත් සහය වනු ඇත. ගැස්සීම්, කැඩුණු පදික වේදිකා, බාධක (පහන් කණු) ඉතා පටු පදිකවේදිකා පොළොන්නරුව නගරයේ බහුල වශයෙන් ඇත. අපි බොහෝමයකට එය කුඩා හිරිහැරයක් ලෙස පෙනුනද ළමුන්, වැඩිහිටි පිරිස් විශේෂයෙන් අබාධිත පුද්ගලයන් සඳහා ඇවිද යාමට හා ආරක්ෂිත හැඟීම සඳහා ඒවා සැබෑ බාධකයන්ය. මෙම උපායමාර්ගයන් මඟින් ඉදිරියේදී නගරය සෞඛ්‍යමත්, ඇවිදයාමට පහසුකම් වලින් යුතු, පා පැදි සවාරි යා හැකි පදික සුහද නගරයටකට පරිවර්ථන කෙරෙනු ඇතැයි අපේක්ෂිතය. පහත මාර්ගයන් පදික මංතීරු සංවර්ධනය සඳහා විශේෂයෙන් තෝරාගෙන ඇත.

අ) පූජනීය නගරයේ සිට A11 මාර්ගය දිගේ පරාකුම සමුද්‍රය වැව් බැම්ම දක්වා.

ආ) A11 මාර්ගය දිගේ රෝහල් හන්දිය ප්‍ර දේශයේ සිට මීටර් 100 සුංගාවිල මාර්ගය

ඇ) A11මාර්ගය දිගේකඳුරුවෙල නගරය ඇතුළත

ඈ) නව නගරයේ මාර්ග පද්ධතිය



රූපය 6.21 : පදිකයින්ට පහසුකම් සැලසීම
මූලාශ්‍රය: Siyudad PH fb *පිටුව*

6.4.3.2.6. කඳුරුවෙල විකල්ප මාගර්ය හා වාහන නැවතුම්පල.

2030 සංවර්ධන සැලැස්මට අනුව, කඳුරුවෙල නගරය ප්‍රධාන වාණිජ මධ්‍යස්ථානය ලෙස දෛනිකව විශාල ජනගහනයක් සංක්‍රමණය වන ස්ථානයකි. එහිදී, ප්‍රමාණවත් වාහන නැවතීමේ පහසුකම් නොමැතිවීම මේ වන විටත් දෛනික සංක්‍රමණික ජනතාව මුහුණ දෙන ප්‍රධාන ගැටළුවකි. එම නිසා, නව විකල්ප මාර්ගයක්හා රථ වාහන නැවතුම් පලවල් **03** ක් ඉදිකිරීමට අපේක්ෂිතය. කඳුරුවෙල පල්ලියේ සිට **CIB** වෙළඳසැල දක්වා නගරයට නිරිත දෙසින් පිහිටි වෙල්යායට යාබඳව **A 11** මාර්ගයට සමාන්තරව මෙම මාර්ගය යෝජනා කර ඇත. නගරයේ රථවාහන තදබදය අවම කර ගැනීම සහ රථවාහන අවිධිමත්ව නවතා තැබීම අවම කර පදික සුහද නගරයක් බවට කඳුරුවෙල නගරය පත්කර ගැනීමට මෙම උපායමාර්ගය මනා පිටුවහලක් වනු ඇත.

යෝජිත විකල්ප මාර්ගය හා **A 11** මාර්ගය සම්බන්ධ කරමින් හරස් මාර්ග **03** ක් යෝජනා කර ඇති අතර, වාහන නැවැත්වීමේ රථ ගාල් ඒ ආශ්‍රිතව ඉදිකෙරෙනු ඇත. මෙම වාහන නැවතුම්වල තම රථය නවත්වා හරස් මාර්ග හරහා නගරයේ ප්‍රධාන මාර්ගයට පිවිසීමෙන් තම අවශ්‍යතා අඩු කාලයකින් ඉටු කර ගැනීමට සංක්‍රමණික ජනතාවට වඩාත් පහසු වනු ඇත.



රූපය 6.22 : යෝජිත කදුරුයවල විකල්ප මාගර්ය සහ වාහන නැවැත්වීයම් ස්ථාන 03 ක්

මූලාශ්‍රය: දිස්ත්‍රික් කාර්යාලය, පොළොන්නරුව - නා.සං.අ.

6.4.3.2.7. මනම්පිටියේ පටු පාලම පුළුල් කිරීම.

A11 මාර්ගයේ ගල්ලැල්ල ආසන්නයේ ඇති පටු පාලම ඒකාකාරී වාහන ගමනාගමනයට බාධා ඇති කරයි. (රූප සටහන 6.23) වරකට එක් දිගු වාහනයකට පමණක් ඉඩ ලබා දෙන මෙම පාලම සතුව පවතින්නේ ආසන්න වශයෙන් මීටර් 5ක අවම පළලකි. එමනිසා එය කාර්ය බහුල වේලාවන්හිදී A11 මාර්ගයේ වාහන තදබදය වැඩි කිරීමට හේතුවකි. අනතුරු වාර්තා ගත වීම් අනුව වැඩි වශයෙන් රාත්‍රී කාලයන් හී මෙම පාලම මත විශාල සංඛ්‍යාවක අනතුරු වාර්තා වී ඇත. මෙම තත්වයෙන් මිදීමට පාලම පුළුල් කිරීමේ උපාය මාර්ගය හඳුනාගෙන ඇත.



රූපය 6.23 : ගල්ලැල්ල පටු පාලම

මූලාශ්‍රය: දිස්ත්‍රික් කාර්යාලය , පොළොන්නරුව - නා.සං.අ.



සිතියම 6.12 : උපාය මාගරීක ප්‍රවාහන සැලැස්ම 2030

මූලාශ්‍රය : පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය - නා.සං.අ.

6.4.3.3. ජල සැපයුම් උපාය මාගරීක සැලැස්ම

පොළොන්නරුව දිස්ත්‍රික්කය කෘෂි ආර්ථිකය මත පදනම් වූ නගරයක් ලෙස හඳුනාගත හැක. එහිදී පානීය ජලය දිනකට එක් පුද්ගලයකුගේ ඉල්ලුම ලීටර් **120** කි. කර්මාන්ත ඉල්ලුම **8%** ක් වන අතර ගෘහස්ථ ඉල්ලුමෙන් වාණිජ ඉල්ලුම **10%** කි. ජලසම්පාදන හා ජලඅපවහන මණ්ඩලයේ වාර්තාවන්ට අනුව වර්ථමාන පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ජල ඉල්ලුම දිනකට **80000 m^3** වන අතර ඉන් **16100 m^3** තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සඳහා වේ. සැලසුම් ප්‍රදේශයේ නේවාසික ජනගහනය **100000** දක්වා ළඟා වුවහොත් එම සැලසුම් ප්‍රදේශයේ දිනකට ඒක පුද්ගල ඉල්ලුම **12000 m^3** වනු ඇත.

ජල සම්පාදන මණ්ඩලය විසින් පොළොන්නරුව සැලසුම් ප්‍රදේශයේ අනාගත ජල ඉල්ලුම ගල්ලැල්ල, සේවාගම සහ බැඳිවැව ප්‍රදේශයේ නව ජල ටැංකි සැකසීම මඟින් ඉටු කිරීමට සැලසුම් කර ඇත. "පොළොන්නරුව නගරය නැගෙනහිර" (***Town east of Polonnaruwa water supply project***) ව්‍යාපෘතිය හරහා ගල්ලැල්ලේ **12000 m^3** දක්වා වූ පිරිපහදු ඒකකයක් ඉදිකිරීමට අපේක්ෂිත අතර, එමඟින් තවදුරටත් අනාගත ජල පරිභෝජන අවශ්‍යතාව ආවරණය කරනු ඇත. එම නිසා, මෙම නගර සංවර්ධන සැලැස්මේ ජල සම්පාදනය පිළිබඳව විශේෂ උපක්‍රම යෝජනා කොට නැති අතර, ජල සම්පාදනය පිළිබඳ අතුරු අංශ දෙකක් වෙත පමණක් උපාය මාර්ග යෝජනා කර ඇත.

නගරයේ කෘෂි ජල අවශ්‍යතාවය පරාක්‍රම සමුද්‍රය මඟින් ආවරණය කෙරෙන අතර, වාරි ජල භීඟයකට නගරය මෙතෙක් මුහුණ දී නැත. පවතින එකම ගැටළුව වන්නේ වාරි ඇළ පද්ධතියේ අක්‍රමවත් නඩත්තුව සම්බන්ධයෙනි.

6.4.3.3.1. නඩත්තු කිරීම් හා තාක්ෂනික වැඩි දියුණු කිරීම් නීතිගත කිරීමෙන් වාරිමාගර් ඇළ මාගර්වල සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම.

දැනට පවතින ජලපද්ධතියේ අවහිරතා ඉවත් කිරීමෙන් **2030** වනවිට **100%** වාරි ඇළමාර්ග සම්බන්ධතාවය වැඩි දියුණු කිරීමට යෝජනා කරන ලදි.

6.4.3.3.2. වැසිජල කළමනාකරණ පද්ධතියක් පවත්වාගෙන යාමට ප්‍රජාව ධෛයර්මත් කිරීම.

2030 පොළොන්නරුව සංවර්ධන සැලැස්ම මඟින් වැසි ජල කළමනාකරණ පද්ධති ප්‍රවර්ධනය කිරීමට විශාල වහළවලින් යුතු ප්‍රදේශ හඳුනාගෙන ඇත. සැලසුම් කමිටු හරහා මෙයද ප්‍රජා මට්ටමින් ප්‍රායෝගිකවසිදු කිරීමට අවස්ථාව ඇත. නාගරිකයින්ට ඔවුන්ගේ

පදිංචි ස්ථාන ඇතුලත වැසි ජල කළමනාකරණ ව්‍යාපෘතියක් නඩත්තු කරමින් පවත්වාගෙන යාමට උපදෙස් පළාත් පාලන ආයතන මඟින් ලබා දෙනු ලැබේ.

එමෙන්ම, ගොඩනැඟිලි අනුකූලතා සහතිකය ලබා දීමේදී කුඩා අමතර ගාස්තුවක් අයකර හෝ නොමිලේ එම උපකරණ කට්ටලය ලබා දීම පළාත්පාලන ආයතනවලට සිදු කළ හැකිය.



සිතියම 6.13: පොළොන්නරුව ප්‍රදේශයේ වර්තමාන ජල සැපයුම

මූලාශ්‍රය : පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය - නා.සං.අ.



සිතියම 6.14: යෝජිත ජල සම්පාදන සැලැස්ම

මූලාශ්‍රය : පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය - නා.සං.අ.

6.4.3.3.4. විදුලි හා තොරතුරු රැහැන්

විදුලිය සපයනු ලබන්නේ ශ්‍රී ලංකාවේ ජාතික ජාලය මඟිනි. එය සම්පූර්ණ සැලසුම් ප්‍රදේශයම ආවරණය කර ඇත. එම නිසා නියඟ සමයන්හි ධාරිතා වල පවතින ජාතික ගැටළු හැරුණු විට වර්තමානයේ ඒ හා සම්බන්ධ කිසිදු ගැටළුවක් නොමැත. එයට අමතරව, නගරයේ විදුලි සැපයුම සඳහා එලන ලද රැහැන් යම් දුරකට නගර අලංකරණයටත්, මිනිසුන්ගේ ආරක්ෂාවටත් බලපානු ලැබේ.

මේ ක්ෂේත්‍රය සඳහා, පහත උපායමාර්ග යෝජනාකර ඇත.

01. පෞද්ගලික මට්ටමින් සූර්ය බල ශක්ති පද්ධතීන් දිරිමත් කිරීම හා රෙගුලාසි හරහා රජයේ ගොඩනැඟිලි සඳහා හරිත ප්‍රමිති සහතිකය අනිවාර්ය කිරීම.

02. ගොඩනැඟිලි සැලැස්මෙහි හරිත සංකල්ප ඇතුළත් කර ඇති අයදුම්කරුවන් සඳහා වැඩි ගෙබිම් ප්‍රමාණයක් අනුමත කිරීම.

03. නාගරික සංවර්ධන අධිකාරියේ ගොඩනැඟිලි අයදුම්පත් ක්‍රියාවලියේදී සූර්ය බල ශක්තිය ඇතුළු හරිත භාවිතයන්ට **50%** ක් දක්වා පෙරසැරි ගාස්තුව අවම කිරීම.

6.4.3.3.5. ජලාපවහන හා මලාපවහන මාගර් සඳහා උපායමාගරීක සැලැස්ම

පොළොන්නරුව සැලසුම් ප්‍රදේශයේ ඇති එක් ප්‍රධාන ගැටළුවක් වනුයේ අවිධිමත් ජලාපවහන පද්ධතියයි. ප්‍රධාන වශයෙන්ම කෘෂිකාර්මික අංශය මත යැපෙන නගරයක් ලෙසින් අපජලය ප්‍රදේශයේ ප්‍රධාන ජල මූලාශ්‍ර කරා ළඟා වන විට එහි පිරිසිදු බව සහතික කළ හැකි මට්ටමකට පිරිසිදුව පැවතිය යුතුය. ප්‍රදේශයේ වැසි ජලය රැගෙන යාමට පොළොන්නරුව සැලසුම් ප්‍රදේශයේ ප්‍රමාණවත් ජලාපවහන පද්ධතියක් තිබේ. **(සිතියම 6.5)** ධාරිතාව ප්‍රමාණවත් වුවත් විශේෂයෙන්ම කඳුරුවෙල හා පොළොන්නරුව රෝහල හංදිය අවට සිදු කරන නව ඉදිකිරීම් සමඟ පවතින ජලාපවහන මාර්ගයන් විධිමත් ලෙස ක්‍රියාත්මක නොවේ.

අනෙක් කරුණ නම්, අපජලය පිරිපහදු කිරීමේ ඒකකයක් නොපවතින නිසාවෙන් වැසි ජලය කඳුරුවෙල නගරයෙන් නිපදවෙන අපජලය සමඟ මිශ්‍රව කුඹුරු කරා ගලා යාමයි. ඒ අනුව, පහත උපාය මාර්ග නගරයේ ජලාපවහන පද්ධතිය හා සම්බන්ධ ගැටළු අවම කිරීමට හඳුනාගෙන ඇත. **(සිතියම 6.15)**

6.4.3.3.5.1. ප්‍රධාන වැසි ජල කාණු පද්ධතියක් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

6.4.3.3.5.2. අපජල පිරිපහදු පද්ධතියක් සැකසීම හා ක්‍රියාත්මක කිරීම.

6.4.1.4.3. ජලාපවහන පද්ධතියේ තෝරාගත් ස්ථානවලපෙරහන දැල් සවි කිරීම.

ප්ලාස්ටික් හා අනෙකුත් දූෂණය වන අපද්‍රව්‍ය කාණුවලට එකතුවීම පාලනය කිරීම සඳහා උපායමාර්ගයක් ලෙසින් පවතින ජලාපවහන ජාලය ඇතුළත දැල් භාවිතා කළ හැකි අතර, එමඟින් ප්ලාස්ටික් හා අනෙකුත් අපද්‍රව්‍ය කුඹුරු හා අනෙකුත් ජල මූලාශ්‍ර වෙත ළඟා වීම වලක්වා ගත හැක. **2030** වන විට කාණුවල පවතින අඛණ්ඩතා අවම කිරීමට කඳුරුවෙල ප්‍රදේශය හා රෝහල හංදිය ප්‍රදේශය ඇතුළත මෙම උපක්‍රමය හඳුන්වා දීමට අපේක්ෂිතය. නමුත්, වැසි ජල කාණු සහ අපජල කාණු පද්ධතිය සැකසීම සහ ක්‍රියාත්මක කිරීම හරහා වඩාත් සාර්ථක දීර්ඝකාලීන පිළියමක් ලබා ගැනීම වඩාත් උචිත වේ.



සිතියම 6.15: යෝජිත අපජලවහන පද්ධති සැලැස්ම

මූලාශ්‍රය: පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය - නා.සං.අ.

6.4.3.3.6. අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම

දැනට පොළොන්නරුව සැලසුම් ප්‍රදේශයෙන් නිපදවන අපද්‍රව්‍ය ප්‍රමාණය මෙට්‍රික් ටොන් 13 ක් පමණ වේ. එනම්, මෙට්‍රික් ටොන් 12 ක් නගරයෙන්ද මෙට්‍රික් ටොන් 1 ක් පූජනීය නගරයෙන්ද වශයෙනි. දැනට ගල්ලැල්ල ප්‍රදේශයේ අපද්‍රව්‍ය කළමනාකරණ

මධ්‍යස්ථානයක් තිබෙන අතර, එය හොඳින් ක්‍රියාත්මක වේ. අනාගතයේ සැලසුම් කලාපය තුළ සන අපද්‍රව්‍ය ටොන් **25** ක් දෛනිකව එක් රැස් වනු ඇතැයි පුරෝකථනය කර ඇත. එම නිසා, පොළොන්නරුව නගරයේ අපද්‍රව්‍ය කළමනාකරණය හා සම්බන්ධව වර්තමානයේ ගැටළු බොහෝමයක් නොතිබුණද අනාගතයේ රෝහල් හා අනෙකුත් අපද්‍රව්‍ය ප්‍රමාණය සලකා බලමින් පහත උපාය මාර්ග යෝජනා කර ඇත.

1. ගල්ලෑල්ල පවතින ගණ අපද්‍රව්‍ය ඒකකය වැඩි දියුණු කිරීම.
    - මල අපද්‍රව්‍ය සඳහා ලීටර් **30000** ක ධාරිතාවක පිරිපහදු ඒකකයක් ස්ථාපිත කිරීම.
    - අවම වශයෙන් **18' x 70'** ක වඩා වැඩි ඉඩකඩක් සහිත කොම්පෝස්ට් අංගනයක් සැකසීම.
2. ජාතික මට්ටමේ ගණ අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ මධ්‍යස්ථානයක් සඳහා ජාතික මට්ටමේ ව්‍යාපෘතියක් මැදිරිගිරියේ මී ගස්වැව ප්‍රදේශයේ පිහිටුවීමට යෝජිතය. **2030** වන විට පොළොන්නරුව නාගරික ප්‍රදේශයද ඒ හරහා ප්‍රතිලාභ ලබනු ඇත.
3. නිවෙස් තුළම කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය දිරිමත් කිරීම.
   පොළොන්නරුව වාරි කර්මාන්තය මත පදනම් වූ දිස්ත්‍රික්කයක් වන අතර, මිනිසුන් කොම්පෝස්ට් පොහොර භාවිතය සම්බන්ධයෙන් හුරු කිරීම එතරම් අපහසු නොවේ. උපාය මාර්ගයක් ලෙසින් කුඩා නිවාස ඒකකවලින් නිපදවන දිරාපත්වන අපද්‍රව්‍ය පාලනය කිරීමට උපදෙස් හා මඟපෙන්වීම ලබා දීම මඟින් අනාගතයේ වඩාත් සෞඛ්‍යමත් වටපිටාවක් නිර්මාණය කර ගත හැකි වනු ඇත.

ඒ අනුව, ඉහත කී තත්වයන් ළඟාකර ගැනීමට මෙම සැලැස්ම තුළින් පහත උපාය මාර්ග හඳුනාගෙන ඇත.

- නගර සීමාව ඇතුළත කසල එකතු කිරීමේ ඒකක හඳුන්වා දීම.
- දිරාපත්වන හා දිරාපත් නොවන අපද්‍රව්‍ය වෙන් කර භාර දීමට අදාළව මිනිසුන් දැණුවත් කිරීම.
- සෑම නිවසකටම කොම්පෝස්ට් බඳුන් ලබා දීම හා අපද්‍රව්‍ය නිපදවීම අවම කිරීමට ගොඩනැඟිලි සඳහා අනුකූලතා සහතිකය ලබා දෙන විට කොම්පෝස්ට් බඳුන් ලබා දෙන ක්‍රමයක් හඳුන්වා දීම.



සිතියම **6.16:** කසල කළමනාකරණ මධ්‍යස්ථානය - ගල්ලැල්ල

*මූලාශ්‍රය: තමන්කඩුව ප්‍රාදේශීය සභා වාර්ෂික වාර්තාව **2016***

6.4.4 පාරිසරික තිරසර උපාය මාර්ග

නිවර්ථන දේශගුණික පරිසරයක සැපපහසු ජීවිතයක් ගත කිරීම සඳහා ප්‍රදේශයේ පවතින පාරිසරික සංවේදී ප්‍රදේශ සංරක්ෂණය කිරීම හා ඓතිහාසික අංග ආරක්ෂා කිරීම සඳහා මෙම පාරිසරික තිරසර උපාය මාර්ග සකස් කර ඇත.

6.4.4.1 සංරක්ෂණ සැලැස්ම

ප්‍රදේශයේ අනන්‍යතාවය ආරක්ෂා කිරීම සහ සංචාරක කර්මාන්ත වැඩි දියුණු කිරීම සඳහා පහත ප්‍රදේශ සංරක්ෂණ කිරීම අත්‍යාවශ්‍ය වේ. මෙම කලාපීකරණ සැලැස්ම හා කලාපීය සාධකය මඟින් පහත ස්ථාන සංරක්ෂණය කිරීම සහතික කරන අතර එහි භෞතික මායිම් සලකුණු කිරීම මඟින් ඒවායේ අනාගත ආරක්ෂාව සම්බන්ධයෙන්ද සහතික විය හැක.

(අ) ජල ගැලුම් නිම්න වයනෝද්‍යානය

ජල ගැලුම් නිම්න ජාතික වනෝද්‍යානය මහවැලි ගඟ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ වෙන්කර ඇති ජාතික වනෝද්‍යාන හතරෙන් එකකි. **1984** අගෝස්තු **07**වන දින මෙම වනෝද්‍යාන නිර්මාණය කරන ලදි. මෙම උද්‍යානය උතුරු මැද පළාතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මහවැලි ගඟ දෙපසින් ව්‍යාප්තව ඇත. මෙම වනෝද්‍යානය මහවැලි ගංගා පද්ධතියේ සුවිශේෂී ස්ථානයක් වන අතර, මෙහි පවතින "විල්ලු" පරිසර පද්ධතියත්, වස්ගමුව ජාතික වනෝද්‍යානය සහ සෝමාවතිය වනෝද්‍යානය අතර වන ජීවීන් සංක්‍රමණය වන වන තීරයක් ලෙසිනුත් වැදගත්කමක් උසුලයි. මනම්පිටිය නගරය උද්‍යානයේ නැගෙනහිර මායිමට පිටතින් පිහිටා ඇත.

(ආ) වගුරු ප්‍රදේශ සහ ස්වාභාවික පරිසරය

පරාක්‍රම සමුද්‍රය අවට සහ ජල ගැලුම් නිම්න ජාතික උද්‍යානයට ආසන්නව මෙම වගුරු බිම් හඳුනාගෙන ඇත. වගුරු වලට අමතරව සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී වන ආවරනයන් සහිත ප්‍රදේශයද සංරක්ෂණ සඳහා යෝජනා කෙරේ.

(ඇ) කුඹුරු සහ අත්හැර ඇති කුඹුරු ඉඩම්

නගරයට හදිසි තද වැසි නිසා වැසි ජලයෙන් සිදුවන හානි අවම කිරීමෙහිලා මෙම කුඹුරු ඉඩම් හා අත්හැර ඇති කුඹුරු වැසිජලය රැඳවීම් ප්‍රදේශ ලෙස සංරක්ෂණය කිරීම අත්‍යාවශ්‍යය.

ඒ සඳහා ප්‍රදේශයේ පවතින වී වගාව සංරක්ෂණය හා ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් කුඹුරු ඉඩම් හා අත්හැර ඇති කුඹුරු ඇතුළත්ව නේවාසික කලාප 2 වශයෙන් වෙනම කලාපයක් හඳුනා ගෙන ඇත. මෙම කලාපය තුළ සංවර්ධන කටයුතු සිදුකිරීමේදී පවත්නා කුඹුරු ඉඩම් සංරක්ෂණය කිරීම සඳහා විශේෂ රෙගුලාසි ද සකස් කර ඇත.

(ඈ) පුරාණ නටඹුන්

ඓතිහාසික නටඹුන් මඟින් පුරාණ පොළොන්නරුව නගරයේ අනන්‍යතාවය පිළිඹිඹු කරනු ලබයි. ඒ අනුව, මෙම සංරක්ෂණ සැලැස්ම තුළින් එම නටඹුන් හා ස්මාරක සංරක්ෂණය කිරීම සඳහා හඳුනා ගෙන ඇත. අනවසර ඉදිකිරීම් / අත්පත්කර ගැනීම් පාලනය කිරීම සඳහා මෙහි මායිම් භෞතිකව ලකුණු කිරීමට මින් යෝජනා කෙරේ.

(ඉ) ජල මූලාශ්‍ර / වාරිමාගර් පද්ධතිය

පොළොන්නරුව පුරාණයේ සිට ජලාශ විශාල ප්‍රමාණයකින් සමන්විත ප්‍රධාන නගරවලින් එකකි. මෙම ජලාශ පොලොන්නරුව නගරයේ අනන්‍යතාවය පෙන්වන තවත් එක් සාධකයක් වන අතර සංචාරක කර්මාන්තය නගා සිටුවීමට ඇති අනඟි විභවතාවයකි. එමෙන්ම, මෙම ජලාශ කෘෂිකර්මාන්තය වෙනුවෙන් සංරක්ෂණය කිරීම අත්‍යාවශ්‍ය වේ.

මෙම ජලාශයන් හි වර්ගය අනුව, (වැව්,ටැංකි, ඇලවල්,තෙත් බිම්)එක් එක් ජලාශ සඳහා පවතින වටප්‍රමාණය සලකිල්ලට ගනිමින් ඒවා වටා භෞතික මායිම් සළකුණු කිරීමට මින් යෝජනා කෙරේ.

මෙලෙස මායිම භෞතිකව සලකුණු කිරීම මඟින් යහපත් අතුරු ප්‍රතිඵලයක් ලෙස අපද්‍රව්‍ය / රසායනික ද්‍රව්‍ය ජලාශවලට මිශ්‍ර වීමද අවම වීම අපේක්ෂිතය. මෙම කරුණුවලට අමතරව මෙම ජලාශවල පිහිනීමට / දිය නෑමට අන්තරාදායක ස්ථාන පිළිබඳ දැන්වීම් සවිකිරීමද නගරයේ **2030** සංචාරක දැක්ම සාර්ථක කර ගැනීම උදෙසා පිටුවහලක් වනු ඇත.

6.4.4.2. භූමි අලංකරණ කළමනාකරණ සැලැස්ම

නගරයේ කාබන් නිෂ්පාදනය අවම කිරීම, උෂ්ණත්වය අවම කිරීම, නාගරික ජනතාවගේ ජීවන තත්ත්වය භෞතිකව හා මානසිකව නගා සිටුවීම වැනි අරමුණු සඳහා භූමි අලංකරණ සැලැස්ම සකසා ඇත. ඉහත අවශ්‍යතාවයන් පහත උපක්‍රම මඟින් ආවරණය කිරීමට නියමිතය.

6.4.4.2.1. නගරයයහි උෂ්ණත්වය වැඩි වීම පාලනය / තාප වියමෝචනය අඩුකිරීම.

නිවෙස් ඉදිරිපිට ශාක රෝපණය, ගොඩනැගිල්ල මුදුනත හා ඒ අවට ප්‍රදේශයට සෙවන ලබාදීම, මාර්ග හරිතවත් කිරීම මේ සඳහා යෝජිත උපක්‍රම වේ. **(පින්තූර 6.25, 6.26, 6.27)** මෙහිදී මාර්ග මධ්‍යයේ හා දෙපස ශාක සිටුවීම සඳහා ප්‍රධාන මාර්ග දෙකක් හඳුනාගෙන ඇත.

- **A11** මාර්ගය (හතමුණ හන්දියේ සිට ගල්ලැල්ල දක්වා)
- මෛත්‍රිපාල සිරිසේන මාවත

මෙම උපාය මාර්ගය නගරයේ උෂ්ණත්වය අඩු කිරීමට මෙන්ම නගර අලංකරණය සඳහාද දායක කර ගැනීමට පහත ශාක වර්ග සිටුවීම සඳහා හඳුනාගෙන ඇත.

- මල් ඇහැළ
- මඟුල් කරඳ
- එරබදු
- මැයි මාර
- රොඛරෝසියා



රූපය 6.24 : එළිමහන් අවකාශය සහ ගොඩනැඟිලි වෘක්ෂලතා මඟින් ආවරණය



පින්තූර 6.25 : හරිත ආවරණ ගොඩනැගිලි ඇතුළත හා පිටත



පින්තූර 6.26 : වහල මත හරිත ආවරණය



පින්තූර 6.27 : ගොඩනැගිලි ඉදිරිපස හරිත ආවරණය

ආ. සුළං මාගර් නිරවුල්/ විවෘත කිරීම

කඳුරුවෙල නගරය තුළ පවතින උෂ්ණත්වය අඩුකිරීම සඳහා කුඹුරුවල සිට හරස් මාර්ග හතරක් A 11 මාර්ගයට (නගරයට) සම්බන්ධ කිරීමට යෝජනා කෙරේ. ඒවා නම්,

- කඳුරුවෙල පල්ලිය අසලින්
- හැටන් නැෂනල් බැංකු ගොඩනැගිල්ල අසලින්
- නිව් හෝම්ස් පැලස් සාප්පුව අසලින්
- CIB සාප්පු සංකීර්ණය අසලින්



රූපය 6.28 : කුඹුරුවල සිට A 11 මාගර්ය දක්වා හරස් මාගර් 04 ක්

6.4.4.3. පොදු විවෘත භූමි අවකාශීය සැලැස්ම

නාගරික සංවර්ධන අධිකාරියේ පිළිගත් ප්‍රමිතීන්ට අනුව, පුද්ගලයින් 1000කට හෙක්ටයාර් 1.4 ක බිම් කඩක් විවේක හා විනෝද කටයුතු සඳහා විවෘතව තැබිය යුතුය. පුරෝකථනය කළ දත්ත විශ්ලේෂණයට අනුව වසර 2030 වන විට පොලොන්නරුව නගරයේ ජනගහනය 100000 ක් වේ. ඒ අනුව, විවේක හා විනෝද කටයුතු සඳහා වසර 2030 වන විට වෙන්කළ යුතු භූමි ප්‍රමාණය හෙක්ටයාර් 140 කි.

6.4.4.3.1 පොලොන්නරුව නගරයේ පවතින ක්‍රීඩාපිටි හා මහජන උද්‍යාන පිළිබඳ දත්ත

පොලොනන්රුව නගරයේ උද්‍යාන හා ක්‍රීඩාපිටි සඳහා හෙක්. 19.3ක ප්‍රමාණයක් වෙන්ව ඇත. (ඇමුණුම -16) නාගරික සංවර්ධන අධිකාරියේ පොදු එළිමහන් විවේක විනෝද කටයුතු රෙගුලාසි වලට අනුව වගු අංක 6.2 සහ ඇමුණුම 16 පරිදි ඒවා වර්ගීකරණය කර ඇත.

වගුව 6.2 පවතින පොදු විවේක විනෝද කටයුතු ස්ථාන - 2018

අංකය	උදයාන වගර්ය	ප්‍රමාණය
1.	කුඩාම උද්‍යාන	0.3
2.	කුඩා උද්‍යාන	5.4
3.	ප්‍රාදේශිය උද්‍යාන	5.2
4.	නගර මධ්‍ය උද්‍යාන	8.4
		19.3

6.4.4.3.2 විවේක විනෝද කටයුතු සංවර්ධනය / විවෘත ඉඩකඩ සඳහා වූ උපාය මාගර්

6.4.4.3.2.1 පවතින උද්‍යාන හා ක්‍රීඩා පිටි සංවර්ධනය

සුදුසුකම්ලත් තැනැත්තෙකුගේ උපදෙස් මත පිළියෙල කරන ලද නිසි සැලැස්මකට අනුව පවතින උද්‍යාන හා ක්‍රීඩාපිටි ප්‍රතිසංවර්ධනය කිරීම.

6.4.4.3.2.2 රේඛීය උද්‍යාන සංවර්ධනය

සියළුම ඇළ මාර්ග, පරාක්‍රම සමුද්‍රයේ රක්ෂිතය, රේඛීය උද්‍යාන ලෙස සංවර්ධනය කළ යුතු වන අතර ඒවා මහජනයා හට එළිමහන් විවේක විනෝද පහසුකම් ලබා ගැනීම සඳහා පහසුම සහ අලංකාරම ස්ථාන වේ.

6.4.4.3.2.3 නගරයේ තෙත් බිම් ලෙස කුඹුරු ඉඩම් සංරක්ෂණය කිරීම

ප්‍ර දේශයේ ගංවතුර උවදුර අනුව, පවතින කුඹුරු ඉඩම් සහ අත්හරින ලද කුඹුරු ඉඩම් ගංවතුර රැඳවීම් ප්‍රදේශ / තෙත් බිම් වශයෙන් සංරක්ෂණය කිරීම සඳහා මෙමඟින් යෝජනා කෙරේ. මෙහිදී යාබද ප්‍රදේශයන්හි සංවර්ධන කටයුතු ද අදාල ආයතනයන්ගේ නිර්දේශවලට අනුකූලව හා අදාල නීතිරෙගුලාසිවලට අනුකූලව සිදුකිරීම කලාපීයකරණ රෙගුලාසි වලට ඇතුළත් කර ඇත.

6.4.4.4. වසර 2030 සඳහා පොදු එළිමහන් විවේක විනෝද කටයුතු සැලැස්ම (PORS)

මෙම පොදු එළිමහන් විවේක විනෝද කටයුතු සැලැස්ම (PORSPlan)යටතේ පහත ප්‍රධාන උද්‍යාන සංවර්ධනය කිරීම සඳහා හඳුනාගෙන ඇත.

අ. පොල හංදියේ මහජන චතුරශ්‍රය

ආ. කඳුරුවෙල නාගරික උද්‍යානය

ඇ. ගල්ලෑල්ල තෙත්බිම් උද්‍යානය

ඈ. දීප උයන - II අදියර

ඉ. නව නගරය නාගරික උද්‍යානය

වගුව අංක 6.3 යෝජිත නව එළිමහන් විනෝද කටයුතු සැලැස්ම 2019 – 2030

ක්‍රමය	උද්‍යාන වර්ගය	ඉඩම් ප්‍රමාණය ලබා දීම	අනුමත භාවිතයන්	අවම බිම් ප්‍රමාණ
1.	යෝජිත කුඩාම උද්‍යාන	0.3	- විසිරුණු ක්‍රීඩා ඉඩකඩ - විවේක ප්‍රදේශ - ගෙවතු කොටස	- අක්කර 0.5
2.	යෝජිත කුඩා උද්‍යානය	1 – 2	- ළමා සෙල්ලම් පිටි - තෘණ වවන ලද කුඩා ක්‍රීඩා පිටි - රේඛීය උද්‍යාන - විවේක ප්‍රදේශ	- අක්කර 0.5-2.5

03	යෝජිත ප්‍රාදේශීය උද්‍යාන	13 - 8	- ළමා ක්‍රීඩාංගන, අවිධිමත් නිදහස් ප්‍රදේශ ඇතුළත්ව පා පන්දු පිටි - ළමා ක්‍රීඩාපිටි සමඟ අවිධිමත් විශාල තෘණ භූමි ප්‍රදේශ - කුඩා වන භූමි උද්‍යාන හා අවිධිමත් ඇවිදින මංතීරු	- අක්කර 2.5 – 7.5
4.	යෝජිත රේඛීය උද්‍යාන	222.4	- ව්‍යායාමය සඳහා ඇවිදීම - බයිසිකල් පැදීම - ස්වාභාදහම විඳීමට සැකසූ මංපෙත්, වන තීර	
5.	යෝජිත වන උද්‍යාන	1513.5	-තොරතුරු මධ්‍යස්ථාන - ස්වාභාදහම විඳීමට සැකසූ මංපෙත්, වන තීර - සෙවන සහිත ඇවිදීමේ මංතීරු -කඳවුරු (සීමිත ක්‍රියාකාරම් සහිත) -පර්යේෂණ මධ්‍යස්ථාන	- ජල ගැලුම් නිමින ජාතික වනෝද්‍යානය - ඇල රක්ෂිතය * - පළමු ඇල (ඇල රක්ෂිතය මීටර් 10) - දෙවන ඇල (ඇල රක්ෂිතය මීටර් 10) - හතරවන ඇල (ඇල රක්ෂිතය මීටර් 10)
5.	යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු ඉඩකඩ 1751.2			
6.	පවතින පොදු එළිමහන් විනෝද කටයුතු ඉඩකඩ 19.3			
	එකතුව 1770.5			



සිතියම **6.17** පොදු එළිමහන් විනෝදාත්මක අවකාශීය සැලැස්ම **2030**

මූලාශ්‍රය : පරිසර සහ භූ දර්ශන අංශය - නා.සං.අ.



රූපය 6.29: කඳුරුවෙල නාගරික උද්‍යානයේ ස්ථානීය සිතියම
මූලාශ්‍රය : පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය - නා.සං.අ.

අ. පොල හංදියේ මහජන චතුරශ්‍රය

පොල හංදිය ආසන්නයේ පැරණි ප්‍රදේශීය සහා ගොඩනැඟිල්ල තිබූ භූමිය ආශ්‍රිත ඉඩම මෙම මහජන චතුරශ්‍රය ඉදිකිරීම සඳහා හඳුනා ගන්නා ලදි. (පින්තූර 6.29) මෙම ව්‍යාපෘතිය නාගරික සංවර්ධන අධිකාරියේ පොලොන්නරුව කාර්යාලයේ උපදෙස් හා මඟපෙන්වීම් මත පොළොන්නරුව මහනගර සභාව යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජනා කෙරේ. මෙම චතුරශ්‍රය පහත අංගයන්ගෙන් සමන්විත වේ.

- ළමා ක්‍රීඩා පිටි
- මින් මැදුර
- ප්‍රජා ශාලා
- වෙළඳ කුටි සඳහා ඉඩකඩ
- බස් නැවතුම්පල
- මහජන චතුරශ්‍රය හා පූජා භූමිය සම්බන්ධ කරමින් ඇළ හරහා පාලමක් ඉදිකිරීම

- මහජන චතුරස්‍රයට ජලය සැපයීම සඳහා ඇළ මාර්ගයේ ජල රෝදයක් සවි කිරීම



පින්තූරය 6.30 :නාගරික උද්‍යාන සඳහා උදාහරණ
මූලාශ්‍රය : අන්තර්ජාලයෙනි

(ආ) කඳුරුවෙල නාගරික උද්‍යානය

බස් නැවතුම්පලේ හා දුම්රිය ස්ථානයේ සිට පැමිණෙන මගී ජනයා ඉලක්ක කරමින් ඔවුනට සුව පහසු පරිසරයක් නිර්මාණය කිරීමේ අරමුණින් මෙම නාගරික උද්‍යානය යෝජනා කෙරේ. එමෙන්ම මෙම සංවර්ධන සැලැස්මේ ප්‍රධාන ඉලක්කයන්ගේ එකක් වන හරිතවත් පරිසරයක් සමඟ සුවපහසු නගරයක් නිර්මාණය කිරීම සැලකිල්ලට ගෙන මෙම ව්‍යාපෘතිය යෝජනා කර ඇත.



රූපය 6.31 : කඳුරුවෙල නාගරික උද්‍යානයේ ස්ථානීය සිතියම
මූලාශ්‍රය : පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය - නා.සං.අ.

ඇ.ගල්ලැල්ල තෙත් බිම් උද්‍යානය

A11 මාර්ගය ඔස්සේ කඳුරුවෙල සිට මඩකලපුව අතර තුර ගල්ලැල්ල ප්‍රදේශයේ මෙම ජල ගැලුම් නිමින ජාතික වනෝද්‍යානය පිහිටා ඇත. මෙම ජල ගැලුම් නිමින ජාතික වනෝද්‍යානය ස්වාභාවික සෞන්දර්යයෙන් පිරිපුන් අතර මෙම පරිසර පද්ධතිය වන ජීවීන් හා ස්වාභාවික වෘක්ෂලතාවන්ගෙන් පිරි ඉහළ ජෛව විවිධත්වයක් දක්වන ස්ථානයකි.

පරිසරවේදීන්ගේ අවධානය තදින් දිනා ඇති මෙය පොලොන්නරුව නගරයේ පවත්නා වටිනාම ප්‍රදේශයක් වන අතර එය නගරයේ ආර්ථිකය වැඩිදියුණු කිරීම සඳහා මෙතෙක් සෘජුව දායක කරගෙන නොමැත. මෙම ස්ථානය පොලොන්නරුව නගරය කරා පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින්ට ස්වාභාවික පරිසරය විඳීමට ඇති වෙනස්ම අත්දැකීමක් ලබා දෙන ස්ථානයක් ලෙස පරිවර්තනය කිරීමට පහත උපායමාර්ග යෝජනා කර ඇත.

- කුරුළු නැරඹුම් ස්ථාන හා වන අලි නැරඹීමට රළු ධාවන පථ නිර්මාණය
- ස්වභාවික පරිසර නැරඹීම සඳහා නිරීක්ෂණ ස්ථාන
- ජලජ ජීවීන් සහ ගංගා පරිසර පද්ධතිය නැරඹීම සඳහා මහවැලි ගඟ සහ අඹන්ගඟ දිගට බෝට්ටු සේවා පහසුකම් සැපයීම
- ගිම්හාන කුටි



රූපය 6.32 : ගල්ලැල්ලහි යෝජිත තෙත් බිම් උද්‍යානයේ ස්ථානීය සිතියම
මූලාශ්‍රය : පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය - නා.සං.අ.



රූපය 6.33 :අභයභූමියේ වත්මන් නාම පුවරුව



රූපය 6.34: යෝජිත තෙත් බිම් උද්‍යානයේ ඇවිදීමේ මාගර්යට උදාහරණ (බැද්දගාන තෙත්බිම් උද්‍යානය)



පින්තූර 6.35 : මහවැලි ගඟේ බෝට්ටු සවාරි යාමට උදාහරණ

ඈ. දීප උයන II අදියර

දීප උයන ව්‍යාපෘතිය නාගරික සංවර්ධන අධිකාරිය විසින් වසර 2015 දී කෙටුම්පත් කරන ලද දල නගර සංවර්ධන සැලැස්ම තුළින් හඳුනාගන්නා ලද ව්‍යාපෘතින්ගෙන් එකක් වන අතර එය පිබිදෙමු පොලොන්නරුව වැඩ සටහන යටතේ ආරම්භ කරන ලදී. වසර 2030 දක්වා වූ නගර සංවර්ධන සැලැස්මේ පරමාර්ථය හා අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම දීප උයන ව්‍යාපෘතිය II අදියර හඳුනා ගෙන ඇත.

යෝජිත සංචාරක බස් නැවතුම, බහු ක්‍රියාකාරී ප්‍රදේශ, යෝජිත කාර් රථ අංගනය, යෝජිත පාපැදි අංගනය



රූපය 6.36 : දීප උයන ව්‍යාපෘතිය II අදියර - ප්‍රධාන සංකල්පීය සැලැස්ම
මූලාශ්‍රය: පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය -නා.සං.අ.



රූපය 6.37 දීප උයන ව්‍යාපෘතිය II අදියර - සංකල්පීය අංශ සැලැස්ම

යෝජිත සංචාරක බස් නැවතුම, බහු ක්‍රියාකාරී ප්‍රදේශ, යෝජිත කාර් රථ අංගනය, යෝජිත පාපැදි අංගනය, පරාක්‍රම සමුද්‍රය, කොටු පවුර, යෝජිත වැසි ජල කාණුව, පාපැදි මංතීරුව, පදික මංතීරුව, කොළඹ පොළොන්නරුව ප්‍රධාන මාර්ගය

6.4.4.5. අපදා අවදානම් කළමනාකරණ සැලැස්ම

පොළොන්නරුව නගරය ලංකාවේ අනෙකුත් නගරවලට සාපේක්ෂව ස්වභාවික විපත් අඩු නගරයකි. පොළොන්නරුව නාගරික ප්‍රදේශය මුහුණ දෙන ප්‍රධාන ආපදා ලෙස

1. අකුණු ගැසීම්
2. ගංවතුර
3. සුළි සුළං
4. අලි මිනිස් ගැටුම් දැක්විය හැකිය.

6.4.4.5.1 පොළොන්නරුව නාගරික ප්‍රදේශයේ ආපදා අවදානම් කලාපය සඳහා මායර්ගෝපදේශ

2003 මාර්තු මාසයේ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හා නාගරික සංවර්ධන අධිකාරිය සම්බන්ධ වීමෙන් *"නාගරික හා ස්වභාවික විපත් අවම කිරීම සඳහා වූ සැලසුම් හා මාර්ගෝපදේශ"* යටතේ ආපදා අවම කිරීම සඳහා පහත මාර්ගෝපදේශ සකස් කර ඇත.

6.4.4.5.2 අකුණු ගැසීම්වලින් සිදුවන විපත්

අකුණු මඟින් නිරන්තරයෙන් සිදුවන අනතුරු අවම කිරීම සඳහා වූ මාර්ගෝපදේශ පහත පරිදි දැක්විය හැකිය.

1. ඉදිකිරීම් සිදු කරන අතරතුරම අකුණු සන්නායක සවිකිරීම
2. භූගත විදුලි රැහැන් (Cable)ස්ථාපනය ප්‍රවර්ධනය කිරීම
3. අනතුරු බහුල ප්‍රදේශයන්හි ගොඩනැගිලිවල අකුණු ආරක්ෂණ පහසුකම් සවි කිරීම

6.4.4.5.3. ගංවතුර උවදුර

පොළොන්නරුව නාගරික ප්‍රදේශයේ ගංවතුර තත්වයන්ට අනුව එය වාර්ෂික ගංවතුරක් අනිවාර්යයෙන් සිදු වන බව නිරීක්ෂණය කරන ලදි. 2017 වසරේදි මෙම ව්‍යසනයෙන් නිවාස 192ක් පීඩාවට පත්ව ඇත. නමුත් මොරගහකන්ද ජලාශය සංවර්ධනය හේතුවෙන් මහවැලි ගඟේ මෙම ජල ගැලීම් නැවතී ඇති බව නිරීක්ෂණය කළ හැකිය. එම නිසා නාගරික ප්‍රදේශයේ ඇතිවන ක්ෂණික ගංවතුර අඩු කිරිම සඳහා පමණක් මෙහිදී උපායමාර්ග ඉදිරිපත් කර ඇත.

1. ගංවතුරින් ආරක්ෂා වීමට ගෙන යන ජලධාරිතාවය වැඩි කිරිම සඳහා ගංගා හා ඇලවල් ගැඹුරු කිරිම, පළල් කිරිම හා අවහිරයන් ඉවත් කිරිම
2. කුඹුරු හා වගුරු බිම් පිරිවීම තහනම් කිරිම
3. ප්‍රදේශය සඳහා නිසි වැසිජල කාණු පද්ධතියක් සකස් කිරිම
4. ගංවතුර රැඳවීම් ප්‍රදේශ ලෙස පවතින කුඹුරු ඉඩම්, වගුරු බිම්, පහත් ඉඩම් හා අත්හැර දමන ලද කුඹුරු ඉඩම් සංරක්ෂණය කිරිම සඳහා සංරක්ෂණ සැලසුමක් සකස් කිරිම
5. රක්ෂිතයන් ප්‍රකාශයට පත්කිරිම
   මහවැලි ගඟ - මීටර් 6
   අඹන් ගඟ - අඩි 30
6. ගංවතුර විපත් ප්‍රදේශ වර්ගීකරණය කිරිම
   ඉහළ ගංවතුර ප්‍රදේශය සහ වාර්ෂික ගංවතුර ප්‍රදේශය - අවම බිම් ප්‍රමාණය පර්චස් 20
7. නාගරික ප්‍රදේශය තුළ විශේෂ ජල පාරගම්‍ය ද්‍රව්‍ය භාවිත කිරිම

නාගරික ප්‍රදේශයේ ඇතුළත මාර්ග ඉදිකිරිමේ දී මෙම ජල පාරගම්‍ය ද්‍රව්‍ය භාවිතා කිරිම මඟින් වැසි ජලය ගලා යෑම අවම කර භූමියට උරා ගැනීම වැඩි කර ගත හැකිය.

6.4.4.5.4 සුළි කුණාටු

අනුමාන වශයෙන් ගත් කල වසර 30 කට වරක් පමණක් ප්‍රධාන සුළි සුළඟක් ඇති වීමේ ප්‍රවනතාවයක් දැක ගත හැකි බැවින්, ඒ සඳහා විශේෂ උපායමාර්ග සකසා නොමැත.

6.4.4.5.5. අලි මිනිස් ගැටුම්

වන අලි තර්ජන අවම කිරිම හා අලි මිනිස් ගැටුම් පාලනය කිරිම සඳහා පහත උපාය මාර්ග හඳුනා ගෙන ඇත.

1. විශාල ගස් සිටුවීම මඟින් ඔවුනගේ මාර්ගය අවහිර කිරිමට වෙනත් මාර්ගයක් නිර්මාණය කිරිම.
2. අලි ගමන් කරන මාර්ගය දිගේ මී මැසි පාලනය ප්‍රවර්ධනය කිරිම.
3. අධි බල විදුලි රැහැන් මඟින් නේවාසික කලාප ආරක්ෂා කිරීම.



සිතියම 6.18: යෝජිත ආපදා අවදානම් අවම කිරීමේ කලාපකරණය

මූලාශ්‍රය : පරිසර සහ භූ දර්ශන අංශය - නා.සං.අ.

6.4.4.6. කෘෂිකාර්මික සැලැස්ම

පොළොන්නරුවේ ප්‍රධාන කෘෂිකාර්මික නිෂ්පාදනය වී වගාව වන අතර ශ්‍රී ලංකාවේ සමස්ථ ජාතික වී නිෂ්පාදනයෙන් 19% ක ප්‍රතිශතයක් ලබා දෙයි.(2018 සංඛ්‍යාලේඛණ) පොළොන්නරුව යනු දේශගුණික තත්වය, පාංශු වර්ගය හා වී වගාව සඳහා බලපාන අනෙකුත් පාරිසරික අවශ්‍යතා සැලකිල්ලට ගත්විට වී වගාව සඳහා වඩාත්ම හිතකර ප්‍රදේශයකි. එම නිසාම අතීතයේ සිටම මෙම ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය වන්නේ ද වී ගොවිතැනයි. වසර ගණනකට පෙර කෘෂි කර්මාන්තය, ජාතික ආදයම් මාර්ගයක් වූ පසු වී වගාව සඳහා අවශ්‍ය වාරිමාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම කෙරෙහි රජය අවධානය යොමු කළේය. නමුත්, වර්තමානයේ වී වගාවට ඇති නැඹුරුතාව අවම වෙමින් පවතින අතර, ගොවීන් කෙරෙහි අඩු අවදානයක් සහ රජය විසින් ඔවුන් දිරිමත් කිරීම සඳහා කිසිඳු නවෝත්පාදනයක් හඳුන්වා දී නොමැති වීම එයට හේතුවයි.

පොළොන්නරුව සංවර්ධන සැලැස්ම 2019/2030 දර්ශණය මඟින් පොළොන්නරුව නගරය සහ ආර්ථිකය වැඩි දියණු කිරීම සඳහා ඇති ප්‍රධාන විභවතාවයක් ලෙස දිස්ත්‍රික්කයේ වී වගාව වැඩිදියුණු කිරීම සහ එහි සංස්කෘතිකමය වැදගත්කම හඳුනාගෙන ඇත. පොළොන්නරුවේ කුඹුරු ඉඩම් වැඩි දියුණු කිරීම සහ ක්‍රියාශීලීව පවත්වාගැනීම සඳහා පහත සඳහන් උපාය මාර්ග හඳුනාගෙන ඇත.

6.4.4.6.1 අතහැර දමා ඇති කුඹුරු නැවත වී වගාව සඳහා යොදාගැනීම

පරාක්‍රමභාහු රජ සමයේ පොළොන්නරුව, මුළු රටටම සහල් සපයන ලද ස්වයංපෝෂිත නගරයක් විය.නමුත් වර්ථමානය වන විට කුඹුරු ඉඩම් සංරක්ෂණය සඳහා අවධානය යොමු වීම අඩු මට්ටමක පවති. පොළොන්නරුව සැලසුම් ප්‍රදේශය තුළ වී ගොවිතැන සඳහා යොදාගන්නා කුඹුරු ඉඩම් හෙක්. 3172.3 ක් ද වී ගොවිතැන සඳහා යොදා නොගන්නා අත්හැර දමන ලද කුඹුරු ඉඩම් හෙක්. 30.68 ක් ද ඇත. පෙර වර්ෂ සමඟ සැසඳීමේදී පුරන් කුඹුරු ඉඩම් වැඩිවීමේ ප්‍රවණතායවක් පවතී. එබැවින් ආපසු වී ගොවිතැන කිරීම සඳහා සුදුසු තත්වයේ පවතින කුඹුරු ඉඩම් හඳුනා ගැනීම පොළොන්නරුව සංවර්ධන සැලැස්මේ තවත් එක් අරමුණකි.

6.4.4.6.2 වී වගාව සඳහා අවශ්‍ය කරන නව තාක්ෂණය සහ නව නිපැයුම් කිරීමට හා පුහුණුව ලබා දීමට ගොවි පුහුණු මධ්‍යස්ථානයක් සැකසීම

කුඹුරු ඉඩම් පරිහානියට පත්වීමේ ප්‍රධානතම හේතුව වන්නේ තවමත් ගොවීන් සාම්ප්‍රදායික ක්‍රම පමණක් යොදාගනිමින් වී වගා කිරීම සහ ඔවුන් මුහුණ දෙන ප්‍රශ්න වලට විසඳුම් සෙවීමේදි තෘප්තිමත් විසඳුම් නොලැබීමයි.

ගොවීන් ගෝලීය ප්‍රවණතාවයන්ගෙන් ඉදිරියට ගෙන ගොස් නව තාක්ෂණය සහ නව නිපැයුම් සොයා ගැනීමට ඔවුනට අවශ්‍ය උපකාර ලබා දීම වගකිව යුතු රාජ්‍ය සේවකයින්ට ඇති ප්‍රධානතම වගකීමක් වේ.

වී වගාව සඳහා අවශ්‍ය කරන නව යන්ත්‍රෝපකරණ සහ තාක්ෂණික ක්‍රමවේදයන් මඟින් ගොවීන්ට අවශ්‍ය නව වෙනස්කම් රාශියක් ලබා දීමට ගොවි පුහුණු මධ්‍යස්ථානය මඟින් අවශ්‍ය කරන පරිසරය සලසා දෙනු ඇත.

6.4.4.6.3 බීජ හා රෝපණ ද්‍රව්‍ය පරීක්ෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයක් සහ යන්ත්‍රෝපකරණ නිෂ්පාදන වැඩපලක් හදුන්වා දීම

“බීජ හා රෝපණ මධ්‍යස්ථානය” මුලික වශයෙන් බීජ නිෂ්පාදනය හා බෙදා හැරීම, රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා බෙදා හැරීම, බීජ රෝපණ ද්‍රව්‍ය ආශ්‍රිත ධාරිතා ගොඩනැගීම සහ පාංශු සාරවත් බව සහ එහි තිරිසර බව යන අංශ දියුණුවට යෝජනා කර ඇත. රජයේ බීජ ගොවිපල ආශ්‍රිතව වැඩිදියුණු කිරීමක් ලෙස මෙය ස්ථාපිත කළ හැක. ධාන්‍යාගාරය තුළ ඇති “පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය” ද එම අංශයේම යෝජනාකර ඇත්තේ ගොවීන්ට හා කෘෂිකාර්මික පර්යේෂණයන්ට පහසුකම් සැලසීමක් ලෙසිනි. ඒ හරහා නව රැකියා අවස්ථාද උත්පාදනය වනු ඇතැයි අපේක්ෂිතය.

මෙම පරිශ්‍රය ආශ්‍රිත ප්‍රදේශයේම යෝජිත වී / සහල් කෞතුකාගාරය මඟින් අතීත වී වගා ක්‍රම, බීජ වර්ග යනාදිය පිළිබඳ අධ්‍යයනයට හා පර්යේෂණ සඳහා අවස්ථාව සැලසීම තවත් පිටුවහලක් වනු ඇත.



සිතියම 6.19 කෘෂිකර්ම සැලැස්ම
මූලාශ්‍රය : පොළොන්නරුව දිස්ත්‍රික් කායර්ාලය - නා.සං.අ.

6.5 වෙනත් උපාය මාර්ග අතර සම්බන්ධතා

පොළොන්නරුව නගරයට නව ආදායම් උත්පාදන අවස්ථාවන්හි තදබල අවශ්‍යතායවක් තිබෙන නමුදු නගරයේ සංවර්ධන කාර්යයන් සඳහා යොදා ගත හැකි භූමි ප්‍රමාණය ඉතාම අල්පය. 60%ක්ම පවතින්නේ පාරිසරික සහ සංස්කෘතිකමය සංවේදී භූමි පරිහරණ රටාවන් වේ. එම නිසා, පරිසරයට හානි නොකර කුඹුරු ගොවිතැන හා ඒ ආශ්‍රිත සංස්කෘතියත්, ඉපැරණි වාරිමාර්ග තාක්ෂණයත් යන විභවතාවයන් භාවිතයට ගෙන ලෝකයේ "කෘෂි සංචරණය" පිළිබඳ වූ අවස්ථාව මඟින් නව ආර්ථික අවස්ථා සම්පාදනය අපේක්ෂිතව වසර 2030 සඳහා පොළොන්නරුව නගරයේ දැක්ම හා අරමුණු නිර්මාණය විය. එක් එක් අරමුණු "ශදුඅත" විශ්ලේෂණයට ලක් කිරීමෙන් පරමාර්ථ තොරා ගන්නා ලදි. එම පරමාර්ථ ක්‍රියාවට නැංවීම උදෙසා "පාරිසරික සංවේදීතාවය", "ජීවත්වීමේ හැකියාව" වැනි විද්‍යාත්මක විශ්ලේෂණ හරහා සංකල්පීය සැලැස්ම නිර්මාණය කර ගන්නා ලදි. එම සංකල්පමය සැලැස්ම භූමියේ ක්‍රියාත්මක කර ගැනීම සඳහා ප්‍රධාන උපායමාර්ග 06 ක් හරහා මෙම සංවර්ධන සැලැස්ම සකස් කරන ලදි.

ආර්ථික සංවර්ධන උපායමාර්ගය මූලික පදනම වන අතර, ඒ සඳහා වඩාත් සහයෝගී වන ලෙස උරුම කළමනාකරණ උපායමාර්ගය සකසා ඇත. ලෝක උරුම පූජා නගරය සහ ස්වභාවික පරිසරය භාවිතා කරමින් නගරයේ ආර්ථිකය වැඩි දියුණු කිරීමට සියළු උපාය මාර්ග ඒකරාශී කොටගෙන ඇත. භෞතික යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ගය මඟින් ආර්ථික ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් හා සේවා සැපයීම මෙන්ම මඟීන්ට හා නිවැසියන්ට සුවපහසුව ලබා දීම පිළිබඳව අවධානය යොමු කරන ලදි.

තිරසාර පරිසර සංරක්ෂණ උපාය මාර්ගය මඟින් සංවේදී ප්‍රදේශ ආරක්ෂා කිරීම සහ නිවර්තන දේශගුණයේ ජීවත්වීමේ හැකියාව ප්‍රවර්ධනය කරන ලදි.

භෞතික සංවර්ධන සැලැස්ම නිර්මාණය සමඟ ඉහත සාකච්ඡා කළ සියළු උපාය මාර්ග සාක්ෂාත් කර ගැනීම සඳහා කලාපීයකරණ සැලැස්ම සහ කලාපවල නියාමනය සිදු කිරීම අපේක්ෂිතය. නිදසුනක් ලෙස, කලාපීකරණ සැලැස්ම මඟින් සංවර්ධනය කළ හැකි ඉඩම්වලට යටිතල පහසුකම් සැපයීම ප්‍රවර්ධනය කරන අතර, සංවේදී කලාපවල යටිතල පහසුකම් සැපයීමට යෝජනා සපයා නොමැත.

ඉහත උපාය මාර්ග හා සම්බන්ධ සෑම ක්‍රියාකාරී ව්‍යාපෘතියක්ම ක්‍රියාත්මක කිරීමෙන් "2030" දී "සහල් රාජධානියේ මහිමාන්විත උරුමයේ හරිත නගරය" ලෙස පොළොන්නරුව යළිත් එහි ඓතිහාසික ශ්‍රී විභූතිය ළඟා කර ගනු ඇත.

6.6 ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගය.

අනෙකුත් උපාය මාර්ග වලින් වැදගත්ම උපාය මාර්ගය වන්නේ මෙයයි. **2030** පොළොන්නරුව සංවර්ධන සැලැස්මෙහි ක්‍රියාත්මක කිරීම සඳහා බොහෝ ක්‍රියාකාරී ව්‍යාපෘති හඳුනාගෙන ඇත. ඒ අනුව, පහත සඳහන් කරුණු සලකා බැලීමෙන් ව්‍යාපෘති ප්‍රමුඛතා අනුපිළිවෙලකට සකස් කර ඇත.

- නගරයේ **2030** දැක්ම
- ව්‍යාපෘති අතර අන්තර් සම්බන්ධතා
- ව්‍යාපෘති ප්‍රතිලාභ
- පාරිසරික අංශය
- සමාජීය දෘෂ්ඨිය
- ව්‍යාපෘති පිරිවැය

ඒ අනුව, ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාවය පහත පරිදි බෙදා වෙන් කර ඇත.

1. පළමු ප්‍රමුඛතා ව්‍යාපෘති
2. දෙවන ප්‍රමුඛතා ව්‍යාපෘති
3. තෙවන ප්‍රමුඛතා ව්‍යාපෘති

එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා වන ආයෝජන ක්‍රම හඳුනාගෙන ඇත්තේ

1. රාජ්‍ය ප්‍රාග්ධන ආයෝජනය
2. පුද්ගලික ප්‍රාග්ධන ආයෝජනය
3. රාජ්‍ය හා පෞද්ගලික ප්‍රාග්ධන ආයෝජනය ලෙසය.

ව්‍යාපෘති ප්‍රමුඛතා ලැයිස්තුවට **2015** පොළොන්නරුව කෙටුම්පත්කළ සංවර්ධන සැලැස්මේ මේ වන විට මුල් පියවර තබා ඇති ව්‍යාපෘතිද ඇතුළත් කර ඇත.

පහත දැක්වෙන්නේ සමස්ථ සැලසුමේ හඳුනාගත් ක්‍රියාකාරී ව්‍යාපෘතිය.

6.6.1 උපාය මාර්ගික ක්‍රියාකාරී ව්‍යාපෘති සහ ආයතනික සැකසුම

අනු අංකය	ක්‍රියාකාරී ව්‍යාපෘති	වගකිව යුතු ආයතනය	කාල සීමාව අවුරුදු
01	නව තරු පන්තියේ හෝටල්	• නාගරික සංවර්ධන අධිකාරිය • ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන මණ්ඩලය • මධ්‍යම සංස්කෘතික අරමුදල	05
02	පාර්ශවකරුවන්ගේ සම්පත් පැතිකඩ (ඉන්වෙන්ටරි) සකස් කිරීම සහ පවතින හෝටල් විධිමත් කිරීම.	• ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන මණ්ඩලය • නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව	05
03	විනෝදාත්මක හා වාණිජ යිවර හා බෝට්ටු සේවා	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව • වාරිමාර්ග දෙපාර්තමේන්තුව	02
04	අන්තර්ජාල පද්ධතිය හරහා අඩු පාපැදි ලබා ගැනීමේ වැඩසටහන	• මධ්‍යම සංස්කෘතික අරමුදල • මහනගර සභාව - පොළොන්නරුව	02
05	ස්වාභාවික මින්මැදුර සහ මිරිදිය යිවර ගම්මානය	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව • වාරිමාර්ග දෙපාර්තමේන්තුව	03
06	නව සංචාරක ස්ථාන ආවරණය කිරීම සඳහා විකල්ප සංචාරක මාර්ගයන් හඳුන්වා දීම	• නාගරික සංවර්ධන අධිකාරිය • මධ්‍යම සංස්කෘතික අරමුදල	03
07	කෘෂි සංචාරක නැරඹුම් වේදිකාව	• නාගරික සංවර්ධන අධිකාරිය • මධ්‍යම සංස්කෘතික අරමුදල • රන්කෙත හෝටලය	02
08	කඳුරුවෙල කුඹුරු ආශ්‍රිතව ජපන් කුඹුරු කලාව ක්‍රියාත්මක කිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව • රාමදා හෝටලය	02
09	ප්‍රායෝගික උදාහරණ සහිත වාරිමාර්ග කෞතුකාගාරය	• නාගරික සංවර්ධන අධිකාරිය • වාරිමාර්ග දෙපාර්තමේන්තුව	03
10	වී කෞතුකාගාරය සහ ආදර්ශ ගම්මානය	• නාගරික සංවර්ධන අධිකාරිය • කෘෂිකර්ම සංවර්ධන දෙපාර්තමේන්තුව • මහනගර සභාව - පොළොන්නරුව • ප්‍රාදේශීය සභාව - පොළොන්නරුව	03
11	කඳුරුවෙල නගරයේ සහල් තොග හා විශාල පරිමාණ තොග වෙළඳපල හඳුන්වා දීම.	• කෘෂිකර්ම සංවර්ධන දෙපාර්තමේන්තුව • නාගරික සංවර්ධන අධිකාරිය	02
12	කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවිකරණ සඳහා වෙළඳ හා වාණිජ මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කිරීම	• කෘෂිකර්ම සංවර්ධන දෙපාර්තමේන්තුව • නාගරික සංවර්ධන අධිකාරිය	03
13	CTB බස් ඩිපෝව සහ දුර ගමන් සේවා මධ්‍යස්ථානය	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව	03

		• ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය	
14	ඉඩම් පොදු පොළ සහ වාහන නැවැත්වීමේ ඉඩකඩ (දැනට පවතින CTB බස් ඩිපෝ ඉඩම)	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව • ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය	05
15	පදික වේදිකා සහ හරිතකරණය සැපයීම සමඟ වාණිජ කලාපයේ පවතින වෙළඳසැල් නැවත සංවර්ධනය කිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව • මාර්ග සංවර්ධන අධිකාරිය	05
16	කඳුරුවෙල හි සියළුම මූල්‍ය ආයතන සඳහා මූල්‍ය සංකීර්ණය ඉදිකිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • ප්‍රජයේ හා පෞද්ගලික බැංකු, මූල්‍ය ආයතන	04
17	නවනගරයේ කුඩා බස්නැවතුම්පල සහ සාප්පු සංකීර්ණය	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව • දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	3
18	සංචාරක පහසුකම් මධ්‍යස්ථානයේ කාර්යයන් වැඩිදියුණු කිරීම සහ සුහුරු බැංකු ඒකක ඇතුළත් කිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • රජයේ හා පෞද්ගලික බැංකු	01
19	සංචාරක කර්මාන්තය ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදල භූමියේ සාප්පු සංකීර්ණය	• නාගරික සංවර්ධන අධිකාරිය • මධ්‍යම සංස්කෘතික අරමුදල	01
20	පොළ හංදියේ සංචාරක සාප්පු සංකීර්ණය	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව	03
21	පොදු නාගරික චතුරස්‍රය සහ අවන්හල් පරිශ්‍රය	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව	03
22	යුනෙස්කෝ උරුම නගරය භෞතික සීමාව වෙන් කිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව	05
23	ගබඩා වෙන් කිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • කෘෂිකර්ම සංවර්ධන දෙපාර්තමේන්තුව	03
24	විජිතපුර බලකොටුව / කඳුරුවෙල බලකොටුව සඳහා මායිම් නිර්ණය කිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව • මධ්‍යම සංස්කෘතික අරමුදල	05
25	පූජා නගරයේ පවතින වෙළඳසැල් නැවත සංවර්ධනය කිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව • මධ්‍යම සංස්කෘතික අරමුදල	03
26	නගර පිවිසුම් හා මංසන්ධි සංවර්ධනය	• නාගරික සංවර්ධන අධිකාරිය • මාර්ග සංවර්ධන අධිකාරිය • පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව	03

27	උරුම නගරයේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම (රාත්‍රී කාලය සහ පාපැදි හිතකාමී යටිතල පහසුකම්)	• නාගරික සංවර්ධන අධිකාරිය • පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව	03
28	උරුම නගරයේ භූමි අලංකරණය (මාර්ග දෙපස සපුෂ්ප ශාක සිටුවීම)	• නාගරික සංවර්ධන අධිකාරිය • මධ්‍යම සංස්කෘතික අරමුදල • පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව	02
29	පූජනීය නගරය අසල හෙල බොජුන් හල	• නාගරික සංවර්ධන අධිකාරිය • කෘෂිකර්ම සංවර්ධන දෙපාර්තමේන්තුව • මධ්‍යම සංස්කෘතික අරමුදල	02
30	ත්‍රිමාණ කෞතුකාගාරය සහිත ඓතිහාසික පුස්තකාලය	• නාගරික සංවර්ධන අධිකාරිය • කෘෂිකර්ම සංවර්ධන දෙපාර්තමේන්තුව	02
31	මහ රෝහලේ ප්‍රධාන වාහන පිවිසුම සුංගාවිල මාර්ගයට මාරු කිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • පොළොන්නරුව මහ රෝහල • මාර්ග සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව	05
32	මහජනතාවගේ හවුල්කාරිත්වයෙන් මහ රෝහලට පැමිණෙන පුද්ගලයින් සඳහා වාහන නැවැත්වීමේ පහසුකම් සැපයීම	• නාගරික සංවර්ධන අධිකාරිය • පොළොන්නරුව මහ රෝහල • මාර්ග සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව • පුද්ගලික ඉඩම් හිමියන්	03
33	මංතීරු දෙකක් ලෙස බණ්ඩාරනායක මාවත සහ නිශ්ශංකමල්ල මාවත වැඩි දියුණු කිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • පොළොන්නරුව මහ රෝහල • මාර්ග සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව	03
34	ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ පිහිටීම වෙනස් කිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • පොළොන්නරුව මහ රෝහල • මාර්ග සංවර්ධන අධිකාරිය • ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය	02
35	හෝටල් කළමනාකරණ පාසල	• නාගරික සංවර්ධන අධිකාරිය • ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන මණ්ඩලය	03
36	වැලි කැනීම් කර්මාන්තය සඳහා විවේක ස්ථානයක් ඉදිකිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • ප්‍රාදේශිය සභාව - පොළොන්නරුව • දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	03
37	තෙහාෂා පාසල	• නාගරික සංවර්ධන අධිකාරිය • අධ්‍යාපන දෙපාර්තමේන්තුව	02
38	සේවාගම මධ්‍යම පාන්තික නිවාස යෝජනා ක්‍රමය	• නාගරික සංවර්ධන අධිකාරිය • නිවාස සංවර්ධන අධිකාරිය	05
39	පොල හංදිය අසල අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව • ප්‍රාදේශීය සභාව - පොළොන්නරුව • ප්‍රාදේශිය ලේකම් කාර්යාලය - තමන්කඩුව	03

40	පරිපාලන නගරය සහ වාණිජ නගරය අතර පෘථු බස් සංසරණය හඳුන්වා දීම	• ශ්‍රී ලං.ග.ම. • මාර්ගස්ථ මඟී ප්‍රවාහන අධිකාරිය • නාගරික සංවර්ධන අධිකාරිය	01
41	දෛනික මඟීන්ට පහසුකම් සැලසීම සඳහා කඳුරුවෙල බස් නැවතුම්පල සංවර්ධනය කිරීම	• ශ්‍රී ලං.ග.ම. • නාගරික සංවර්ධන අධිකාරිය • මාර්ග සංවර්ධන අධිකාරිය	03
42	වි කල්ප මාර්ග සහ "ඔබ සිටින තැන" පෙන්වන තුළ දිශා පුවරු සහ නාම පුවරු ප්‍රධාන මංසන්ධි සහ උප මංසන්ධිවල සවි කිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව • මාර්ග සංවර්ධන අධිකාරිය • ප්‍රාදේශීය සභාව - පොළොන්නරුව	02
43	කඳුරුවෙල බස් නැවතුම්පල හා දුම්රිය ස්ථානය අතර සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • දුම්රිය දෙපාර්තමේන්තුව • මහනගර සභාව - පොළොන්නරුව	03
44	පදික වේදිකා වැඩිදුයුණු කිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • මාර්ග සංවර්ධන අධිකාරිය • මහ නගර සභාව - පොළොන්නරුව	05
45	කඳුරුවෙල විකල්ප මාර්ගය සහ වාහන නැවැත්වීමේ ස්ථාන තුනක්	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව • දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	05
46	මනම්පිටියේ පටු පාලම පුළුල් කිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • මාර්ග සංවර්ධන අධිකාරිය	46
47	නඩත්තු හා තාක්ෂණික වැඩි දියුණු කිරීම් නියාමනය කිරීමෙන් වාරිමාර්ග ඇළ මාර්ගවල සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • වාරිමාර්ග දෙපාර්තමේන්තුව	05
48	ජලාපවහන ප්‍රධාන සැලැස්ම සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව • මාර්ග සංවර්ධන අධිකාරිය • ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය	05
49	අපජල පවිත්‍රාගාර සැලැස්ම හා ක්‍රියාත්මක කිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව • ප්‍රාදේශීය සභාව - පොළොන්නරුව • ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය	05
50	තෝරා ගත් ස්ථානවල ජලාපවහන දැල් සවි කිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව • ප්‍රාදේශීය සභාව - පොළොන්නරුව	02
51	ගල්ලෑල්ලේ පවතින ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව • ප්‍රාදේශීය සභාව - පොළොන්නරුව • මධ්‍යම පරිසර අධිකාරිය • දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	02

52	කඳුරුවෙල A 11 මාර්ගයට යාබද වෙල් යායේ සිට හරස් මාර්ග 03 ක් ඉදිකිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • මාර්ග සංවර්ධන අධිකාරිය • දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	03
53	මහජන චතුරස්‍ර (පොල හංදිය)	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව	05
54	කඳුරුවෙල නාගරික උද්‍යානය	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව	05
55	ගල්ලෑල්ල තෙත් බිම් උද්‍යානය	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව • වන ජීවී දෙපාර්තමේන්තුව • වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව	05
56	දීප උයන අදියර ii	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව • දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	02
57	නවනගරය නාගරික උද්‍යානය	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව • දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	02
58	වී බීජ හා යන්ත්‍රෝපකරණ නිෂ්පාදන කර්මාන්ත ශාලාව / වැඩපල	• නාගරික සංවර්ධන අධිකාරිය • කෘෂිකර්ම සංවර්ධන දෙපාර්තමේන්තුව • රජයේ බීජ ගොවිපල	02
59	ගොවීන් සඳහා පුහුණු මධ්‍යස්ථානය	• නාගරික සංවර්ධන අධිකාරිය • කෘෂිකර්ම සංවර්ධන දෙපාර්තමේන්තුව • රජයේ බීජ ගොවිපල	02
60	බීජ හා රෝපණ ද්‍රව්‍ය පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය	• නාගරික සංවර්ධන අධිකාරිය • කෘෂිකර්ම සංවර්ධන දෙපාර්තමේන්තුව • රජයේ බීජ ගොවිපල	02

වගුව 6.4 උපායමාර්ගික ක්‍රියාකාරී ව්‍යාපෘති

6.6.1.1 පළමු ප්‍රමුඛතා ව්‍යාපෘති

අනු අංකය	ක්‍රියාකාරී ව්‍යාපෘති	සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු ආයතන
01	පාර්ශවකරුවන්ගේ සම්පත් පැතිකඩ (ඉන්වෙන්ටරි) සකස් කිරීම සහ පවතින හෝටල් විධිමත් කිරීම.	• ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන මණ්ඩලය • නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව
02	ජලාපවහන ප්‍රධාන සැලැස්ම සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව • මාර්ග සංවර්ධන අධිකාරිය • ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
03	අපජල පවිත්‍රාගාර සැලැස්ම හා ක්‍රියාත්මක කිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව • ප්‍රාදේශීය සභාව - පොළොන්නරුව • ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
04	තෝරා ගත් ස්ථානවල ජලාපවහන දැල් සවි කිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව • ප්‍රාදේශීය සභාව - පොළොන්නරුව
05	නඩත්තු හා තාක්ෂණික වැඩි දියුණු කිරීම් නියාමනය කිරීමෙන් වාරිමාර්ග ඇළ මාර්ගවල සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • වාරිමාර්ග දෙපාර්තමේන්තුව
06	ගල්ලෑල්ලේ පවතින ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව • ප්‍රාදේශීය සභාව - පොළොන්නරුව • මධ්‍යම පරිසර අධිකාරිය • දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
07	පරිපාලන නගරය සහ වාණිජ නගරය අතර ඍජු බස් සංසරණය හඳුන්වා දීම	• ශ්‍රී ලං.ග.ම. • මාර්ගස්ථ මඟී ප්‍රවාහන අධිකාරිය • නාගරික සංවර්ධන අධිකාරිය
08	කෘෂි සංචාරක නැරඹුම් වේදිකාව	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව • රන්කෙත හෝටලය
09	මහ රෝහලේ ප්‍රධාන වාහන පිවිසුම සුංගාවිල මාර්ගයට මාරු කිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • මහ රෝහල,මාර්ග සංවර්ධන අධිකාරිය, මහනගර සභාව - පොළොන්නරුව

10	මහජනතාවගේ හවුල්කාරිත්වයෙන් මහ රෝහලට පැමිණෙන පුද්ගලයින් සඳහා වාහන නැවැත්වීමේ පහසුකම් සැපයීම	• නාගරික සංවර්ධන අධිකාරිය • මහ රෝහල • මාර්ග සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව • පෞද්ගලික ඉඩම් හිමියන්
11	මංතීරු දෙකක් ලෙස බණ්ඩාරනායක මාවත සහ නිශ්ශංකමල්ල මාවත වැඩි දියුණු කිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • මහ රෝහල • මාර්ග සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව
12	කදුරුවෙල විකල්ප මාර්ගය සහ වාහන නැවැත්වීමේ ස්ථාන තුනක්	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව • දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
13	කදුරුවෙල A 11 මාර්ගයට යාබද වෙල් යායේ සිට හරස් මාර්ග 03 ක් ඉදිකිරීම	නාගරික සංවර්ධන අධිකාරිය මාර්ග සංවර්ධන අධිකාරිය • දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
14	වී කෞතුකාගාරය සහ ආදර්ශ ගම්මානය	• නාගරික සංවර්ධන අධිකාරිය • කෘෂිකර්ම සංවර්ධන දෙපාර්තමේන්තුව • මහනගර සභාව - පොළොන්නරුව • ප්‍රාදේශීය සභාව - පොළොන්නරුව • රජයේ බීජ ගොවිපල
15	ප්‍රායෝගික උදාහරණ සහිත වාරිමාර්ග කෞතුකාගාරය	• නාගරික සංවර්ධන අධිකාරිය • වාරිමාර්ග දෙපාර්තමේන්තුව • රජයේ බීජ ගොවිපල
16	කදුරුවෙල කුඹුරු ආශ්‍රිතව ජපන් කුඹුරු කලාව පුහුණු කිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව • රාමදා හෝටලය • රජයේ බීජ ගොවිපල • කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
17	අන්තර්ජාල පද්ධතිය හරහා පාපැදි ලබා දීමේ වැඩසටහන	• මධ්‍යම සංස්කෘතික අරමුදල • මහනගර සභාව - පොළොන්නරුව
18	නව තරු පන්තියේ හෝටල්	• නාගරික සංවර්ධන අධිකාරිය • ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන මණ්ඩලය • වාරිමාර්ග දෙපාර්තමේන්තුව
19	විනෝදාත්මක හා වාණිජ යිවර හා බෝට්ටු සේවා	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව • වාරිමාර්ග දෙපාර්තමේන්තුව
20	පොල හංදිය අසල අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව

		• ප්‍රාදේශීය සභාව - පොළොන්නරුව • ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - තමන්කඩුව
21	මනම්පිටියේ පටු පාලම පුළුල් කිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • මාර්ග සංවර්ධන අධිකාරිය
22	නගර පිවිසුම සහ මංසන්ධි සංවර්ධනය	• නාගරික සංවර්ධන අධිකාරිය • මාර්ග සංවර්ධන අධිකාරිය • පුරා විද්‍යා දෙපාර්තමේන්තුව
23	උරුම නගරයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම (රාත්‍රී කාලය)	• නාගරික සංවර්ධන අධිකාරිය • පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව • මධ්‍යම සංස්කෘතික අරමුදල
24	සංචාරක පහසුකම් මධ්‍යස්ථානයේ කාර්යයන් වැඩිදියුණු කිරීම සහ සුහුරු බැංකු ඒකක ඇතුළත් කිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • පෞද්ගලික රාජ්‍ය හවුකාරිත්වය
25	සී.ටී.බී.බස් ඩිපෝව සහ දුර ගමන් සේවා මධ්‍යස්ථානය	• ශ්‍රී ලං.ග.ම. • නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව
26	යුනෙස්කෝ උරුම නගරයේ මායිම භෞතිකව සලකුණු කිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • පුරා විද්‍යා දෙපාර්තමේන්තුව
27	වැව් වල රක්ෂිත මායිම භෞතිකව සලකුණු කිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • වාරිමාර්ග දෙපාර්තමේන්තුව
28	විජිතපුර බලකොටුව කඳුරුවෙල බලකොටුව සඳහා මායිම් වෙන් කිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • පුරා විද්‍යා දෙපාර්තමේන්තුව • මධ්‍යම සංස්කෘතික අරමුදල
29	පුරාවිද්‍යා නගරයේ දැනට පවතින වෙළඳසැල් නැවත සංවර්ධනය කිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • පුරා විද්‍යා දෙපාර්තමේන්තුව
30	උරුම නගරයේ භූමි අලංකරණය (මාර්ගය දෙපස සපුෂ්ප ගස් සිටුවීම)	• නාගරික සංවර්ධන අධිකාරිය • පුරා විද්‍යා දෙපාර්තමේන්තුව
31	හෝටල් කළමනාකරණ පාසල	• නාගරික සංවර්ධන අධිකාරිය • ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන මණ්ඩලය
32	දෛනික මඟීන්ට පහසුකම් සැලසීම සඳහා කඳුරුවෙල බස් නැවතුම්පල සංවර්ධනය කිරීම	• ශ්‍රී ලං.ග.ම. • නාගරික සංවර්ධන අධිකාරිය • මාර්ග සංවර්ධන අධිකාරිය
33	විකල්ප මාර්ග සහ "ඔබ සිටින තැන" පෙන්වන තුළ දිශා පුවරු සහ නාම පුවරු ප්‍රධාන මංසන්ධි සහ උප මංසන්ධිවල සවි කිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව • මාර්ග සංවර්ධන අධිකාරිය • ප්‍රාදේශීය සභාව - පොළොන්නරුව
34	පදික වේදිකා වැඩිදුයුණු කිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • මාර්ග සංවර්ධන අධිකාරිය • මහ නගර සභාව - පොළොන්නරුව

6.6.1.2.දෙවන ප්‍රමුඛතා ව්‍යාපෘති

වගුව 6.6. දෙවන ප්‍රමුඛතා ව්‍යාපෘති

අනු අංකය	ක්‍රියාකාරී ව්‍යාපෘති	වගකිව යුතු ආයතනය
01	ස්වාභාවික මින්මැදුර සහ මිරිදිය ධීවර ගම්මානය	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව • වාරිමාර්ග දෙපාර්තමේන්තුව
02	නව සංචාරක ස්ථාන ආවරණය කිරීම සඳහා විකල්ප සංචාරක මාර්ගයන් හඳුන්වා දීම	• නාගරික සංවර්ධන අධිකාරිය • මධ්‍යම සංස්කෘතික අරමුදල
03	පොදු වෙළඳ පොළ සහ වාහන නැවැත්වීමේ ඉඩකඩ (දැනට පවතින CTB බස් ඩිපෝ ඉඩම)	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව • ශ්‍රී.ලං.ග.ම.
04	පදික වේදිකා සහ හරිතකරණය සැපයීම සමඟ වාණිජ කලාපයේ පවතින වෙළඳසැල් නැවත සංවර්ධනය කිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව • මාර්ග සංවර්ධන අධිකාරිය
05	කඳුරුවෙල හි සියළුම මූල්‍ය ආයතන සඳහා මූල්‍ය සංකීර්ණය ඉදිකිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • පෞද්ගලික රාජ්‍ය හවුල්කාරිත්වය
06	නවනගරයේ කුඩා බස්නැවතුම්පල සහ සාප්පු සංකීර්ණය	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව
07	සංචාරක කර්මාන්තය ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදල භූමියේ සාප්පු සංකීර්ණය	• නාගරික සංවර්ධන අධිකාරිය • මධ්‍යම සංස්කෘතික අරමුදල
08	පොල හංදියේ කුඩා බස් නැවතුම්පල හා සංචාරක සාප්පු සංකීර්ණය	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව
09	පොදු නාගරික චතුරස්‍රය සහ අවන්හල් පරිශ්‍රය - පොළ හංදිය	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව
10	පූජනීය නගරය අසල හෙල බොජුන් හල	• නාගරික සංවර්ධන අධිකාරිය • කෘෂිකර්ම සංවර්ධන දෙපාර්තමේන්තුව • මධ්‍යම සංස්කෘතික අරමුදල
11	වැලි කැනීම් කම්කරුවන් සඳහා විවේක ස්ථානයක් ඉදිකිරීම - ගල්ලැල්ල	• නාගරික සංවර්ධන අධිකාරිය • ප්‍රාදේශිය සභාව - පොළොන්නරුව • දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
12	පොල හංදිය අසල අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව • ප්‍රාදේශිය ලේකම් කාර්යාලය - තමන්කඩුව

13	කඳුරුවෙල බස් නැවතුම්පල හා දුම්රිය ස්ථානය අතර සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • දුම්රිය දෙපාර්තමේන්තුව • මහනගර සභාව - පොළොන්නරුව
14	මහජන චතුරස්‍ර (පොල හංදිය)	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව
15	කඳුරුවෙල නාගරික උද්‍යානය	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව
16	ගල්ලැල්ල තෙත් බිම් උද්‍යානය	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව • වන ජීවී දෙපාර්තමේන්තුව • වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
17	දීප උයන අදියර ii	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව • දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
18	නවනගරය නාගරික උද්‍යානය	• නාගරික සංවර්ධන අධිකාරිය • මහනගර සභාව - පොළොන්නරුව • දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

6.6.1.3.තෙවන ප්‍රමුඛතා ව්‍යාපෘති

වගුව 6.7 තෙවන ප්‍රමුඛතා ව්‍යාපෘතිය

අනු අංකය	ක්‍රියාකාරී ව්‍යාපෘති	වගකිව යුතු ආයතනය
01	කඳුරුවෙල නගරයේ සහල් තොග හා විශාල පරිමාණ තොග වෙළඳපල හදුන්වා දීම.	• නාගරික සංවර්ධන අධිකාරිය
02	කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවිකරණ සඳහා වෙළඳ හා වාණිජ මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය
03	ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ ඉදිකිරීම	• නාගරික සංවර්ධන අධිකාරිය • මහ රෝහල • මාර්ග සංවර්ධන අධිකාරිය • ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය
04	තෙහාෂා පාසල	• නාගරික සංවර්ධන අධිකාරිය • අධ්‍යාපන දෙපාර්තමේන්තුව
05	සේවාගම මධ්‍යම පාන්තික නිවාස යෝජනා ක්‍රමය	• නාගරික සංවර්ධන අධිකාරිය • නිවාස සංවර්ධන අධිකාරිය
06	වී බීජ හා යන්ත්‍රෝපකරණ නිෂ්පාදන කර්මාන්ත ශාලාව / වැඩපල	• නාගරික සංවර්ධන අධිකාරිය • කෘෂිකර්ම සංවර්ධන දෙපාර්තමේන්තුව • රජයේ බීජ ගොවිපල
07	ගොවීන් සඳහා පුහුණු මධ්‍යස්ථානය	• නාගරික සංවර්ධන අධිකාරිය • කෘෂිකර්ම සංවර්ධන දෙපාර්තමේන්තුව • රජයේ බීජ ගොවිපල
08	බීජ හා රෝපණ ද්‍රව්‍ය පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය	• නාගරික සංවර්ධන අධිකාරිය • කෘෂිකර්ම සංවර්ධන දෙපාර්තමේන්තුව • රජයේ බීජ ගොවිපල

පොළොන්නරුව නගර සංවර්ධන සැලැස්ම යටතේ යෝජිත ක්‍රියාකාරී

ව්‍යාපෘති 01

01.	ව්‍යාපෘතියේ නම:	සංචාරක ක්ෂේත්‍රයේ සියළු පාර්ශවකරුවන්ගේ සම්පත් පැතිකඩක් සැකසීම හා ඒ සමඟ ඔවුන් සංචාරක සංවර්ධන මණ්ඩලයේ ලියාපදිංචි කරවීම.
02.	ව්‍යාපෘතියේ අරමුණු හා අදාළත්වය:	පොළොන්නරුව නගර සංවර්ධන සැලැස්මේ **2030** දැක්මට ළඟා වීමේදී සංචාරක ක්ෂේත්‍රය හරහා නගරයේ ආර්ථිකය ගොඩනැංවීම ප්‍රධාන අරමුණකි. වර්තමානයේ නගරය පුරා සංචාරක ක්ෂේත්‍රයට සම්බන්ධ විවිධ අංශයන්ගෙන් රැකියා අවස්ථාවන් හා විවිධ ප්‍රමාණයේ සංචාරක හෝටල්, ලැගුම්හල්, විවිධ මිල ගණන් යටතේ පවතී. එමෙන්ම, සංචාරක මාර්ගෝපදේශනයේ සිට සියළු අංශ පිළිබඳ තොරතුරු එක්රැස්කර එම අංශ විධිමත්ව ප්‍රමිතිගත කිරීම සඳහා මූලික අඩිතාලම වන්නේ මෙම සම්පත් පැතිකඩ නිර්මාණය කිරීමයි.
03.	සිදු කරන ආකාරය	**a)** පහත අංශයන්ගේ තොරතුරු එක්රැස් කිරීම හා විශ්ලේෂණය • හෝටල් වර්ග (තරු පන්තිය) සහ ඒවායේ පහසුකම් • කුඩා ප්‍රමාණයේ ලැගුම්හල් සහ ඒවායේ පහසුකම් • නිවාස ආශ්‍රිත සංචාරක කර්මාන්තය • සංචාරක මාර්ගෝපදේශකයින් ලැයිස්තුව හා ජීව දත්ත • සංචාරක කටයුතු සඳහා කුලී රථ, බයිසිකල් සැපයීම පිළිබඳ විස්තර • අවන්හල්, අත්කම්, රෙදිපිළි දේශීය කර්මාන්තකරුවන් ආදී විවිධ අංශ

		b) එම තොරතුරු අනුව ඔවුන්ගේ දැණුවත්භාවය වැඩිදියුණු කිරීමට පුහුණු කළ යුතු අංශවලට ඔවුන් යොමු කිරීම / කරවීම. c) නීත්‍යානුකූල අනුමැතීන් හා ප්‍රමිතීන් ලබා ගැනීමට ඔවුන්ව යොමු කිරීම d) සාමාන්‍ය නාගරික ජනතාව සහ නගරයේ අනෙකුත් ක්ෂේත්‍ර සංචාරක කර්මාන්ත පිළිබඳව දැණුවත් කර, නගරය තුළ පවත්වා ගත යුතු සාමූහික ප්‍රමිතිය පවත්වා ගැනීමට උනන්දු කරවීම.
04.	ව්‍යාපෘති පිරිවැය	රුපියල් මිලියන 01
05.	මූල්‍ය සැලැස්ම	රාජ්‍ය හා පෞද්ගලික ව්‍යවසාය
06.	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව	ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන මණ්ඩලය, පොළොන්නරුව මහනගර සභාව හා පොළොන්නරුව ප්‍රාදේශීය සභාව

පොළොන්නරුව නගර සංවර්ධන සැලැස්ම යටතේ යෝජිත
ක්‍රියාකාරී ව්‍යාපෘති 02

01	ව්‍යාපෘතියේ නම	ප්‍රධාන වැසිජල කාණු පද්ධතිය සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම
02	ව්‍යාපෘතියේ අරමුණු හා අදාළත්වය:	පොළොන්නරුව නාගරික ප්‍රදේශය ඉතා මද බෑවුමක් සහිත තැනිතලා භූමි ප්‍රදේශයකි. ප්‍රධාන මාර්ග දෙපස සැකසූ වැසි ජල කාණු පැවතියද, වර්තමානය වන විට අවධිමත් ඉදිකිරීම් හා වෙනත් කරුණු රාශියක් නිසා පද්ධතිය නිසි පරිදි ක්‍රියාත්මක වන්නේ නැත. අප ජලයද වැසි ජල කාණු වලටම එක්රැස් වීම නිසාත් අවධිමත් කසල බැහැර කිරීම නිසාත් සමස්ථ වැසිජල කාණු පද්ධතියම අවහිර වී ඇත. නගරයේ අනාගත දැක්ම ළඟාකර ගැනීම සඳහා ප්‍රධාන වැසි ජල කාණු පද්ධතිය සැලසුම් කර එම පද්ධතිය ප්‍රතිස්ථාපිත කර ගැනීම අත්‍යාවශ්‍ය කාරණයකි.
03	පිහිටි ස්ථානය	පවතින වැසිජල කාණු පද්ධතිය 

04	අවශ්‍ය ඉඩම් ප්‍රමාණය	සමස්ථ නාගරික කලාපයෙහි මාර්ග දෙපස රක්ෂිතය
05	ව්‍යාපෘති පිරිවැය	රුපියල් මිලියන 10
06	මූල්‍ය සැලැස්ම	මෙවන් ව්‍යාපෘති සඳහා රාජ්‍ය නොවන සංවිධාන ආධාරයෙන් මූල්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමේ හැකියාව පවතී.
07	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරී	• නාගරික සංවර්ධන අධිකාරිය • මාර්ග සංවර්ධන අධිකාරිය • පොළොන්නරුව මහනගර සභාව • පොළොන්නරුව ප්‍රාදේශීය සභාව • ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
08	නඩත්තුව	පොළොන්නරුව මහනගර සභාව හා පොළොන්නරුව ප්‍රාදේශීය සභාව

පොළොන්නරුව නගර සංවර්ධන සැලැස්ම යටතේ යෝජිත ක්‍රියාකාරී ව්‍යාපෘති 03

01	ව්‍යාපෘතියේ නම	ප්‍රධාන අපජලවහන සැලැස්ම සැකසීම හා ක්‍රියාත්මක කිරීම
02	ව්‍යාපෘතියේ අරමුණු හා අදාළත්වය	නගරයේ අපජලය නිසි පවිත්‍රකරණයකට ලක් නොවී වැසි ජල කාණු හරහා නගරයේ වාරිමාර්ග පද්ධතියට එක් වීම වර්තමානයේ ප්‍රධාන ගැටළුවකි. ඉන් පසු එම ජලය නගරයේ වෙල්යායන්ට මුසුවීම නිසා ගොවීන් දුෂ්කරතා රැසකට මුහුණ දෙනු ලබයි. මෙම තත්වය වෙනස් කිරීම නගරයේ අනාගත දැක්ම හා අරමුණු ළඟාකර ගැනීමේදි අත්‍යාවශ්‍ය කරුණක් වේ.
03	ස්ථානීය පිහිටීම	විශේෂයෙන්ම පොල හංදිය, කදුරුවෙල වාණිජ නගරය හා නවනගරය යන ප්‍රදේශ ත්‍රිත්වය 

04	ව්‍යාපෘති ක්‍රමවේදය	1. අප ජලය ගෙන යාම සඳහා නගරයේ වැසි ජල කාණුව තුළම සකසන ලද නල පද්ධතියක් එළීම. 2. වෙළඳ සැල් වලින් නිකුත් කරන අප ජලය පෙරහන පද්ධතියකට සවි කිරීම මඟින් ජලය පමණක් නල පද්ධතියට මුදා හැරීම. 3. ස්වකීය වෙළඳසැල්වල ඝන අපද්‍රව්‍ය කොටස් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය වෙතම භාර දීමට ක්‍රමවේදයක් සැකසීම. 4. නල පද්ධතිය ස්වභාවික බෑවුම ඔස්සේ සකසා නගරයේ පිටත මානික්කම්පට්ටිය ප්‍රදේශයේ පවිත්‍රාගාරයට ගෙන යාම. 5. එහිදී පියවර කිහිපයක් යටතේ පවිත්‍ර කරන ලද ජලය අවසානයේ මහවැලි ගඟ කරා නල පද්ධතියක් හෝ ඇළ මාර්ගයක් මඟින් මුදා හැරීම
05	අවශ්‍ය ඉඩම් ප්‍රමාණය	මාර්ග දෙපස රක්ෂිතය, වැසි ජල කාණු පද්ධතිය හා අවසාන ජල පවිත්‍රාගාරය මානික්කම් පට්ටිය ප්‍රදේශයේ අක්කර ½ ක පමණ ප්‍රදේශයක්
06	ව්‍යාපෘති පිරිවැය	රුපියල් මිලියන 15
07	මූල්‍ය සැලැස්ම	රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික ව්‍යවසාය
08	ව්‍යාපෘතිය සැලසුම් කිරීම ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව	➢ නාගරික සංවර්ධන අධිකාරිය ➢ පොළොන්නරුව මහනගර සභාව ➢ ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය පොළොන්නරුව මහනගර සභාව

පොළොන්නරුව නගර සංවර්ධන සැලැස්ම යටතේ යෝජිත ක්‍රියාකාරී

ව්‍යාපෘති 04

01.	ව්‍යාපෘතියේ නම	වැසි ජලවහන පද්ධතියේ සහ අපද්‍රව්‍ය රඳවා ගැනීමට පෙරහන දැල් තොරාගත් ස්ථානවල සවිකිරීම
02.	ව්‍යාපෘතියේ අරමුණු හා අදාළත්වය:	වර්තමානයේ නගරයේ වැසි ජලයත් අප ජලයත් යන දෙවර්ගයම වැසි ජල කාණු පද්ධතිය හරහා නගරය අසල වාරි ඇළ මාර්ග වලට ගලා යනු ලබයි. අපජලයට අමතරව ප්ලාස්ටික්, පොලිතීන් , වීදුරු බෝතල් ආදී විශාල සහ අපද්‍රව්‍ය ප්‍රමාණයක්ද මේ සමඟ පහත් බිම් වල තැන්පත් වේ. අපජලවහන පද්ධතිය වෙනම සකසන තුරු හා ඉන් ඉදිරියටත් මෙම තත්වය මඟ හරවා ගැනීම සඳහා පොළොන්නරුව නගරයේ තෝරා ගත් ජල මාර්ග කිහිපයක මෙම පෙරහන් දැල් සවි කිරීම යෝජනා කර තිබේ.
03.	පිහිටි ස්ථානය	

04.	ව්‍යාපෘති පිරිවැය	රුපියල් මිලියන 0.5
05.	මූල්‍ය සැලැස්ම	පොළොන්නරුව මහනගර සභාව
06.	ව්‍යාපෘතිය සැලසුම්	වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා පොළොන්නරුව මහනගර සභාව
07	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව	පොළොන්නරුව මහනගර සභාව

පොළොන්නරුව නගර සංවර්ධන සැලැස්ම යටතේ යෝජිත ක්‍රියාකාරී ව්‍යාපෘති 05

01.	ව්‍යාපෘතියේ නම	නඩත්තු හා තාක්ෂණික වැඩි දියුණු කිරීම් නියාමනය කිරීමෙන් වාරි ඇළ මාර්ගවල සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම
02.	ව්‍යාපෘතියේ අරමුණු හා අදාළත්වය:	පොළොන්නරුව නගරය පුරාම පැතිරුණු වාරි ඇළ පද්ධතියක් අතීතයේ සිටම ක්‍රියාත්මක විය. මෙම වාරි ඇළ පද්ධතියෙන් ප්‍රධාන කොටස් කීපයක් කොන්ක්‍රීට් යොදා ස්ථාවර කර ඇති නමුදු **60%** කට වැඩි ප්‍රතිශතයක් සාමාන්‍ය ඇළ මාර්ග ලෙස ගලා යයි. වර්තමානයේ විවිධ ව්‍යාපෘතීන් හා අනවසර ඉඩම් ගොඩකිරීම් නිසා මෙම පද්ධතිය බිඳ වැටී ඇත. එබැවින්, හදිසි වර්ෂාවකට පෙරදී ජලයෙන් යට නොවූ ප්‍රදේශ පවා හදිසි වර්ෂාවන්හීදී ජල ගැලීම් වලට ලක්වේ. මෙම තත්වය වලක්වා ගැනීමට වාරි ඇළ පද්ධතිය සම්පූර්ණ සමීක්ෂණයකට ලක්කොට නැවත යථා තත්වයට පත්කර ගත යුතුය.
	පිහිටි ස්ථානය	
03.	අවශ්‍ය මුළු ඉඩම් ප්‍රමාණය	නගරයේ වාරි ඇළ මාර්ග ජාලය හා ඇළ රක්ෂිත

04.	ව්‍යාපෘති පියවර	1. ප්‍රධාන පාර්ශවකරුවන් / ගොවීන් හඳුනා ගැනීම 2. ඇළ රක්ෂිත පිරිසිදු කර ගැනීම 3. මාර්ගයේ වැසි ජල කාණු පද්ධතිය හා ඇළ මාර්ග පද්ධතිය නිවැරදිව සිතියම්ගත කිරීම 4. බිද වැටුණු තැන් හඳුනාගෙන වැඩිදියුණු කිරීම 5. පද්ධතිය නිසි පරිදි පවත්වාගෙන යාම.
05	ව්‍යාපෘතිය සඳහා පිරිවැය	රුපියල් මිලියන 10
06	මූල්‍ය සැලැස්ම	රාජ්‍ය නොවන සංවිධාන වාරිමාර්ග දෙපාර්තමේන්තුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ප්‍රදේශයේ ගොවි සංවිධානවල ශ්‍රම දායකත්වය
07	ක්‍රියාත්මක කිරීම	වාරිමාර්ග දෙපාර්තමේන්තුව
08.	නඩත්තු කිරීම	වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා ගොවි සංවිධාන

පොළොන්නරුව නගර සංවර්ධන සැලැස්ම යටතේ යෝජිත ක්‍රියාකාරී ව්‍යාපෘති 06

01	ව්‍යාපෘතියේ නම	ගල්ලැල්ල කසල කළමනාකරණ මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම
02	ව්‍යාපෘතියේ අරමුණු හා අදාළත්වය:	නගරයේ දෛනිකව ඝන අපද්‍රව්‍ය ටොන් 13 ක් එක්රැස් වන බව මහනගර සභාව පෙන්වා දී ඇත. ඒවායින් 48%ක් දිරාපත්වන සහ 52% ක් දිරාපත් නොවන කසලය. අනාගතයේ ජනගහනය පිළිබඳ පුරෝකථනයට සමගාමීව 2030 දී නගරයේ දෛනික ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය ටොන් 25 ක් වෙතැයි ගණන් බලා තිබේ. ජාතික මට්ටමේ කසල කළමනාකරණ මධ්‍යස්ථානයක් මැදිරිගිරිය මී ගස්වැව ප්‍රදේශයට යෝජිත බැවින්, පවතින ගල්ලැල්ල කසල ප්‍රතිචක්‍රීයකරණය මධ්‍යස්ථානය පහත පරිදි ප්‍රතිසංවිධානය කිරීම නගර සංවර්ධන සැලැස්ම හරහා යෝජනා වී ඇත.
03	පිහිටි ස්ථානය	ගල්ලැල්ල කසල පිරිපහදු මධ්‍යස්ථානය (සිතියම 6.16) 

04	අවශ්‍ය ඉඩම් ප්‍රමාණය	කසල මධ්‍යස්ථානයට වෙන් කර ඇති භූමිය ප්‍රමාණවත්ය
05	වැඩිදියුණු කළ යුතු අංග	➢ මල අපද්‍රව්‍ය සඳහා ධාරිතාව ලීටර් 30000 ක පිරිපහදු ඒකකයක් ➢ අඩි 18x70 ප්‍රමාණයේ කොම්පෝස්ට් අංගනයක් ➢ වෙනත් යන්ත්‍රෝපකරණ ➢ ආරක්ෂිත අධි විදුලි රැහැන් අලි වැට ප්‍රති සංස්කරණය ➢ පරිශ්‍රය වටා ජීව වැටක් සැකසීම ➢ දහන ඒකකය සඳහා වෙනම ගොඩනැඟිල්ලක් සැකසීම
06	ව්‍යාපෘතිය සඳහා පිරිවැය	රුපියල් මිලියන 50
07	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව	පොළොන්නරුව මහනගර සභාව පොළොන්නරුව ප්‍රාදේශිය සභාව

පොළොන්නරුව නගර සංවර්ධන සැලැස්ම යටතේ යෝජිත ක්‍රියාකාරී ව්‍යාපෘති 07

01	ව්‍යාපෘතියේ නම	කෘෂි සංචාරක නැරඹුම් වේදිකාව
02	ව්‍යාපෘතියේ අරමුණු හා අදාළත්වය:	ලංකාවේ හොඳම සංචාරක උරුම නගරය බවට පත්වීමේදී අපගේ වී වගාව හරහා සංචාරකයින් ඇද බැඳ ගැනීම අත්‍යාවශ්‍ය කරුණකි. නගරයේ ප්‍රධාන මාර්ගයට යාබදව ඇති හරිත වෙල්යායන්වල සුන්දරත්වය නැරඹීමට අවස්ථාව ලබා දීම මඟින් එහි මූලික පියවර තැබිය හැකිය. එවන් වූ එක් ව්‍යාපෘතියක් අලංකාර ලෙස නිම කිරීමෙන් ඇති වන උත්තේජනය මත අනෙකුත් ගොවීන්ද තම කෙත් වතු සංචාරක කර්මාන්තය හා ගලපා ගැනීමටත් නව අදහස් ක්‍රියාත්මක කිරීමට පෙළඹවීමටත් මෙම උපායමාර්ගය යෝජිතා කෙරිණි. රන්කෙත හෝටලය හා සමගාමීව මෙය සිදු කිරීමට අපේක්ෂිත අතර, වෙනත් කෘෂි සංචාරක ක්‍රියාකාරකම්ද මෙහි ප්‍රවර්ධනය කෙරෙනු ඇත.
03	පිහිටි ස්ථානය	

04	අවශ්‍ය ඉඩකඩ	අක්කර 4.5 ක් (රන්කෙත කුඹුරු ඉඩම)
05	දළ ඇස්තමේන්තුගත මුදල	නැරඹුම් වේදිකාව සඳහා රුපියල් මිලියන 01
06	ව්‍යාපෘතිය සඳහා මූලාශ්‍ය සැලැස්ම	පෞද්ගලික ආයෝජන හා පොළොන්නරුව මහනගර සභාව
07	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව	රන්කෙත හෝටලය හා පොළොන්නරුව මහනගර සභව

පොළොන්නරුව නගර සංවර්ධන සැලැස්ම යටතේ යෝජිත ක්‍රියාකාරී ව්‍යාපෘති 08

01	ව්‍යාපෘතියේ නම	පොළොන්නරුව මහරෝහලේ ප්‍රධාන වාහන පිවිසුම සුංගාවිල මාර්ගයට විතැන් කිරීම
02	ව්‍යාපෘතියේ අරමුණු හා අදාළත්වය:	පොළොන්නරුව මහ රෝහල භූමිය අක්කර 22 ක් පමණ වන නමුදු භූමි ප්‍රමාණයෙන් 85% ක් පමණ ඉදිකළ ප්‍රදේශ වේ. මේ නිසා රෝහල් පරිශ්‍රය තුළ රෝගීන්ගේ වාහන ගාල් කිරීමට ප්‍රමාණවත් ඉඩකඩක් නොමැත. මේ නිසාම පරිශ්‍රය තුළට ඇතුළු වන වාහන එසැනින් පරිශ්‍රයෙන් පිට විය යුතුය. ප්‍රධාන වාහන පිවිසුම හා බාහිර රෝගී අංශය A 11 මාර්ගය අසල පැවතීම මඟින් සහ මඟින් මාරුවන ප්‍රධාන ස්ථානය ප්‍රධාන ගේට්ටුව අසල පැවතීමෙන් සෑම තත්පර 20 කට වරක් වාහන ගමනාගමනයට බාධා සිදු වේ. මෙම තත්වය අවම කර ගැනීමේ අරමුණින් ප්‍රධාන වාහන පිවිසුම හා රෝගීන් ඇතුළත් කර ගැනීම සුංගාවිල මාර්ගයෙහි පවතින පිවිසුමට මාරු කිරීම මෙම ව්‍යාපෘතියෙන් යෝජනා කෙරේ.
03	පිහිටි ස්ථානය	
04	අවශ්‍ය ඉඩකඩ	සුංගාවිල මාර්ගයේ පිවිසුම අසල පරිශ්‍රය
05	දළ ඇස්තමේන්තුගත මුදල	රුපියල් මිලියන 50
06	ව්‍යාපෘතිය සඳහා මූල්‍ය සැලැස්ම	සෞඛ්‍ය අමාත්‍යාංශ අරමුදල

07	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව	පොළොන්නරුව මහ රෝහල

6.6.2 පොළොන්නරුව නගර සංවර්ධන සැලැස්ම යටතේ යෝජිත ක්‍රියාකාරී ව්‍යාපෘති 2019 - 2030

<u>උපායමාර්ගික ක්‍රියාකාරී ව්‍යාපෘතිය 01</u>

01.	ව්‍යාපෘතියේ නම:	සංචාරක ක්ෂේත්‍රයේ සියළු පාර්ශවකරුවන්ගේ සම්පත් පැතිකඩක් සැකසීම හා ඒ සමඟ ඔවුන් සංචාරක සංවර්ධන මණ්ඩලයේ ලියාපදිංචි කරවීම.
02.	ව්‍යාපෘතියේ අරමුණු හා අදාළත්වය:	පොළොන්නරුව නගර සංවර්ධන සැලැස්මේ 2030 දැක්මට ළඟා වීමේදී සංචාරක ක්ෂේත්‍රය හරහා නගරයේ ආර්ථිකය ගොඩනැංවීම ප්‍රධාන අරමුණකි. වර්තමානයේ නගරය පුරා සංචාරක ක්ෂේත්‍රයට සම්බන්ධ විවිධ අංශයන්ගෙන් රැකියා අවස්ථාවන් හා විවිධ ප්‍රමාණයේ සංචාරක හෝටල්, ලැගුම්හල්, විවිධ මිල ගණන් යටතේ පවතී. එමෙන්ම, සංචාරක මාර්ගෝපදේශනයේ සිට සියළු අංශ පිළිබඳ තොරතුරු එක්රැස්කර එම අංශ විධිමත්ව ප්‍රමිතිගත කිරීම සඳහා මූලික අඩිතාලම වන්නේ මෙම සම්පත් පැතිකඩ නිර්මාණය කිරීමයි.
03.	සිදු කරන ආකාරය	a) පහත අංශයන්ගේ තොරතුරු එක්රැස් කිරීම හා විශ්ලේෂණය ● හෝටල් වර්ග (තරු පන්තිය) සහ ඒවායේ පහසුකම් ● කුඩා ප්‍රමාණයේ ලැගුම්හල් සහ ඒවායේ පහසුකම් ● නිවාස ආශ්‍රිත සංචාරක කර්මාන්තය ● සංචාරක මාර්ගෝපදේශකයින් ලැයිස්තුව හා ජීව දත්ත ● සංචාරක කටයුතු සඳහා කුලී රථ, බයිසිකල් සැපයීම පිළිබඳ විස්තර ● අවන්හල්, අත්කම්, රෙදිපිළි දේශීය කර්මාන්තකරුවන් ආදී විවිධ අංශ b) එම තොරතුරු අනුව ඔවුන්ගේ දැණුවත්භාවය වැඩිදියුණු කිරීමට පුහුණු කළ යුතු අංශවලට ඔවුන්

		යොමු කිරීම / කරවීම. c) නීත්‍යානුකූල අනුමැතීන් හා ප්‍රමිතීන් ලබා ගැනීමට ඔවුන්ව යොමු කිරීම d) සාමාන්‍ය නාගරික ජනතාව සහ නගරයේ අනෙකුත් ක්ෂේත්‍ර සංචාරක කර්මාන්ත පිළිබඳව දැණුවත් කර, නගරය තුළ පවත්වා ගත යුතු සාමූහික ප්‍රමිතිය පවත්වා ගැනීමට උනන්දු කරවීම.
04.	ව්‍යාපෘති පිරිවැය	රුපියල් මිලියන 01
05.	මූල්‍ය සැලැස්ම	රාජ්‍ය හා පෞද්ගලික ව්‍යවසාය
06.	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව	ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන මණ්ඩලය, පොළොන්නරුව මහනගර සභාව හා පොළොන්නරුව ප්‍රාදේශීය සභාව

උපායමාර්ගික ක්‍රියාකාරී ව්‍යාපෘතිය 02

01.	ව්‍යාපෘතියේ නම	ප්‍රධාන වැසිජල කාණු පද්ධතිය සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම
02.	ව්‍යාපෘතියේ අරමුණු හා අදාළත්වය:	පොළොන්නරුව නාගරික ප්‍රදේශය ඉතා මද බෑවුමක් සහිත තැනිතලා භූමි ප්‍රදේශයකි. ප්‍රධාන මාර්ග දෙපස සැකසූ වැසි ජල කාණු පැවතියද, වර්තමානය වන විට අවධිමත් ඉදිකිරීම් හා වෙනත් කරුණු රාශියක් නිසා පද්ධතිය නිසි පරිදි ක්‍රියාත්මක වන්නේ නැත. අප ජලයද වැසි ජල කාණු වලටම එක්රැස් වීම නිසාත් අවධිමත් කසල බැහැර කිරීම නිසාත් සමස්ථ වැසිජල කාණු පද්ධතියම අවහිර වී ඇත. නගරයේ අනාගත දැක්ම ළඟාකර ගැනීම සඳහා ප්‍රධාන වැසි ජල කාණු පද්ධතිය සැලසුම් කර එම පද්ධතිය ප්‍රතිස්ථාපිත කර ගැනීම අත්‍යාවශ්‍ය කාරණයකි.
03.	පිහිටි ස්ථානය	පවතින වැසිජල කාණු පද්ධතිය 

04.	අවශ්‍ය ඉඩම් ප්‍රමාණය	සමස්ථ නාගරික කලාපයෙහි මාර්ග දෙපස රක්ෂිතය
05.	ව්‍යාපෘති පිරිවැය	රුපියල් මිලියන **10**
06.	මූල්‍ය සැලැස්ම	මෙවන් ව්‍යාපෘති සඳහා රාජ්‍ය නොවන සංවිධාන ආධාරයෙන් මූල්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමේ හැකියාව පවතී.
07.	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම	ñ නාගරික සංවර්ධන අධිකාරිය ñ මාර්ග සංවර්ධන අධිකාරිය ñ පොළොන්නරුව මහනගර සභාව ñ පොළොන්නරුව ප්‍රාදේශීය සභාව ñ ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
08	නඩත්තුව	පොළොන්නරුව මහනගර සභාව හා පොළොන්නරුව ප්‍රාදේශීය සභාව

උපායමාර්ගික ක්‍රියාකාරී ව්‍යාපෘතිය 03

01.	ව්‍යාපෘතියේ නම	ප්‍රධාන අපජලවහන සැලැස්ම සැකසීම හා ක්‍රියාත්මක කිරීම
02.	ව්‍යාපෘතියේ අරමුණු හා අදාළත්වය	නගරයේ අපජලය නිසි පවිත්‍රකරණයකට ලක් නොවී වැසි ජල කාණු හරහා නගරයේ වාරිමාර්ග පද්ධතියට එක් වීම වර්තමානයේ ප්‍රධාන ගැටළුවකි. ඉන් පසු එම ජලය නගරයේ වෙල්යායන්ට මුසුවීම නිසා ගොවීන් දුෂ්කරතා රැසකට මුහුණ දෙනු ලබයි. මෙම තත්වය වෙනස් කිරීම නගරයේ අනාගත දැක්ම හා අරමුණු ළඟාකර ගැනීමේදි අත්‍යාවශ්‍ය කරුණක් වේ.
03.	ස්ථානීය පිහිටීම	විශේෂයෙන්ම පොල හංදිය, කදුරුවෙල වාණිජ නගරය හා නවනගරය යන ප්‍රදේශ ත්‍රිත්වය 
04	ව්‍යාපෘති ක්‍රමවේදය	1. අප ජලය ගෙන යාම සඳහා නගරයේ වැසි ජල කාණුව

		තුළම සකසන ලද නල පද්ධතියක් එළීම. 2. වෙළඳ සැල් වලින් නිකුත් කරන අප ජලය පෙරහන පද්ධතියකට සවි කිරීම මඟින් ජලය පමණක් නල පද්ධතියට මුදා හැරීම. 3. ස්වකීය වෙළඳසැල්වල ඝන අපද්‍රව්‍ය කොටස් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය වෙතම භාර දීමට ක්‍රමවේදයක් සැකසීම. 4. නල පද්ධතිය ස්වභාවික බෑවුම ඔස්සේ සකසා නගරයේ පිටත මානික්කම්පට්ටිය ප්‍රදේශයේ පවිත්‍රාගාරයට ගෙන යාම. 5. එහිදී පියවර කිහිපයක් යටතේ පවිත්‍ර කරන ලද ජලය අවසානයේ මහවැලි ගඟ කරා නල පද්ධතියක් හෝ ඇළ මාර්ගයක් මඟින් මුදා හැරීම
05.	අවශ්‍ය ඉඩම් ප්‍රමාණය	මාර්ග දෙපස රක්ෂිතය, වැසි ජල කාණු පද්ධතිය හා අවසාන ජල පවිත්‍රාගාරය මානික්කම් පට්ටිය ප්‍රදේශයේ අක්කර ½ ක පමණ ප්‍රදේශයක්
06.	ව්‍යාපෘති පිරිවැය	රුපියල් මිලියන 15
07.	මූල්‍ය සැලැස්ම	රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික ව්‍යවසාය
08.	ව්‍යාපෘතිය සැලසුම් කිරීම	fi නාගරික සංවර්ධන අධිකාරිය fi පොළොන්නරුව මහනගර සභාව fi ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
	ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව	පොළොන්නරුව මහනගර සභාව

උපායමාර්ගික ක්‍රියාකාරී ව්‍යාපෘතිය 04

01.	ව්‍යාපෘතියේ නම	වැසි ජලවහන පද්ධතියේ සහ අපද්‍රව්‍ය රඳවා ගැනීමට පෙරහන දැල් තොරාගත් ස්ථානවල සවිකිරීම
02.	ව්‍යාපෘතියේ අරමුණු හා අදාළත්වය:	වර්තමානයේ නගරයේ වැසි ජලයත් අප ජලයත් යන දෙවර්ගයම වැසි ජල කාණු පද්ධතිය හරහා නගරය අසල වාරි ඇළ මාර්ග වලට ගලා යනු ලබයි. අපජලයට අමතරව ප්ලාස්ටික්, පොලිතීන් , වීදුරු බෝතල් ආදී විශාල සහ අපද්‍රව්‍ය ප්‍රමාණයක්ද මේ සමඟ පහත් බිම් වල තැන්පත් වේ. අපජලවහන පද්ධතිය වෙනම සකසන තුරු හා ඉන් ඉදිරියටත් මෙම තත්වය මඟ හරවා ගැනීම සඳහා පොළොන්නරුව නගරයේ තෝරා ගත් ජල මාර්ග කිහිපයක මෙම පෙරහන් දැල් සවි කිරීම යෝජනා කර තිබේ.
03.	පිහිටි ස්ථානය	
04.	ව්‍යාපෘති පිරිවැය	රුපියල් මිලියන 0.5
05.	මූල්‍ය සැලැස්ම	පොළොන්නරුව මහනගර සභාව
06.	ව්‍යාපෘතිය සැලසුම් කිරීම	වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා පොළොන්නරුව මහනගර සභාව
07	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව	පොළොන්නරුව මහනගර සභාව

උපායමාර්ගික ක්‍රියාකාරී ව්‍යාපෘතිය 05

01.	ව්‍යාපෘතියේ නම	නඩත්තු හා තාක්ෂණික වැඩි දියුණු කිරීම් නියාමනය කිරීමෙන් වාරි ඇළ මාර්ගවල සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම
02.	ව්‍යාපෘතියේ අරමුණු හා අදාළත්වය:	පොළොන්නරුව නගරය පුරාම පැතිරුණු වාරි ඇළ පද්ධතියක් අතීතයේ සිටම ක්‍රියාත්මක විය. මෙම වාරි ඇළ පද්ධතියෙන් ප්‍රධාන කොටස් කීපයක් කොන්ක්‍රීට් යොදා ස්ථාවර කර ඇති නමුදු 60% කට වැඩි ප්‍රතිශතයක් සාමාන්‍ය ඇළ මාර්ග ලෙස ගලා යයි. වර්තමානයේ විවිධ ව්‍යාපෘතීන් හා අනවසර ඉඩම් ගොඩකිරීම් නිසා මෙම පද්ධතිය බිඳ වැටී ඇත. එබැවින්, හදිසි වර්ෂාවකට පෙරදී ජලයෙන් යට නොවූ ප්‍රදේශ පවා හදිසි වර්ෂාවන්හිදී ජල ගැලීම් වලට ලක්වේ. මෙම තත්වය වලක්වා ගැනීමට වාරි ඇළ පද්ධතිය සම්පූර්ණ සමීක්ෂණයකට ලක්කොට නැවත යථා තත්වයට පත්කර ගත යුතුය.
	පිහිටි ස්ථානය	
03.	අවශ්‍ය මුළු ඉඩම් ප්‍රමාණය	නගරයේ වාරි ඇළ මාර්ග ජාලය හා ඇළ රක්ෂිත

04.	ව්‍යාපෘති පියවර	1. ප්‍රධාන පාර්ශවකරුවන් / ගොවීන් හඳුනා ගැනීම 2. ඇළ රක්ෂිත පිරිසිදු කර ගැනීම 3. මාර්ගයේ වැසි ජල කාණු පද්ධතිය හා ඇළ මාර්ග පද්ධතිය නිවැරදිව සිතියම්ගත කිරීම 4. බිඳ වැටුණු තැන් හඳුනාගෙන වැඩිදියුණු කිරීම 5. පද්ධතිය නිසි පරිදි පවත්වාගෙන යාම.
05	ව්‍යාපෘතිය සඳහා පිරිවැය	රුපියල් මිලියන 10
06.	මූල්‍ය සැලැස්ම	රාජ්‍ය නොවන සංවිධාන වාරිමාර්ග දෙපාර්තමේන්තුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ප්‍රදේශයේ ගොවි සංවිධානවල ශ්‍රම දායකත්වය
07.	ක්‍රියාත්මක කිරීම	වාරිමාර්ග දෙපාර්තමේන්තුව
08.	නඩත්තු කිරීම	වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා ගොවි සංවිධාන

උපායමාර්ගික ක්‍රියාකාරී ව්‍යාපෘතිය 06

01.	ව්‍යාපෘතියේ නම	ගල්ලැල්ල කසල කළමනාකරණ මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම
02.	ව්‍යාපෘතියේ අරමුණු හා අදාළත්වය:	නගරයේ දෛනිකව ඝන අපද්‍රව්‍ය ටොන් 13 ක් එක්රැස් වන බව මහනගර සභාව පෙන්වා දී ඇත. ඒවායින් 48%ක් දිරාපත්වන සහ 52% ක් දිරාපත් නොවන කසලය. අනාගතයේ ජනගහනය පිළිබඳ පුරෝකථනයට සමගාමීව 2030 දී නගරයේ දෛනික ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය ටොන් 25 ක් වෙතැයි ගණන් බලා තිබේ. ජාතික මට්ටමේ කසල කළමනාකරණ මධ්‍යස්ථානයක් මැදිරිගිරිය මී ගස්වැව ප්‍රදේශයට යෝජිත බැවින්, පවතින ගල්ලැල්ල කසල ප්‍රතිචක්‍රීයකරණය මධ්‍යස්ථානය පහත පරිදි ප්‍රතිසංවිධානය කිරීම නගර සංවර්ධන සැලැස්ම හරහා යෝජනා වී ඇත.
03.	පිහිටි ස්ථානය	ගල්ලැල්ල කසල පිරිපහදු මධ්‍යස්ථානය (සිතියම 6.16) 
04.	අවශ්‍ය ඉඩම් ප්‍රමාණය	කසල මධ්‍යස්ථානයට වෙන් කර ඇති භූමිය ප්‍රමාණවත්ය

05.	වැඩිදියුණු කළ යුතු අංග	● මල අපද්‍රව්‍ය සඳහා ධාරිතාව ලීටර් 30000 ක පිරිපහදු ඒකකයක් ● අඩි 18x70 ප්‍රමාණයේ කොම්පෝස්ට් අංගනයක් ● වෙනත් යන්ත්‍රෝපකරණ ● ආරක්ෂිත අධි විදුලි රැහැන් අලි වැට ප්‍රති සංස්කරණය ● පරිශ්‍රය වටා ජීව වැටක් සැකසීම ● දහන ඒකකය සඳහා වෙනම ගොඩනැඟිල්ලක් සැකසීම
06.	ව්‍යාපෘතිය සඳහා පිරිවැය	රුපියල් මිලියන 50
07.	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව	පොළොන්නරුව මහනගර සභව පොළොන්නරුව ප්‍රාදේශිය සභාව

උපායමාර්ගික ක්‍රියාකාරී ව්‍යාපෘතිය 07

01.	ව්‍යාපෘතියේ නම	කෘෂි සංචාරක නැරඹුම් වේදිකාව
02.	ව්‍යාපෘතියේ අරමුණු හා අදාළත්වය:	ලංකාවේ හොඳම සංචාරක උරුම නගරය බවට පත්වීමේදී අපගේ වී වගාව හරහා සංචාරකයින් ඇද බැඳ ගැනීම අත්‍යාවශ්‍ය කරුණකි. නගරයේ ප්‍රධාන මාර්ගයට යාබදව ඇති හරිත වෙල්යායන්වල සුන්දරත්වය නැරඹීමට අවස්ථාව ලබා දීම මඟින් එහි මූලික පියවර තැබිය හැකිය. එවන් වූ එක් ව්‍යාපෘතියක් අලංකාර ලෙස නිම කිරීමෙන් ඇති වන උත්තේජනය මත අනෙකුත් ගොවීන්ද තම කෙත් වතු සංචාරක කර්මාන්තය හා ගලපා ගැනීමටත් නව අදහස් ක්‍රියාත්මක කිරීමට පෙළඹවීමටත් මෙම උපායමාර්ගය යෝජිනා කෙරිණි. රන්කෙත හෝටලය හා සමගාමීව මෙය සිදු කිරීමට අපේක්ෂිත අතර, වෙනත් කෘෂි සංචාරක ක්‍රියාකාරකම්ද මෙහි ප්‍රවර්ධනය කෙරෙනු ඇත.
03.	පිහිටි ස්ථානය	

04.	අවශ්‍ය ඉඩකඩ	අක්කර **4.5** ක් (රන්කෙත කුඹුරු ඉඩම)
05.	දළ ඇස්තමේන්තුගත මුදල	නැරඹුම් වේදිකාව සඳහා රුපියල් මිලියන **01**
06.	ව්‍යාපෘතිය සඳහා මූල්‍ය සැලැස්ම	පෞද්ගලික ආයෝජන හා පොළොන්නරුව මහනගර සභාව
07.	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව	රන්කෙත හෝටලය හා පොළොන්නරුව මහනගර සභව

උපායමාර්ගික ක්‍රියාකාරී ව්‍යාපෘතිය 08

01.	ව්‍යාපෘතියේ නම	පොළොන්නරුව මහරෝහලේ ප්‍රධාන වාහන පිවිසුම සුංගාවිල මාර්ගයට විතැන් කිරීම
02.	ව්‍යාපෘතියේ අරමුණු හා අදාළත්වය:	පොළොන්නරුව මහ රෝහල භූමිය අක්කර 22 ක් පමණ වන නමුදු භූමි ප්‍රමාණයෙන් 85% ක් පමණ ඉදිකළ ප්‍රදේශ වේ. මේ නිසා රෝහල් පරිශ්‍රය තුළ රෝගීන්ගේ වාහන ගාල් කිරීමට ප්‍රමාණවත් ඉඩකඩක් නොමැත. මේ නිසාම පරිශ්‍රය තුළට ඇතුළු වන වාහන එසැනින් පරිශ්‍රයෙන් පිට විය යුතුය. ප්‍රධාන වාහන පිවිසුම හා බාහිර රෝගී අංශය A 11 මාර්ගය අසල පැවතීම මඟින් සහ මඟින් මාරුවන ප්‍රධාන ස්ථානය ප්‍රධාන ගේට්ටුව අසල පැවතීමෙන් සෑම තත්පර 20 කට වරක් වාහන ගමනාගමනයට බාධා සිදු වේ. මෙම තත්වය අවම කර ගැනීමේ අරමුණින් ප්‍රධාන වාහන පිවිසුම හා රෝගීන් ඇතුළත් කර ගැනීම සුංගාවිල මාර්ගයෙහි පවතින පිවිසුමට මාරු කිරීම මෙම ව්‍යාපෘතියෙන් යෝජනා කෙරේ.
03.	පිහිටි ස්ථානය	
04.	අවශ්‍ය ඉඩකඩ	සුංගාවිල මාර්ගයේ පිවිසුම අසල පරිශ්‍රය
05.	දළ ඇස්තමේන්තුගත මුදල	රුපියල් මිලියන 50
06.	ව්‍යාපෘතිය සඳහා මූල්‍ය සැලැස්ම	සෞඛ්‍ය අමාත්‍යාංශ අරමුදල
07.	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව	පොළොන්නරුව මහ රෝහල

උපායමාර්ගික ක්‍රියාකාරී ව්‍යාපෘතිය 09

01.	ව්‍යාපෘතියේ නම	හෝටල් කළමනාකරණ පාසල (හෝටල් කර්මාන්ත සංවර්ධන වැඩසටහන)
02.	ව්‍යාපෘතියේ අරමුණු හා අදාළත්වය:	පොළොන්නරුවේ හෝටල් කර්මාන්තයේ අනාගත අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් එය ජාත්‍යන්තර මට්ටමට වැඩිදියුණු කළ යුතුය. දේශීය හා විදේශීය සංචාරකයින් සංචාරය කළ හා විනෝද වූ විගසම නගරයෙන් පිටව යන නමුත් ඉතා කලාතුරකින් දිනකට වඩා වැඩි කාලයක් නගරයේ රැඳී සිටියහ. මෙයට එක් හේතුවක් නම් ඔවුන්ට සේවය කිරීම සඳහා නිසි හා සම්මත නවාතැන් පහසුකම් නොමැති වීමයි. නව හෝටල් කළමනාකරණ පාසල සංචාරක ආගන්තුක සත්කාරය සම්බන්ධයෙන් කර්මාන්තයට පිවිසීමට කැමති තරුණ තරුණියන් පුහුණු කිරීම මගින් නගරයේ හෝටල් කර්මාන්තය සම්මත ආකාරයකින් වැඩිදියුණු කිරීමට සාර්ථක ක්‍රමයක් වනු ඇත. නගරයේ විරැකියා ජනගහනයෙන් 2.2% කට මෙය හොඳ විසඳුමක් වනු ඇත.
03.	ව්‍යාපෘති අරමුණු	ñ නව අධ්‍යාපන හා වෘත්තීය පහසුකම් ඇති කිරීම ñ හෝටල් කර්මාන්තයේ කුසලතා වර්ධනය කිරීම සඳහා තරුණ පරම්පරාවට පහසුකම් සැපයීම ñ රැකියා විරහිත ජනගහනය සඳහා විසඳුම ñ සංචාරක කර්මාන්තයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම ñ තරුණ පරම්පරාව අතර නව දැනුම බෙදා හැරීම
04.	පිහිටි ස්ථානය:	අධ්‍යාපන සහ ආයතන කලාපය

05.		
06.	අවශ්‍ය ඉඩම් ප්‍රමාණය	හෙක්ටයාර 7ක් පමණ
07.	ව්‍යාපෘතිය සඳහා පිරිවැය	මිලියන 40
08.	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව	ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන මණ්ඩලය

උපායමාර්ගික ක්‍රියාකාරී ව්‍යාපෘතිය 10

01.	ව්‍යාපෘතියේ නම	සුහුරු බැංකු ඒකක ඇතුළුව සංචාරක පහසුකම් මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම් ප්‍රතිසංවිධානය කිරීම.
02.	ව්‍යාපෘතියේ අරමුණු හා අදාළත්වය:	ñ ප්‍රදර්ශන පුවරු මගින් සංචාරකයින් සඳහා නගරය තුළ විකල්ප සංචාරක සැලසුම් සඳහා තොරතුරු සැපයීම ñ සංචාරක සාප්පු සංකීර්ණ වැඩි දියුණු කිරීම ñ පරිශ්‍රය තුළ ස්මාර්ට් බැංකු පහසුකම් ස්ථාපනය කිරීම
03.	පිහිටි ස්ථානය	
04.	අවශ්‍ය ඉඩකඩ	සංචාරක පහසුකම් මධ්‍යස්ථානයේ ඉඩම
05.	දළ ඇස්තමේන්තුගත මුදල	මිලියන 03 ක් පමණ
06.	ව්‍යාපෘතිය සඳහා මූල්‍ය සැලැස්ම	රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වය
07.	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව	මහජන සහ පෞද්ගලික බැංකු මධ්‍යම සංස්කෘතික අරමුදල පොළොන්නරුව මහ නගර සභාව

උපායමාර්ගික ක්‍රියාකාරී ව්‍යාපෘතිය 11

01.	ව්‍යාපෘතියේ නම	යෝජිත මූල්‍ය සංකීර්ණය සහ නාගරික උද්‍යානය කඳුරුවෙල
02.	ව්‍යාපෘතියේ අදාළත්වය:	බස් නැවතුම්පලේ හා දුම්රිය ස්ථානයේ සිට පැමිණෙන මගී ජනයා ඉලක්ක කරමින් ඔවුනට සුව පහසු පරිසරයක් නිර්මාණය කිරීමේ අරමුණින් මෙම නාගරික උද්‍යානය යෝජනා කෙරේ. එමෙන්ම මෙම සංවර්ධන සැලැස්මේ ප්‍රධාන ඉලක්කයන්ගේ එකක් වන හරිතවත් පරිසරයක් සමඟ සුවපහසු නගරයක් නිර්මාණය කිරීම සැලකිල්ලට ගෙන මෙම ව්‍යාපෘතිය යෝජනා කර ඇත.
